

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බක් පුර එකොළොස්වක ලත් කිව් දින | කාණ්ඩය 112 | පත්‍රය 108 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 23 සිකුරාදා

වරාය නගර කොමිසමේ බහුතරය ශ්‍රී ලාංකිකයෝ

ජනාධිපති නීතිඥ සංජීව ශ්‍රේෂ්ඨාධිකරණයට කියයි

නෙල්කා මැදගෙදර

යෝජිත 'කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ' බහුතරය දේශීය සාමාජිකයන්ගෙන් සම්න්විත වන බව ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආටිගල සහ කැබිනට් මණ්ඩල ලේකම් ඩොනල්ඩ් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් පෙනී සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඊයේ (22) දන්වා සිටියේය. පිට 06

රසායනික පොහොර ගෙන්වීම නවත්වනවා

ගොවීන්ට කාබනික පොහොර දෙනවා

අනුර ප්‍රේමලාල්

රසායනික පොහොර ආනයනය ඉදිරි කෙටි කාලය තුළදී සම්පූර්ණයෙන් නතර කරන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කළේය. පිට 06

පිට 6

චීන ආරක්ෂක ඇමැති 27 දා මෙරට සංචාරයක

විශ්වවිද්‍යාල ඇරඹීම සති දෙකකින් කල් යයි

වරාය නගර කෙටුම්පත භයානකයි

1190ට 93%ක් එන්නේ අදාළ නැති දැනුම් දීම්

ආසාදිතයන්ගේ ශීඝ්‍ර වැඩි වීමක් මෙරට ප්‍රභේද ගැන පරීක්ෂණ අරඹයි

ජල ප්‍රභව සංවර්ධනයට ලෝක බැංකුවෙන් කෝටි 1,350ක්

මුතුරාජවෙල ජාතික වනෝද්‍යානයක් කරන්න කැබිනට් පත්‍රිකාවක්

දින 10කදී දුම්රියට කෝටි 13ක ආදායමක්

පිට 6

මැතිසබේ ගැටුම විමර්ශනයට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හතක්

පිට 6

මෝදර වරාය අඩු මුදලට බදු දීම: රාජිතගේ අල්ලස් නඩුව ජූනි 16 දා කැඳවයි

පිට 6

'රටක් වටිනා පොතක්' පොත් දස දහසක් ලිවීමේ ජාතික වැඩසටහනේ පළමු අදියරෙහි සහතික පත් ප්‍රදානෝත්සවය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පෙරේදා (21) පස්වරුවේ පැවති අතර, දිවයිනේ පළාත් 9ම නියෝජනය වන පරිදි තෝරා ගැනුණු සිසුන් තිස් දෙනකුට ජනාධිපතිවරයා අතින් සංකේතාත්මකව සහතික පත් ප්‍රදානය කළ අයුරු. අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස්, විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහත්වරු ද මෙහි වෙති. *ඡායාරූපය - ජනාධිපති මාධ්‍ය අංශය*

කුලියාපිටිය හුදෙකලා කරයි

අනුර ප්‍රේමලාල්

කුලියාපිටිය පොලිස් වසම ඊයේ (22) මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි හුදෙකලා කිරීමට තීරණය කළ බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි. පිට 06

IDH රෝහලේ ඔක්සිජන් අවශ්‍යතාව ඉහළ ගිහින්

සුභාෂිණී සේනානායක

ඇ.යි.ඩී.එච්. රෝහලේ පවතින ඉඩ ප්‍රමාණයට වඩා මේ වන විට රෝගීන් ඇතුළත් කර ඇති බැවින් මේ වන විට රෝහලේ ඔක්සිජන් අවශ්‍යතාව ඉහළ ගොස් ඇති බව වාර්තා වේ. පිට 06

ලංකාවේ වාසි වැඩිම මොබයිල් පෙරගෙවුම් Plan එකට මාරුවෙන්න

TRIPLE BLASTER

විනාඩි 1150 D2D
SMS 1150 D2D
Anytime Data 550MB
FREE Bonus Data 825MB (Anytime 4G Bonus 275MB, Night Bonus 550MB)
රු.345/-*
*බදු ඇතුළත් වේ

Activate කිරීමට රු. 345/- ඊලෝඩ් කරන්න හෝ #678# dial කරන්න

Dialog අනාගතය අදයි.

TRC/D/SEA/19/02

*කොන්දේසි සහිතයි. වලංගු කාලය දින 30කි.

මහජන බැංකුවේ ස්වයං බැංකුකරණ ඒකකයක් නුගේගොඩ ප්‍රධාන ශාඛාවට

බැංකු ඉතිහාසයේ සිය අභිමානවත් 60 වැනි සංවත්සරය සමරන මහජන බැංකුව සිය ගනුදෙනුකරුවන්ට වඩාත් පහසුකම් සහිත කඩිනම් බැංකු සේවාවක් සලසා දෙමින් 251 වැනි ස්වයං බැංකුකරණ ඒකකය නුගේගොඩ ප්‍රධාන ශාඛාවේදී මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ටී.එම්. ඩබ්ලිව්. චන්ද්‍ර කුමාර මහතා අතින් පසුගියදා විවෘත කෙරිණි.

මේ ස්වයං බැංකුකරණ ඒකකය (Self Banking Unit) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දෙකකින් (ATM) හා මුදල් තැන්පතු යන්ත්‍රයකින් (CDM) සමන්විතය. මේ තුළින් සතියේ සෑම දිනකම දිනපතා පැය විසිහතර පුරාම නොකඩවා මුදල් ආපසු ගැනීම, මුදල් තැන්පත් කිරීම ආදී වඩාත් පහසුකම් සහිත කාර්යක්ෂම බැංකු සේවාවක් ලබා ගැනීමේ අවස්ථාව ගනුදෙනුකරුවන්ට හිමි වේ.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරාධිපති අයි.වී. ප්‍රේමලාල්, උප නගරාධිපති ප්‍රේමලාල් අතුකෝරල, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී අනුර වික්‍රමසිංහ, මහජන බැංකුව කොළඹ පිටත ප්‍රාදේශීය කළමනාකාර ලාල් පීරිස්, සහකාර ප්‍රාදේශීය කළමනාකාරිනි ප්‍රියංකා රත්නසිරි, විනෝදිකා පීරිස්, නුගේගොඩ ප්‍රධාන ශාඛාවේ කළමනාකාරිනි සේනානි රාජපක්ෂ මහත්ම මහත්මීන් සමඟ ගනුදෙනුකරුවෝ විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ටී.එම්.ඩබ්ලිව්. චන්ද්‍ර කුමාර මහතා නුගේගොඩ ප්‍රධාන ශාඛාවේ ස්වයං බැංකුකරණ ඒකකය විවෘත කළ අවස්ථාව. කොළඹ පිටත ප්‍රාදේශීය කළමනාකාර ලාල් පීරිස්, නුගේගොඩ ප්‍රධාන ශාඛාවේ කළමනාකාරිනි සේනානි රාජපක්ෂ යන මහත්ම මහත්මීහු ද මෙහි වෙති.

අපනයන සංඛ්‍යෝත්ත මිල ගණන්

2021.04.20 දිනෙන් අවසන්වූ සතිය තුල සැපයූ සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑම්යට රුපියල්)

වෙරිනය	ඩිස්ක්‍රිප්ශන	කොළඹ	කළුතර	ගාලුවිදිය	මාතලේ	රත්නපුර	කුරුණෑගල	පුත්තලම	කන්දෙපොළ	කන්කස්තුරා	කන්කස්තුරා	කන්කස්තුරා	කන්කස්තුරා	කන්කස්තුරා
සුරාබදු	Alba					-	-	-	-	-	3,000	3,125	3,000	-	-
	C-5 Sp					-	-	-	2,650	-	2,590	2,600	2,600	-	-
	C-5					-	-	-	2,500	2,050	2,480	2,475	2,467	2,500	-
	C-4					-	-	-	2,400	1,725	2,365	2,425	2,390	2,425	-
	M-5					-	-	-	-	-	2,650	-	2,350	-	-
	M-4					-	-	-	-	-	1,900	-	2,300	-	-
	H-1					-	-	-	2,100	-	1,865	2,175	2,172	2,150	-
ගම්මිරිස්	1 ශ්‍රේණිය	700	720	667	683	-	710	683	638	651	660	660	688	700	700
	2 ශ්‍රේණිය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
සරාමු 1 ශ්‍රේණිය		1,059	1,054	1,018	1,033	-	872	967	838	1,010	870	900	1,030	1,000	850
කොපි 1 ශ්‍රේණිය		997	963	1,015	986	-	937	977	883	1,020	970	925	960	1,000	930
කොකෝවා 1 ශ්‍රේණිය		350	344	-	283	-	335	326	-	-	-	-	-	-	370
කරදමුංගු ගුණෝ ලීන්		14,000	15,000	-	-	-	-	11,500	-	-	-	-	-	-	-
කාපිත්තා 1 ශ්‍රේණිය		839	807	675	700	-	-	850	-	-	-	600	-	-	-
වසාවසි 1 ශ්‍රේණිය		4,175	4,200	3,400	2,600	-	-	3,500	-	-	-	3,900	-	-	-
ගිරුවා කොකු 1000න්		-	-	-	-	-	-	8,000	-	6,000	-	-	-	-	-
පුවක් කරවත්තා කි.ග්‍රෑ.වලට		576	619	600	616	-	541	642	588	660	600	625	650	610	606

විමර්ශනය	කි/කොට	ප/ පුර	කාලීය	මිනිසා
සුරාබදු කොකු කොපි (65 ග්‍රෑ./රාත.)	-	-	3,220	2,700
කොකෝ කොපි (60 ග්‍රෑ./රාත.)	2,000	0	-	2,000

දැන්න සැසඳුම් - අපනයන කොමිසාරිස් ආරංචිය පරීක්ෂණ අංශය
අපනයන කොමිසාරිස් බෝගා වගාකිරීම් හා පැසවීම් පිළිබඳ නියත පාත්තණික කොරතුරු සහ උපදෙස් කොමිෂනේ ප්‍රකාශනීම සඳහා
අපනයන කොමිසාරිස් වගාවේ නිලධාරි හමුවන්න.
ස්ථානය - කොළඹ කෝන්දර දිනය - සඳුදා
වේලාව -පෙ.ව. 8:30 සිට පස්. 4:30

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.dea.gov.lk

සන්නිවේදන අංශය, අපනයන කොමිසාරිස් දෙපාර්තමේන්තුව, 1095, දුම්රිය පාර, කෝරළෙණිය
අපනයන කොමිසාරිස් දෙපාර්තමේන්තුව - අපනීට සරල හෙට දිනසට
දු.අ. 2388651

නුවරඑළියේ කොවිඩ් ආසාදිතයන් ගණන ඉහළට

හැටන් මධ්‍යම විශේෂ

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් හා දික්ඔය ප්‍රදේශවලින් පෙරේදා (21) හමුවූ කොවිඩ් ආසාදිතයන් 04 දෙනා සමඟ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිතයන් ගණන 1618 දක්වා ඉහළ ගොස් ඇති බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අංශ නිලධාරියෙක් පැවසීය.

මේ පිළිබඳ වැඩිදුරටත් එම නිලධාරියා පැවසුවේ පෙරේදා (21) හැටන් ප්‍රදේශයෙන් හෙදියක හා ඇයගේ පාසල් යන පුතුන් දෙදෙනකු හා තවත් අයකු කොවිඩ් ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇති බවත් එම තත්ත්වය මත නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිතයන් ගණන 1618 දක්වා ඉහළ ගොස් ඇති බවත්ය.

මෙසේ අලුතින් හඳුනාගත් කොවිඩ් ආසාදිත පාසල් සිසුන් දෙදෙනාගේ ආශ්‍රිතයන් ලෙස පාසල් සිසු සිසුවියන් 88ක් ගුරුවරුන් තිදෙනකු ස්වයං නිරෝධායනයට ලක් කිරීමට පියවර ගෙන ඇති බවත් ආශ්‍රිතයන් පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කිරීමට පියවර ගන්නා බවත් මේ වන විට නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් කොවිඩ් මරණ 12ක් වාර්තා වී ඇති බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

යාපනයේ පොලිස් ස්ථාන කීපයක ආසාදිතයන් වැඩි වීමේ ප්‍රවණතාවක්

උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

යාපනයේ පොලිස් ස්ථාන කීපයක් හරහා කොරෝනා ආසාදිතයන් වැඩිවීමේ ප්‍රවණතාවක් පෙරේදා (21) දක්නට ලැබුණු බව උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඒ.කේතීස්වරන් මහතා පැවසීය.

යාපනයේ පොලිස් නිලධාරීන් 13ක් කොරෝනා රෝගීන් ලෙස වාර්තා වීමත් සමඟම යාපනයේ සෞඛ්‍ය නිලධාරි කාර්යාල කීපයක් විසින් පොලිස් නිලධාරීන් 258ක් පී.සී.ආර්. පරීක්ෂණවලට ලක් කර තිබේ.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා පැවසුවේ යාපනයේ මේ පොලිස් නිලධාරීන්ට අමතරව තවත් ප්‍රදේශ කීපයකින් පෙරේදා (21) කොරෝනා ආසාදිතයන් 23ක් හමු වූ බවය.

යාපනය දිස්ත්‍රික්කයේ පෙරේදා (21) පොලිස් නිලධාරීන්ගේද ඇතුළුව පී.සී.ආර්.පරීක්ෂණ 788ක් සිදු කොට තිබේ. උතුරේ සෙසු දිස්ත්‍රික්කවලින්ද රෝගීන් හමු වී ඇති අතර එම සංඛ්‍යා වවුනියාවෙන් 7ක් හා මන්නාරමෙන් 5ක් වශයෙනි.

හැටන් දික්ඔය පාසල් දෙකක සිසුන් නිරෝධායනයට

හැටන් මධ්‍යම විශේෂ

මධ්‍යම කඳුකරයේ හැටන් ආශ්‍රිත ප්‍රදේශවල කොවිඩ් වසංගතය නැවත හිස ඔසවන බැවින් සෞඛ්‍ය නීති දැඩි කිරීමට අදාළ බලධාරීන් පියවර ගත යුතු බව ප්‍රදේශවාසීහු පවසති.

මේ වන විට හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශයෙන්ද කොවිඩ් මරණයක් වාර්තා වී ඇති බවත් මෙයට අමතරව කොවිඩ් ආසාදිත හෙදියක් හා පාසල් සිසුන් දෙදෙනකුද හමුවීමත් සමඟ පාසල් දෙකක 02,04,06, පන්තිවල සිසුන් පිරිසක් නිරෝධායනයට ලක් කර ඇති බවත් පවසති.

මේ තත්ත්වය මත සමහර බස් රථවල පාසල් සිසුන් ඇතුළු මඟීන් වැඩිපුර ගෙන යෑමෙන් හා මුඛ ආවරණ නොමැතිව නගරයේ සිදු කරන පදික වෙළෙඳාම් වැනි කටයුතුවලින් කොවිඩ් අවදානම වැඩි විය හැකි බවද ඔවුහු පවසති.

පුණ්‍යා හීන්දෙණියගේ සැමියා ලන්ඩනයේදී අභාවප්‍රාප්ත වෙයි

ශ්‍රී ලාංකේය සිනමාවේ අපූරු මතක සටහන් තැබූ ප්‍රවීණ රංගන ශිල්පිනියක වන පුණ්‍යා හීන්දෙණිය මහත්මියගේ සැමියා වන විශේෂඥ වෛද්‍ය මිල්රෝයි නානායක්කාර මහතා (83) අභාවප්‍රාප්ත විය.

කලක් රෝගාතුරව සිටි ඒ මහතා එංගලන්තයේ ලන්ඩන්හි රෝහලක ප්‍රතිකාර ලබමින් සිටිය දී ඊයේ (22) අලුයම මියගිය බව වාර්තා වෙයි. මොණරාගල රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීවරයා වශයෙන් කටයුතු කළ ඒ මහතා සැම්බියාවේ සහ ලන්ඩන්හි වෛද්‍යවරයකු වශයෙන් සේවය කර තිබේ.

හද ඇඳි කවි සළු හෙට එළිදකී

දිගු කලක් තිස්සේ පුවත්පත් කවි පිටු සැරසූ දේවප්‍රිය රණවීර කිවිඳුන්ගේ කුලුඳුල් කාව්‍ය ග්‍රන්ථය 'හද ඇඳි කවි සළු' හෙට (24) පෙ.ව. 9.00ට කොළඹ 7, නිදහස් මාවතේ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී එළිදැක්වේ. මිරිස්සේ ධම්මික හිමිපාණන් මුලසුන හොබවන මෙහිදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුමුදු කරුණාරත්න සහ ජ්‍යෙෂ්ඨ ලේඛක සෝමසිරි පට්ටියආරච්චි මහත්වරු දෙසුම් පවත්වති.

එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්

ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කරන ලද විශේෂිත ප්‍රාථමික අලෙවිකරු

2020 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන

NSB Fund Management

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා	2020 විගණනය කළ රු. '000	2019 විගණනය කළ රු. '000
පොලී ආදායම	1,501,182	1,449,315
පොලී වියදම	(922,406)	(1,020,726)
ශුද්ධ පොලී ආදායම	578,776	428,589
ගාස්තු හා කොමිස් ආදායම	52,775	58,959
ගාස්තු හා කොමිස් වියදම	(5,800)	(4,766)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	46,975	54,193
වෙළඳ කටයුතුවලින් ශුද්ධ ලාභය / අලාභය	471,652	471,619
අනෙකුත් ආදායම් / (වියදම්)	(7)	18
මුළු මෙහෙයුම් ආදායම	1,097,396	954,419
අපචයවීම් සඳහා ගැලපීම්	111	(103)
ශුද්ධ මෙහෙයුම් ආදායම	1,097,507	954,316
මෙහෙයුම් වියදම්		
පිරිස් පිරිවැය	(28,318)	(31,063)
අනෙකුත් මෙහෙයුම් වියදම්	(28,146)	(19,897)
එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු පෙර මෙහෙයුම් ලාභය	1,041,043	903,356
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද	(139,956)	(119,928)
ජාතිය ගොඩනැගීමේ බදු වියදම	-	(15,423)
ආදායම් බදුවලට පෙර ලාභය	901,087	768,005
ආදායම් බදු වියදම	(292,941)	(252,596)
වසරේ ලාභය	608,146	515,409
අනෙකුත් විස්තීර්ණ ආදායම්	57,802	98,892
වර්ෂය සඳහා සම්පූර්ණ විස්තීර්ණ ආදායම	665,948	614,301

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	31.12.2020 විගණනය කළ රු. '000	31.12.2019 විගණනය කළ රු. '000
වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	1,196	169,365
ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්	12,092,392	10,670,391
ක්‍රමක්ෂය පිරිවැය මත ණය සහ අත්තිකාරම්	12,320	20,937
ක්‍රමෂය පිරිවැය මත මූල්‍ය වත්කම්	3,926,609	3,933,465
අනෙකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්	648,008	1,009,706
අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ වටිනාකම මත කොටස් ආයෝජන	2,000	2,000
දේපළ, පිරියත සහ උපකරණ	6,294	5,350
අස්පෘශ්‍ය වත්කම්	5,983	186
උපයෝජිත හිමිකම් ඇති වත්කම්	39,363	42,996
විලම්භිත බදු වත්කම්	-	338
අනෙකුත් වත්කම්	147,601	131,312
මුළු වත්කම්	16,881,766	15,986,046
වගකීම් සහ ස්කන්ධය		
නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ ණය ගැනීම්	12,785,463	12,413,643
ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල	2,660	5,040
අනෙකුත් වගකීම්	5,974	25,581
කල්බදු වගකීම්	39,430	40,443
ගෙවිය යුතු ආදායම් බදු	213,227	161,268
විලම්භිත බදු	126	-
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	1,815	2,947
මුළු වගකීම්	13,048,695	12,648,922
ස්කන්ධය		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	1,700,000	1,700,000
විශේෂ අවධානම් සංචිතය	865,558	713,522
රඳවාගත් ඉපැයුම්	1,250,080	962,445
අනෙකුත් සංචිත	17,433	(38,843)
මුළු ස්කන්ධය	3,833,071	3,337,124
මුළු වගකීම් සහ ස්කන්ධය	16,881,766	15,986,046

ස්කන්ධ වෙනස්කම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. '000	විශේෂ අවදානම් සංචිතය රු. '000	රඳවාගත් ඉපැයුම් රු. '000	අනෙකුත් සංචිත රු. '000	මුළු රු. '000
2019.01.01 දිනට ආරම්භක ශේෂය	1,700,000	584,669	576,372	(138,220)	2,722,821
වර්ෂය සඳහා ලාභය			515,409		515,409
අනෙකුත් විස්තීර්ණ ආදායම්			(484)	99,377	98,893
මාරුකිරීම්		128,852	(128,852)		-
2019.12.31 දිනට සංවෘත ශේෂය	1,700,000	713,521	962,445	(38,843)	3,337,123
වර්ෂය සඳහා ලාභය			608,146		608,146
අනෙකුත් විස්තීර්ණ ආදායම්			1,526	56,276	57,802
මාරුකිරීම්		152,037	(152,037)		-
ගෙවූ ලාභාංශ			(170,000)		(170,000)
2020.12.31 දිනට සංවෘත ශේෂය	1,700,000	865,558	1,250,080	17,433	3,833,071

සහතික කිරීම

(අත්සන් කළේ) ඩී.එල්.පී. අභයසිංහ
ප්‍රධාන විධායක නිලධාරි

NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

(අත්සන් කළේ) අජිත් පීරිස්
විධායක අධ්‍යක්ෂ

(අත්සන් කළේ) කේෂිලා ජයවර්ධන
සභාපතිනිය

නො. 400, ගාලු පාර, කොළඹ 03.
දු.ක. 2425010 ෆැක්ස් : 2574387 ඊමේල් : nsbfmc@nsb.lk වෙබ් : www.nsb.lk / fund - management/

අනපේක්ෂිත මොහොතක වන අලි දෙදෙනෙක් ගම්වැදිලා

ගම්මු බියෙන් : යතුරුපැදියකටත් පහර දීලා

මාපාකඩවැව සමූහ
එච්. එම්. රංජිත් කරුණාවීර

මහියංගණ මහවැලි ගඟේ රැඳී සිටින වන අලි දෙදෙනකු පෙරේදා (21) සවස 5.00ට පමණ මිනිපේ වේරගංතොට පාලම හන්දිය, ගඟේයාය ප්‍රදේශයෙන් ගම්මානය වෙත අනපේක්ෂිත මොහොතක කඩාවැදීම හේතුවෙන් ගම්වාසීහු මහත් භීතියට පත් වුහ. වන අලිය මහියංගණ මහනුවර මාර්ගයේ මහවැලි පාලම අසල නවතා තිබූ යතුරුපැදියකටද ප්‍රහාරයක් සිදු කර යළි මහවැලි ගඟ දෙසට දිව ගියේය.

වසර 10කට අධික කාලයක් තිස්සේ මහියංගණයට බල පා ඇති උග්‍ර වන අලි තර්ජන දිනෙන් දිනම වැඩිවෙමින් පවතින අතර ඒ සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමට තවමත් බලධාරීහු අපොහොසත්ව සිටිති.

වන අලි තර්ජන අධිකවීම හේතුවෙන් මහියංගන හා මිනිපේ ගොවි ජනපදයේ සාමාන්‍ය මිනිස් ජන ජීවිතය මේ වන විට සම්පූර්ණයෙන්ම අවුල් වී ඇති බව ගම්මු මැසිවිලි නගති. වසරකට අධික කාලයක් තිස්සේ දිවා කාලයේ මහියංගණ මහවැලි ගඟේ රැඳී සිටින වන අලි රංචුවෙන් දෙදෙනෙකු මිනිපේ, පාලම හන්දිය, ගඟේයාය ප්‍රදේශයෙන් ගොඩබිමට පැමිණිමත් සමඟ ගම්වාසීහු නොසන්සුන් වූහ.

වන අලි ගඟේයාය ගම්මානයේ මාර්ගය දිගේ මහියංගණ මහනුවර ප්‍රධාන මාර්ගයට පිවිසිමට උත්සාහ දැරීමේදි ගම්වාසීන් හා මාර්ගවල ගමන්ගත් පිරිස නොසන්සුන් ලෙස හැසිරීම හේතුවෙන් වන අලි දෙදෙනා ද කලබලකාරී ලෙස හැසිරෙමින් මාර්ගයේ නවතා තිබූ යතුරුපැදියකටද ප්‍රහාරක් එල්ල කළහ. ප්‍රහාරය එල්ල කර අලි දෙදෙනා නැවතත් මහවැලි ගඟ දෙසටම දිව ගියහ.

මහියංගණ හා මිනිපේ ගොවි ජනපදයේ උග්‍ර වන අලි තර්ජනවලට ස්ථිර විසඳුම් ඉල්ලා "වල්සපුගල" උපවාසයට සමගාමීව මහියංගණ නගර මධ්‍යයේ පැවැත්වෙන අඛණ්ඩ සත්‍යග්‍රහයට අරඹා ඊයේ (22) වන විට දින 37ක් ගතව ඇතත් මේ වනතුරු බලධාරීන් ඊට සවන් දී ඇති බවක් නොපෙනේ.

මහජන බැංකුව 2020දී රුපියල් කෝටි 2,100ක බදු පෙර ලාභයක් වාර්තා කරයි

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙහිලා දැවැන්ත ශක්තියක් ලබාදෙන මහජන බැංකුව 2020 වසරේ දී රුපියල් කෝටි 2,100 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට සමත්ව තිබේ.

මහජන බැංකුවේ 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ මේ බව සඳහන් වන අතර එම වාර්ෂික වාර්තාව අරලියගහ මන්දිරයේදී ඊයේ (22) මහජන බැංකුවේ සභාපති සූජීව රාජපක්ෂ මහතා විසින් අගමැති මහින්ද රාජපක්ෂ මහතාට පිළිගැන්වීය.

වාර්ෂික වාර්තාවට අනුව මහජන බැකුවේ බදුපෙර ලාභය රුපියල් කෝටි 2,100 ක් (බිලියන 21ක්) වන අතර බදුපසු ලාභය රුපියල් කෝටි 1,400කි (බිලියන 14කි).

2020 වර්ෂයේ මහජන බැංකුවේ ලාභාංශය රුපියල් කෝටි 350 (බිලියන 3.5) ක් ලෙසත් රාජ්‍ය බදු රුපියල් කෝටි 1,400 (බිලියන 14) ක් ලෙසත් එම වාර්තාවේ සඳහන් වෙයි.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුව යමින් මහජන බැංකුව මේ වසරේ රුපියල් කෝටි 2,500 (බිලියන 25) ක ලාභයක් සහ රුපියල් කෝටි 1,500 (බිලියන 15) කට වැඩි බදු ආදායමක් බලාපොරොත්තු වන අතර ඉලක්ක ගත ලාභාංශය රුපියල් කෝටි 300 (බිලියන 3) කි.

මහජන බැංකුවේ සභාපති සූජීව රාජපක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි රංජිත් කොඩිතුවක්කු, මූල්‍ය නිලධාරි අසාම් අහමඩ් සහ අලෙවි විධායක නාලක විජේවර්ධන මහත්වරු ද මේ අවස්ථාවට සහභාගි වූහ.

විදේශගත වන ශ්‍රමිකයන්ට පහසු මිලට වට්ටම් සහිතව ගුවන් ටිකට් පත්

සුභාෂිණී සේනානායක සහ අනුර ප්‍රේමලාල්

විදේශගත වන ශ්‍රමිකයන් සඳහා පහසු මිලට වට්ටම් සහිතව ගුවන් ටිකට් පත් ලබා දීමේ විශේෂ වැඩපිළිවෙළක් විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ අමාත්‍යාංශය විසින් හඳුන්වා දී තිබේ.

මෙහි අරමුණ වන්නේ අවම මුදලකට රැකියා සඳහා විදේශ ගතවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ගුවන් ටිකට් පත් ලබාදීම බව ඇමැති ප්‍රියංකර ජයරත්න මහතා පැවැසීය.

මේ සඳහා නව ගුවන් ප්‍රවේශ පත්‍ර කාර්යාලයක් නාවල, නාරාහේන්පිට පාරේ අංක 12 විදේශ රැකියා ඒජන්සි සමාගම් පරිශ්‍රයේ පිහිටුවා ඇති බව විදේශ රැකියා ඒජන්සි සමාගමේ සභාපති මේජර් සුදත් අබේසිංහ මහතා පැවැසීය.

එමෙන්ම සියලුම රටවල් සඳහා වට්ටම් සහිතව ගුවන් ප්‍රවේශ පත්‍ර මේ කාර්යාලයෙන් වෙන් කරවා ගත හැකි බවද සභාපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ යටතේ අන්තර්ජාතික සමුළු සඳහා, රැකියා පුහුණු සඳහා මෙන්ම විවිධ රාජකාරි සඳහා විදේශ ගතවන රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම රාජ්‍ය ආයතනවලට වට්ටම් සහිතව ගුවන් ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමට විශේෂ වැඩපිළිවෙළක් සකස් කර තිබෙන බවත් මේ යටතේ රාජ්‍ය ආයතන දැනුම්වත් කරමින් සිටින බවත් සභාපති සුදත් අබේසිංහ මහතා කියා සිටියේය.

ආර්ථික පුනර්ජීවන සහ දරිද්‍රතාව පිටුදැකීමේ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා සහ විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ ඇමැති ප්‍රියංකර ජයරත්න මහතා සමඟ පැවැති සාකච්ඡාවකදී පළාත් ශාඛා විවෘත කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත් මේ වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් කාර්යාලයක් ස්ථාපිත කළ බවත් කියා සිටි ඒ මහතා ඉදිරියේදී සියලු දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ගුවන් ප්‍රවේශ පත්‍ර කාර්යාල විවෘත කරන බවත් කියා සිටියේය.

මේ වැඩසටහන යටතේ කඩිනම් සේවාවක්, රජයේ රැකවරණය, සාධාරණ මිල ගණන් යටතේ ගුවන් ප්‍රවේශ පත්‍ර ලබා ගත හැකි වන අතර වැඩි විස්තර www.slfea.lk, info@slfea.lk මගින් සහ දුරකථන අංක 0112807400න් ලබා ගත හැකිය.

දුම්රිය අනතුරු වර්ධනය වීමට හේතු සොයා අභ්‍යන්තර වාර්තා කැඳවයි

දුම්රිය වැඩ බලන සාමාන්‍යාධිකාරී

සුභාෂිණී සේනානායක

දුම්රිය අනතුරු වර්ධනය වීමට හේතු සොයා බැලීමට දුම්රිය අභ්‍යන්තර වාර්තා කැඳවා ඇති බව දුම්රිය වැඩ බලන සාමාන්‍යාධිකාරී ඩබ්ලිව්. ඒ. ඩී. ගුණසිංහ මහතා පැවැසීය.

අනතුරු සිදුවීමට බලපාන ප්‍රධාන සාධක එහිදී සැලකිල්ලට ගන්නා බව කියා සිටි ඒ මහතා සියදිවි නසා ගැනීමට දුම්රියට පැනීම ඉතා කනගාටුදායක තත්ත්වයක් බවත් එවැනි පුද්ගලයන්ගේ ජීවිත බේරා ගැනීමට දුම්රිය රියැදුරන් දැඩි උත්සාහයක් ගන්නා බවත් කියා සිටියේය.

එදිනෙදා සිදුවන දුම්රිය ප්‍රමාද , දුම්රිය සංඥා නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම් ඇතුළු දුම්රිය අනතුරු සිදුවීමට බලපාන ප්‍රධාන හේතු මෙහිදී සලකා බැලෙන බවත් ඊට කඩිනම් විසඳුම් ලබාදීමට පියවර ගන්නා බවත් කියා සිටි වැඩබලන දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා එම කරුණු සම්බන්ධයෙන් ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා සමඟ සාකච්ඡා කරන බවත් උපදෙස් ගන්නා බවත් කියා සිටියේය.

අලුත් අවුරුදු දින කීපයේ ස්ථාන තුනක සිදුවූ දුම්රිය අනතුරු සම්බන්ධයෙන් වෙනම පරීක්ෂණයක් සිදු කෙරෙන බවද ඒ මහතා කියා සිටියේය. ඒ මහතා මේ බව කියා සිටියේ අලුත් අවුරුදු දින කීපයේ සිදු වූ දුම්රිය අනතුරු සම්බන්ධයෙන් දිනමිණ කළ විමසීමකදීය.

ලෝකවාසීන්ට සුව පතා අත්තනගල්ල රාජමහා විහාරයේ පිරිත්

අත්තනගල්ල විශේෂ

කොවිඩ් 19 රෝ බිය දුරුවී ලෝවැසි සැමට ආයු ආරෝග්‍ය සම්පත්තිය උදාවේවායි ප්‍රාර්ථනා කරන තිස්පැය හතේ මහ පිරිත් දේශනාව ආරක්ෂක ලේකම් (විශ්‍රාමික මේජර් ජනරාල්) කමල් ගුණරත්න මහතාගේ ද සහභාගිත්වයෙන් පෙරේදා(21) රාත්‍රී 8.00ට ඓතිහාසික අත්තනගල්ල රාජමහා විහාරයේදී ආරම්භ විය.

ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමියන්ගේ මූලිකත්වයෙන් සමස්ත ලංකා සසුන් මඟ භික්ෂු සංවිධානය මෙහෙයවන මේ මහා පිරිත් දෙසුම මේ මස 26දා දක්වා දිනපතා පෙරවරු 8.00ට පස්වරු 3.00ට සහ රාත්‍රී 8.00ට පැවැත්වේ.

අප්‍රේල් 26 වැනි දින රාත්‍රී දේව දූර පෙරහර සහ දොරකඩ අස්න අනුශාසනාව පැවැත්වේ.

2020 ඡන්ද හිමි නාමලේඛනයේ කෙටුම්පත මැතිවරණ කොමිෂන් සභා වෙබ් අඩවියේ

අනුර ප්‍රේමලාල්

2020 වසරට අදාළ ඡන්ද හිමි නාමලේඛනයේ කෙටුම්පත මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ www.elections.gov.lk ප්‍රදර්ශනය කර ඇත.

එම ඡන්ද හිමි නාමලේඛනයේ ඒ ඒ ග්‍රාම නිලධාරි වසමට අදාළ කොටස ඒ ඒ ග්‍රාම නිලධාරි කාර්යාලවලද දිස්ත්‍රික්කයේ නාමලේඛනය ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලද ප්‍රදර්ශනය කර ඇත.

එම නාමලේඛනය සහතික කිරීම මේ මස 30 වැනි දින සිදු කිරීමට නියමිත බව මැතිවරණ කොමිෂන් සභාව කියා සිටියි.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 23 සිකුරාදා

මිහිතල දිනයට පසු වදනක්

සෑම වනාන්තරයක් තුළම දෙවියකු ඇතැයි ද එම දෙවියන් වනාන්තරය ආරක්ෂා කරතැ'යි ද විශ්වාසයක් අපේ මුතුන්මිත්තන් ළඟ තිබිණි. එය මිථ්‍යාවක් සේ බැහැර කළ හැකි වුව එම සංකල්පයෙහි ඇති උපාය මාර්ගික වටිනාකම කිසි ලෙසකින් හෝ අමතක කළ නොහැකිය. වනයට බිය මුසු ගෞරවයක් දැක්වූ ගැමියා එහි ප්‍රවේශ වීමට පෙර දෙවියන්ගෙන් අවසර ගත්තේය; නැත හොත් දෙවියන් ඉදිරියේ ගිවිසුමකට එළැඹියේය. ඒ වනය විනාශ නොකරන බවට හා දිවි හිමියෙන් එය ආරක්ෂා කරන බවටය. පුරාණ ගැමි සමාජය වනාන්තර සමඟ ජීවත් වූ අතර, එහි ස්වභාවය හොඳින් වටහා ගත්හ. ගැමියා වනයට පමණක් නොව, මිහිතලයේ සියලු වස්තුවලට අසීමිත ලෙස ආදරය කළේය. අතීතයේ පාරිසරික ප්‍රශ්න අවම වූයේ ඒ හේතුවෙනි.

ඊයේ ලොව පුරා ජගත් මිහිතල දිනය මහ ඉහළින් සමරනු දක්නට ලැබිණි. කොවිඩ් වසංගත තත්ත්වය යටතේ වුව වන වගා වැඩසටහන් ක්‍රියාත්මක විය. පාරිසරික සම්මන්ත්‍රණ පැවැත්විණි. කොවිඩ් වසංගත තත්ත්වය මත වායු දූෂණය අඩු වී ඇත. ඒ අනුව මිහිතලය උණුසුම් වීම කෙමෙන් අඩු වන්නට පටන් ගෙන තිබේ. ග්ලැසියර් දිය වීම හා මුහුදේ ජල මට්ටම ඉහළ යෑම පිළිබඳ ජගත් ගැටලුවට එක්තරා විසඳුමක් ලැබී ඇතැ'යි සතුටු විය හැකිය. එහෙත් ආපසු හැරී බලන විට එය තාවකාලිකය. වසංගතයේ නිමාවත් සමඟ වායු දූෂණය දෙගුණයකින් ඉහළ යන්නට පුළුවන. අන්තර්ජාතික සංවිධාන මිනිස් සමාජයේ අනාගත ක්‍රියාකාරකම් කෙරෙහි අලුත් ප්‍රවේශයකින් කරුණු සලකා බලන්නට ඉදිරිපත් විය යුතුව තිබේ. අලුත් ගිවිසුම් ඇති කළ යුතුය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට මෙහිලා බරපතළ වගකීමක් පැවරෙයි.

ජගත් පරිසර සංවිධානවල දැඩි අවධානය යොමු වී ඇති මූලික පාරිසරික ගැටලු කිහිපයක් පවතී. ග්ලැසියර් දිය වීම, මුහුදේ ජල මට්ටම ඉහළ යෑම, පෘථිවි තලයේ උණුසුම අධික වීම, කාන්තාරකරණය, ජලය අපවිත්‍ර වීම, වායු දූෂණය, ඝන අපද්‍රව්‍ය මගින් කසළ කඳු බිහි වීම ඒ අතර ප්‍රධාන යැයි සිතන්නට පුළුවන. මේ තත්ත්වයන් ස්වාභාවිකව පහළ නොවන අතර, මිනිස් ක්‍රියාකාරකම් නිසා ඒවා වර්ධනය වෙයි. පුදුමයකට මෙන් ලෝකයට නීති පනවන හා උපදේශන සපයන බලවත් රටවල මිනිස් ක්‍රියාකාරකම් ඉතා ශීඝ්‍රයෙන් පරිසරයේ තුලිත බව විනාශ කරයි. චීනය, අමෙරිකාව, ඉන්දියාව වැනි රටවල් දිනකට වාතලයට මුදා හරින කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය ඉතා අධිකය. ඒවා සීමා කිරීම සඳහා බලවත් රටවල් දක්වන උනන්දුව ඉතා අඩුය.

ලෝකයේ විස්මිත ස්වාභාවික නිර්මාණ සේ සලකනු ලබන මහා ගංගා සියල්ලෙහිම පාහේ ජලය දූෂණය වන්නට පටන්ගෙන තිබේ. ඒ හැරෙන්නට ගංගා පිටාර තැනි අසාර වෙමින් පවතින අතර, ජලධාරිතාව පහළ යමින් පවතී. ගංගාවල රිද්මය වෙනස් වී ඇත. නයිල් ගඟ, හොවැංහෝ ගඟ, මීකොං ගඟ, මරේඩාලිං ගඟ, යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා හා ඉන්දියාවේ සියලු ගංගා ද දැඩි සේ දූෂණයට ලක් වී ඇත. ඇතැම් ගංගාවක ගලා යන්නේ විස රසායන මිශ්‍ර ජලය යැයි කිව හැකිය. ගංගා පමණක් නොව විල්, පොකුණු, වැව්, කලපු හා මුහුදු ආදියත් විවිධ හේතු මත දූෂණයට ලක් වී ඇත. මළ මුහුද ඝන අපද්‍රව්‍යවලින් පිරිගිය කසළ ගොඩක් වීමට තවත් වැඩි කාලයක් ගත නොවනු ඇතැ'යි පුරෝකථන ඉදිරිපත් වී ඇත. මේවා කලාපීය වශයෙන් ද සාකච්ඡාවට ගෙන විසඳුම් වෙත ගමන් කළ යුතුය.

පරිසරය ආරක්ෂා කළ යුතු යැයි හඬක් ලොව පුරා පැවතිය ද ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ ඉතා මන්දගාමී ලෙසය. බලවත් රටවල් මේ කෙරෙහි අඩු සැලකිල්ලක් දක්වන්නේ ආර්ථික සංවර්ධනය හා පාරිසරික සංරක්ෂණය අතර කිසියම් ගැටීමක් ඇති නිසා යැයි සිතන්නට පුළුවන. විශාල ගොවි බිම් සඳහා වනය හෙළි කරන්නට සිදු වේ. නිවාස ව්‍යාපෘති, මහා මාර්ග හා ආයෝජන කලාප සඳහා තවත් ආකාරයකින් භූමිය විශාල ලෙස යෙදවීමට සිදු වෙයි. විදුලිය නිෂ්පාදනය සඳහා ගල් අඟුරු හා ඉන්ධන භාවිත කිරීමට සිදු වෙයි. මේවා පිළිබඳ ආරක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කිරීමට බලවත් රටවල් පෙලඹී නැත. එය විශාල අවාසියකි. තවත් අතකින් වනාන්තර ස්වාභාවික ලෙසම විනාශ වන්නට පටන්ගෙන තිබේ. අමෙරිකාවේ ළැවගිනි හා ඔස්ට්‍රේලියාවේ ළැව් ගිනි ඊට නිදසුන්ය. මේ සඳහා ස්ථාවර විසඳුමක් තවම නැත.

ලෝකයේ සමස්ත පරිසරය දෙස ආපසු හැරී බලන්නටත් නව මානයකින් යුතුව පාරිසරික වැඩසටහන් මෙහෙයවීමටත් කාලය පැමිණ ඇතැ'යි සිතන්නට පුළුවන. එහිදී කලාපීය සංවිධානවලට මෙන් එකිනෙක රටවල ජාතික සංවිධානවලට ද විශාල වගකීමක් පැවරෙනු ඇත. අපේ පරිසරය අප රැකගත යුතුය යන අදහස ලෝකය පුරා ප්‍රචලිත කළ යුතුව තිබේ. එහිදී අතීත අත්දැකීම් අපට මහත් පිටුබලයක් වනු ඇතැ'යි සිතිය හැකිය. අතීත මානවයා උපාය මාර්ගික ක්‍රියාවලියක් ඔස්සේ පරිසර සංරක්ෂණයට යොමු වී සිටියේය. තාක්ෂණයේ දියුණුවත් සමඟ මානවයා වෙතින් එය මඟහැරී ගියේය. එය නැවත ගොඩනැඟීම කාලීන අවශ්‍යතාවක් සේ සැලකිය හැකිය. අපේ තෙත්බිම්, අපේ වනාන්තර, අපේ සාගර කලාප අප විසින්ම රැක බලා ගත යුතු වේ. ඒ හැර මිහිතලය ආරක්ෂා කිරීමට වෙනත් විකල්පයක් නැත.

ශ්‍රී ලංකාව දෙසට හැරී බැලුව හොත් පරිසරය ආශ්‍රයෙන් ගොඩනැඟුණු අලුත් ගැටලු ගණනාවක් පවතී. වන සතුන් ගම්මානවලට පැමිණ වගා විනාශ කිරීම, දේපොළ හානි සිදු කිරීම හා මිනිසුන්ට පහර දීමත්, ඒ අතර ප්‍රධාන ගැටලුවක් වෙයි. වන සතුන්ට ප්‍රමාණවත් පරිදි වනාන්තර පුළුල් වීමක් සිදු විය යුතුව තිබේ. ගැමියන්ගේ වගා බිම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනීම ද මේ ගැටලුවේ තවත් පැත්තකි. වන අලින්, කොටින්, වල් ඌරන්, දඬු ලේනුන්, රිළවුන්, වඳුරන් පමණක් නොව, මොනරුන් පවා ජන ජීවිතයට බාධාවක් වී ඇති බව දැන් දැක ගත හැකිය. එම ගැටලුවට ස්ථිරසාර විසඳුමක් සෙවීම, පරිසර සංරක්ෂණයට ද අදාළ කටයුත්තක් සේ සැලකිය හැකිය. මානවයාට මෙන්ම සතාසීපාවාට ද මේ මිහිතලය උරුමය. වන සතුන් පරිසරයේම කොටසක් ලෙස සැලකීමට අපට සිදු වනු ඇත. ඒ අනුව පාරිසරික ගැටලු විසඳීම පහසු නැති බව පෙනී යයි.

දැනට ශ්‍රී ලංකාවේ පවතින වනාන්තරවල ප්‍රමාණය මුළු භූමියෙන් 29%ක් ලෙස ගණනය කර තිබේ. එය කෙටි කාලයක් තුළදී 32% දක්වා ඉහළ නැංවීම රජයේ ඉලක්කය වී තිබේ. මේ අනුව සෑම අවස්ථාවක්ම ප්‍රයෝජනයට ගනිමින් නැවත වන වගාව සිදු වන ආකාරයක් පෙනෙන්නට තිබේ. පරිසර අමාත්‍යාංශය රටේ සියලු ගංගා සුරක්ෂිත කිරීමේ වැඩසටහනක් ද ආරම්භ කර තිබේ. එය කාලෝචිත වැඩසටහනකි. පරිසර සංරක්ෂණය සාමූහික ක්‍රියාවලියකි. එහි වගකීමෙන් කොටසක් සෑම පුරවැසියකු වෙතම පැවරෙනු ඇත.



අවදානම් නිසා ඉදිරියෙ තිබෙන සති
අනහැර දමා දුර දිග නොබලනා ගති
විමසා රැකී ඉන්නට හැකි සෑම පැති
හිතුවොත් පරිස්සම ගැන හොඳටෝම ඇති

රටකට අවැසි විනය සමඟ දැනුම

කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය ඒකකයේ හිටපු මහාචාර්ය
අජන්තා හපුආරච්චි

බුදුන් වහන්සේ තම ශාසනයේ පැවැත්ම උදෙසා විනය පිළිබඳව තම ශ්‍රාවකයන්ට දුන් අවවාද සහ පිළිපැදිය යුතු කරුණු පිළිබඳව අපි විනය පිටකයෙන් දකිමු. ලෝකයේ පැවැත්ම සඳහා ද විනය කෙතරම් වැදගත් ද යන්න මෙහෙණි සසුන පිහිටුවීමේදී ප්‍රථමයෙන් විනය නීති රැසක් පනවමින් ඒ සඳහා අවසර දීම අපි යළි මෙනෙහි කරන්නේ නම් විනය කෙතරම් වැදගත් කාරණයක් ද යන්න පිළිබඳව අමුතුවෙන් කිව යුතු නොවේ. ලී ක්වාන් යූ සිංගප්පූරුව ගොඩනැඟීමේදී යොදා ගත් ආදර්ශ පාඨවලදී නැත හොත් නිර්ණායකයේදී විනය ප්‍රමුඛස්ථානයක් ගනු ලැබීය. ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධනය අනෙකුත් නිර්ණායකයන් විය. රටක් සංවර්ධනය වීමේදී ඒ රටේ තිබිය යුතු ප්‍රමුඛතම කාරණය වන විනය යන්න වැදගත් වන්නේ එය පාසල් අධ්‍යාපනය සමඟ සමපාත වන බැවිනි.

මෑතකදී බොහෝ විට අසන්නට දකින්නට ලැබෙන පුවත් අතර පාසල් දරුවන්ගේ විනය පිරිහී ඇති බවට නිතර චෝදනා නැඟේ. එසේම දරුවන් බෙහෙවින් සමාජ මාධ්‍ය ජාලා සමඟ නිරන්තරයෙන් රැඳී සිටීමත් ඒවා අවභාවිත කිරීමත් නිසා විවිධ ප්‍රශ්න ඇති කර ගත් අවස්ථා ද නැතිවා නොවේ. මේ තත්ත්වයට බෙහෙවින් බලපෑවේ මානව හිමිකම් වැනි අංග අනවශ්‍ය ලෙස හුවා දක්වමින් අපට තිබුණු පැරණි අපේ වටිනාකම් හා සාරධර්ම වෙනම තැනකට තල්ලු වී ගිය බැවින්යැයි කරුණු විමසා බැලීමේදී පැහැදිලි වේ. විනය දැඩි ලෙස අධ්‍යාපනය සමඟ බද්ධ වී ඇති අතර එය දඬුවම සමඟ ගමන් කරන්නකි. මානව අයිතිවාසිකම් කතාබහ සමඟ දඬුවම පාසලෙන් අතුරුදන් වී ඇත. විනය යන්න දැනුමේ ශාඛාවකි. රටක පවතින නීතිරීති හා සාරධර්ම වටිනාකම්වලට ගරු කරන ගුණගරුක සමාජයකට මිනිසුන් පුහුණු කිරීම විනය ලෙස හඳුනා ගත හැකි අතර දඬුවම ඊට අනුබද්ධව පවතී. ඉන් කරනුයේ අකීකරුකම්වලින් නිසිමඟට ජනතාව පත් කිරීමය.

මෙහිදී 'වදන් කවි පොතේ' එන

"වේවැල් කෝටු නාරං සියඹලා අතු
කිතුල් පොල් ඉරටු වැල් කහඹිලිය අතු
මෙහෙම ඉපල් මගෙ දෑතට නොපෑ යුතු
පමා නොවී එම් අකුරට මෙයින් මතු"
"අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
වැල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා
කල් ගිය රෙදි වැරැලි ඇඳ දැලි කුණෙන් වකා
ඇල්මෙන් අකුරු උගනී කුමරු ඉදිරි වැඩ තකා"

යන කවි පිළිබඳව මඳක් විමසා බැලීමේදී අප අධ්‍යාපනයේ අතීත තොරතුරු ගොනුවක් හඳුනා ගත හැකිය. පමා වීමෙන් දරුවකු ගුටි කෑ ආකාරයත්, ඊට කෙතරම් බිය වී ද, යන්නත් එක කවියකින් පැහැදිලි කරයි. වත්මන දරුවකුට ගුටියක් කෑමට සිදු වුව හොත් ගුරුවරයාට සිදු වන්නේ ඊටත් වඩා දඬුවමකි. එසේම ඉගෙනීම සඳහා සැප පහසුකම් නොසොයා දැනුම සොයා ගිය මෙරට පැරණි සමාජය අද දකින දරුවකු ඒවාට සමච්චල් කරනු නොඅනුමානය. ගුරුවරුන් සහ දරුවන් ඈත් කර වූ කරුණු පිළිබඳ යළි සලකා බැලීමක් අවශ්‍ය බැව් පෙනේ. එසේම පැරැන්නන් ඉගෙනීම කළේ බොහෝ අඩුපාඩු හා අඩුපහසුකම් යටතේ බව කියවුණ ද ඉන් අධ්‍යාපනය ලැබීමේ වටිනාකම ගිලිහී ගියේ නැත.

■ ළමා අයිතිවාසිකම් සම්මුතිය

ඒ තත්ත්වය ඇති වූයේ 1970 ට පසු කාලයේ සිදු වූ දේශපාලන වෙනසත් සමඟිනි. එම නිසා අධ්‍යාපනයේ ගමන් මඟ ද වෙනස් වූයේ මහා චරිත පරිහානියක් ද සිදු වෙමිනි. පාසල් විනය පිරිහෙන්නට වූයේ මෙතැන් පටන්ය. රටක දේශපාලන ව්‍යුහය සෘජුවම මෙන්ම වක්‍රාකාරව අධ්‍යාපනයට බලපානවායැයි යන්න සමස්ත රටේ අනාගතය පරිහානියට ලක් වීමකි. පසුගිය වකවානුවේ මේ රටේ දරුවන්ගේ විනය ආරක්ෂා කිරීම සඳහා 1989 දී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය සම්මත වූ පසු පාසල් විනය පාලනය ළමයාගේ මානව ගරුත්වයට අනුකූල වන ආකාරයට සිදු කරන බවට ශ්‍රී ලංකාව ද ප්‍රතිඥා දී ඇත.1998 අංක 5 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික ළමාරක්ෂක අධිකාරිය ස්ථාපිත කළේය. ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය 2005/17 දරන පාසල තුළ විනය ආරක්ෂා කිරීම නමැති චක්‍රලේඛය නිකුත් කළේය. එමඟින් දරුවන්ට ශාරීරික දඬුවම් දීම සම්පූර්ණයෙන් තහනම් විණි. මේ නිසා එක් අතකින් දරුවන්ගේ රැකවරණයට ආරක්ෂණයක් සිදු වුව ද දරුවන් හා ගුරුවරුන් අතර විශාල දුරස්ථ බවක් ඉන් ඇති වීම වඩාත් අහිතකර තත්ත්වයක් ගෙන එනු ලැබීය.

මව්පියන් දරුවන්ගේ අකීකරුකම් නොමනාකම් වෙනුවෙන් පාරට බැසීමත්, පොලිසියට සහ උසාවියට යෑමට ඉදිරිපත් වීමත් සමඟ ගුරුවරයා දරුවන්ගේ විනය පිළිබඳව අතගැසීමට අකැමති පසුබැසීමකට එය හේතු විය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කරුණු අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නඩු නිමිත්තක් වශයෙන් ගුරුවරයා හඳුනාගනු ලැබීය. දණ්ඩ නීති සංග්‍රහයේ ඇතැම් වගන්ති අනුව දඬුවමක් කළ ගුරුවරයාට ඇතැම් කරුණු නඩු නිමිත්තක් වූ අවස්ථා නැතුවා නොවේ.

ඇතැම් චක්‍රලේඛ නිසා පාසල් විනය මණ්ඩලය කැඳවා දැඩි වරදක් කළ දරුවකුට වුව මේ නීතිරීති මඟින් අවහිරකම් රැසක් අවම කොට ඇත. කුමන චක්‍රලේඛ, අණ පනත් තිබුණ ද ගුරුවරයාගේ වෘත්තිය අන්තර්ජාතික වශයෙන් පිළිගත් ගෞරවනීය තත්ත්වකට පත් වීම මේ හේතුවෙන් ගිලිහිනි. පාසල් විනය දැඩි සෝදාපාළුවකට පත් වීමට මුල් වූ ප්‍රධාන සාධකය එයය.

නවීන දැනුම,තාක්ෂණය මෙන්ම ආචාර ධර්ම නොමැති වෘත්තියක් සමාජ අවශ්‍යතාවක් බවට පත් නොවේ. මේ වෘත්තියට හිමි උසස් ජීවන තත්ත්වයක් හා ස්වාධීන පැවැත්මක් ද තවමත් ලැබී ඇතැයි සිතීම උගහටය. පිළිගත් ආචාර ධර්ම පද්ධතියක් නොමැති නිසා ආදර්ශය හා කැපවීම ඔවුන්ගෙන් දුරස්ථ වී ඇත. එම නිසා ඉගෙනීමට හිත කර පරිසරයක් පාසල තුළ ඇති නොවේ.

පසුගිය වකවානුවේ මේ රටේ දරුවන්ගේ විනය පිළිබඳව යම් නීතියක්, චක්‍රලේඛයක්, රීතියක් නිකුත් කළේ රටේ දරුවන්ගේ විනය වැඩි දියුණු කිරීමටය. එසේ පවතින රටක දරුවන්ට මෙන්ම වැඩිහිටි පරපුරට පාලමක් ලෙස හඳුනාගත හැකි පාර්ලිමේන්තුව යනු මෙසේ පාසල් අධ්‍යාපනයෙන් පෝෂණය වූ කොටසකින් සමන්විත සමාජයේ නියෝජනයකි. ඇතැම් අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ හැසිරීම කුඩා පන්ති කාමරයකටත් වඩා පහත් තැනක පවතී. එහිදී අප අපෙන්ම ප්‍රශ්න කර ගත යුත්තේ කෙතරම් නීතිරීති තිබුණ ද විනයගරුක පුරවැසියකු බිහි කිරීමට පාසලට ඇති නොහැකියාව ද? යන්නය.

■ පාර්ලිමේන්තුවේ හැසිරීම

කවුරු කුමක් කීව ද තවමත් කතෝලික පාසල්වල විනය අනෙකුත් පාසල්වලට වඩා යහපත්ව පවතින බව නොරහසකි. ඉහළ පන්තිවල දරුවන්ගේ ඇතැම් නොමනාකම් මේ පාසල්වලින් අසන්නට, දකින්නට ලැබෙන්නේ කලාතුරකිනි. එමෙන්ම පාසල් වර්ගීකරණය වුව මේ සඳහා බලපාන බව පෙනේ. විනය දරුවන්ට අද මෙයින් කදිම පාඩමක් උගන්වා ඇත. මහා වේගයෙන් ගමන් කළ අධ්‍යාපනය සෙමෙන් ගමනකට පත් වන්නේ දරුවන්ගේ විනයට මූලිකත්වයක් දෙමිනි. ඔවුනට අද පන්ති කාමරයට පෙරදී මෙන් දිව ගොස් ඇතුළු වීමට නොහැකිය. ඊට පෙර දෑත් සෝදා මුව ආවරණ පැලඳ ගනිමින් පෙර සූදානමකට පත් කොට ඇත්තේ විනය මූලිකවය. ඔවුනට පෙර මෙන් එක්ව පන්ති කාමරයේ එක ආහාර වේල බෙදා ගෙන කෑම ඇහිරී ඇත. එකට දුව පනිමින් පිටිටනියේ කළ සෙල්ලම් දුරස්ථ තැනකට ගෙන ගොස් ඇත. දරුවන් හුදෙකලාව එහෙත් සාමූහිකව කටයුතු කිරීමේ විනයක් අද ඇති වී තිබේ. දරුවන්ට මෙය මුලදී අපහසුවක් මෙන් දැනෙන්නට ඇති මුත් අද වන විට එසේ කිරීම අනිවාර්ය වී ඇත. මෙය විනය පිළිබඳ අද ඇති වී තිබෙන තත්ත්වය වේ.

මේ වන විට අප විසින් පිළිගෙන ඇති ඇතැම් ලෝක තත්ත්වයන් අපට අදාළ කර ගැනීමට පැවැති රජයන් කිසිදු උත්සාහයක් නොකෙරිණි. ඒවා එසේම පිළිගෙන මේ රටේ ස්ථාපිත කිරීම පුරුද්දක් වී තිබේ. මේ තත්ත්වයන් එසේම පැවැතීම තුළින් අපේක්ෂිත ඵලයන් ලැබුණේදැයි යළිත් සලකා බැලිය යුතුය.

විශේෂයෙන් ගුරුවරුන්ට බලපාන ඇතැම් නීතිරීති නිසා ඔවුන් දරුවන්ගේ යහපැවැත්ම හා විනය පිළිබඳ තීරණ ගැනීමිවලදී පසුගාමීත්වයක් තිබීම රටේ දරුවන්ගේ විනය පිළිබඳ ප්‍රශ්නයක් විනා යහපත් වූවක් නොවේ. ඒ සඳහා තෝරා ගන්නා ගුරුවරුන් ද වෘත්තීය ආචාර ධර්ම ස්වේච්ඡාවෙන්ම පිළිපැදීමට ශක්‍යතාවක් ඇති අය විය යුතුය.

■ ගුරු පුහුණුව

වර්තමාන ලෝකයේම ගුරු පුහුණුවේ වෙනසක් අපේක්ෂා කරන අතර මෙය ඒ පිළිබඳව යළි සලකා බැලිය යුතු කදිම අවස්ථාවකි. එය රටට අවශ්‍ය පරිදි මෙන්ම ලෝක දැක්මක් තුළ සිදු විය යුත්තකි. මෙහිදී මට එක්තරා ලිපියක් සිහිපත් වේ. එය යුනෙස්කෝ ප්‍රකාශනයක සුසෑන් නම් ලේඛිකාවක් විසින් ලියන ලද්දකි. ඇය මේ සංකල්පය ඉදිරිපත් කර තිබුණේ 1997දීය. එය අදටත් නූතනය. එහෙත් ලෝකයේ රටවල් එහි වටිනාකම එතරම් විචාරාත්මකව බැලුවේ නැත. ඇගේ සංකල්පය වූයේ අධ්‍යාපනය හැම විටම glocalize විය යුතු බවය. එනම් ලෝක දැක්ම හා දේශීයත්වය යන දෙකම එක්ව එනම් global+Local යන කොටස් එක්ව ගමන් කළ යුතු බවය. මෙහිදී ලෝකය සමඟ හා ලෝකයට සමගාමීව ගමන් කරන රටවල් අතර භූතානය, කියුබාව ප්‍රධාන තැනක් ගනී. ඒ රටවල් ලෝකයේ සිදු වන සහ සිදු කරන සෑම දෙයකටම අනුගත වන්නේ තම රට මුලට තබා ගෙනය. එහිදී භූතානය කොවිඩ් වසංගතය හමුවේ ඒ ගමන පිළිබඳ ඉඟියක් ද පෙන්වා ඇත. කොවිඩ් පාලනය කර ගත හැකි වූයේ ඔවුන් එසේ glocalize පිළිබඳව දැක්ම පෙරට තබා ගත් හෙයිනි.

අධ්‍යාපනය එසේ රටට ගැළපෙන ලෝකය සමඟ එක්ව ගමන් කරන මාවතකට පත් කිරීමේදී ප්‍රමුඛත්වයක් දිය යුත්තේ විනය පිළිබඳ කාරණයේදීය. විනයක් නැති රටක් කිසිදා සංවර්ධිත රටක් වන්නේ නැත. මිනිසා හදා රට සංවර්ධනය කරමුයැයි කියවෙන්නේ විනයගරුක පුරවැසියකු නොමැති තැන රටක්ද නැති බැවිනි. දරුවන්ගේ විනය රැකීමට ගුරුවරයා ද ස්වාධීන වෘත්තිකයකු කිරීම ද එකට ගමන් කළ යුත්තකි.

කප්රුක තියෙද්දී කටු පොල් කුමට ද?

පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (සැකසුම්) පී. එදිරිමාන්න

පිළිකාකාරක පොල් තෙල් ආනයනයත් සමඟ පොල් කර්මාන්තය ගැන වඩාත් උණුසුම් වාද විවාද මතු විය. ඉපැරැණි කර්මාන්තයක් ලෙස පොල් වගාව කාලීනව සංවර්ධනය විය යුතු බවට ද යෝජනා ඉදිරිපත් විය. ඒ අනුව පොල් නිෂ්පාදන ආශ්‍රිත දේශීය අවශ්‍යතා සම්පූර්ණ කර ගනිමින් මෙම කර්මාන්තය ඉදිරියට යා යුත්තේ කෙසේ ද? යන්න පිළිබඳ පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (සැකසුම්) පී. එදිරිමාන්න මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.

● ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය කියන්නේ රටට විදේශ විනිමය උපයා දෙන ප්‍රධානතම මාර්ගයක්. මෙම කාර්මාන්තය තුළ අපි අද සිටින්නේ කොතැනද?

ශ්‍රී ලංකාවේ දැනට පොල් අක්කර ලක්ෂ 11ක් තිබෙනවා. සාමාන්‍යයෙන් වසරකට පොල් අස්වැන්න විදිහට ගෙඩි මිලියන 2800ක් - 3000ක් ලැබෙනවා. මින් තුනෙන් දෙකක් එනම්, ගෙඩි මිලියන 1900ක් 2000ක් දේශීය පරිභෝජනය සඳහා ගනු ලබනවා. ඉතිරි ගෙඩි මිලියන 800-1000 පොල් ආශ්‍රිත කර්මාන්තවලට යොදවනවා. එහෙත්, සමස්ත දේශීය පොල් අවශ්‍යතාව ගෙඩි මිලියන 3600ක්. ඒ කියන්නේ අවම වශයෙන්වත් ඒ ප්‍රමාණය අපට උවමනායි. නමුත්, දැනට අපේ අස්වැන්න ගෙඩි මිලියන 2800ක් පමණ නිසා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ඉහළ යෑම සහ ආනයනික නිෂ්පාදනවල මතුවන ගැටලුවලට නිරන්තරයෙන් මුහුණ දීමට අපට සිදු වෙනවා.

● පොල් ආශ්‍රිත නිෂ්පාදනවලින් වැඩි ඉල්ලුමක් තිබෙන්නේ පොල් තෙල්වලට. නිෂ්පාදන ධාරිතාව ප්‍රමාණවත් නැති පසුබිමක පොල් තෙල් ආනයනයෙන් අපේ අවශ්‍යතාව සපුරා ගන්නේ කොහොමද?

විදෙස් රටවලින් පොල් තෙල් ආනයනය කර අපට ලාභයක් ගන්න බැහැ. එහෙත් දේශීය අවශ්‍යතාව සපුරා ගැනීමට නම් පොල් තෙල් ආනයනය කරන්න සිදු වෙනවා. පොල් තෙල් වගේම පොල් කිරි සහ පිටි කළ පොල් කිරිවලටත් වැඩි ඉල්ලුමක් තිබෙන බව අපි මතක තබා ගත යුතුයි. පොල් තෙල්වලට වඩා මේ නිෂ්පාදන අද පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගෙන තිබෙනවා. එය නව ප්‍රවණතාවක්.

● පොල් තෙල් ආනයනය කළත්. දේශීය නිෂ්පාදකයින් අතින් පොල් තෙල් අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක් අපි නිපදවා ගන්නවා නේද?

ඔව්. අපේ පොල් තෙල් නිෂ්පාදකයින් අතින් දේශීය වෙළෙඳපොළට පොල් තෙල් යම් ප්‍රමාණයක් එනවා. වාර්ෂික පොල් තෙල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 180,000ක් පමණ වෙනවා. කෑමට සහ විවිධ කර්මාන්ත ඒ කියන්නේ බිස්කට්, බේකරි නිෂ්පාදන ආදිය සඳහා අපිට මේ ප්‍රමාණය උවමනායි. නමුත්, අපි දැනට නිෂ්පාදනය කර ගන්නේ මෙට්‍රික් ටොන් 40,000යි. ඒ කියන්නේ සියයට 75ක්ම සපුරා ගන්නේ ආනයනයෙන්. මේ ප්‍රමාණය පියවා ගැනීමට නම්, දැනට පවතින තත්ත්වය අනුව ආනයනය කරන්නම වෙනවා.

● පොල් තෙල් වෙනුවට ෆාම් ඔයිල් විකල්පයක් නෙමෙයි ද?

නෑ .අපි ෆාම් ඔයිල් ගෙන්වීම දිරිගන්වලා පොල් තෙල් අඩුවෙන් ගෙන්වන්නේ නෑ. දේශීය පාරිභෝගිකයින්ගේ විශ්වාසය දිනා ගැනීමට පොල් තෙල් ගෙන්වීම මිස මිල අඩු වුණත් ෆාම් ඔයිල් ගෙන්වීම විකල්පයක් නොවෙයි. පසුගිය අවුරුද්දේ මැද භාගයේ ෆාම් ඔයිල්වල මිල විදෙස් වෙළෙඳපොළ තුළ අඩු වුණා. පොල් තෙල් මිල ඉහළ ගියා. නමුත්, අපි පොල් තෙල් ආනයනය සීමා කළේ නෑ. අදටත් පොල් තෙල් ආනයනයට රජය බදු සහන ලබා දී තිබෙන්නේ පොල් තෙල් ආනයනය දේශීය පාරිභෝජන අවශ්‍යතාව සපුරාලීම සඳහා කළ යුතුම කාර්යයක් නිසයි.

● ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය ගැන යළි උණුසුම් කතාබහක් ඇති කළේ පිළිකාකාරක පොල් තෙල් සිද්ධියත් සමගයි. ඒ සමගම දේශීය කර්මාන්තයක් ලෙස පොල් තෙල් නිෂ්පාදනයට මිට වඩා අවධානය යොමු කළ යුතු බැව් අදහස් ඉදිරිපත් වී තිබෙනවා නේද?

අපේ දේශීය පොල් අස්වැන්න අනුව ජාතික අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් පොල් තෙල් නිෂ්පාදනයට අමුද්‍රව්‍ය අපි සතුව නෑ. නමුත්, අපි ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කරනවා. ලංකාව තුළ පොල් තෙල් පිරිපහදු යන්ත්‍රාගාර නවයක් තිබෙනවා. ඉන් රජය සතුව තිබෙන්නේ එක යන්ත්‍රාගාරයයි. සෙසු අටම පෞද්ගලික අංශය සතුයි. ඒක අපිට ගැටලුවක් නෑ. ඒ වගේම මහා පරිමාණ මෝල් සියයක් පමණ තිබෙනවා කොප්පරා ආනයනයේදී පිරිසුදු කොප්පරා ලබා ගැනීමේ ගැටලුව පවතිනවා. මේ නිසා දැනට රජයේ පූර්ණ අවධානය තිබෙන්නේ කොප්පරා වෙනුවට කුරුට්ට සහිත වියළි පොල් කැබලි ආනයනය කර දේශීය පොල් තෙල් නිෂ්පාදකයින් දිරි ගැන්වීමටයි. අමුද්‍රව්‍ය තිබෙනවා නම් තව මෙට්‍රික් ටොන් 90,000කින් පොල් තෙල් නිෂ්පාදනය වැඩි කර ගැනීමේ හැකියාව අප සතුයි.

● රජය අමුද්‍රව්‍ය සපයන්නේ නම් උසස් තත්ත්වයේ පොල් තෙල් නිෂ්පාදනය කර දිය හැකි බැව් දේශීය පොල් තෙල් නිෂ්පාදකයින් ප්‍රකාශ කර තිබුණා නේ ද?

අපිත් උත්සාහ කරන්නේ මේ සඳහා තමයි. අමුද්‍රව්‍ය ආනයනයේදීත් අපි පරිස්සම් වෙන්න ඕනෑ. ඒ නිසා ඒ සඳහා විශ්වාසවන්තව අමුද්‍රව්‍ය ආනයනයට සම්බන්ධ කර ගත හැකි පාර්ශ්ව කවුද කියන එකත් අපි හඳුනාගත යුතුයි. ඒ සඳහා දැන් කටයුතු කරමින් ඉන්නවා.

● අපි පොල්තෙල් ආනයනය කරන්නේ කුමන රටවලින් ද? ඒ සඳහා අපි වැය කරන මුදල කොපමණ ද?

පිලිපීනය, වියට්නාමය, ඉන්දුනීසියාව, මැලේෂියාව වැනි රටවල්වලින් තමයි අපි ආනයනය කරන්නේ. පොල් තෙල් සහ ෆාම් ඔයිල් දෙකම ආනයනයට වාර්ෂිකව විශාල මුදලක් අපි වැය කරනවා.

● දේශීය පාරිභෝජන අවශ්‍යතාව සපුරා ගැනීමටත් පොල් කරිමාන්තයක් ලෙස සංවර්ධනය කිරීමටත් බාධාවක් වන්නේ පොල් වගාව ප්‍රමාණවත් පරිදි සංවර්ධනය නොකිරීම බවට චෝදනාවක් තිබෙනවා. පොල් වගාව සංවර්ධනයට දැනට තිබෙන වැඩපිළිවෙළ කුමක් ද?

පොල් වගාව වැඩි දියුණු කිරීමට පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය ඇතුළු සෑම ආයතනයක්ම කාලයක් තිස්සේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. මෙහි ප්‍රගතියක් අපි අත් කරගෙන තිබෙනවා වගේම දේශීය පොල් වගාව වැඩි දියුණු කිරීමේදී බාධාවන් ද නැතුවා නොවෙයි. අපේ පැවති පොල් ත්‍රිකෝණය වන ගම්පහ, කුරුණෑගල සහ හලාවත කියන රාමුවෙන් මිදී පොල් වගාවට සුදුසු සෑම බිම් අඟලක්ම මේ සඳහා බද්ධ කර ගැනීමට අපි දැනටමත් කටයුතු කරලයි තිබෙන්නේ. ඒ අනුව තමයි උතුරු නැගෙනහිර පවා සුදුසු බිම් ප්‍රදේශ හඳුනාගෙන පොල් වගාවට කටයුතු කර තිබෙන්නේ. මේ ප්‍රදේශවලින් එන අස්වැන්න ද ඉදිරියේදී ලැබුණාම අපිට ඉලක්ක අපේ බොහොම හොඳින් කළමනාකරණය කර ගත හැකියි.

● කෙසේ වෙතත් ඉකුත්දා සිදු වුණු සෞඛ්‍යාරක්ෂිත නොවන පොල් තෙල් ආනයනයත් සමඟ විවිධ මතවාද ඉදිරිපත් වුණා. මෙවැනි සිද්ධි ඉදිරියේදී ඇති නොවීමට නම් අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුත්තේ කුමක්ද?

වෙළෙඳපොළ ක්‍රියාදාමය කියන්නේ තනිකරම මුදල් ඉපයීමේ ක්‍රමයක් නිසා පාරිභෝගිකයාගේ යහපත වෙනුවෙන්ම නිපදවන නිෂ්පාදන වෙළෙඳපොළට එයි කියන විශ්වාසය අපිට තියන්න බෑ. අපිට කරන්න වෙන්නේ හැකි තරම් සුපරික්ෂාකාරීව නිෂ්පාදන මිල දී ගැනීමයි. රට තුළට ආනයනය කරන විටම අපි පරීක්ෂා කර බලන්න ඕනෑ. ඇත්තෙන්ම සිදු වීමට ගිය විපත කල් ඇතිව හසු කර ගැනීමට හැකි වුණේ රජය සිය නියාමන කාර්ය හරියාකාරව සිදු කළ නිසයි. ඒ සිද්ධියෙන් අපිට ලැබුණු පාඩම තමයි අපි තවදුරටත් මේ කාර්යය ශක්තිමත් කළ යුතු බව.

● බොර තෙල් වගේ පොල් තෙල් පිරිපහදු කරන්න බෑ කියන තර්කයකුත් ගොඩනැඟුණා නේ ද?

නෑ. පොල් තෙල් වුණත් පිරපහදු කරන්න පුළුවන්. අපිරිසුදු නම් පිරිපහදු කළ යුතුයි.

● වෙළෙඳපොළ ක්‍රියාදාමය තුළ පාරිභෝගික විශ්වාසය සමස්ත කර්මාන්තයටම වැදගත් වෙනවා. අපිත් පොල් නිෂ්පාදන අපනයනය කරන රටක් හැටියට ඒ විශ්වාසය තහවුරු කර තිබෙනවාද?

ඇත්තෙන්ම ඔව්. අපිත් පොල් ආශ්‍රිත නිෂ්පාදන පිටරටට යවනවා. අපි දුන්නට විදෙස් රටවල් ඔවුන් අපේක්ෂා කරන ප්‍රමිතිය නැත්නම් මිල දී ගන්නේ නෑ. අපි හොඳ දේ දුන්නොත් ඉල්ලුම වැඩි වෙනවා. අපි දැනට අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ හොඳ නමක් දිනාගෙන තිබෙනවා. එය පළුදු නොකරගෙන ඉදිරියට යෑමයි අපි කළ යුත්තේ.

● දේශීය පොල් අස්වැන්න වැඩි කර ගැනීමට නම් අපි කළ යුත්තේ මොනවාද?

අපි අනිවාර්යෙන්ම වගා බිම් ප්‍රමාණය පුළුල් කර ගන්න ඕනෑ. ඒ වගේම වැඩි ඵලදාවක් ලැබෙන පොල් ප්‍රභේද සඳහා පොල් පර්යේෂණ ආයතනය අඛණ්ඩව සිය පර්යේෂණ කටයුතු කරගෙන යනවා. හැම නිවෙසකම එක පොල් පැළයක් හරි සිටුවා ගන්නවා නම් අපිට කර්මාන්තය ගොඩදාගන්න ශක්තියක්. නියඟයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද ඕනෑ. හේතුව නියඟයෙන් පොල් ඵලදාවට සිදු වන බලපෑම සුළු කොට තකන්න බැහැ.

● පොල් ඉඩම් කට්ටි කිරීම දේශීය කර්මාන්තයට විශාල තර්ජනයක් බැව් කාලයක් තිස්සේ මතු වුණු කාරණාවක්. අදටත් මෙය සිදු වෙමින් තිබෙනවා නේද?

පොල් ඉඩම් කට්ටි කිරීම සිදු වන්නේ ජනාවාස, මාර්ග සංවර්ධනය, කර්මාන්ත ශාලා ඉදි කිරීම වැනි අවශ්‍යතාවලට ඉඩම් යොදා ගැනීම නිසයි. මේ සඳහා පොල් ඉඩම් පමණක්ම ඕනෑ ද කියන ප්‍රශ්නයත් කෙනෙකුට මතු කළ හැකියි. පොල් ඉඩම් තිබෙන්නේ තැනිතලා බිම්වල. අනෙක් කාර්යයන්වලටත් හොයන්නේ මේ වගේම භූමියේ ගැටලු නොමැති ඉඩම්. අනෙක පරම්පරාගත පොල් ඉඩම් හිමිකරුවන් විශාල ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. නමුත්, ඒවායෙහි හිමිකරුවන්ගේ දෙවැනි තුන්වැනි පරම්පරාවන් ඇතැම් විට විදෙස් රටවල පදිංචිකරුවන් බවට පත් වෙලා. මේ නිසා ඉඩම් සංවර්ධනය කරන්න, රැක බලා ගන්න විධිමත් ක්‍රමවේදයක් නැති වෙන්නත් පුළුවන්. මේ නිසා ඇතැම් අය මේ ඉඩම් විකුණනවා. නමුත්, එහෙම කියලා අපි අපේ වගකීම සැහැල්ලුවෙන් තකන්නේ නෑ. අපිට ඕනෑ කරන්නේ කර්මාන්තය ඔසවා තබන්න. අලුතින් වගා බිම් ඇති කළාම අනාගතයේ මතුවන ප්‍රශ්නවලට බොහොමයක් විසඳුම් ලැබෙන නිසා වගාව අඛණ්ඩව වැඩි දියුණු කළ යුතුයි.

● පොල් ගස් කැපීම නියාමනය කරන්න බැරි ද?

පොල් ගසත් කොස්, දෙල් වගේ වටිනා ශාකයක් නිසා කැපුම් අවසර ලබා ගැනීමේදී මිට වඩා තදබල නීති පැවතිය යුතු බවට කාලයක සිට තර්ක විතර්ක ආවා. නමුත්, දැඩි නීති පැනෙවුවොත් නිවෙසක් හදා ගැනීමට වගේ කාරණාවලදී එය ජනතාවටම හිරිහැරයක් වෙනවා. එහෙත් කර්මාන්තය රැක ගැනීමට නම් මිට වඩා විධිමත් වැඩපිළිවෙළක් ඕනෑ නිසා අලුතින් යම් යම් නීති ටිකක් හඳුන්වා දීම සඳහා නව නීති කිහිපයක් කෙටුම්පත් කරමින් යනවා.

● පොල් කර්මාන්තයෙන් නිසි ඵල ලබා ගැනීමේදී අපි අතින් සිදු වන නාස්තිය ගැන මතක් කළ යුතුයි නේද?

අනිවාර්යෙන්ම ඔව්. පොල් අපනයනයෙන් අපි රුපියල් බිලියන 125ක් පමණ උපයාගත්තත් ඉන් බිලියන 30ක් පමණ නිසි ප්‍රයෝජන නොගෙන නාස්ති කරනවා කිවුවොත් නිවැරදියි. ලෙල්ල විසිකරනවා. කටුව විසිකරනවා. පොල් ගාන සාම්ප්‍රදායික හිරමණයෙන් ඈත් වුණු අපි නවීන උපකරණ යොදාගෙන පොල් මදයේ කිරිවලින් සියයට 30ක් අපතේ යවන එක තමයි කරන්නේ. පොල් ලෙල්ල කියන්නේ ක්ෂණික භෝග නිෂ්පාදන කලාවේ හරිතාගාරවලට පස වෙනුවට ගන්නා සාරවත්ම මාධ්‍යය. මීට පෙර අපි දේශීය වගා බිම්වලින් ලැබුණු පොල් ලෙලිවලින් සියයට 20යි ගත්තේ. අද මෙය සියයට 60 දක්වා වැඩි කරගෙන තිබෙනවා.

ඒ වගේම පොල් කටුව කියන්නේ සක්‍රිය කාබන් නිෂ්පාදනය කරන මාධ්‍යය. මිනිහෙක් වස බිවුවොත් ඒ විස විෂ රෝහලෙන් එළියට ගන්නෙත් සක්‍රිය කාබන් ශරීරගත කරලා. පොල්කටුවලින් සක්‍රිය කාබන් සකසා අපනයනයෙන් අපි බිලියන 20ක් උපයා ගන්නවා. මිනිස් ජීවිත රැක ගැනීමේ සිට රත්රන් පිරිපහදුවට ජලය, ගෑස් සහ වායු සියල්ලම පිරිසිදු කරන මාධ්‍යය සක්‍රිය කාබන්. මේ නිසයි පොල් ගස කප්රුකක් කියන්නේ. මේ වටිනා සම්පතින් නියම ප්‍රයෝජනය අපි තවමත් හරිහැටි ලබා ගෙන නෑ.

● පොල් පැළ සහනාධාරය ඇතුළු ඇතැම් සහනාධාර මේ වන විට කප්පාදු කර ඇති බවක් කියනවා. එහි ඇත්ත තත්ත්වය කුමක් ද?

පොල් වගාවේ දියුණුව වෙනුවෙන් වෙහෙසෙන අවස්ථාවක කිසිම සහනාධාරයක් හෝ වගාකරුවන් දිරි ගැන්වීමට, නිෂ්පාදකයින් දිරි ගැන්වීමට සපයා දී ඇති කිසිදු සහනයක් කප්පාදු කර නෑ. රජයට අවශ්‍ය වී තිබෙන්නේ මේ කර්මාන්තය ජාතික අවශ්‍යතාවට ගැළපෙන ලෙස සංවර්ධනය කර ඉදිරියට ගෙන යෑමයි. අලුතින් පොල් පැළ මිලියන හතරක් සිටුවීමේ ඉලක්කය ජය ගැනීමටයි අපි මේ මොහොතේ කටයුතු කරමින් ඉන්නේ. ඒ මිලියන හතර තුළ පොල් පැළ සහනාධාරයත් තිබෙනවා.

● පොල් වගා ඉඩම්වලට බරපතළ තර්ජනයක් වී ඇත්තේ වන අලි හානිය සහ වඳුරන්ගෙන් සහ රිළවුන්ගෙන් ඵලදාව විනාශ වීම. මේ ප්‍රශ්නවලට ගොවියාට සහනයක් නොමැතිව ඉදිරියට යෑම අසීරුයි. මේ සම්බන්ධව ගෙන ඇති පියවර මොනවා ද?

ඇත්තෙන්ම වියළි කලාපයේ සියලුම වගාවන්වලට ඔය කියන ප්‍රශ්නය බරපතළවම තිබෙනවා. ගොවි ජනතාවගෙන් වැඩියෙන්ම ඉල්ලීම් එන්නෙත් මේ ප්‍රශ්නවලට විසැඳුම් අපේක්ෂාවෙන්. මේ ගැටලුවලට එකවර ක්ෂණික විසැඳුම් දීම අසීරු වුණත් පොල් වගාවට තිබෙන අභියෝග ජය ගැනීමට අපි හැමවිටම ගොවි ජනතාව දිරි ගන්වනවා.

● රජය මේ වන විට කටුපොල් වගාව තහනම් කර තිබෙනවා. නමුත්, වෙනත් රටවල කටුපොල් කර්මාන්තයත් දිගටම කර ගෙන යනවා නේද?

පොල් වගා කරන්න පුළුවන් සියලු පරිසර සාධක තිබෙනවා නම්, කටුපොල් මොකටද? රජය අරගෙන තිබෙන්නේ බොහොම දූරදර්ශී තීරණයක්. පොල් ගස කියන කප්රුකෙන් සියලු සම්පත් සපයා ගත හැකි යහපත් පරිසරයක් තිබෙන නිසා වෙනත් මං සොයා යෑමට කිසිදු අවශ්‍යතාවක් නෑ.

සකුන්තලා ජයසිංහ

වගාවේ අභියෝග ජය ගැනීමට ගොවියා දිරිමත් කළ යුතුයි

පොල් තෙල් නිෂ්පාදනයට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය අපි සතුව නෑ

අපි අනිවාර්යයෙන්ම වගා බිම් ප්‍රමාණය පුළුල් කර ගන්න ඕනෑ

අපිත් පොල් ආශ්‍රිත නිෂ්පාදන පිටරටට යවනවා

සෑම නිවෙසකම පැළයක් සිටුවීම කර්මාන්තයට ශක්තියක්

මහා පරිමාණ මෝල් සියයක් පමණ අපට තියෙනවා

සතුන්ටත් ගහ කොළටත් ජීවිතය දෙන්න

පණපිටින් සිටියදීම මිනිසුන් කිහිප දෙනකු එක්ව ගාතයක් කපා ගෙන ගිය වේදනාවෙන් පණ අදිමින් ඒ විපත කළ තැනැත්තන් දෙස උපේක්ෂාවෙන් බලා සිටිනා එළදෙනක පිළිබඳ ජනමාධ්‍ය මඟින් වාර්තා කළේ වැඩි කලෙකට ඉහතදී නොවේ. ඒ දසුන ඉකුත් දා නැවත මතකයට නැංවූයේ පුවත්පත් වාර්තාවකිනි. ඒ දර්ශනය රූපවාහිනියෙන් දුටු හුඟ දෙනකු ඉන් සසල වූවාට සැක නැත. ඒ කුඹුක් දැව ජාවාරමකි. පණ ගැහෙන එළදෙනත්, කැලෑවේ ඔහේ වැඩෙන කුඹුක් ගසත් යන දෙකෙහි මහා වෙනසක් කෙනකු දකින්නට පුළුවන.

එහෙත් කුඹුක් වැනි පරිසර සමතුලිතතාවට වැඩි දායකත්වයක් දක්වන ශාක නොවන්නට මිනිසා ඇතුළු සතුන්ට බෙහෙවින් විපත්, කරදර බාධකවලට මුහුණ පෑමට සිදුවනු ඒකාන්තය. එසේම, එළදෙනට මෙන් ඉක්මන් මරණයක් නොවුණ ද කෙමෙන් විඳවමින් සොබාදහමේ විපර්යාසවලට මුහුණ දෙමින් ඉන් පීඩාවිඳින්නට මේ අයුරින් පරිසරය වනසන කවුරු කවුරුත් දායක වන බව සැබෑවකි. එහි විපාක මිහිපිටදීම අත් දකින්නට අපට සිදුවනවා පමණක් නොව නූපන් පරම්පරා ගණනාවකට ද ඊට වන්දි ගෙවන්නට සිදු වනු නියතය.

සැබෑවින්ම පරිසරයට සතාසිවුපාවුන්ට ආදරය කරන කොයි කවුරුත් ඊට විණ කරනවාට කැමැති නැත. එහෙත් අපේම ඇතැම් පිරිස් පරිසරය මතු පරපුරටත් උරුම වග අමතක කරන්නේ පටු වාසි තකමිනි.

පරිසරය මිනිසාගේත්, සතුන්ගේත් ජීවත් වීම කෙරෙහි අත්‍යවශ්‍ය වන වග නොවැටහීම මෙවැනි පරිසර විනාශවලට මිනිසා පෙලඹෙන්නට එක් හේතුවකි. එහි විපාක හරිහැටි දන්නේ නම් කිසිසේත්ම බුද්ධිමත්ම සත්ත්වයා වන මිනිසා පරිසරය වනසන්නේ නැත.

ඒ අතින් බලන කල මෙරට බොහෝ දෙනකුගේ පරිසර සාක්ෂරතාව එතරම් සතුටුදායක මට්ටමක නොවන වග පරිසර විද්‍යාඥයන්ගේ මතයයි. ඔවුන් ඊට ඉදිරිපත් කෙරෙන සාධක අතර ලෝකයේ වෙනත් රටවල් සමඟ සසඳන විට මෙරට පෙන්වන රතු එළි සුළු පටු නොවේ. මේ වන විටත් කැලණි ගඟට හැරවූ මල පද්ධති බොහොමයක් පිළිබඳ හඳුනාගෙන තිබේ. ගෘහාශ්‍රිතව මෙන්ම ඇතැම් හෝටල් ආදියෙන් ද එය එසේ වන බව හෙළි වී ඇත.

එමෙන්ම, ප්‍රාථමික වනාන්තර වනසන රටවල් අතුරෙන් 4වැනි තැනට මෙරට පැමිණ ඇතැයි යන්න ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය 2011 සහ 2014 වර්ෂවලදී අවධාරණය කරන ලද්දකි. එපමණක් නොවේ. මහ මුහුදට ප්ලාස්ටික් හා පොලිතින් අපද්‍රව්‍ය වැඩිපුරම ඉවතලන රටවල් අතුරෙන් මුල් 20 අතර මෙරට නම ද කියැවීමෙන් එහි බරපතළකම පෙනේ.

ගොඩබිම මෙන් 8 ගුණයක් විශාල සයුරකට මෙරට හිමිකම් කියයි. පෙර අපර දෙදිග මුහුදු මාර්ග ඒ හරහා යෙදේ. ඒ අනුව අන්තර්ජාතික ප්‍රජාව හරහා අපේ මුහුද දූෂ්‍ය නොවන්නට වග බලා ගැනීම අපට පැවරේ. එය එසේ වුව හොත් අනාගත ලෝකයේ ආර්ථික මර්මස්ථානයක පිහිටි දූපතක් වශයෙන් අපට එහි උපරිම ඵල නෙළා ගැනීම අපට අපහසු නැත. එසේම, මේ වන විට ලෝකයේ මුළු වනාන්තරවලින් වර්ග කිලෝමීටර බිලියන 6කට වඩා වැනසී ඇතැයි ද වාර්තා වේ.

ඇත්තෙන්ම මේ, කිසිම රටක ආණ්ඩුවට හෝ පාලකයන්ට පමණක් තනිව විසඳිය හැකි ගැටලුවක් නොවේ. එය මුළු මහත් ප්‍රජාවම එක්ව නිරාකරණය කර ගත යුත්තකි.

ඉදින්, මෙරට වනගහණය 16%ක් තරම් වන බව ද පරිසරවේදීන් පවසයි. 2009 වර්ෂයේදී එය 29%ක්ව තිබූ වග ඔවුන්ගේ පෙන්වා දීමකි. මේ අනුව මතු වෙතැයි අනතුරු අඟවන ව්‍යසන රැසකි. වනාන්තර විනාශ කළ හොත් ඒ සමඟ සත්ත්ව වාසස්ථාන ද වැනසේ. මේ වන විටත් මෙරට සියලු සතුන්ට අවශ්‍ය ආහාර වනාන්තර තුළ හිඟ වන්නට පටන්ගෙන ඇතැයි ද පරිසරවේදීහු කියති.

එපමණක් නොවේ. මිනිසාට, සතුන්ට මෙන්ම ගස්වැල්, ඇළ, දොළට පවා පරිසර උෂ්ණත්වය බලපායි. මෙයින් දශකයකට කලින් රජරටින් වාර්තා වී ඇත්තේ සෙල්සියස් අංශක 34ක පමණ උෂ්ණත්වයක් වුවද අද වන විට එය සෙල්සියස් අංශක 38-40 තරම් ඉහළ අගයක් ගැනීම පරිසරවේදීන් ඊට දක්වන උදාහරණයකි. මළ ගංගා ඇතිවීමට එය ප්‍රබල හේතුවක්ව ඇතැයි ද ඔවුහු පවසති.

එසේම, එක් තැනැත්තකුට හුස්ම සඳහා දිනකට ඔක්සිජන් 500l පමණ අවශ්‍ය වෙතැයි සැලකේ. ඒ අනුව ගත් විට මෙරට මුළු ජනගහණයට හුස්ම පිණිස අවම වශයෙන් මෙරට වනාන්තර 24%ක් වත් තිබිය යුතු වග ද පරිසරවේදීන්ගේ තවත් අවධාරණය කිරීමකි.

එමෙන්ම, ලෝක ජනගහනය 18 වැනි ශත වර්ෂයේ සිට මේ දක්වා ලෝක ජනගහනය 8 ගුණයකින් වැඩි වී ඇතැයි වාර්තා වේ. එම කාල සීමාව තුළදී මිනිසාගේ බලශක්ති පරිභෝජනය ද 80%කින් පමණ වැඩි වී තිබේ. තවද 20 වැනි සියවසට වඩා වායුගෝලයේ අඩංගු මීතේන් වායු ප්‍රමාණය තුන් ගුණයකින් පමණ වැඩි වී ඇතැයි ද හෙළි වී ඇත.

නුවන් මහේෂ් ජයවික්‍රම

ආසාදිතයන්ගේ ශීඝ්‍ර වැඩි වීමක් මෙරට ප්‍රභේද ගැන පරීක්ෂණ අරඹයි

සුභාෂිණී සේනානායක

දිවයින පුරා විවිධ ප්‍රදේශවල කොවිඩ් ආසාදිතයන් වැඩි වශයෙන් වාර්තා වීමත් සමඟ කොවිඩ් වයිරස් ප්‍රභේද පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජීව විද්‍යා ආයතනය පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබේ. මේ නව ප්‍රභේද සම්බන්ධයෙන් පරීක්ෂණ ලබන 27 ආරම්භ කරන බව එහි අධ්‍යක්ෂ, වෛද්‍ය චන්දිම ජීවන්දර මහතා පැවසීය. ශ්‍රී ලංකාව පුරා වාර්තා වන කොරෝනා වයිරසයේ ප්‍රභේද සාමාන්‍ය පීසීආර් පරීක්ෂණ මඟින් හඳුනා ගැනීමට නොහැකිවීම හේතුවෙන් මේ නව පරීක්ෂණ ආරම්භ කිරීමට තීරණය කළ බව වෛද්‍ය චන්දිම ජීවන්දර මහතා මහතා පැවසීය. අමෙරිකාව, බ්‍රිතාන්‍යය, දකුණු අප්‍රිකාව ඉන්දියාව සහ බ්‍රසීලය යන රටවල ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන වයිරස් ප්‍රභේද ශ්‍රී ලංකාව තුළ පැතිර යන්නේද යන්න සොයා බැලීමට නව පරීක්ෂණ කරනු ලබන බවත් එම වයිරස් ප්‍රභේද රට තුළට ඇතුළු වී ඇද්ද යන්න මේ පරීක්ෂණ මඟින් අනාවරණය කර ගැනීමට හැකි වනු ඇති බවත් අධ්‍යක්ෂවරයා කියා සිටියේය.

ඒ සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණවල ප්‍රතිඵල කෙටි කාලයක් තුළ දීමට හැකි වන බවද ප්‍රකාශ කළේය.

විශ්වවිද්‍යාල ඇරඹීම සති දෙකකින් කල් යයි

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

සියලු විශ්වවිද්‍යාල ආරම්භ කරන දිනය සති දෙකකින් කල්දැමීමට තීරණය කළ බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (22) ප්‍රකාශ කළේය.

විශ්වවිද්‍යාල ලබන අඟහරුවාදා (27) විවෘත කිරීමට මීට පෙර තීරණය කර තිබූ බවත් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලද උපදෙස් මත එම දිනය වෙනස් කළ බවත්, ඒ අනුව අප්‍රේල් 27දා සිට සති දෙකක් ගත වීමෙන් පසු විශ්වවිද්‍යාල ආරම්භ කරන ලෙස සියලු උපකුලපතිවරුන්ට දැනුම් දුන් බවද ඇමැතිවරයා පැවසීය.

රටේ පවතින සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි අවධානය යොමු කරමින් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ උපදෙස් දුන් බවද ඒ මහතා වැඩිදුරටත් කීය.

ධනාත්මක චින්තන වැඩමුළුව 26දා

බුද්ධි කරුණාරත්න

කොවිඩ් වසංගතය නිසා මානසිකව බිඳ වැටුණු දූ දරුවන්ගේ මානසික මට්ටම ගොඩනඟා ගුරුගෝල සම්බන්ධය ගොඩනඟන ධනාත්මක චින්තන වැඩමුළු මාලාවක පළමු වැන්න අප්‍රේල් 26 වැනි දින ගම්පහ සිපෙල්කා අධ්‍යාපන ශාලාවේදී නොමිලේ පැවැත්වීමට සූදානම් කර තිබේ. මේ වැඩමුළුව හය ශ්‍රේණියේ සිට සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනුම ලබන දරුවන් වෙනුවෙන් පැවැත්වේ. මෙදින සහභාගි වන අයට විශේෂ ත්‍යාග දීමට නියමිත අතර ජනිත් බටගොඩ, ධනුෂ්ක අමරකෝන්, ගයාන් දිසානායක, බුද්ධික තිලකරත්න, විජිත් වීරසේන, හේමංග සමරසිංහ යන ඇදුරු මඩුල්ල විසින් මේ වැඩමුළුව පවත්වනු ලැබේ. සංවිධායක මණ්ඩලය මේ වැඩමුළුවට සහභාගි වන ලෙස සිසු සිසුවියන්ගෙන් ඉල්ලා සිටියි.

චීන ආරක්ෂක ඇමැති 27 දා මෙරට සංචාරයක

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාව සහ චීනය අතර තිබෙන ආරක්ෂක සහයෝගීතාව තව දුරටත් ශක්තිමත් කර ගැනීමේ අරමුණින් චීනයේ රාජ්‍ය මන්ත්‍රී සහ ආරක්ෂක ඇමැති ජෙනරාල් වෙයි ෆෙන්ගහි (Wei Fenghe) මහතා දෙදින නිල සංචාරයක් සඳහා මේ මස 27 දා ශ්‍රී ලංකාවට පැමිණෙයි.

මෙරටට පැමිණෙන චීන ආරක්ෂක ඇමැතිවරයා රජයේ ඉහළ පෙළේ නායකයන් සමඟ සාකච්ඡා කිරීමට නියමිතව තිබෙන අතර කලාපයේ ආරක්ෂක සහයෝගීතාව තවදුරටත් ඉහළ නංවා ගැනීම සම්බන්ධයෙන් එහිදී වැඩි අවධානයක් යොමු කරන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

ඒ අනුව එළඹෙන 29 දා තෙක් මෙරට රැඳී සිටින චීන ආරක්ෂක ඇමැති ජෙනරාල් වෙයි ෆෙන්ගහි මහතා පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ සෞඛ්‍ය අංශ නිකුත් කර තිබෙන නිර්දේශ අනුව සිය සංචාරය කිරීමටද නියමිතව තිබේ.

වරාය නගර කෙටුම්පත භයානකයි

රනිල් වික්‍රමසිංහ

ශිරෝමි අබයසිංහ

වරාය නගරය පිළිබඳ අලුතින් සකස් කර ඇති පනත් කෙටුම්පත භයානක බව හිටපු අග්‍රාමාත්‍ය, එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කරයි. මාධ්‍ය වෙත ඊයේ (22) විශේෂ ප්‍රකාශයක් කරමින් ඒ මහතා මේ බව පැවසීය. එම පනත මඟින් මුදල් අමාත්‍යාංශය වඳ කර ඇතැයිද වික්‍රමසිංහ මහතා කීය. ඒ මහතා මෙසේද සඳහන් කළේය.

කොළඹ වරාය නගරය තුළ කොළඹ මූල්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට මා 2016 දී කැබිනට් මණ්ඩලයට යෝජනා කළා. ඒ වෙනුවෙන් අප නීති සකස් කළා. නීතිය හැදීම අපේ වගකීම වූ අතර යටිතල පහසුකම් සලසා දීම අදාළ සමාගමේ වගකීම වුණා. අප නීති කෙටුම්පතක් සකස් කළා.

වරාය නගරයේ සම්බන්ධ වැඩ කටයුතු කිරීම අදාළ සමාගමේ වගකීමක්. මේ අනුව අප නීති රාමුවක් කෙටුම්පත් කළා. ඊට අමතරව නීති විධින් විට සම්මත කර ගැනීම සඳහාත් නීති ගණනාවක් අවශ්‍ය වෙනවා. එයින් අප ව්‍යවස්ථාදායකයේ, අධිකරණයේ මෙන්ම කැබිනට් මණ්ඩලයේ බලතල ආරක්ෂා කළා.

එහෙත් මේ අලුත් කෙටුම්පත භයානකයි. එයින් ව්‍යවස්ථාදායකයේ, අධිකරණයේ සහ කැබිනට් මණ්ඩලයේ බලතලත් ඉවත් කර තිබෙනවා. වෙනත් කිසිම රටක මෙවැනි තත්ත්වයක් වී නැහැ.

මෙවැනි දෙයක් කරන්නේ ඇයි දැයි අප දැන ගත යුතුයි. වෙනත් කිසිම රටක මහ බැංකුව හෝ පාලනය කරන කොමිසම සුදු පොළවල් පිහිටුවීමට බලය දී නැහැ. මේ දෙක එකතු කිරීමෙන් කරන්නේ මුදල් විශුද්ධිකරණයද යන ප්‍රශ්නය ඇති වී තිබෙනවා. අවුරුදු නොනගතය අවස්ථාවේ මේ පනත රිංගන්නට හදන්නේ ඇයි? මේ පිළිබඳ අප වසර දෙකක් කතා කළා. මේ පනත හරහා මුදල් අමාත්‍යාංශය වඳ කර තිබෙනවා. එම අමාත්‍යාංශයේ බලය නැති කර තිබෙනවා. මේ ආකාරයේ විවිධ ප්‍රශ්න තිබෙනවා. මේ සම්බන්ධ ගැටලු සාකච්ඡා කරමු යැයි අප ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ බලය ආරක්ෂා කොට අප මේ වැඩ කටයුතු ඉදිරියට කර ගෙන යමු.

මෝදර වරාය අඩු මුදලට බදු දීම:

රාජිතගේ අල්ලස් නඩුව ජූනි 16 දා කැඳවයි

රෝෂන් තුෂාර

මෝදර ධීවර වරාය පෞද්ගලික සමාගමකට අඩු මුදලට බදු දීමෙන් රජයට පාඩුවක් කළේ යැයි පවසමින් හිටපු ධීවර ඇමැති රාජිත සේනාරත්න මහතා ඇතුළු විත්තිකරුවන් තුන් දෙනකුට එරෙහිව පැවරූ අල්ලස් නඩුව ජූනි මස 16 වැනිදා කැඳවන ලෙස කොළඹ මහාධිකරණ විනිසුරු මොහොමඩ් ඉර්ෂඩීන් මහතා ඊයේ (22) දින නියම කළේය.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම මඟින් මේ නඩුව අල්ලස් පනතේ 70වැනි වගන්තිය යටතේ දූෂණය නම් වරද කරමින් රජයට පාඩුවක් කිරීම ඇතුළු චෝදනා යටතේ පවරා ඇත.

ඊයේ නඩුව කැඳවූ අවස්ථාවේ විත්තිකාර රාජිත සේනාරත්න මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා අධිකරණය හමුවේ කරුණු දක්වමින් විත්තිය වෙත පැමිණිල්ල විසින් දිය යුතු ලේඛන ගෙන නඩු විභාගයට සූදානම් වීම සඳහා දිනයක් දෙන ලෙස ඉල්ලා සිටියේය.

ඒ අනුව නඩුව ජූනි මස 16 වැනිදා කැඳවීමට නියම කළ මහාධිකරණ විනිසුරුවරයා එදින නඩුව විභාගයට ගන්නා දිනය නියම කරන බව නිවේදනය කළේය.

මේ නඩුවේ සෙසු විත්තිකරුවන් ලෙස ධීවර වරාය නීතිගත සංස්ථාවේ හිටපු සභාපති උපාලි ලියනගේ සහ එහි කළමනාකාර අධ්‍යක්ෂ නිල් රවින්ද්‍ර මුණසිංහ යන අය නම් කර ඇත.

2014 වසරේ අගෝස්තු මස 1දා සහ එම වසරේ නොවැම්බර් මස 1දා අතර කාලසීමාව තුළ මෝදර ධීවර වරාය සීගල්ෆ් යූ. කේ. ප්‍රයිවට් ලිමිටඩ් නමැති සමාගම වෙත අඩු මුදලකට බදු දීම සඳහා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පෙළඹවීම තුළින් රජයට පාඩුවක් කිරීම ඇතුළු අධි චෝදනා පහක් යටතේ මේ නඩුව පවරා ඇත.

ධීවර වරාය බදු දීමෙන් විත්තිකරුවන් අල්ලස් පනතේ 70 වැනි වගන්තිය යටතේ සඳහන් දූෂණය නමැති වරද කර ඇති බවද සඳහන් කර ඇත.

මේ නඩුවේ සාක්ෂිකරුවන් ලෙස පුද්ගලයන් 17 දෙනකු නම් කර ඇති අතර, නඩු භාණ්ඩ ලෙස ලේඛන 55ක්ද අල්ලස් කොමිසම අධිකරණයට ඉදිරිපත් කර ඇත.

119ට 93%ක් එන්නේ අදාළ නැති දැනුම් දීම්

පොලිස් මාධ්‍ය ප්‍රකාශක

රක්ෂණ ශ්‍රියන්ත

පොලිස් හදිසි ඇමතුම් 119 මධ්‍යස්ථානය වෙත පසුගිය වසරේ ඇමතුම් 1,232,272 ක් ලැබී ඇති බව පොලිසිය පවසයි.

පොලිස් හිදිසි ඇමැතුම් 119 අංකයට දිනකට ඇමතුම් 3,300ක් පමණ ලැබෙන අතර, දිනකට 8,000ක පමණ පිරිසක් 119 මධ්‍යස්ථානය සම්බන්ධ කර ගැනීමට උත්සාහ කරන අතර, ප්‍රමාණය ඉක්මවා විවිධ හේතූන් නිසා ඇමතුම් ගැනීම නිසා සම්බන්ධ කර ගැනීමට නොහැකි වන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

මෙලෙස ලැබෙන ඇමතුම්වලින් සියයට අනූ තුනක්ම හදිසි අවශ්‍යතාවලට නොවන ඇමතුම් බවට හඳුනා ගෙන ඇති අතර, එබැවින් හදිසි අවශ්‍යතාවලට ඇමතුම් ගන්නා ජනතාවට අවස්ථාව නොලැබී යන බවට පෙනී ගොස් ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පවසයි.

එබැවින් 119 අංකය භාවිත කළ යුත්තේ හිදිසි ආපදාවක්, අපරාධයක්, අනතුරක් පිළිබඳ දැනුම් දීමට බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා අවධාරණය කරයි.

ජල ප්‍රභව සංවර්ධනයට ලෝක බැංකුවෙන් කෝටි 1,350ක්

මහින්ද අලුත්ගෙදර

කෘෂි ඉඩම් හෙක්ටයාර් 165,000ක් ආවරණය වන පරිදි ජල ප්‍රභව සහ ජල සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ලෝක බැංකුව රුපියල් කෝටි 1,350ක (අමෙරිකානු ඩොලර් මිලියන 69.53) ණය ගිවිසුමකට අත්සන් තබයි.

ගොවි පවුල් 356,000කට පමණ ප්‍රතිලාභ සැලසෙන පරිදි කෘෂි ඉඩම් හෙක්ටයාර් 165,000ක් ආවරණය වන ලෙස, වැව් අමුණු හා වාරිමාර්ග යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීමටත්, ජල ප්‍රභව සහ ජල සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහාත් ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව ඊයේ (22) මේ ණය ගිවිසුමට අත්සන් තැබීය.

රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල සහ ලෝක බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකාව සඳහා වූ ලෝක බැංකු අධ්‍යක්ෂ ෆාරිස් එච්. හදාද්-සර්වෝස් මහත්වරුන් මේ ගිවිසුමට අත්සන් තැබූ බව ලෝක බැංකුව පවසයි.

"ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික සමෘද්ධිය සඳහා ජල සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම බොහොම වැදගත් වෙනවා" යැයි ශ්‍රී ලංකා ලෝක බැංකු අධ්‍යක්ෂ ෆාරිස් එච්. හදාද්-සර්වෝස් පවසයි. "ශ්‍රී ලංකාව ස්වාභාවික හා මානවයා විසින් සැකසූ ජල සම්පත්වලින් අනූනයි. ජල ප්‍රභවයන් ආරක්ෂා කර ගතහොත් දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වෙමින් ජනතාවට තම ජීවනෝපාය වෙත එල්ල වන දේශගුණික බලපෑම් අවම කර ගැනීමට හැකි වෙනවා." යැයිද ඒ මහතා පෙන්වා දුන්නේය.

අධික ගංවතුර, නියඟය සහ නාය යෑම් වැනි ඛේදවාචක වළක්වා ගැනීම සඳහා මූලික වශයෙන් මධ්‍ය කඳුකරයේ ඉහළ මහවැලියේ ජල ප්‍රභව සංරක්ෂණය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ වඩා හොඳින් කළමනාකරණය කිරීම මේ ව්‍යාපෘතියේ අරමුණ වන අතර, ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමටද එහි දායකත්වය ලැබේ.

"ශ්‍රී ලංකා රජය ජල ප්‍රභව සංරක්ෂණය කිරීමට කැපවී සිටිනවා. තවද 'ශ්‍රී ලංකාවේ පොදු ජල කළමනාකරණයක් බිහි කිරීම සඳහා උපායමාර්ගික යන්ත්‍රණයක්' යන තේමාව යටතේ පුළුල් ප්‍රතිපත්ති රාමුවක් සැකසීමට සැලසුම් කර තිබෙනවා යැයි වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා කියයි. "මේ පස් අවුරුදු ව්‍යාපෘතිය තුළින් මෙරට වටිනා ජල සම්පත් හා ජල ප්‍රභව සංවර්ධනය කිරීම සඳහා ලෝක බැංකුව සමඟ සම්බන්ධ වීමට ලැබීම ගැන අප, වාරිමාර්ග අමාත්‍යාංශය ලෙස සතුට පළ කරනවා." යැයිද පැවසීය.

01 වැනි පිටුවෙන්...

වරාය නගර...

එම කොමිසම සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වන්නේ නම් ඉන් තිදෙනකු ශ්‍රී ලාංකිකයන් වනු ඇති බවද සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත වන්නේ නම් සිව් දෙනකු ශ්‍රී ලාංකිකයන් වනු ඇති බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් පනත් කෙටුම්පතට එරෙහිව ගොනු කර ඇති පෙත්සම් කැඳවූ අවස්ථාවේදී අතරමැදි පෙත්සම් වෙනුවෙන් කරුණු දක්වමින් ජනාධිපති නීතිඥවරයා මේ බව සඳහන් කළේය.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් පනත් කෙටුම්පතට සංශෝධන කිහිපයක් සිදු කරන බව ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ රොමේෂ්ද සිල්වා මහතා ඊයේ (23) ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියේය.

එම සංශෝධන කමිටු අවස්ථාවේදී කරන බව සඳහන් කළ ජනාධිපති නීතිඥවරයා එම සංශෝධන සම්බන්ධයෙන් නීතිපතිවරයාට යොමු කළ ලිපියේ පිටපත් අධිකරණයට දුන්නේය.

එම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බවට ගොනු කළ පෙත්සම් කැඳවූ අවස්ථාවේදී පනතට පක්ෂව ඉදිරිපත් කළ අතරමැදි පෙත්සම් සම්බන්ධ කරුණු දැක්වීම් කළ අවස්ථාවේදී ජනාධිපති නීතිඥවරයා මේ ලේඛන ඉදිරිපත් කළේය.

අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, ප්‍රියන්ත ජයවර්ධන, මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා යන පංච පුද්ගල විනිසුරු මඩුල්ල හමුවෙහි පෙත්සම් සම්බන්ධ කරුණු දැක්වීම් කරන ලදි.

මේ පනත් කෙටුම්පතෙහි වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බැවින් පාර්ලිමේන්තුවේ 2/3 බහුතර ඡන්දයෙන් සහ ජනමත විචාරණයකින් සම්මත විය යුතු බවට පෙත්සම්කාර පාර්ශ්වයන් විසින් ඉල්ලා තිබිණි.

මෙය නීතියක් බවට පත් වීමට සරල බහුතර ඡන්දයෙන් සම්මත වීම ප්‍රමාණවත් බවට අතරමැදි පෙත්සම් මඟින් ප්‍රකාශ කෙරිණි.

එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්, සභාපති, සමඟි ජන බලවේගයේ මහ ලේකම් ඇතුළු පිරිසක් විසින් මේ පෙත්සම් ඉදිරිපත් කර තිබිණි.

ජනාධිපති ලේකම් පී. බී. ජයසුන්දර, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් ඇතුළු පිරිසක් විසින් අතරමැදි පෙත්සම් ඉදිරිපත් කරනු ලැබීය.

රසායනික පොහොර...

පොහොර සහනාධාරය වෙනුවට ගොවීන්ට කාබනික පොහොර දීමට සැලසුම් කරන බව පැවසූ ජනාධිපතිවරයා එමඟින් වාර්ෂිකව පොහොර ආනයනය කිරීමට වැය කෙරෙන ඩොලර් මිලියන 400ක මුදල ජනජීවිතය නඟා සිටුවීමට යොදා ගත හැකි බවත් පැවසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මෙසේ ප්‍රකාශ කළේ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන් කොටුව ජනාධිපති මන්දිරයේදී ඊයේ (22) හමු වූ අවස්ථාවේදීය.

රසායනික පොහොර භාවිතයෙන් ඉහළ අස්වැන්නක් ගත හැකිය. වැව්, ඇළවේලි සහ භූගත ජලය දූෂණයෙන් ජීවිතවලට වන හානිය එම ලාභයෙන් පියවිය නොහැකිය. රසායනික පොහොරවල බලපෑම වකුගඩු රෝගය ඇතුළු බෝ නොවන රෝග රැසකට හේතු වී ඇතැයි සෞඛ්‍ය අංශ පෙන්වා දී තිබේ. ප්‍රතිකාර සඳහා වැය වන මුදල සහ ජීවිතවලට වන බලපෑම ඉහළය. නීරෝගි සහ ඵලදායී පුරවැසියකු බිහි කිරීමට නම් රජය විසින් වස විසෙන් තොර ආහාර වේලක් සඳහා ජනතාවට ඇති අයිතිය සහතික කළ යුතුය. ඒ වෙනුවෙන් මෙරට කෘෂිකර්මාන්තය මුළුමනින්ම කාබනික පොහොර භාවිතයට යොමු කරන බව ජනාධිපති රාජපක්ෂ මහතා පැවසීය.

මෙරට කාබනික පොහොර නිෂ්පාදනය ඉහළ නැංවීමට සියලු පාර්ශ්ව මැදිහත් විය යුතු බවත් ජනාධිපතිවරයා පැවසීය.

තමා බලයට පත් කිරීමෙන් ජනතාව ප්‍රතිපත්තිමය වෙනසක් අපේක්ෂා කළා. රට වෙනුවෙන් එම අපේක්ෂා ඉටු කර ගැනීමට සියලු දෙනාගේ සහාය අවශ්‍ය බව ජනාධිපති රාජපක්ෂ මහතා කියා සිටියේය.

එතනෝල් ගෙන්වීම සම්පූර්ණයෙන් නතර කිරීමෙන් අඛණ්ඩව පාඩු ලැබූ ලංකා සීනි සමාගම අත් කර ගත් ලාභය මිලියන 1100කි. වසර 20කට ආසන්න කාලයක් අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කළ 2,500කට ආසන්න පිරිසක් ස්ථිර කිරීමට, උසස්වීම් සහ ප්‍රසාද දීමනා දීමට එමඟින් හැකි වූ බව ලංකා සීනි සමාගමේ සභාපතිවරයා පැවසීය.

පාඩු ලැබූ ආයතන රැසක් ජනාධිපතිවරයා ගෙන යන වැඩපිළිවෙළින් පසු ලාභ ලබන තත්ත්වයට ගෙන ඒමට හැකි වූ බව සභාපතිවරු පෙන්වා දුන්හ.

'සෞභාග්‍යයේ දැක්ම' තුළින් ආයතන ළඟා විය යුතු ඉලක්ක පැහැදිලිව දක්වා තිබේ. කැබිනට්, රාජ්‍ය අමාත්‍යාංශවලට අදාළ ආයතන සහ අත් කර ගත යුතු ප්‍රගතිය පැහැදිලිව සඳහන් කර ඇත. සාමූහික වගකීමක් ඇතිව වැඩ කර ජනතාව බලාපොරොත්තු වූ ප්‍රතිපත්තිමය වෙනස ළඟා කර ගැනීමට කැප වන ලෙස ජනාධිපතිවරයා සභාපතිවරුන්ට පැවසීය.

ජනාධිපති ලේකම් පී. බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, මුදල් ලේකම් එස්. ආර්. ආටිගල යන මහත්වරුද මේ අවස්ථාවට එක්ව සිටියහ.

IDH රෝහලේ ...

එහි රෝගීන් 120 දෙනකුට ඉඩ පහසුකම් පවතින අතර මේ වන විට කොවිඩ් ආසාදිතයන් 138 දෙනකු එහි ප්‍රතිකාර ලබන අතර, එහි දැඩි සත්කාර ඒකකයේ ඇති ඇඳන් 8ම පිරී ඇති බව රෝහල් ප්‍රකාශකයෙක් කියා සිටියේය.

එම රෝහලේ සිටින ආසාදිතයන්ගෙන් සියයට 20කට පමණ ඊයේ (22) වන විට ඔක්සිජන් දී ඇති අතර ඉදිරියේදී ඔක්සිජන් අවශ්‍යතාව ඉහළ යනු ඇති බව එම ප්‍රකාශකයා පැවසීය.

අයි.ඩී.එච්. රෝහලේ ආසාදිතයන් ඇතුළත් කිරීම සිංහල අලුත් අවුරුද්දෙන් පසු ඉහළ ගොස් ඇති බවද එම රෝහලේ ප්‍රකාශකයා කියා සිටියේය.පවතින තත්ත්වය සමඟ රෝහල් කාර්ය මණ්ඩලයද රෝගී සත්කාරයන්හි නියැළී කටයුතු කරන බවද එම ප්‍රකාශකයා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

දින 10කදී දුම්රියට කෝටි 13ක ආදායමක්

සුභාෂිණී සේනානායක

අලුත් අවුරුදු උත්සව සමයේ ගත වූ දින 10ක කාලය තුළ රුපියල් කෝටි 13ක ආදායමක් දුම්රිය දෙපාර්තමේන්තුව උපයා තිබේ. අප්‍රේල් නම වැනිදා සිට 19 වැනිදා දක්වා කාලය තුළ මේ ආදායම උපයා ගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව සමත් වී තිබේ. අලුත් අවුරුද්ද වෙනුවෙන් ගම්බිම් බලා යෑමට පවතින සාමාන්‍ය දුම්රියන්ට අමතරව විශේෂ දුම්රිය 21ක් මෙන්ම අමතර දුම්රිය ගමන්වාර 58ක් යොදවා තිබූ බවත් එම කාලයේ දිනකට රුපියල් මිලියන 13 ඉක්ම වූ ආදායමක් උපයා ගැනීමට හැකි වූ බවත් වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරි ඩබ්ලිව් ඒ. ඩී. ගුණසිංහ මහතා දිනමිණට පැවසීය.

මැතිසබේ ගැටුම විමර්ශනයට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හතක්

පාර්ලිමේන්තු පරිශ්‍රයේදී හරින් ප්‍රනාන්දු සහ ජානක තිස්ස කුට්ටිආරච්චි යන මන්ත්‍රීවරුන් අතර පාර්ලිමේන්තු පරිශ්‍රයේදී වූ ගුට්බැට හුවමාරුව මෙන්ම හරින් ප්‍රනාන්දු මහතා පාර්ලිමේන්තු පරිශ්‍රයට තහනම් ද්‍රව්‍ය කිහිපයක් රැගෙන ඒමේ සිද්ධිය සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීමට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් හත්දෙනකුගෙන් යුත් කමිටුවක් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පත් කර තිබේ.

මේ කාරණා සම්බන්ධයෙන් සොයා බැලීමට කමිටුවක් පත් කිරීමට තමා තීරණය කර ඇති බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (22) පැවසීය.

එම කමිටුව ඉදිරියේදී දෙන තීරණ අනුව තමා කටයුතු කරන බව පෙන්වා දුන් කථානායකවරයා පාර්ලිමේන්තුවේදී හා ඉන් පිටතදී පෙරේදා (21) වූ එම සිදුවීම් ඉතා අවාසනාවන්ත මෙන්ම ලැජ්ජා සහගත සිදු වීමක් බවත් එවැනි සිදුවීම් කිසිවකුත් අනුමත නොකරන බවත් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සඳහන් කළේය.

පාර්ලිමේන්තුවේ දී හා ඉන් පිටතදී වූ එම නොගැළපෙන සිදුවීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඒ පිළිබඳ පාර්ලිමේන්තුවට කරුණු වාර්තා කරන්නැයි සභාවේ කටයුතු ආරම්භයේදී ප්‍රකාශයක් කරමින් සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා කථානායකවරයාගෙන් ඉල්ලීමක් කළේය.

මුතුරාජවෙල ජාතික වනෝද්‍යානයක් කරන්න කැබිනට් පත්‍රිකාවක්

පරිසර අමාත්‍යාංශ ලේකම්

ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න

මුතුරාජවෙල අභය භූමිය ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර ඇතැයි පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා ප්‍රකාශ කළේය.

එමෙන්ම කෝපා කමිටුව මඟින් පෙර රැස්වීමේදී නිර්දේශ කළ පරිදි මුතුරාජවෙල අභය භූමිය සංරක්ෂණය කිරීම සඳහා වගකිවයුතු සියලු පාර්ශ්වයන්ගෙන් සැදුම් ලත් ඒකාබද්ධ කමිටුවක් පත් කර ඇති බවද ජාසිංහ මහතා සඳහන් කළේය.

එම කමිටුව නාගරික සංවර්ධන අමාත්‍යාංශය පරිසර අමාත්‍යාංශය සහ වනජීවී අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල ලෙකම්වරුන්ගේ සම සභාපතිත්වයෙන් යුතුව ක්‍රියාත්මක වන බවද පැවසීය.

එම කමිටුව බලාත්මක කිරීම සඳහා මේ වන විට සාකච්ඡා පවත්වා කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කොට ඇති අතර, එය අනුමත වීම සමඟ ක්‍රියාත්මක වීම ආරම්භ කළ හැකි බවත්, එම කමිටුවට සහාය වීම සඳහා අදාළ සියලු ආයතන සහ පරිසර සංවිධානවල නියෝජිතයන්ගෙන් සමන්විත ක්‍රියාකාරි කමිටුවක් පත් කිරීම අත්‍යවශ්‍ය බවද මෙහිදී අවධාරණය විය.

ඒ මහතා මේ බව සඳහන් කළේ මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (21) පාර්ලිමේන්තුවේදී පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදීය.

පසුගිය ජනවාරි 27 වැනිදා බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් මුතුරාජවෙල අධි සංවේදී පරිසර කලාපයේ සියලු පෞද්ගලික ඉඩම් අක්කර 600ක් රජයට පවරා ගන්නා බවට, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී යෝජනා සම්මත කර තිබීම පිළිබඳ මෙහිදී කෝපා කමිටුවේ අවධානය යොමු වූ අතර, එහි නීත්‍යනුකූලභාවය පිළිබඳ සාකච්ඡා කෙරිණි.

මුතුරාජවෙල පරිසර කලාපයට අයත් ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධව පැමිණිලි රාශියක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආදි ආයතන වෙත ලැබුණද ඒවා සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක් විය. මුතුරාජවෙල තෙත්බිම් කලාපය තුළ අනවසර ඉදිකිරීම් පිළිබඳ ලැබෙන පැමිණිලි අදාළ රාජ්‍ය ආයතන මඟින් නිසි පරිදි විමර්ශනයට ලක් නොවීම පිළිබඳ විගණකාධිපතිවරයාගේ අවධානය යොමු වූ අතර, මෑතකදී එලෙස හෙක්ටයාර 6ක් ගොඩ කිරීම සම්බන්ධව විගණන විමසුමක් දැනටමත් පවතින බවත් මෙලෙස රාජ්‍ය ආයතන නිසි පරිදි මැදිහත් නොවීම තුළ අනවසර ගොඩ කිරීම් සහ ඉදි කිරීම්වලට අනු

ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන තහනම පල දරලා

ඇමැති මහින්ද අමරවීර

බුද්ධිකා ඉඹුලාන

මාර්තු 31 වැනි දින සිට ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන වර්ග 5ක් මෙරට නිෂ්පාදනය තහනම් කිරීමට පරිසර අමාත්‍යංශය පැනවූ තහනම පල දරමින් මේ වනවිට සැෂේ පැකට් නිෂ්පාදනය සියයට 100කින් නැවතී ඇති බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා කියයි.

දැනට වෙළෙඳ පොළේ තිබෙන සැෂේ පැකට් තව මාස තුනකින් හෝ හතරකින් අලෙවි කර අවසන් වන බවට අදාළ ආයතන විසින් තහවුරු කර තිබෙන අතර මෙම වසර අවසන් වන විට අපේ රටේ සැෂේ පැකට් අලෙවිය මුළුමනින්ම නතර වනු ඇති බව තමා වගකීමෙන් ප්‍රකාශ කරන බව ද ඇමැතිවරයා අවධාරණය කරයි.

ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන වර්ග 5ක් මෙරට භාවිතය සඳහා නිෂ්පාදනය තහනම් කිරීමට පරිසර අමාත්‍යාංශය ගත් පියවර අනුව එම නීතිය තදින්ම ක්‍රියාත්මක කරන ලෙස තමන් මධ්‍යම පරිසර අධිකාරියට දැනුම් දුන් බවද ඇමැතිවරයා පවසයි.

එක්වරක් පමණක් භාවිතා කර ඉවත දමන පොලිතීන් හා ප්ලාස්ටික්, පෙට් බෝතල් PET bottles (Poly Ethylene Terepthalate), මයික්‍රෝන 20ට අඩු ලන්ච් ෂීට්, සැෂේ පැකට් (ආහාර හා ඖෂධ නොවන) කොටින් බඩ් (වෛද්‍ය කටයුතු සඳහා යොදා නොගන්නා), හා සුළං පුරවන ලද ප්ලාස්ටික් සෙල්ලම් භාණ්ඩ ද මෙසේ තහනමට ලක්වූ ද්‍රව්‍ය වේ.

සමාගම් කිහිපයක් විසින් කරන ලද ඉල්ලීම් සලකා බලමින් දැනට නිපදවා අවසන් කර ඇති ඇති අදාළ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පමණක් මාස තුනක කෙටි කාලයක් ලබා දී තිබිණි.

මෙරට දිනපතා එකතු කරන නාගරික ඝන අපද්‍රව්‍යවලින් සියයට 5.9ක් පොලිතීන් හා ප්ලාස්ටික් වන අතර අප රට තුළ දිනකට ප්ලාස්ටික් හා පොලිතීන් ටොන් 400ක් පමණ එකතු කරනු ලබයි. PET බෝතල් භාවිතය මාසයකට ටොන් 1,250ක් පමණ වේ යැයි ගණන් බලා තිබේ. ඉන් ප්‍රතිචක්‍රියකරණය කරනු ලබන්නේ ටොන් 250ක් පමණි. අප රටේ සමස්ත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රියකරණය දෙස බලන විට සමස්ත ප්ලාස්ටික් අපද්‍රව්‍යවලින් සියයට 15-20ත් අතරප්‍රමාණයකි. දිනකට දහනය කරනු ලබන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 232කි.

මුලතිව් මුහුදේ සිදු වන නීති විරෝධී ධීවර කටයුතු මැඬලීමට නව යන්ත්‍රණයක් සකසනවා

ඇමැති ඩග්ලස් දේවානන්දා

මුලතිව් මුහුදේ සිදුවන නීති විරෝධී ධීවර කටයුතු මැඬලීමට නව යන්ත්‍රණයක් සකසන බව ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා පවසයි.

ඇමැතිවරයා මෙම අදහස් පළකර සිටියේ මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර සංගම් කිහිපයක නියෝජිතයන් ඇමැතිවරයා හමු වූ අවස්ථාවේදීය.

තවදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

දිගින් දිගටම සිදුවන මෙම ලයිට් කෝස් පන්න ක්‍රමය නීති විරෝධී පන්න ක්‍රමය නතර කිරීමට නාවික හමුදාව හා ධීවර පරීක්ෂකවරුන් එක්ව සෝදිසි මෙහෙයුම් දියත් කරනවා. ජාති ආගම් භේද නොතකා නීති විරෝධී පන්න ක්‍රමවල යෙදෙන සියලු දෙනා අත්අඩංගුවට ගැනීමට කටයුතු යොදනවා. තම ප්‍රදේශයේ ධීවර සම්පත් නෙළාගනිමින් දකුණු ප්‍රදේශයේ ධීවරයන් පැමිණ ලයිට් කෝස් ක්‍රමයට මසුන් ඇල්ලීම නිසා තම ධීවරයන්ට කර්මාන්තය කර ගෙන යෑමට නොහැකි තත්වයක් උද්ගතව තිබෙනවා.

නැගෙනහිර නාවික ආඥාපති වයිස් අද්මිරාල් වයි.එම්.ජයරත්න,ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කැලිස්ටන්, මුලතිව් දිස්ත්‍රික් ධීවර සමුපකාර සංගමයේ සභාපති සහ මුලතිව් ග්‍රාමීය ධීවර සම්මේලනයේ සභාපති මෙම අවස්ථාවට සහභාගි වී සිටියහ.

චීන රජය සමඟ රනිල් සාකච්ඡා කොට වරාය නගර භූමිය 99 අවුරුදු බද්දකට පරිවර්තනය කර ගත්තා

එජාප මහලේකම්

මැදකොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ

කොළඹ වරාය නගර භූමිය චීන රජයට සින්නක්කරව පවරා දී තිබූ අවස්ථාවක එජාප නායක හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා චීනය සමඟ සාකච්ඡා කොට 99 අවුරුදු බද්දකට පරිවර්තනය කළ බව එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා ප්‍රකාශ කෙළේය.

එජාප මහලේකම්වරයා මෙම ප්‍රකාශ කෙළේ පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමිනි.

මාධ්‍යවේදීන් විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඒ මහතා මෙසේද පැවසීය.

මෙම ගිවිසුම වෙනස් කිරීමට චීන රජයේ නායකයන් මුණගැසීමට පෙර රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිවරයා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සමඟ සාකච්ඡා කොට පසුව චීන නායකයින් මුණගැසී කොළඹ වරාය නගර භූමිය 99 අවුරුදු බද්දකට දීමට කටයුතු කළා.

මේ අවස්ථාවේ රනිල් වික්‍රමසිංහ මහතා චීන රජයේ නායකයන් සමඟ පැවැත්වූ සාකච්ඡාවෙන් පසුව පැවැත්වූ මාධ්‍ය හමුවක් රංගේ බණ්ඩාර මහතා ප්‍රදර්ශනය කෙළේය.

නමුත් මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව අපට දිගින් දිගටම චෝදනා කළේ අපි රාජ්‍ය දේපොළ විකුණු බවයි. නමුත් විකුණා තිබූ දේපොළක් යළි රජයේ දේපොළක් බවට රනිල් වික්‍රමසිංහ මහතා පත් කළා. මේ බව රටේ බුද්ධිමත් ජනතාවට අවබෝධ වී තිබෙනවා.

කොළඹ වරාය නගර භූමිය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයෙහි කොටසක් ලෙසට ප්‍රකාශයට පත් කිරීමට තිබූ අවශ්‍යතාව එදා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ඇමැතිවරයාව සිටි ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්තුමා වෙත ලිපියකින් දැනුම් දී තිබෙනවා.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන් රත්නප්‍රිය මහතා- වර්තමාන ආණ්ඩුව මෙවර මැයි දින රැලි කොරෝනා මුල් කරගෙන තහනම් කිරීමට තීරණය කර තිබෙනවා. අගමැති මහින්ද රාජපක්ෂ මහතාට සිය පක්ෂ කණ්ඩායමට සම්බන්ධ අනෙකුත් පක්ෂ එකතු කර ගැනීමට බැරි තත්ත්වයක් උද්ගත වී තිබෙනවා. ඒබැවින් සියලුම මැයි දින රැලි කොරෝනා පිට දාගෙන තහනම් කිරීම රටේ වැඩ කරන ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්.

උතුරේ දෙමළ දේශපාලන පක්ෂ ගෙන යන මඩ ප්‍රචාර හා පෞද්ගලික විවේචන නැවැත්විය යුතුයි

හිටපු ප/සභා මන්ත්‍රී එම්.කේ. ශිවාජිලිංගම්

උතුරු පළාත් විශේෂ

පළාත් සභා මැතිවරණය පැවැත්වීමක් ගැන ආණ්ඩුව ස්ථිර නිගමනයක් ප්‍රකාශයට පත් කොට නොතිබියදී උතුරේ දෙමළ දේශපාලන පක්ෂ මේ දිනවල එක් එක් දේශපාලනඥයන්ට හා දේශපාලන පක්ෂවලට එරෙහිව ගෙන යන මඩ ප්‍රචාර හා පෞද්ගලික විවේචන වහාම නැවැත්විය යුතු බව උතුරු පළාත් සභාවේ හිටපු මන්ත්‍රී එම්.කේ.ශිවාජිලිංගම් මහතා පසුගිය දා (21) පැවසීය.

අසනීප තත්ත්වයෙන් පසු වූ ශිවාජිලිංගම් හිටපු මන්ත්‍රීවරයා රෝහලෙන් නික්ම නිවෙසට පැමිණි පසුව පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී ඔහු මේ බව කියා සිටියේය.

'මම පසුගිය දවස්වල රෝහලේ ඉන්න කොට ජනමාධ්‍ය ඔස්සේ දැක්ක බරපතලම කාරණය තමයි දෙමළ දේශපාලන පක්ෂවල උදවිය අනෙක් පක්ෂ විවේචනය කරලා තිබුණු විදිහ. මේක හරිම නින්දා සහගතයි. ඒ වගේම එක් එක් දේශපාලනඥයන්ගේ පෞද්ගලික ජීවිත ගැනත් ඔවුන් විවේචනය කරලා තිබුණා.

පළාත් සභා ඡන්දේට උතුරු පළාතෙන් ප්‍රධාන ඇමැති තනතුරට අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමට යෑමේදී තමයි මේ තත්ත්වය උදා වෙලා තියෙන්නේ. නමුත් මේක නොවිය යුතු දෙයක්. මැතිවරණයකට ඕනෑම අයකුට ඉදිරිපත් වෙන්න පුළුවන්. ඒක අයිතියක්. එහෙම වුණා කියලා විරුද්ධවාදියා විනාශ කරන්න පදනම් විරහිතව යම් යම් ප්‍රකාශ කිරීම සදාචාරාත්මක නැහැ.

අනෙක් කාරණය තමයි පළාත් සභා මැතිවරණය පවත්වනවාද නැද්ද කියන එක ගැන තවම හරි හැටි තීරණයක් ආණ්ඩුවෙන් ප්‍රකාශයට පත් කරලා නැහැ. එහෙම තියෙද්දී දෙමළ දේශපාලන පක්ෂ එකිනෙකා ඇනකොටා ගැනීම නොකළ යුතු දෙයක්. මේ වේලාවෙදි දෙමළ ජනතාව ඉතාම අසරණ වෙලා ඉන්නේ. ඒ අයට හොඳ සේවයක් කරන්න දෙමළ දේශපාලන පක්ෂ උනන්දු වීමයි කරන්න ඕනේ. අපි දෙමළ දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටින්නේ මොන මැතිවරණයක් හරි පවත්වන්න කලින් අපි ඔක්කොම පක්ෂ එකට එකතු වීම අනිවාර්ය කටයුත්තක්.'

ආණ්ඩුව පිළිතුරු දිය යුතු පාස්කු ප්‍රහාරයේ සැක සහිත තැන් බොහොමයක් තිබෙනවා

ජවිපෙ නායක අනුර කුමාර දිසානායක

නදී මාණික්කගේ

ආණ්ඩුව පිළිතුරු දිය යුතු පාස්කු ප්‍රහාරයේ සැක සහිත තැන් බොහොමයක් තිබෙන බව ජවිපෙ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා පැවසීය.

ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන කාර්යාලයේදී පසුගිය (21) දා පැවැති මාධ්‍ය හමුවට එක්වෙමින් දිසානායක මහතා මේ බව පැවසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක මහතා මෙසේද පැවසීය.

අද අප්‍රේල් මාසයේ 21වැනිදා. පාස්කු ප්‍රහාරය සිදුකර වසර 2ක්. අපේ රටේ ඉතාමත් කැලඹිලිකාරී අවිනිශ්චිත තත්ත්වයක් ඇති කරන මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන් ගණනාවක් එදා සිදු කළා. 260ක් ඉක්මවූ පිරිසක් මිය ගිහින් 500කට අධික පිරිසක් තුවාල ලැබුවා. දේවස්ථාන, හෝටල් ඇතුළු ස්ථාන කිහිපයකට බරපතළ හානි සිදු කළා. ඒවගේම සංවිධානාත්මක සැලසුම් සහගත කළබල ඇති කිරීමේ තත්ත්වයක් දියත් කළ බව පැහැදිලි වුණා. කුලියාපිටිය, හෙට්ටිපොළ, පඬුවස්නුවර, බිංගිරිය, හලාවත, මීගමුව, මිනුවන්ගොඩ ආදී ස්ථාන ගණනාවක මේ කැළඹීම්, ගිනිතැබීම්, පහරදීම් සහ ඝාතනයන් පවා සිදු කළා. මේ ප්‍රහාරයෙන් පස්සේ විශේෂයෙන්ම සිංහල සහ මුස්ලිම් ජනතාව අතර අවිශ්වාසය, වෛරය, ක්‍රෝධය ඇති කළා. එකට පැවතිය යුතු සමාජ දේහය බරපතළ ඛණ්ඩනයකට ලක් කළා.

ප්‍රහාරයෙන් පසු අපේ රටේ දේශපාලන දේහය එතෙක් පැවති ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම්, ජනතාවගේ ජීවත්වීමේ ගැටලු ආදී වශයෙන් තිබුණු දේශපාලන සටන්පාඨ මුළුමනින්ම විතැන් වුණා. අවිනිශ්චිතතාවය තුරන් කිරීම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම, නැවත මෙවැනි ප්‍රහාර වැළැක්වීම වැනි කරුණු දේශපාලන න්‍යාය පත්‍රයේ කරළියට ආවා. ප්‍රහාරයෙන් මාස 7කට පමණ පසුව ජනාධිපතිවරණයත් ඉන්පසුව මහා මැතිවරණයත් දේශපාලන පෙරළි බවට පත්කර ගත් සිද්ධිය මේ ප්‍රහාරයයි. ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ පාර්ශ්වය විසින් දෙන ලද ප්‍රධානම පොරොන්දුව වූයේ මෙම ප්‍රහාරය පිටුපස දේශපාලන හස්තයන් තිබෙන බවත් එය මුළුමනින්ම නිරාවරණය කර, දඬුවම් දීමට තමන්ගේ පාලනයක් පිහිටුවන බවයි. ප්‍රහාරකයන් සහ ප්‍රහාරය මෙහෙයවූ අය අත්අඩංගුවට ගෙන දඬුවම් කරන බව සමාජගත කළා. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ සහ පාර්ලිමේන්තුවේ 2/3කේ බලය පිටුපස ප්‍රබලතම දේශපාලන සටන් පාඨය වූයේ පාස්කු ප්‍රහාරකයන්ට දඬුවම් ලබා දීමේ කරුණයි.

හැබැයි දැන් ජනාධිපතිවරයා බලයට පත්වෙලා මාස 17කට ආසන්න කාලයක්. 2/3කේ ආණ්ඩුවට මාස 8 ඉක්මවමින් තිබෙනවා. ජනාධිපතිවරණයේදීත්, මහා මැතිවරණයේදීත් ජනතාවට පොරොන්දු වූ සහ ජනතාව බලාපොරොත්තු වූ දේත් චින්තයන්ට යුක්තිය ඉටුවීමත් තාමත් ප්‍රශ්නයක්. විවිධ පැතිවලට බෝලය පාස්කරමින් ඉන්නවා. ජනාධිපතිවරයා විසින් පත්කළ කොමිෂන් සභාවට අවුරුදු 1 1/2ක පමණ කාලයක් බෝලය පාස්කරමින් තිබුණා. කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කළාට පසුව එම වාර්තා නීතිපතිවරයාට යොමුකර තිබෙන නිසා, නීතිපතිවරයා අතේ සියල්ල තිබෙන බව කියනවා. ආණ්ඩුවක් හැටියට නීතිපතිවරයාගේ වැඩවලට ඇඟිලි ගහන්නේ නැහැ කියනවා. අධිකරණ ක්‍රියාවලිය ස්වාධීන ක්‍රියාවලියක් බව කියනවා. වංචනිකයන් සහ අපරාධකරුවන් නිදහස් කර ගැනීමේදී අධිකරණයේ ස්වාධීනත්වය ගැන කල්පනා කරනවා වෙනුවට විවිධ කොමිෂන් සභා හදලා අපරාධකරුවන් වංචනිකයන් නිදහස් කර ගන්නා අතර, මේ ප්‍රශ්නය නීතිපතිවරයාට බැර කරනවා.

කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය - වේයන්ගොඩ

ටෙන්ඩර් දැන්වීමයි

වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කසළ බැහැර කිරීම සඳහා සුදුසු ආයතනයක් / පුද්ගලයෙක් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ

කොන්දේසි,

1. මෙම කොන්ත්‍රාත් කාලය වර්ෂයක කාල සීමාවකට බල පැවැත්වේ. (2021 ජූලි 11 වන දින සිට 2022 ජූලි 10 වන දින දක්වා)
2. දෛනිකව විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පරිශ්‍රය, කාර්යාලය, ආපනශාලාව ගබඩා කාමර අවට ප්‍රදේශ, මාළු වෙළඳසැල් ඇතුළුව සම්පූර්ණ භූමිය පවිත්‍ර කිරීම, කසළ බැහැර කිරීම හා පාර පෙදෙසේ කොළ අතු කැපීම මේ යටතේ වේ.
3. කසළ බැහැර කිරීම සඳහා යෝග්‍ය භූමියක් පැවතිය යුතු අතර, ඒ සඳහා බදු ඉඩමක් නම් අදාළ කාල සීමාව සඳහා එම භූමිය තමන් වෙත බදු පදනම මත ලබාදෙන බවට සහතිකයක් පැවතිය යුතුය.
4. පරිසරයට හානි නොවන අයුරින් කසළ බැහැර කිරීමේ කටයුතු සිදු කළ යුතුය. මේ සම්බන්ධව පළාත් සෞඛ්‍ය සේවා නිලධාරී මහතාගෙන් සහතිකයක් ලබාගත යුතුය.
5. කසළ බැහැර කිරීම සඳහා ප්‍රවාහන මාධ්‍යයක් තමන් සතු විය යුතුය.
6. තෝරා ගන්නා අය විසින් 100,000/= ක මුදල් ඇපයක් හෝ බැඳුම්කරයක් ලබාදිය යුතු අතර, අදාළ කාල සීමාව අවසානයේදී එය නිදහස් කරනු ඇත.
7. ටෙන්ඩර්පත් ලබාගැනීම සඳහා වේයන්ගොඩ මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුම් අංක 079100180010068 දරන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණභාර ගිණුමට රු. 10,000/= ක මුදලක් ගෙවා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. එම මුදලින් රු. 9,000/= ක මුදලක් ටෙන්ඩරයේ මූලික කටයුතු අවසන් වූ පසු නැවත ගෙවීමට සලකා බලනු ලැබේ. ටෙන්ඩර්පත් කාර්යාල දිනවල වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයෙන් ලබාගත හැක.
8. ඔබ විසින් තිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර්පත් 2021.05.06 දින පෙරවරු 10.00 ට පෙර **ලේකම්, කළමනාකරණභාරය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අත්තනගල්ල** වෙත ලියාපදිංචි තැපැල් මගින් ලැබීමට සැලැස්වීම හෝ අතින් ගෙනවිත් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුය. ටෙන්ඩර්පත් එදින **පෙරවරු** 10.30 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

09. තෝරාගනු ලබන අය විසින් 2021.07.11 දින සිට කසළ බැහැර කිරීමේ කටයුත්ත සිදු කළ යුතු අතර, නොඑසේ නම් මීළඟ ටෙන්ඩර්කරු වෙත අදාළ ටෙන්ඩරය ලබාදෙනු ඇත.

මේ සම්බන්ධ අවසාන තීරණය කළමනාකරණභාරය සතුවේ.

ලේකම්,
කළමනාකරණභාරය,
විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය,
වේයන්ගොඩ.

ලුහුඬු දැන්වීම්

රැකී රක්ෂා

ඇබෑර්තු
ඇඳුම් මසන්නන් / නිර්මාණකරුවන්

ටේලර් මහතුන් අවශ්‍යයි. Shirt, National, Jubba කපාගෙන මැසීමට පළපුරුදු ටේලර් මහතුන් හා කුඩා ප්‍රමාණයෙන් Readymade Shirt මසා පැක් කර සැපයීමට හැකි අය වහාම අමතන්න. කොළඹ අවටින් විශේෂයි. නවාවී බම්බලපිටිය. අමතන්න. 0759523500029784

ඇබෑර්තු
හෝටල් / බේකරි

ආපනශාලා සේවක ඇබෑර්තු - පෑලියගොඩ මැනිං මාර්කට් නව වෙළඳ සංකීර්ණයේ ආපනශාලාවට පහත සඳහන් සේවකයන් බඳවා ගැනීම. දේශීය ආහාර, ඉන්දියන්, චීන, රයිස්, කොත්තු, ෂෝටීස්, පේස්ට්‍රි, පිළියෙළ කිරීම සඳහා පුහුණු පළපුරුදු බාස්වරුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සතියේ දිනවල මධ්‍යම බස්නැවැතුම්පල මේධා ගොඩනැගිල්ලේ පලමු මහලේ අංක 101 කාමරය. විමසීම්. 0777971196 සහ 0777958149 029191

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න

ඇබෑර්තු
මේසන්වරු / වඩුබාස්වරු

මේසන් / සැටලින් / කම්බි උප-කොන්ත්‍රාත්කරුවන් - මොරටුව, කුරුණෑගල, නිට්ටඹුව, නාවින්න, කොළඹ 07. විශාල ප්‍රමාණයේ වැඩබිම් සඳහා වහාම අවශ්‍යයි. දිනපතා වියදම් මුදල් / නවාතැන් / දින 15 න් කරන ලද වැඩ සඳහා 75% ක අත්තිකාරම් මුදල් / මාසය අවසානයේ බිල මැන බිල්පත් මුදල් ගෙවනු ලැබේ. විමසන්න. 0702691786 / 0702691787 / 0718544308 029158

ඇබෑර්තු
විවිධ

කොළඹ පිහිටි ප්‍රසිද්ධ අවමංගල ආයතනයකට පහත සඳහන් සේවකයින් අවශ්‍යයි. වයස අවු. 30 - 50 අතර මැනේජර්වරුන්, වයස අවු. 25 - 45 අතර බරවාහන රියදුරන්, මෘත ශරීරවලට බෙහෙත් ගැල්වීමට දක්ෂ එම්බාර්මිකරුවන්, වයස අවු. 18 - 35 ගෝලයින් සිත්ගන්නා සුළු වැටුප් සහිතයි. සම්මුඛ පරීක්ෂණයක් සඳහා 077-1468992 හෝ 070-41356856 අමතන්න. 029769

පරිගණක දැනුමැති පරිගණක ලිපිකාරිණියක් සහ අලෙවි සේවිකාවන් හා සේවකයින් අවශ්‍යයි. විමසන්න. 0779009767, 0779046514. අංක 51, 1 වන හරස් වීදිය, කොළඹ 11. 028896

වාහන අලුත්වැඩියා කිරීමේ හා සේදීමේ ආයතනයක් සඳහා සේවක මහතුන් අවශ්‍ය වී ඇත. ඉහළ වැටුප් සමග නොමිලේ නවාතැන් හා ආහාරපාන. බත්තරමුල්ල. 0773576559 / 0777910821 029037

www.nlb.lk

දිනය 2021.04.21 බදාදා නිල ප්‍රතිඵල

මහජන සම්පත
දිනුම් වාරය : 4458
දිනා ඇති මුළු මුදල
රු. 9,589,930.00
ජයග්‍රාහී අක්ෂරය G ජයග්‍රාහී අංක 5 7 3 7 1 4
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. 23,351,844.00

ගොවි සෙත කොවිසෙත Govisetha
දිනුම් වාරය : 2753
දිනා ඇති මුළු මුදල
රු. 7,308,940.00
ඉංග්‍රීසි අක්ෂරය Z ජයග්‍රාහී අංක 12 41 45 55
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. 66,345,430.40

මෙගා පවර් 10 Mega POWER මෙගා පවර් மெகா பவர்
දිනුම් වාරය : 817
දිනා ඇති මුළු මුදල රු. 3,083,740.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 129,618,216.40
ඉංග්‍රීසි අකුර P සුපිරි අංකය 25 ජයග්‍රාහී අංක 07 34 40 60
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ධන නිධානය
දිනුම් වාරය : 495
දිනා ඇති මුළු මුදල
රු. 3,274,940.00
ඉංග්‍රීසි අක්ෂරය X ජයග්‍රාහී අංක 37 45 58 69
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. 93,846,643.60

ජාතික සම්පත JATHIKA SAMPATHA ஜாதிக சம்பத்
දිනුම් වාරය : 1113
දිනා ඇති මුළු මුදල
රු. 2,876,640.00
ජයග්‍රාහී ලග්නය කන්‍යා ජයග්‍රාහී අංක 1 6 6 0 7 9
විශේෂිත අංකය 06190
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
රු. 15,798,709.86

2021.04.21 ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකළ මුළු ත්‍යාගලාභීන් සංඛ්‍යාව 677,625
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල රු. 26,134,190.00
රු. 1,000,000.00 ත්‍යාග: 01 රු. 100,000.00 ත්‍යාග: 28

- රු. ලක්ෂ 5 ට වැඩි තහන රජයේ බදු නිහිඊහිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475

මහින්ද ඇතුළු කණ්ඩායමෙන් පළි ගන්න

යහපාලන ආණ්ඩුව ජනතා මුදල් ලක්ෂ 336ක් වියදම් කළා

රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු කණ්ඩායම දේශපාලන පළි ගැනීම්වලට ලක් කිරීම සඳහා ජනතා මුදල් රුපියල් ලක්ෂ 336ක් යහපාලන ආණ්ඩුව නිරපරාදේ වියදම් කර ඇතැයි සමෘද්ධි ,ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (22) ප්‍රකාශ කළේය.

මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු කණ්ඩායමෙන් පළි ගැනීම සඳහා යහපාලන ආණ්ඩුව සංවිධානාත්මකව කටයුතු කළ බවත් එම පළිගැනීම්වලට එවකට යහපාලන ආණ්ඩුවේ සිටි සමස්ත කැබිනට් මණ්ඩලයම වගකිව යුතු බවත් ඇමැතිවරයා පැවසුවේය.

දේශපාලන පළි ගැනීම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව පිළිබඳ විවාදයට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව ඊයේ (22) රැස්විය. නිවේදන, ලිපි ලේඛන, පෙත්සම් වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව එදිනට නියමිත කටයුතු ආරම්භ කෙරිණ.

රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා

යහපාලනය බැඳුම්කර වංචාව සිදු කර රටට ලොකු විනාශයක් සිදු කළා. මෙරට රාජ්‍ය සේවාව බිඳ වැටීමකින් තොරව මහජනතාවට සිදු වූ අසාධාරණය ගැන සොයා බලන්න වගකිවයුතු ආණ්ඩුවක් විදියට අපට වගකීමක් තිබෙනවා. සංවිධානාත්මකව මේ පළිගැනීම් යහපාලනය සිදු කළා. යහපාලන ආණ්ඩුවේ සමස්ත කැබිනට් මණ්ඩලයම මේ පළිගැනීම්වලට වග කියන්න ඕනේ. කොවිඩ් මර්දන ජනාධිපති කාර්යසාධන බළකාය සහ යහපාලන ආණ්ඩුවේ දූෂණ විරෝධී කමිටුව සමාන කරලා සුමන්තිරන් මහතා කතා කළා. මේ දෙක අහසට පොළොව වගේ. සුමන්තිරන් මහතා කතා කරලා හැමදාම සභාවෙන් එළියට යනවා. රන්ජන් රාමනායක මහතා සම්බන්ධ තීන්දුව අධිකරණයෙන් ලබාදී පැය 24ක් ගත වීමටත් පෙර වෙනත් මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවට නම් කළා. රන්ජන් රාමනායක මහතා අධිකරණයට අපහාස කිරීම නිසා ඔහුට වන්දි ගෙවන්න සිදු වුණා. දූෂණ විරෝධී කමිටුවෙන් තමන්ට අවශ්‍ය විදියට පළිගැනීම් කරන්න යහපාලනය කටයුතු කළා. දුම්න්ද සිල්වා මහතා ගැන සරත් ෆොන්සේකා මහතා කතා කළා. 2015 වසරේ රුපියල් ලක්ෂ 134ක් මේ කමිටුවට යහපාලනය වියදම් කළා. 2016 වසරේ දී රුපියල් ලක්ෂ 140ක් ද, 2017 වසරේදී රුපියල් ලක්ෂ 62 ක්ද මේ සඳහා වියදම් කරනවා. මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු කණ්ඩායමෙන් පළිගැනීම සඳහා රුපියල් ලක්ෂ 336 ක් වියදම් කරනවා.

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී නලීන් ප්‍රනාන්දු මහතා (පො.ජ.පෙ.)

රාජ්‍ය නිලධාරියෙක් විදියට පස් වතාවක් දේශපාලන පළි ගැනීම් විදියට මට බන්ධනාගාරගත වීමට සිදු වුණා. දේශපාලන පළි ගැනීම් සංවිධානාත්මකව සිදු කිරීමට පසුගිය ආණ්ඩුව කටයුතු කළේ ඇයි කියන එක සිතිය යුතුයි. දූෂණ විරෝධී කමිටුවක් යහපාලන ආණ්ඩුවෙන් පත් කළා. එහි සාමාජිකයන් වුණේ යහපාලන ආණ්ඩුවේ අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවේ ප්‍රබල පුද්ගලයන්. ඉතිං මේ අය කමිටුව හරහා දේශපාලන පළි ගැනීම් සිදු කළා. දූෂණ විරෝධී කාර්යාලයක් ද ආරම්භ කළා. මේ කාර්යාලයට මහජන පැමිණිලි ලබා ගත්තා. දූෂණ විරෝධී කාර්යාලයෙන් අනුමත වූ පැමිණිලි විමර්ශනය කරන්න වුණා. අපි මාස ගණනක් බන්ධනාගාරයේ සිටියා. මම බන්ධනාගාරගතව සිටියදී මගේ තාත්තා මරණයට පත් වුණා. එතුමා ඒ ගැන සිතලා සිතලා රෝගාතුර වෙලා රෝහල්ගතව දින ගණනක් සිටියත් ගෙදරින් මට ඒ බව දැන්වූවේ නැහැ. ඒ වගේම මේ සිදුවීම නිසා මගේ දරුවන් පවා රෝහල්ගතව සිටියා. සතොස සභාපතිවරයාව සිටියත් මම කිසිදු සතයක් අයථා ලෙස පරිහරණය කර නැහැ. වැටුපක් ගැනීමවත් මම කළේ නැහැ. මට සිදු කළ අසාධාරණයට කොමිසමට ගිහිං සාධාරණයක් ඉටු කරන්න කියලා ඉල්ලුවේ නැහැ.

පත් කළ මන්ත්‍රී ජයන්ත වීරසිංහ මහතා (පො.ජ.පෙ.)

මා මෙම යෝජනාව ඉතා සතුටින් ස්ථිර කරනවා. මේ යෝජනාව මට ඉතා සමීපයි. පළි ගැනීම ජාතික කර්තව්‍යයක් ලෙස සැලකූ යහපාලන ආණ්ඩුව බැසිල් රාජපක්ෂ මහතාගෙන් පළි ගැනීම් ආරම්භ කළා. පොහොට්ටුපක්ෂයේ සහ රාජපක්ෂ පවුලේ නඩු 15කට මම සම්බන්ධව සිටිනවා. ඒ නිසා මේ ගැන කතා කරන්න මට අයිතියක් තිබෙනවා. යහපාලන ආණ්ඩුව බලයට පැමිණ දින 12 කින් දේශපාලන පළිගැනීම් ආරම්භ කළා. හිටලර්වත්, ඉඩි අමීන්වත් නොකළ ආකාරයට මේ දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් ද පළි ගැනීම සිදු කළා. මේ පාලනය නීති විරෝධී පොලිසියක් ද පිහිටවූවා. යහපාලනය විසින් එෆ්.සී.අයි.ඩී. පොලිසිය පිහිටුවා තිබෙන්නේ අපරාධ නීති සංග්‍රහය අනුව නොවේ. මේ පොලිසිය පිහිටුවා පළි ගැනීම ආරම්භ කළේ මහින්ද රාජපක්ෂ මහතාගෙන්. මේ රටේ යුද්ධය අවසන් කළ නායකයාගෙන් තමයි මේ පළි ගැනීම ආරම්භ කළේ. එතුමාගෙන් පමණක් නොව එතුමාගේ දරුවන්ගෙනුත් පළි ගත්තා. පළි ගැනීම ජාතික කලාවක් කර ගත් ආණ්ඩුවක් විදියට පසුගිය ආණ්ඩුව හඳුන්වා දෙන්න පුළුවන්. මොන තරම් නඩු ගොනු කර සිරේ දැමීමට බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව කටයුතු කළත් ඔහුට හොඳ ආත්ම ශක්තියක් තිබුණා. අසත්‍ය සාක්ෂි නිර්මාණය කරමින් බන්ධනාගාරගත කිරීමට කටයුතු කළා.

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී සරත් ෆොන්සේකා මහතා (ස.ජ.බ.)

මේ යෝජනාව ඉදිරිපත් කළ නලීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා කී ඇතැම් දේවල් මගේ හිතටත් දැනුණා. මට කම්පාවක් හිතුණා. දේශපාලන පළි ගැනීම් නිසා එතුමාගේ දරුවන් පවා අපහසුතාවට පත් වූ බව එතුමා පැවසුවා. මාව හිරේට අරගෙන මගේ දරුවන් දුටු තැන අල්ලන්න කියලා පෝස්ටර් ගැහුවා එවකට පැවැති ආණ්ඩුව. මට සිටින්නේ දුවලා දෙදෙනෙක්. ඒ අය පිටරට කැම්පස්වල ඉගෙනගෙන ලංකාවට ඇවිත් මහ රෑ බහින විට ගුවන්තොටුපොළේ කාමරයකට රැගෙන ගොස් පැය ගණනාවක් ප්‍රශ්න කළා.

(නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය.)

නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රී නිමල් පියතිස්ස මහතා (පො.ජ.පෙ.)

මහා සංඝරත්නය, රණවිරුවන්, ප්‍රගතිශීලී නායකයන් යහපාලන ආණ්ඩුවට පෙන්නන්න බැරි වුණා. සමලිංගිකවාදීන්, මූලධර්මවාදීන්, කල්ලිවාදීන් මේ යහපාලන ආණ්ඩුව තුළ සිටියා. මේ ආණ්ඩුව කැත ඉතිහාසයක් රට තුළ නිර්මාණය කළා. පළිගැනීම කියන එක එක්සත් ජාතික පක්ෂය තුළ තිබෙන දෙයක්. කනගාටුදායක කරුණක් වන්නේ මේ පුද්ගලයන්ට නිලධාරීන් ද සහාය දීමයි. බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට සහන සැලසීමට සහ රණවිරුවන් දංගෙඩියට දැක්වීමට මේ යහපාලනය කටයුතු කළා. දෙමළ ඩයස්පෝරාව සමඟ යහපාලනය කටයුතු කළා.

(දිවා ආහාරයෙන් පසුව හරිනි අමරසූරිය මහත්මිය මුලසුනට පැමිණියාය.)

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා-

හිටලර් එක රැයකින් තමන්ගේ විරුද්ධවාදීන් විනාශ කළා. හිටලර් එක රැයකින් කළ දේ වත්මන් ආණ්ඩුව එක වාර්තාවකින් කරන්න හදනවා. දේශපාලන පළිගැනීමේ කොමිෂන් සභා වාර්තාවෙනුත් උත්සාහ කරන්නේ ඒ වගේ දෙයක්. ආණ්ඩුව මේ වාර්තාව තුළින් තමන්ගේ දේශපාලන සතුරන් විනාශ කරන්නට කුමන්ත්‍රණය කර තිබෙන බව ඉතාම පැහැදිලියි. දේශපාලන පළි ගැනීමේ කොමිසම නම් කළ යුත්තේ දේශපාලන සතුරන්ගෙන් පළි ගැනීමේ කොමිසම විදියට. උතුරට විශාල සේවයක් ඉටුකළ ආර් .සම්බන්ධන්,සුමන්තිරන් වැනි නායකයින්ගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්නට උත්සාහ කරමින් කියන්නේ උතුරේ ජනතාවට නැවත ආයුධ අතට ගන්න කියල ද? රාවුන් හකීම්ගේ ප්‍රජා අයිතිය අහෝසි කරමින් නැවත සහරාන්ලා බිහිකරන්නටද හදන්නේ. වෙනස් මතයක් දැරුවත් රනිල් වික්‍රමසිංහ මහතා කියන්නේ මේ මේ රටේ දිගු කාලීන දේශපාලන ඉතිහාසයක් ඇති මිනිසෙක්. පාර්ලිමේන්තුව උසාවියක් නොහැකි සේ උසාවියට පාර්ලිමේන්තුව බවට පත්වන්නටත් බැහැ. ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුනෙන් එකක් හෝ කඩා වැටුනොත් සමස්ත ප්‍රජාතන්ත්‍රවාදයම බිඳ වැටෙනවා.

රාජ්‍ය ඇමති මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා-

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා කතා කළේ වෙනත් ග්‍රහලෝකයකින් ඇවිත් වගේ . එතුමා කියන විදිහට එතුමා පසුගිය ආණ්ඩුවේ ඉඳලා නැහැ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ ආණ්ඩුව පළි ගන්න ආණ්ඩුවක් නෙවෙයි. ඇත්ත වශයෙන්ම අපට ඇයි මේ වගේ කොමිසමක් පත් කරන්නට සිදු වුණේ. මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ අපගේ නියෝජිතයින් සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුව බොරු කන්දක් සමාජගත කළා. ඔවුන් ඒ වෙනුවෙන් වෙනම කොමිසන් සභාවක් පත්කරනවා. කවුද මේ කොමිෂන් සභාවේ සාමාජිකයෝ. දූෂණ විරෝධී කොමිෂන් සභාවේ සාමාජිකයින්ට අමතරව ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සඳහාත් පිරිසක් පත් කරනවා. අනුර කුමාර දිසානායක මහතාත් ක්ෂණික ප්‍රතිචාර දක්වන ඒකකයේ සාමාජිකයෙක්. මේ වෙනුවෙන් මුදල් පවා වෙන් කළා. ඒ වගේම එෆ් .සී .අයි. ඩී .එකත් පත් කරනවා. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය නීති විරෝධියි. එදා හිටපු නීතිපතිවරයාට වැඩ කිරීමේ හැකියාව තිබුණ ද. නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු සොලිසිටර් ජෙනරාල් සුහද ගම්ලත් මහතා වැනි අයට මොනවද කළේ. නීතිපති දෙපාර්තමේන්තුවට පසුගිය ආණ්ඩුව බලපෑම් කරපු ආකාරය ගැන සුහද ගම්ලත් මහතා අරුණ පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් ලබා දුන්නා.

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා (සජබ)-

දූෂණ විමර්ශන කොමිෂන් සභාව පත් කරන ලද්දේ පත්වූ රජයට පැවැති බලය අනුව. මෙම කමිටුව හැදුවට නඩු පැනෙවුවේ, නීතිමය ක්‍රියාමාර්ග ගත්තේ අධිකරණය විසින්. කමිටුව විසින් නඩු ඇහුවේ නැහැ. අපි පසුගිය කාලේ ජාවාරම් කාරයින්ට වැට බැන්දා. අපේ ප්‍රජා අයිතිය අහිමි කරන්නට හදන්නේ එවැනි කරුණු නිසාවෙන් නම් අපි හිස් මුදුනින් එය පිළිගන්නවා. අධිකරණයට අපි බලපෑම් කරලා නැහැ. විපක්ෂයේ සක්‍රියව වැඩ කරන මහජන නියෝජිතයින් මර්දනය කිරීමේ උත්සාහයක් තිබෙනවා.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජයරත්න හේරත් මහතා (පොජප)

දේශපාලන පළි ගැනීම් මේ රටට හඳුන්වා දුන්නේ 1977 බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින්. විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතාගේ පියා ප්‍රමුඛ එජාප ආණ්ඩුව මැතිණියගේ ප්‍රජා අයිතිය අහෝසි කරන තැනට පත්වුණා.එතනින් ඉවරවුණේ නැහැ. ආධාරකරුවන් ඝාතනය කළා. ඔවුන්ට හිරිහැර කළා. රැකියා අහිමි කළා. ඉතිහාසය පුරාවට එක්සත් ජාතික පක්ෂය කටයුතු කළේ ඒ ආකාරයට. ඒ අය තවමත් ඒ ජානමය ලක්ෂණ සමඟයි ජීවත් වන්නේ. 2015දී පත්වූ ආණ්ඩුව විකෘති ආණ්ඩුවක්. එෆ්.සී.අයි.ඩී.ය පත් කරන්නේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ කැබිනට් පත්‍රිකාවක් මඟින්. තමන්ගේ විරුද්ධවාදීන්ගෙන් පළිගැනීම සඳහා එය පත් කළා. රාජපක්ෂ පවුලේ දරුවන්ගෙන් පවා පළිගත්තා.

මාතලේ දිස්ත්‍රික් මන්ත්‍රී රෝහිණි කුමාරි කවිරත්න (සජබ)

අධිකරණයේ විභාගවන නඩු ඉවත් කිරීම වෙනුවෙන් බලපෑම් කරන්නට පාර්ලිමේන්තුවට කිසිඳු බලයක් නැහැ.

(පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා මුලසුනට පැමිණියේය.)

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉෂාක් රහුමාන් මහතා (සජබ)-

පාස්කු ප්‍රහාරයේ වගකීම පසුගිය ආණ්ඩුවේ අපි හැමෝම භාරගත යුතුයි.

පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතා (සජබ)-

මෙහි සඳහන් නඩුවලින් අනූවක් ඉදිරිපත් කළේ එදා හිටපු නීතිපති.

(මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගානක්‍යම් රාසපුත්‍රන් මහතා මුලසුනට පැමිණියේය.)

ඉරාන් වික්‍රමරත්න මහතා

මේක හරියට එතුමාට එරෙහිව විශ්වාසභංගයක් ගේනවා වගේ වැඩක්. ආණ්ඩුව මේ මොහොතේ සිටින්නේ අසමත් අවධියක. කොරෝනාවලින්, පාස්කුවලින් ෆේල්. තමන්ගේ අසමත් වීම වසා ගැනීම වෙනුවෙන් විපක්ෂය දඩයම් කරන්නට උත්සාහ කරන්නට එපා.

පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා (පොජපෙ)

අපේ ආණ්ඩුව බලයට පත්වී කෙටි කාලයක්. පසුගිය වසර පහ තුළ අපේ පාක්ෂිකයෝ, අපේ නායකයෝ ආදි සියලු දෙනාගෙන්ම පළි ගත්තා. දේශපාලනික වශයෙන් පළි ගත්ත සමහර දේශපාලන නායකයන්ට තමන්ගේ පාර්ලිමේන්තු ආසනය පවා අද අහිමි වෙලා. අපි එක දෙයක් කියනවා. අපි කාගෙවත් ප්‍රජා අයිතිය අහෝසි කරන්නේ නැහැ. වරදක් කරපු උදවිය ඉන්නවා නම් ඒ ඉන්න අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක විය යුතුයි. මම බොහෝ නඩුවලට පෙනී සිටියා. සමහර සිද්ධීන් වලදී ගෝඨාභය රාජපක්ෂ මහතා දඩයම් කිරීම වෙනුවෙන් ආරක්ෂක අංශ නිලධාරීන්ට එරෙහිව නඩු දැම්මා. ඒ වගේම ඒ නිලධාරීන්ට නඩු පවරන්න යොදා ගත්තේ මී මින්නන්ගේ ඇටකටු.

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මහතා (පොජපෙ)-

අද වෙන කොට රාජ්‍ය සේවකයෝ වැඩ කරන්න බයයි. මොකද පසුගිය කාලයේදී පළිගැනිම් කරපු හැටි දැක්කා. සමස්ත රාජ්‍ය සේවයේ කොඳු නාරටිය යහපාලන ආණ්ඩුව විසින් බිද දැම්මා.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තුෂාර ඉඳුනිල් මහතා (සජබ)

පසුගිය කාලය තුළ සිදුවූ විවිධ දූෂණ සම්බන්ධයෙන් අපි සොයා බැලුවා. නමුත් නිවැරදිම දූෂණ වංචා සම්බන්ධයෙන් නඩු පැවරුවද කියන ගැටලුව මට අදටත් තිබෙනවා. සමහර සිදුවීම් රනිල් වික්‍රමසිංහ මහතා අතයටින් බේරා ගත්තාද කියන ගැටලුවත් තිබෙනවා. මේ නඩු පැවරුවේ දේශපාලකයන් විසින්. ආණ්ඩුවට එරෙහිව නැගී සිටින අය යම් මර්දනයකට ලක් කිරීමේ උත්සාහයක් තිබෙන බවටත් අපට තොරතුරු තිබෙනවා.

(පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොළවත්ත මහතා මුලසුනට පැමිණියේය.)

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා (පොජපෙ)

දේශපාලන පළි ගැනීම් කියන වචනය දේශපාලන සංස්කෘතියට එකතු කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින්. ඒ වගේම පොලිසියට නිවාඩු දීලා දේශපාලන පළි ගැනීම් කළා. එක්සත් ජාතික පක්ෂය බලයට පත්වූ සෑම අවස්ථාවකම අලුගෝසුවන් මෙන් අපේ පාක්ෂිකයන්ගෙන් පළි ගත්තා. අලුගෝසුවන්ගේ ලේ පිපාසය අවසන් වේ යැයි කියා අපි හිතුවා.

පාර්ලිමේන්තු මන්ත්‍රී රාධ ක්‍රිෂ්ණන් මහතා (ස.ජ.බ.)

මට පෙර කතා කළ මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා යහපාලනය කාලයේ මොහාන් පීරිස් ඉවත් කළා කියලා. ශිරාණි බණ්ඩාරනායක ඒ කාලයේ අයින් කළා. ඒ බව ඔයගොල්ල මතක තබා ගන්න ඕනෑ. මමත් ඒකට අත්සන් කළා. ඒ කාලයේ මම සිටියෙත් ඔයාලගේ පැත්තේ.

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා-

දැන් ඔබතුමා හිටියනේ ඒකට. ඔබතුමාත් අත්සන් කළානේ. එදා අත්සන් කරලා පාර්ලිමේන්තුවට ගෙනැවිත් නීත්‍යනුකූලවනේ ඒක කළේ. මොහාන් පීරිස් අයින් කළේ නීත්‍යනුකූලව නොවේ. අසාද් සාලි කියන දේශපාලනඥයා ගිහිං තර්ජනය කරලා විනිශ්චයකාරයා අයින් කළේ. ඒක ප්‍රජාතන්ත්‍රවාදී ද. අපි ශිරාණි බණ්ඩාරනායක ඉවත් කළේ නීතියට අනුව. කැලෑ නීතිය ක්‍රියාත්මක කරමින් තමයි මොහාන් පීරිස් ඉවත් කළේ.

රාධ ක්‍රිෂ්ණන් මහතා-

දෙපැත්තම වැරදි කරනවා. මේ රටේ හොඳට ජීවත් වන්න අපි අපේක්ෂා කරනවා. වතුවල ජනතාවගෙන් පළි ගන්න කටයුතු කරන්න එපා. නුවරඑළියේ ජනතාව අර්තාපල් ගලවන සීසන් එක තමයි මේ. මේ වේලාවේ පිටරටින් රුපියල් 60 ට අල ගෙනල්ලා. ඇයි එහෙම කරන්නේ.

රාජ්‍ය ඇමැති රමේෂ් පතිරණ මහතා

තේ, රබර්, පොල්, අල, වීවලට ඉතිහාසයේ වැඩිම මිලක් වත්මන් ආණ්ඩුව යටතේ ලැබී තිබෙනවා. බද්දත් ඉවත් කරලා තවත් වැඩි මුදලක් ලබාදෙන්න අපි කටයුතු කරනවා. ඔබතුමා පළි ගැනීමක් ගැන සඳහන් කළා. අපි කාගෙන්වත් පළි ගන්නේ නැහැ. අපේ ප්‍රතිපත්තිය එකයි. බලයට පැමිණි දා සිට අපි සාධාරණව කටයුතු කරනවා.

රාධ ක්‍රිෂ්ණන් මහතා-

අල පිටරටින් ගෙන්වීම ගැන මම වෙළෙඳ ඇමැතිට කතා කළා. අද අල රුපියල් 100 යි. රුපියල් 95ක් වගා කරන්න වියදම් වෙනවා. රුපියල් 5ක ලාබයක් අරගෙන මොනවා කරන්නද.

රමේෂ් පතිරණ මහතා-

ගොවියාට සෙත සැලසුණේ මහින්ද රාජපක්ෂ මහතාගේ, ගෝඨාභය රාජපක්ෂ මහතාගේ කාලයේ.

රාධ ක්‍රිෂ්ණන් මහතා-

මම මේ දේවල් කියන්න අවශ්‍යයයි. නැත්නම් මගේ ජනතාවට මම මොනවාද කියන්නේ. රුපියල් 125 ක් වත් අලවලට දෙන්න අවශ්‍ය වෙනවා.

මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී ඉණතිලක රාජපක්ෂ මහතා (පො.ජ.පෙ.)

පළි ගැනීම් පිළිබඳව කුප්‍රකට ඉතිහාසයක් එක්සත් ජාතික පක්ෂයට තිබෙනවා. නඩු නැතිව මාස තුනක කාලයක් බෝගම්බර හිරගෙදර මම ඇතුළු තවත් කිහිපදෙනෙක් හිර කරලා තිබුණා. එහෙව් කළ ආණ්ඩුවකට පක්ෂපාතීව තමයි සරත් ෆොන්සේකා මහතා කතා කරන්නේ. පළි ගැනීම් ගැන කතා කරන්න එජාපයට සදාචාරාත්මක අයිතියක් නැහැ. මහින්ද රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, මහින්දානන්ද මහත්වරුන්ට යහපාලනය කාලේ ඉන්න දුන්නේ නැහැ. බොරු චෝදනා කරමින් ඔවුන්ගෙන් පළිගන්න යහපාලනය කටයුතු කළා.

කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතා (ස.ජ.බ.)-

දේශපාලන පළි ගැනීම් කවුරු කළත් වැරදියි. කිසි දවසක දේශපාලන පළිගැනීම් සිදු නොකරන බවට සමඟි ජනබලවේගය විදියට අපි ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබෙනවා.

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා-

ඔබතුමාලාගේ ප්‍රතිපත්තියට මගේ ගෞරවය පුද කරනවා. ඔබතුමා උගතෙක්. මේ පාර්ලිමේන්තුවේ සිටිය යුතු කෙනෙක්. මම එක දෙයක් අහනවා 2015 සිදු කළ දේශපාලන පළි ගැනීම් වැරදියි නේද. ඔව් ද නැද්ද කියන්න.

මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතා-

කවුරු කළත් දේශපාලන පළිගැනීම් අනුමත කරන්න බැහැ. හරින් ප්‍රනාන්දු ත්‍රස්ත පනත යටතේ අත්අඩංගුවට ගැනීමට සූදානම්ව සිටිනවා.

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා-

උදයංග වීරතුංග මහතාගේ කන්ටේනර් එක ඔබතුමාලා අවුරුදු පහක් හිර කරගෙන හිටියා. ගෙදර තිබුණ පුටු සෙට් එක පවා ඔබතුමාලා හිර කර ගෙන සිටියා. ඒ තරම් ඔබතුමාලා අසාධාරණකම් කළා. හරින් ප්‍රනාන්දු, මනුෂ නානායක්කාර කියන දේවල් ගැන හොයන්න ඕනෑ.

කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී සමන්ප්‍රිය හේරත් මහතා (පො.ජ.පෙ.)-

1977 පටන්ම දේශපාලන පළි ගැනීම් කළා. දූෂණ විරෝධී කමිටුව පත් කරමින් මහින්ද රාජපක්ෂ පවුලට එරෙහිව කටයුතු කළා. මහින්ද රාජපක්ෂ මහතා බලයට පැමිණෙයි කියන බවට ඒ පළි ගැනීම් සිදු කළා. දේශපාලන පළි ගැනීම් නිසා මමත් අසාධාරණයට ලක් වූවා. මගේ නිවෙසට පැමිණ මහින්ද මහත්තයා කෑම කාලා ගියා කියලා මාව දින 14 ක් බන්ධනාගාර ගත කළා. පසුගිය පාස්කු ප්‍රහාරය නිසා ඊයේ විපක්ෂයේ අය කළු ඇඳගෙන ඇවිත් තිබුණා.

මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී වසන්ත යාපා බණ්ඩාර මහතා (පො.ජ.පෙ.)-

එදා යුද්ධය ජය ගත්තා වගේම ජාතියට පිට කොන්ද ලබා දෙන්න අපේ නායකවරු කටයුතු කර තිබෙනවා. අන්තර්ජාතික බලපෑම්, ජිනීවා මානව හිමිකම් කොමිෂන් වල බලපෑම් ආදිය තිබියදීත් ඔවුන් කොන්ද කෙළින් තියාගෙන වැඩ කළා. පසුගිය යහපාලන ආණ්ඩුව අපේ පාක්ෂිකයාගෙන්, නායකයන්ගෙන්, රාජ්‍ය නිලධාරීන්ගෙන් පළි ගත්තේ නිර්ලජ්ජිත ලෙස. ඒ වගේම වසන්ත කරන්නාගොඩ, දසනායක මහතා වැනි අයගෙන් අසීමාන්තික ලෙස පළි ගත්තා. දැන් ඔය බෙදිලා වගේ ඉන්න සුමන්තිරන්ලා, අනුරලා පවා මේ දේවල්වලට වගකිව යුතුයි. මොකද ඒ ගොල්ලෝ තමයි මේ කමිටුවල හිටියේ. ඒ වගේම තව කරුණක් කිව යුතුයි. ඊයේ පාර්ලිමේන්තුවේදී හරින් ප්‍රනාන්දුලා හැසිරුණ විදිහ දැක්කම මට ගෙදර ගිහින් දරුවෝ තුන්දෙනාගේ මූණ බලන්න ලැජ්ජයි. ඒ නිසා එම සිද්ධිය වෙනුවෙන් මම ජාතියෙන් සමාව ගන්නවා.

පාර්ලිමේන්තුව අද (23) පෙරවරු 10.00ට නැවත රැස් වේ.

පාර්ලිමේන්තුව

දේශපාලන පළි ගැනීම් මේ රටට හඳුන්වා දුන්නේ 1977 බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි

මන්ත්‍රී ජයරත්න හේරත්

දේශපාලන පළි ගැනීම් සංවිධානාත්මකව සිදු කිරීමට පසුගිය ආණ්ඩුව කටයුතු කළා

මන්ත්‍රී නලීන් ප්‍රනාන්දු

අප කාගෙවත් ප්‍රජා අයිතිය අහෝසි කරන්නේ නැහැ

මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොළවත්ත

මාව හිරේට අරගෙන මගේ දරුවන් දුටු තැන අල්ලන්න කියලා පෝස්ටර් ගැහුවා

මන්ත්‍රී සරත් ෆොන්සේකා

වැවුරුකන්නල විහාරාධිපති දික්වැල්ලේ තිස්ස අනුනා හිමි ශ්‍රී දේහයට ජනපතිගෙන් අවසන් බුහුමන්...

ගන්දර සමූහ - ජයසිරි පේදුරුආරච්චි

අපවත්වී වදාළ අමරපුර සිරි සද්ධම්මවංශ මහා නිකායේ අනුනායක ආචාර්ය දික්වැල්ලේ තිස්ස අනුනාහිමියන්ගේ ශ්‍රී දේහයට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවසන් ගෞරව පුදා කළේය.

ශ්‍රී දේහය තැන්පත් කර ඇති වැවුරුකන්නල බුදුරජ මහා විහාරස්ථානයට ඊයේ (22) පෙරවරුවේ ගිය ජනාධිපතිවරයා අනුනාහිමි දේහයට අවසන් ගෞරව දක්වා විහාරස්ථානයේ තබා ඇති ශෝක සටහන් පොතේ සටහනක්ද තැබීය. ඇමැති ඩලස් අලහප්පෙරුම, රාජ්‍ය ඇමැති කංචන විජේසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක මහත්වරුද ජනාධිපතිවරයා සමග මේ අවස්ථාවට එක්ව සිටියහ.

අධ්‍යාපනයේ නව නැම්මකට අවශ්‍ය වෙනස්කම් කඩිනමින්:

කුඩා කාලයේ සිටම දරුවන්ට ලියන්න කියවන්න හුරු කිරීම අපේ වගකීමක්

‘රටක් වටින පොතක්’ ජාතික වැඩසටහනේ සහතික පත් ප්‍රදානෝත්සවයේදී ජනපති කියයි

මහින්ද අලුත්ගෙදර

අධ්‍යාපනයේ නව නැම්මක් සඳහා අවශ්‍ය වෙනස්කම් කඩිනමින් හඳුන්වාදෙන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පවසයි.

රටට වැඩදායී සහ ආර්ථිකයට සෘජුවම දායකවන දරු පිරිසක් අනාගතයට දායාද කිරීම රජයේ අරමුණ බව පෙන්වා දෙන ඒ මහතා දරුවන් පොතපතට නැඹුරු කොට රටට ලෝකයට ආදරය කරන වැඩදායී පුරවැසියන් ලෙස සමාජගත කිරීම අත්‍යවශ්‍ය වන බවද රටක් දියුණු කළ හැක්කේ ගුණාත්මක අධ්‍යාපනයකින් බවද පෙන්වා දෙයි.

අරලියගහ මන්දිරයේ දී පෙරේදා (21) පස්වරුවේ පැවති “රටක් වටිනා පොතක් ” පොත් දස දහසක් ලිවීමේ ජාතික වැඩසටහනේ පළමු අදියරෙහි සහතික පත් ප්‍රදානෝත්සවයට සහභාගි වෙමින් ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේය.

රටක් දියුණු කළ හැක්කේ ගුණාත්මක අධ්‍යාපනයකින්

එහිදී වැඩිදුරටත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මෙසේද කීය.

පාසල් දූදරුවන් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයත් එක්ව ක්‍රියාත්මක කළ වටිනා ව්‍යාපෘතියක් වූ “රටක් වටින පොතක්” වැඩසටහනට එක්වීමට ලැබීම මට ඉමහත් සතුටක්. අපේ දූ දරුවන්ගේ නැණස පාදන මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම රජයක් විසින් නිරන්තරයෙන්ම කළ යුත්තක්. ලිවීම නැතිනම් ලේඛනය මානව සන්නිවේදනයේ වැදගත් සන්ධිස්ථානයක්. ඒ වගේම දරුවන්ගේ අධ්‍යාපනයේ ද ප්‍රධාන අංගයක්. තාක්ෂණය මත පදනම් වූ වර්තමානයේ ලෝකයේ දරුවන්ට ලේඛන හැකියාව වැඩිදියුණු කරගැනීමට ඇති අවස්ථා සීමාසහිතයි.

ගුරුවරුන්, මව්පියන් නිරන්තරයෙන් දරුවන් වෙත කරන චෝදනාවක් තමයි වර්තමානයේ ඉන්න දරුවන් කියවීමට ලිවීමට වැඩි නැඹුරුවක් නැති බව කියන එක. සමහරවිට දරුවන්ට මේ ගැන ඔවුන්ගේ පැත්තෙන් කියන්න කරුණු කාරණා තියෙන්න පුළුවන්. ඒත් වර්තමානයේ දරුවන් උපතේ සිටම ලෝකය දකින්නේ අහන්නේ තාක්ෂණික මෙවලම් හරහා. විවිධ විෂයන් සඳහා ක්‍රීඩා සඳහා දරුවන් පුරුදු පුහුණු කරනවා සේම කුඩා කාලයේ සිටම දරුවන්ට ලියන්න, කියවන්න හුරු කිරීම වැඩිහිටියන් වන අපගේ වගකීමක්.මේ වගකීම දෙමාපියන් වගේම ගුරුවරුන්ටත් පැවරෙනවා. පුංචි කාලේ ඉඳලා දරුවන්ට පොතක් මිල දී ගන්න, පුස්තකාලයකට යන්න, දරුවන්ට ඇහෙන්න පොතක්, කතාන්දරයක් කියවන්න වැනි දේවල්වලින් දරුවන් පොතපතට නැවත නැඹුරු කර ගන්න පුළුවන්.

එමගින් පාසල් දරු දැරියන්ගේ චින්තන හැකියාව, නිර්මාණශීලිත්වය, අභියෝග ජය ගැනීමේ හැකියාව වර්ධනය කිරීමට මෙන්ම දරුවන්ට කියවීමේ රුචිය ඇති කරන්නත් හැකියාව තියෙනවා. දරුවන්ට එදිනෙදා සිය අධ්‍යාපන කටයුතු සිදු කරන අතර පොත් ලියන්න කියවන්න ඇති කාලය අවමයි. වර්තමානයේ ලොව පුරා පැතිර යන කොවිඩ්-19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් ලක්ෂ 43කට ආසන්න ලාංකේය පාසල් දූ දරුවන්ට පසුගිය 2020 වර්ෂයේ මාර්තු - ජුනි කාලසීමාවේ බියෙන්, පීඩනයෙන්, ආතතියෙන් යුක්තව තම නිවෙස්වලටම සිර වී කාලය ගතකරන්න සිදුවුණා.

ඒ හේතුව නිසාම දරුවන්ගේ බිඳවැටුණු මානසික යෝග්‍යතාව ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව වර්ධනය කිරීමේ අරමුණ ඇතිව එවකට අධ්‍යාපන ඇමැතිවරයාව සිටි ඩලස් අලහප්පෙරුම මහතාගේ මූලිකත්වයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස "රටක් වටින පොතක්" පොත් 10,000ක් ලිවීමේ ජාතික වැඩසටහන ආරම්භ කරන්න කටයුතු කළා.

මේ ව්‍යාපෘතිය ආරම්භ කරද්දි තිබුණේ මාරාන්තික වයිරසයක් පැතිර යන තත්ත්වයක් නිසා දරුවන් පොත් ලියාවිද යන ප්‍රශ්නාර්ථය සමග ආසන්න වශයෙන් පොත් 10,000ක් පමණ දරුවන් අතින් ලියැවෙනු ඇතැයි බලාපොරොත්තු වුණා. කෙසේ නමුත් ව්‍යාපෘතිය අවසන් වනවිට මේ සඳහා පොත් 42,000කට ආසන්න ප්‍රමාණයක් දිවයින පුරා සිංහල, දෙමළ, මුස්ලිම් සියලුම දරුවන්ගෙන් ලැබී තිබුණු බව මට දැනගන්න තිබෙනවා. එය මා දන්නා ආකාරයට මීට පෙර ලෝකයේ කොතැනක හෝ පාසල් දරුවන් අතින් එතරම් විශාල පොත් ප්‍රමාණයක් එකවර ලියැවී නැහැ. ඒ අතින් ගත්තොත් මේ ව්‍යාපෘතිය දරුවන්ගේ අනාගතයට අතිශයින් වැදගත් වෙනවා.

මේ ව්‍යාපෘතියට දරුවන් විසින් රචනා කරන ලද හොඳම කෘති 100ක් අපි මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්කර එම සිසුන් සඳහා රාජ්‍ය සම්මාන පිරිනැමීමටත් කටයුතු කරනවා. එමගින් අපේ දරුවන් ලිවීමට, කියවීමට උනන්දු කිරීම අපේ මූලික පරමාර්ථයයි. එසේම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය හරහා අප නිරන්තරයෙන් ළමා පරපුරට නිවැරදි මඟපෙන්වීමක් සිදුකිරීමට ක්‍රියාකරනවා.

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයේ අධ්‍යාපනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. අධ්‍යාපනයේ නව නැම්මක් සඳහා අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට අපි මේ දිනවල ක්‍රියා කරමින් සිටිනවා. රටට වැඩදායි පුද්ගලයන් ගොඩනඟන, ආර්ථිකයට සෘජුවම සහභාගි විය හැකි අනාගත පරපුරක් ගොඩනැඟීමට අවශ්‍ය වෙනස්කම් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් කළ යුතුයි. ඒ පිළිබඳ අදහස් සහ යෝජනා විමසීම මේ දිනවල සිදු කෙරෙනවා. ඔබත් එම වෙබ් අඩවියට ගොස් ඔබගේ අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන්න. මොනවගේ අධ්‍යාපන ක්‍රමයක් ද අවශ්‍ය ඒ පිළිබඳ ඔබගේ අදහස් ඊට එක් කරන්න. ඒ වගේම නව අධ්‍යාපන ක්‍රමයක් සැකසීමේ දී, ගුරුවරුන්, මවුපියන් ද ඒ සඳහා අදහස් එක් කරනවානම් ඉතා වැදගත් වෙනවා,

මේ "රටක් වටින පොතක්" ව්‍යාපෘතියේ නිර්මාතෘ ඩලස් අලහප්පෙරුම මහතාටත්, මේ ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යෑමට උනන්දුවෙන් කටයුතු කරන අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස් මහතා ප්‍රමුඛ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ටත්, මේ ව්‍යාපෘතියේ සමීක්ෂණ කටයුතු සිදුකරමින් එය ඉදිරියට ගෙනයන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති සොනාල ගුණවර්ධන ප්‍රමුඛ එම කාර්ය මණ්ඩලයටත්, ග්‍රන්ථ 42,000කට ආසන්න ප්‍රමාණයක් රචනා කරමින් මේ ව්‍යාපෘතියට දායක වූ නිර්මාණශීලී දරුවන්ටත්, ඔවුන් දිරිමත් කළ මව්පියන්, ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ටත් මගේ විශේෂ ස්තුතිය මේ අවස්ථාවේ පුදකර සිටිනවායැයි පැවසීය.

කොවිඩ් -19 වසංගතය නිසා පාසල් වසා තැබූ කාලයේ දරුවන්ගේ නිර්මාණශීලි ලේඛන හැකියාව සහ කියවීම වැඩිදියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි. හිටපු අධ්‍යාපන ඇමැති ඩලස් අලහප්පෙරුම මහතාගේ අදහසකට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඒකාබද්ධව වැඩසටහන ක්‍රියාවට නැංවිණි. ශ්‍රී ලංකාවේ සියලු රජයේ පාසල්, පිරිවෙන්, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන 1 වසරේ සිට 13 වසර දක්වා වයස් කාණ්ඩ 3කින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් නිර්මාණ ඉදිරිපත් කිරීමේ හැකියාව පැවතිණි. ග්‍රන්ථ දස දහසක් ව්‍යාපෘතියේ ඉලක්කය වන අතර පිටපත් භාර ගැනීමේ අවසන් දිනය වන විට 43,000කට ආසන්න නිර්මාණ සංඛ්‍යාවක් දිවයිනේ සෑම පළාතකින්ම ලැබී තිබිණ.

තෝරා ගත් නිර්මාණ 100ක් මුද්‍රණය කර රාජ්‍ය සම්මාන පිරිනැමීමට අපේක්ෂා කරන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සඳහන් කළේය. දිවයිනේ පළාත් 9ම නියෝජනය වන පරිදි තෝරා ගත් සිසුන් තිස් දෙනෙකුට සංකේතාත්මකව සහතිකපත් ප්‍රදානය කිරීම ජනාධිපතිවරයා අතින් සිදු කෙරිණ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති සොනාල ගුණවර්ධන මහතා “ජාතික ජන කතා සංග්‍රහය” පළමු වෙළුම ජනාධිපතිවරයා වෙත පිළිගැන්වීය.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්, විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහත්වරු සහ අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීහු, විදුහල්පතිවරු, ගුරුවරු හා සිසුහු මේ අවස්ථාවට එක්ව සිටියහ.

ඇතැම් ආයතන ප්‍රධානීන්ගේ කාර්යභාරය හරියට ඉටු වී නෑ:

රජයේ අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වී නැති රාජ්‍ය ආයතන ගැන වාර්තාවක් දෙන්න

මාසික සමාලෝචන රැස්වීමේදී රාජ්‍ය ඇමැතිවරුන්ට ජනපති දැනුම් දෙයි

මහින්ද අලුත්ගෙදර

ඇතැම් ආයතන ප්‍රධානීන්ගේ කාර්යභාරය නිසි ලෙස ඉටු නොවීම සම්බන්ධයෙන් වාර්තා වී තිබෙන අතර රජයේ අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වී නැති එවැනි ආයතන පිළිබඳ වාර්තාවක් දෙන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා රාජ්‍ය ඇමැතිවරුන්ට දැනුම් දී තිබේ.

ඒ අනුව එවැනි ආයතනවලට වෙනත් නිලධාරීන් පත් කළ යුතු නම් ඒ සඳහා ද තමා සූදානම් බව ඒ මහතා ප්‍රකාශ කරයි.

රාජ්‍ය ඇමැතිවරුන් සමග මාසිකව පැවැත්වෙන සමාලෝචන රැස්වීම ජනාධිපති මන්දිරයේදී පෙරේදා (21) පැවැති අතර එහිදී ජනාධිපතිවරයා මේ අදහස් පළ කළේය. “මහජන සේවා සැපයෙන රාජ්‍ය ආයතනවලින් ජනතාව අපේක්ෂා කරන කාර්යය ඉටු කර ගැනීමට නොහැකිය” යන චෝදනාවට තිත තැබිය යුතුයැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

කොවිඩ් වසංගතය හමුවේ වුවද “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් පොරොන්දු වූ බොහෝ දේ ඉටු කර තිබෙන අතර ජනතාව තුළ ඇති කනස්සල්ලට හේතුව ඇතැම් රාජ්‍ය ආයතනවල පවතින අකාර්යක්ෂමතාව, දූෂණය, කල් ගත වීම බව ජනතාව පෙන්වා දෙති. කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් වෙනුවෙන් රාජ්‍ය ඇමැතිවරුන්ගේ සෘජු මැදිහත්වීමෙන් සහ තාක්ෂණය භාවිතයෙන් ගැටලුවට විසඳුම් දිය හැකි බව ජනාධිපතිවරයා පෙන්වා දෙයි.

ඇතැම් ආයතන ප්‍රධානීන්ගේ කාර්යභාරය නිසිලෙස ඉටුනොවීම පිළිබඳව ද වාර්තා වී තිබෙන අතර රජයේ අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වී නැති එවැනි ආයතන පිළිබඳ වාර්තාවක් දෙන ලෙස රාජ්‍ය ඇමැතිවරුන්ට පැවසූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එම ආයතන සඳහා වෙනත් නිලධාරීන් පත් කළ යුතු නම් ඒ සඳහා ද තමා සූදානම් බව කියා සිටියේය.

විදේශ ණය සහ දේශීය අයවැය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතින්හි ප්‍රගතිය අධීක්ෂණය කර කඩිනම් කරවීමේ අවශ්‍යතාව ද ජනාධිපතිවරයා අවධාරණය කළේය. “ජනතාව සමගයි අපේ ශක්තිය තිබෙන්නේ, ඔවුනගේ අවශ්‍යතා කඩිනමින් ඉටුවිය යුතුයි. ගැටලුවලට ඇහුම්කම් දෙමින්, ජනතාවගෙන් දුරස් නොවී වැඩ කරන්න” යැයි ඒ මහතා රාජ්‍ය ඇමැතිවරුන්ට කියා සිටියේය.

රජයේ ප්‍රතිපත්තිය රැකියා නිෂ්පාදනයයි. එබැවින් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගමේ ගොඩනගා රැකියා අවස්ථා උදා කිරීමේ හැකියාව ද පෙන්වා දුන්නේය. උත්සව සමයේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළයාම ස්වභාවයයි. අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය නිසා ගොවි අස්වනු අලෙවි කර ගැනීමට ද නොහැකි වෙයි. එම තත්ත්වය වෙනස් කරමින් මෙවර අලුත් අවුරුදු සමයේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පහළ මට්ටමක පවත්වාගෙන යෑමටත්, ගොවීන්ගේ අස්වනු මිලදී ගැනීමටත් පළමු වතාවට රජයට හැකි වූ බව පෙන්වා දුන් ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව පිටුදැකීමේ ජනාධිපති කාර්යසාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා රුපියල් පන්දහසේ දීමනාව බෙදාදීමට රාජ්‍ය නිලධාරීන් දැක්වූ සහාය සහ කැපවීම ද ඇගයීමට ලක්කළේය.

රාජ්‍ය ඇමැතිවරුන්, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර්. ආටිගල, රාජ්‍ය පරිපාලන ලේකම් ජේ.ජේ. රත්නසිරි මහත්වරුද මේ අවස්ථාවට එක්ව සිටියහ.

කොළඹ වරාය නගර කොමිසමට රජයේ ඉඩම් පැවරීමේ බලය ජනාධිපතිවරයාට තිබෙනවා

ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන

වරාය නගර පනතට එරෙහි පෙත්සම් විභාගය

නෙල්කා මැදගෙදර

යෝජිත 'කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ' සාමාජිකයන් බහුතරයක් ශ්‍රී ලාංකිකයන් බව මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආටිගල සහ කැබිනට් මණ්ඩල ලේකම් ඩොනල්ඩ් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා ශ්‍රේෂ්ඨාධිකරණයට ඊයේ (22) දන්වා සිටියේය.

එම කොමිසම සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත වන්නේ නම් ඉන් තිදෙනකු ශ්‍රී ලාංකිකයන් වනු ඇති බව ද සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත වන්නේ නම් සිව්දෙනකු ශ්‍රී ලාංකිකයන් වනු ඇති බව ද ඒ මහතා ප්‍රකාශ කළේය.

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් පනත් කෙටුම්පතට එරෙහිව ගොනු කර ඇති පෙත්සම් කැඳවූ අවස්ථාවේදී අතරමැදි පෙත්සම් වෙනුවෙන් කරුණු දක්වමින් ජනාධිපති නීතිඥවරයා මේ බව ප්‍රකාශ කළේය.

මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා, සභාපතිවරයා, සමගි ජන බලවේගයේ මහ ලේකම්වරයා, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සහික වසන්ත සමරසිංහ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු පිරිසක් විසින් පෙත්සම් 19ක් ගොනු කර තිබුණි. එසේම පනතට එරෙහිව සිවිල් පුද්ගලයන් තිදෙනකු ද පෙත්සම් ගොනු කර තිබිණි.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආටිගල, කැබිනට් මණ්ඩල ලේකම් ඩොනල්ඩ් ප්‍රනාන්දු ඇතුළු පිරිසක් විසින් පනත් කෙටුම්පතට පක්ෂව අතරමැදි පෙත්සම් 11ක් ගොනු කර තිබිණි.

මෙම පෙත්සම් සලකා බැලීම සිව්වන දිනට ද ඊයේ (22) සිදු කරනු ලැබුයේ අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, ප්‍රියන්ත ජයවර්ධන, මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා යන පංච පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල හමුවේය.

එම අවස්ථාවේදී අතරමැදි **පෙත්සම්කාර කැබිනට් මණ්ඩල ලේකම්වරයා සහ මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආටිගල මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා** තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් මෙසේ කීය.

කොළඹ වරාය නගර කොමිසමට රජයේ ඉඩම පැවරීමේ බලය ජනාධිපතිවරයාට තිබෙනවා. එම ඉඩම බදු දෙනවා ද, ව්‍යාපාර අවස්ථා සඳහා ලබා දෙන්නේ කෙසේද යන්න තීරණය කරන්නේ එම කොමිසම විසිනුයි. මෙම කලාපය විවිධ කටයුතු රැසක් වෙනුවෙන් වෙන් කළ හැකියි. නිවාස, වාණිජමය කටයුතු, අධ්‍යාපනික ආයතන, විනෝදජනක අවස්ථා ආදිය සඳහා ලබාදීමට සැලසුම් කර තිබෙනවා. මෙය ජාතික ආර්ථික සංවර්ධනය මූලික ලෙස අරමුණු කර ගන්නවා.

මෙම වරාය නගර ආර්ථික කොමිසමේ අරමුදල් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත්. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති සමාගම රුපියල් මිලියන 400ක් කොමිසමට ගෙවිය යුතුයි. එම මුදල පමණක් ලබා ගැනීම මෙහි අරමුණ නොවෙයි. මෙම ඉඩම් කොටස් බදු දීමෙන් ලැබෙන සම්පූර්ණ මුදලෙන් සියයට 1ක් කොමිසම තබා ගන්නවා. ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර වෙනවා.

විනිසුරු මුර්දු ප්‍රනාන්දු

එම සියයට 1 ලබාගැනීමේ කාලසීමාව 2028 ජූලි තෙක් සීමා කර තිබෙනවා. විශේෂ කාලසීමාවක් ඇයි? අධ්‍යාපන සහ රෝහල් රජයේ වාණිජමය වටිනාකම් සහිත අලෙවි කළ හැකි ඉඩම්වල පිහිටා ඇත්තේ ඇයි?

ජ.නීතිඥවරයා

කාලසීමාව මූලික ආරම්භ කාලයක් පමණයි. මෙම කලාපයේ ඇති අලෙවි කළ හැකි රජයේ ඉඩම් ප්‍රමාණයේ තමයි රෝහල් සහ පාසල් ඇති කරන්නේ. ඒවායේ සේවය ලබාගැනීමට ඕනෑම අයෙකුට යා හැකියි.

ජනාධිපතිවරයා හෝ මුදල් ඇමැතිවරයා විසින් පනවන ඕනෑම රෙගුලාසියක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේදී ප්‍රශ්න කළ හැකියි. එවැනි ව්‍යවස්ථාදායක කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුම්වත් කරනවා.

අගවිනිසුරුවරයා

බදු සහන ලබාදීම සම්බන්ධයෙන් කිසිදු මාර්ගෝපදේශයක් මෙහි සඳහන් වන්නේ නෑ.

ජ.නී.

සෑම ව්‍යාපාරයක්ම එකලෙස සලකන්නේ නෑ. එක් එක් ව්‍යාපාර වෙනුවෙන් ලැබෙන බදු සහනය විවිධ විය හැකියි. එය සියයට 5 සිට 25 තෙක් විය හැකියි.

අගවිනිසුරුවරයා

ව්‍යාපාරයක් කොතරම් වැදගත් වන්නේ ද යන්න තීරණය කරන්නේ කෙසේද? ඒ පිළිබඳව උපමාන මෙහි සඳහන් වන්නේ නැහැ.

ජ.නී. රොමේෂ් ද සිල්වා

එවැනි ව්‍යාපාර වලට බදු සහන ලබාදීමේදී පාර්ලිමේන්තුව දැනුවත් කර එහි අනුමැතියට යටත්ව කටයුතු කළ හැකි පරිදි එය සංශෝධනය කළ හැකියි. ආචාර්ය ජයසුන්දර කළ යුතු සංශෝධන පිළිබඳව නීතිපතිවරයා දැනුවත් කර තිබෙනවා.

ජ.නී. සංජීව ජයවර්ධන

මෙම කලාපයෙහි කටයුතු කිරීමේදී බේරුම්කරණය කළ හැකියි. එය අධිකරණය ඉක්මවා යෑමක් නොවෙයි.

අගවිනිසුරුවරයා

මෙහි 27(4) වගන්තිය අනුව විදේශ මුදල් තිබෙන ශ්‍රී ලාංකිකයන්ට පවා මෙම කලාපයෙහි ආයෝජනය කළ හැකියි. එලෙස අවස්ථාව ලබා දෙන්නේ ඇයි?

ජ.නීතිඥවරයා

එය දිරිගැන්වීමක් වශයෙන් සිදු කරනවා.

අගවිනිසුරුවරයා

මෙම කලාපයේ විදේශ බැංකුවල විශේෂ වරප්‍රසාද තිබෙන බවත් ඒවා ලබාගැනීමේ අදහසින් ජනතාව එම බැංකු සමඟ කටයුතු කළහොත් රටේ සෙසු සමස්ත බැංකු පද්ධතියම බිඳ වැටෙන බවට තර්කයක් ඉදිරිපත් වුණා.

ජ.නීතිඥවරයා

මෙම ස්වභාවයේ විදේශ බැංකු රටේ ක්‍රියාත්මක වෙනවා. මෙම බැංකුවල ව්‍යාපාර කටයුතු මුල සිට අවසානය තෙක්ම සම්පූර්ණ වශයෙන් මූල්‍ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරනවා.

මෙය නීතිමය රාමුවක් තුළ විශේෂ ව්‍යාපාර අවස්ථා නිර්මාණය කර විදේශ විනිමය ඉපැයීමේ වටිනා අවස්ථාවක්. මෙහි ප්‍රතිලාභ හිමිවන්නේ මෙරට ජනතාවටමයි. ලංකාවේ ආර්ථිකයේ ස්වරූපය මේ සමඟ වෙනස් වේවි. ජනාධිපතිවරයා, මුදල් ඇමැතිවරයා ලෙස අගමැතිවරයා, කැබිනට් මණ්ඩලය ඇතුළු නිලධාරීන් ඒකමතික තීරණයක සහ උවමනාවක සිටිනවා මෙම ආර්ථික කලාපය ඇති කළ යුතු බවට.

ශ්‍රී ලංකා කොළඹ ව්‍යාපාරිකයන්ගේ සංගමයේ සභාපතිවරයා ගොනු කළ පෙත්සම වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මහතා මෙසේ ද කීය.

මෙම ස්ථානයේ පවත්වාගත යුතු සහ හැකි ආකාරයන් හඳුනාගෙන තිබෙනවා. මෙම කලාපයට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවන් ඉදිරිපත් කළ කරුණු වැරදියි. මේ වන විටත් ව්‍යාපෘති සමාගම විසින් එම පහසුකම් සැලසීම සිදු කර අවසන්. මෙම කලාපයෙහි ඇතැම් ස්ථාන ව්‍යාපෘති සමාගමට අයත්වන අතර ඉතිරිය රජයේ අයිතිය සහිත අලෙවි කළ හැකි ඉඩම් ලෙස හඳුනාගන්නවා. රෝහල්, පාසල්, සම්මන්ත්‍රණ ශාලා ආදිය රජය යටතේ පවතීවි.

මෙම පනත ක්‍රියාත්මක වූ විගස අදාළ කොමිසම බල ගැන්වෙනවා. එම කොමිසම විසින් රජයේ අලෙවි කළ හැකි ඉඩම් බදුදීම අරඹනවා. මෙම කලාපය කොළඹ දිස්ත්‍රික්කයට අයත් වෙනවා. මෙම පනත ඉදිරිපත් කර ඇත්තේ විශේෂ ආර්ථික කලාපයක් ඉදිකිරීම අරමුණු කරගෙනයි. එය වර්තමාන ගෝලීය ආර්ථිකයේ අත්‍යවශ්‍ය අංගයක්. ආයෝජකයන්ට නැවත රැගෙන යා නොහැකි ව්‍යාපාර ස්ථාන මේ නිසා නිර්මාණය වෙනවා.

බැංකු සම්බන්ධයෙන් මෙහි සඳහන් වන කරුණු අලුත් ඒවා නොවෙයි. එම බොහොමයක් කරුණු 'බැංකු පනතෙහි' සඳහන්.

මෙම කොළඹ වරාය නගරය තුළ සියලු කටයුතු තීරණය කිරීමේ බලය විශේෂ කොමිසමට ඇති අතර, එය පහසුකම් සපයන්නා ද වෙනවා. දුෂ්කරතා වලට මුහුණදී ඇති ජාතික ආර්ථිකයට පිබිදීමක් ඇති කිරීම සඳහා මෙම පනත ඉදිරිපත් කරනවා. මෙම කෙටුම්පතේ කිසිවක් ව්‍යවස්ථාවට පටහැනි නෑ.

අතරමැදි පෙත්සම්කාර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් නීතිඥ සාගර කාරියවසම් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ කුෂාන්ත ද අල්විස් මහතා මෙසේ කීය.

ලෝකය පුරා විශේෂ ආර්ථික කලාප 5000කට අධික ප්‍රමාණයක් තිබෙනවා. එම කලාපවල විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ දිරිමත් කිරීමට විවිධ සහනයන් ලබා දෙනවා. ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සහ රැකගැනීම සඳහා දිරිමත් කිරීම් කළ යුතුයි. ආයෝජකයන්ට ලංකාව තුළ ආයෝජනය කළ යුතුය යන හැඟීම ලබාදීමට නම් එවැනි දේ කළ යුතුයි. එසේ නොමැති විට ඔවුන් සිය කාලය හා ධනය මෙහි වැය නොකර වෙනත් රටවලට යාවි. ඒ නිසයි මෙම පනත මඟින් විශේෂ වරප්‍රසාද සහ පහසුකම් සලසා ඇත්තේ.

මෙහිදී අන්තර්ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයක් මෙම කලාපයේ ඉදිකිරීමට නියමිතයි. ව්‍යාපාරිකයන් අතර සේවකයන් අතර හෝ මෙම කලාපයේ කටයුතු කරන පුද්ගලයන් අතර ඇතිවන ගැටුම් හෝ මතවාද සම්බන්ධයෙන් මෙම බේරුම්කරණ මධ්‍යස්ථානයට යා හැකියි. එහිදී සාධාරණ විසඳුමක් ලබාගත හැකියි. එහි ඇති වරද කුමක්ද?

නීතිමය කටයුතුවලදී මෙම විශේෂ කලාපයෙහි අය වෙනුවෙන් කඩිනම් නඩු විභාගයක් පැවැත්විය හැකියි. එය පන්ති දෙකක ජනතාවක් නිර්මාණය කිරීමක් නොවෙයි.

බදු හෝ වෙනත් සහන ලබා නොදුණහොත් කිසිදු ආයෝජකයෙක් අපේ රටේ ආයෝජනය කිරීමට නොපැමිණේවි. ඔවුන්ට තෝරා ගැනීම සඳහා ඕනෑතරම් ආයෝජන අවස්ථා ලෝකයේ තිබෙනවා. එලෙස ආයෝජකයන් දිරිගැන්වීමට නම් ඔවුන්ට පහසුකම් සැලසිය යුතුයි.

ලංකාවේ මේ වන විට එකම පළාත් සභාවක්වත් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා මෙම පනත් කෙටුම්පත පළාත් සභාවලට ඉදිරිපත් කළ නොහැකි වුණා.

මෙම පනතට අභියෝග කර ඇත්තේ එකම පෙත්සම්කරුවන් කොටසක්. පාර්ලිමේන්තුව විසුරුවූ අවස්ථාවේදීත් 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළ අවස්ථාවේත් ඔවුන් ඊට එරෙහිව අධිකරණයට ආවා. ඔවුන් අධිකරණයට එන්නේ ජනතාවගේ යහපත සඳහා නොවෙයි. එහි සැඟවුණු අරමුණු තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු විය යුතුයි. මෙහි කිසිවක් ව්‍යවස්ථාවට පටහැනි නෑ. එබැවින් එය සරල බහුතරයෙන් සම්මත විය යුතුයි.

පොදුජන පෙරමුණේ නීතිඥ සංගමයේ නීතිඥ අතුල ප්‍රියදර්ශන ද සිල්වා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ වී.කේ. චොක්සි මහතා මෙසේ කීය.

මෙම කොමිසම කිසිදු අවස්ථාවක කරුණු සලකා බැලීමෙන් තොරව කිසිදු ව්‍යාපෘතියක් ලබා දෙන්නේ නැහැ.

මෙම වරාය කලාපයෙහි පිහිටුවන බැංකු අලුත් සංකල්පයක් නොවෙයි. ඒවා පිහිටුවන්නේ බැංකු පනත අනුවයි.

මෙය අප රටට ලැබෙන ස්වර්ණමය අවස්ථාවක්. මෙහි කිසිදු වගන්තියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වගන්තියට අදාළ වන්නේ නෑ. එබැවින් එය සම්මත කිරීමට විශේෂ බහුතර ඡන්දයක් හෝ ජනමත විචාරණයකට යොමු කිරීම අවශ්‍ය නැහැ.

මැදිහත් පාර්ශ්ව පෙත්සම්කාර නීතිඥ නලීන් සමරකෝන් සහ බී.පී. කරුණාතිලක වෙනුවෙන් පෙනී සිටි නීතිඥ නිශාන් ප්‍රේමතිරත්න මහතා මෙසේ කීය.

යම් යම් කාර්යයන් අරමුණු කරගෙන පිහිටුවන ආයතන අධීක්ෂණය කිරීමේ බලය ඒ සඳහා වූ ඉහළ ආයතනවලට තිබෙනවා. එසේම එම ආයතන හිතුවක්කාරී ලෙස ජනතාවගේ අයිතීන් උල්ලංඝනය වන පරිදි කටයුතු කරන්නේ නම් එය අධිකරණය හමුවේ අභියෝගයට ලක් කළ හැකියි. මෙම වරාය නගර ආර්ථික කොමිසම ද එලෙසමයි. එයට සුවිශේෂී වූ අධිකාරී බලයක් නැහැ. එහි කටයුතු පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කළ හැකියි.

මෙම කොමිසමේ සාමාජිකයන් ලෙස විදේශිකයන් පත් කිරීමේ වරදක් නෑ. ඔවුන්ට වරාය නගර සම්බන්ධව අත්දැකීම් තිබිය හැකියි. මෙම කොමිසමට විදේශිකයන් හත්දෙනකු පත් කරාවි යැයි අප සිතන්නේ නෑ. එය ජනාධිපතිවරයාගේ දේශපාලන දිවියේ සියදිවි නසා ගැනීමක් ලෙස හැඳින්විය හැකියි. මෙම කොමිසමට සුදුසුකම් සහිත පුද්ගලයන් පත් කිරීමට ජනාධිපතිවරයාට ඉඩදීමට තරම් අප නම්‍යශීලී විය යුතුයි. වරාය නගර කලාපය තුළ 'ජුරාසික් පාක්' චිත්‍රයක් මැවීමට පෙත්සම්කරුවන් උත්සහ කරනවා. එහි බිය විය යුතු කිසිවක් සැබෑවටම නැහැ.

විදේශිකයන් මෙහි ආයෝජනය කළ පසු අමෙරිකානු ඩොලරය රුපියල් සියය බවට පත්වුවහොත් වන්නේ කුමක්ද? එහි ලාභය සමස්ත ජනතාවටම ලැබේවි.

වරාය නගරය ශ්‍රී ලංකාවේම කොටසක්. ශ්‍රී ලංකාව තුළ බේරුම්කරණ කාර්යයන් සියල්ල බේරුම්කරණ පනතට යටත්වෙනවා. එලෙසම මෙම කොළඹ වරාය නගර කලාපයෙහි මතුවන බේරුම්කරණ කටයුතු ද 'බේරුම්කරණ පනත' අනුව සිදු වේවි.

ලී ක්වාන් යූ උත්සහ කළේ සිංගප්පූරුව ලංකාවක් බවට පත් කිරීමටයි. අප අද සිංගප්පූරුවට පිටුපසින් සිටින්නේ. රටක මුහුදු සීමාව නාවික සැතපුම් 12ක් තෙක් විසිරෙනවා. එම රටේ ජනතා පරමාධිපත්‍යය එම නාවික සැතපුම් 12වත් ක්‍රියාත්මකයි. එම මුහුද ගොඩකර ගොඩනඟන බිමකට ද එම පරමාධිපත්‍යය හිමියි.

අපේ ව්‍යවස්ථාවේ පරාසයන් තුළ ක්‍රියාත්මක වෙමින් උපරිම නම්‍යශීලී වෙමින් මෙරට ආයෝජනය කිරීම සඳහා විදේශිකයන් ආකර්ෂණය කරගැනීම මෙහි අරමුණයි.

මෙහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් ෆර්සානා ජමීල් මහත්මිය කරුණු ඉදිරිපත් කළාය.

කමිටු අවස්ථාවේදී මෙම පනත් කෙටුම්පතට කිරීමට යෝජිත සංශෝධන කිහිපයක් ලැබී තිබෙනවා. එය අධිකරණයට ඉදිරිපත් කරනවා.

මෙය දැනට පවතින ආයෝජන නීති රාමුවට බොහෝ එහාට ගිය පනත් කෙටුම්පතක්. රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව රටේ ප්‍රධානියා, විධායකයේ ප්‍රධානියා, සන්නද්ධ හමුදා ප්‍රධානියා, කැබිනට් මණ්ඩල ප්‍රධානියා විසින් මේ සම්බන්ධව ක්‍රියා කරනවා. ඔහු කැබිනට් මණ්ඩලයට වගකියනවා.

මෙම මුහුද ගොඩකර සෑදූ බිම ලංකා භූමි භාගයට අයත් නොවන බවට පෙත්සම්කරුවන් කරුණු ඉදිරිපත් කළා. පෙත්සම්කරුවන් අභියෝගයට ලක් කරන ගැසට් නිවේදනය නිකුත් කර ඇත්තේ මීට වසර දෙකකට පෙරයි. ඒ සම්බන්ධව දැන් නීතිමය මැදිහත්වීමක් විය නොහැකියි.

මෙගා පොලිස් අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ව්‍යාපෘති සමාගම මීට පෙර ගිවිසුමක් ඇති කර ගත්තා. මෙය හුදෙක් වාණිජමය නගරයක් නොව ඊට වඩා පුළුල් වෙමින් ආර්ථික නගර කලාපයක් බවට පත් වීමට රජය තීරණය කළා. ඒ අනුව කටයුතු කිරීමටයි නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළේ. මෙහි ඉඩම් නීතිය, ව්‍යාපාර නීතිය, බදු නීතිය, බැංකු නීතිය ආදී නීති බොහෝමයක් විශාල ආර්ථික කලාපයකට බලපානවා.

ඒ අනුව තමයි එම සියලු කටයුතු නියාමනය කිරීම සඳහා අධිකාරී බලය සහිත කොමිසමක් පිහිටුවීමට අදාළ විධිවිධාන මෙහි සඳහන් වන්නේ. රජයේ අරමුණ විදේශිකයන් මෙරට ආයෝජනය කිරීමට යොමු කර ගැනීමයි. මෙම කොමිසමේ මුදල් විගණනය කෙරෙනවා. නීතිය අසමාන වීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණිවීම යන්න සමාන ලෙස සැලකිය නොහැකියි.

ඉඩම් පනතේ 60 වන වගන්තිය අනුව ජනාධිපතිවරයාට වෙරළබඩ ඉඩම් ගොඩකිරීමේ හැකියාව තිබෙනවා. මුහුද ගොඩකර ඉඩමක් නිර්මාණය කිරීම ද එය බදුදීමේ බලය ද ජනාධිපතිවරයාට තිබෙනවා. එබැවින් ලංකා භූමියට මෙම වරාය නගරය ඇතුළත් කර ගැනීම නීතියට පටහැනි බවට පෙත්සම්කරුවන් ඉදිරිපත් කරන තර්ක පදනම් විරහිතයි. එය නීතියට අනුකූලව කර තිබෙනවා.

කොළඹ නගරයේ බටහිර සීමාව මුහුදයි. එය වෙනස් වී නැහැ. ඡන්ද බලය හිමි ජනතාව වෙසෙන ප්‍රදේශයකට ඡන්ද බලය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක වෙනවා. නමුත් අනාගතයේදී ජනතාව පදිංචිවීමට කටයුතු කිරීමට යෝජිත ගොඩබිමකට අදාළව ඡන්ද බලය ගැන කතා කළ නොහැකියි.

මෙම පනත් කෙටුම්පත ඉවත් කර ඇත්තේ විශේෂ ආර්ථික කලාපයක් බිහිකිරීමටයි. එය බිහි කරන්නේ රජයේ මූලික ප්‍රතිපත්තියක් අනුවයි. එය පළාත් පාලන ලැයිස්තුවට අයත් වන්නේ නැහැ. එය මධ්‍යම රජයට අයත්.

අගවිනිසුරුවරයා

මෙම පනත් කෙටුම්පතෙහි කළ යුතු සංශෝධන කිහිපයක් පිළිබඳව සඳහන් කරමින් ජනාධිපති ලේකම්වරයා නීතිපතිවරයාට යැවූ ලිපියක් අධිකරණයට ලැබී තිබෙනවා. ඒ පිළිබඳව නීතිපතිගේ ස්ථාවරය දැනගැනීමට අධිකරණයට අවශ්‍යයයි.

විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන

ඒ පිළිබඳව නීතිපතිවරයාගේ ස්ථාවරය අධිකරණයට දැනුම් දෙන ලිපියක් අවශ්‍යයයි.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය

නීතිපතිවරයා මෙතෙක් කළේ තමන්ට ලැබෙන ලිපි අධිකරණයට යොමු කිරීමයි.

අගවිනිසුරුවරයා

මේ පිළිබඳ අර්ථ නිරූපණය ලබාදීමේදී සංශෝධන පිළිබඳව වැදගත්. ජනාධිපති ලේකම්වරයා නීතිපතිට යැවූ ලිපිය මත පදනම්ව අධිකරණයට එම අර්ථ නිරූපණ ලබාදිය නොහැකියි. නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන ලිපියක් අවශ්‍යයි.

අ.සො.ජනරාල්වරිය

අධිකරණයේ අවශ්‍යතාව එය නම් එය කිරීමට සූදානම්.

රජයේ මූල්‍ය පරිපාලනය පාර්ලිමේන්තුව සතු විය යුතුය යන්න 2008 දී විශේෂ පෙත්සමක් මඟින් අභියෝගයට ලක් කළා. ඒ අනුව මූල්‍ය උත්පාදන ක්‍රම එනම් බදු අය කිරීම් යනාදිය සහ රාජ්‍ය මුදල් වැය කිරීම සහ රජයේ මුදල් විගණනය යනාදිය රාජ්‍ය මූල්‍ය ලෙස සඳහන් කර තිබුණා.

එම කටයුතු සියල්ල එකින් එක පාර්ලිමේන්තුව විසින් සිදු කළ නොහැකි අවස්ථාවලදී ඒ සම්බන්ධ බලය විෂය භාර ඇමැතිවරයාට හෝ ඉහළ නිලධාරීන්ට ලැබෙනවා.

අගවිනිසුරුවරයා

මෙම පනත් කෙටුම්පත අනුව බදු සහන දීමේ බලය විෂය භාර ඇමැතිවරයාට තිබෙනවාද?

අ.සො. ජනරාල්වරිය

ඇමැතිවරයාට ඒ සඳහා වන රෙගුලාසි සකස් කළ හැකියි.

විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන

මෙම පනතට පක්ෂව පෙනී සිටින විවිධ නීතිවේදීන් විවිධ අදහස් පළ කරනවා. අධිකරණයට පැහැදිලි අදහසක් අවශ්‍යයයි. නීතිපතිවරයාගේ අදහස පැහැදිලි විය යුතුයි.

අගවිනිසුරුවරයා

අද උදෑසන අධිකරණයට නීතිවේදීන් දැනුම් දුන්නා මෙම රාජ්‍ය මූල්‍ය සම්බන්ධ වගන්ති සංශෝධන කිරීමට යෝජිත බව.

අ.සො.ජනරාල්වරිය

මට කරුණු ඉදිරිපත් කළ හැක්කේ පවතින පනත් කෙටුම්පත පිළිබඳවයි.

අගවිනිසුරුවරයා

අධිකරණයට මෙය ගැටලුකාරීයි. ඇතැම් නීතිවේදියෙක් සංශෝධන පිළිබඳව කතා කරද්දී තවත් නීතිවේදියෙක් එය අනවශ්‍ය බව පවසනවා. මෙම තත්ත්වය මත අධිකරණයට පැහැදිලි ස්ථාවරයකට පැමිණිය නොහැකියි. පැහැදිලි ස්ථාවරය දැක්වීම අවශ්‍යයයි. අදාළ සංශෝධන පිළිබඳව සටහන් තබාගෙන අතිරේක සොලිසිටර් ජනරාල්වරිය කරුණු දක්වනවා නම් හොඳයි.

ජ.නී. සුමන්තිරන් මහතා

පෙත්සම්කරුවන් කරුණු ඉදිරිපත් කළේ පවතින පනත් කෙටුම්පතටයි. දින හතරක් ගතවුවත් රජය අසමත්වී තිබෙනවා අදාළ සංශෝධන කවරේ ද යන්න පැවසීමට. එම සංශෝධන සම්බන්ධයෙන් ද පෙත්සම්කරුවන්ට කරුණු දැක්වීමට අවශ්‍යයයි

අගවිනිසුරුවරයා

ඒ සඳහා සීමිත අවස්ථාවක් දිය හැකියි.

අතිරේක සො. ජනරාල්වරිය

පනත් කෙටුම්පතට සිදු කරන සංශෝධන පිළිබඳව නීතිපතිවරයා හරහා දැනුවත් කිරීම සාමාන්‍ය ස්වභාවයයි. එහෙත් මෙහිදී එය වෙනස් වී තිබෙනවා.

අගවිනිසුරුවරයා

සීමිත කාලයක් සහිත වුවත් මේ තත්ත්වය යටතේ පෙත්සම් විභාගය තවදුරටත් කරගෙන යා නොහැකියි. අදාළ සංශෝධන පිළිබඳව අධ්‍යයන කර නීතිපතිවරයාගේ ස්ථාවරය හෙට උදෑසන අධිකරණයට දැනුම් දෙන්න.

පෙත්සම් විභාගය අද (23)ට කල් තැබිණි.

අන්තර්ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයක් මේ කලාපයේ ඉදි කිරීමට නියමිතයි

මේ පනත් කෙටුම්පත ඉවත් කර ඇත්තේ විශේෂ ආර්ථික කලාපයක් බිහි කිරීමටයි

මුහුද ගොඩ කර ඉඩමක් නිර්මාණය කිරීම ද එය බදු දීමේ බලය ද ජනාධිපතිවරයාට තිබෙනවා

පරිසරය සුරැකීම යනු ගහකොළ ආරක්ෂා කිරීම හෝ වැඩිපුර වගා කිරීම පමණක්ම නොවෙයි

ජගත් මිහිතල දින රුක් රෝපණ වැඩසටහනේදී පරිසර ඇමැති කියයි

බුද්ධිකා ඉඹුලාන සහ ආරියරත්න ගනේගොඩ

අපේ පාසල් පද්ධතියෙන් පමණක් දිනකට කාබන් පෑන් කිලෝ ග්‍රෑම් 80-100ක් අතර ප්‍රමාණයක් මුදාහරින අතර මෙරට සුපිරි වෙළෙඳසල් ජාලයෙන් වසරකට ෂොපින් බෑග් කෝටි 100ක් පාරිභෝගිකයන්ට නිකුත් කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා කියයි.

ලෝකයෙන්ම ලන්ච් ෂීට් භාවිතා කරන එකම රට ශ්‍රී ලංකාව බවත් දිනපතා ලන්ච් ෂීට් මිලියන 10ක් අපේ රටේ ජනතාව විසින් පරිසරයට එක් කරන බවත් ඇමැතිවරයා පවසයි.

මෙයින් සිදුවන පරිසර හානිය ගැන සමාජ මාධ්‍ය ඔස්සේ මෙන්ම ප්‍රධාන මාධ්‍ය ඔස්සේ කතා කිරීම ප්‍රමාණවත් නොවන බව තම අදහස යැයිද ඇමැතිවරයා අවධාරණය කරයි..

ජගත් මිහිතල දිනය නිමිත්තෙන් ඊයේ (22) පරිසර අමාත්‍යාංශය හා කොළඹ මහනගර සභාවේ සංවිධානයෙන් කොළඹ විහාරමහා දේවි උද්‍යානයේදී පැවැත්වූ රුක් රෝපණ වැඩසටහනේදී ඇමැතිවරයා මේ බැව් අනාවරණය කළේය.

එම උද්‍යානයේ අපේ රටේ වඳ වෙමින් යන දුර්ලභ පලතුරු ඇතුළත් පලතුරු උයනක් ස්ථාපිත කිරීම ද ඊයේ (22) පෙරවරුවේ දී සිදු කෙරිණි.

මෙහිදී ඇමැතිවරයා පෙන්වා දුන්නේ පරිසරය සුරැකීම යනු වෘක්ෂලතා ආරක්ෂා කිරීම හෝ ඒවා වැඩිපුර වගා කිරීම හෝ පමණක් නොවන බවයි.

ජගත් මිහිතල දිනයේ 51 වන සැමරුම අදට යෙදී තිබෙනවා. මේ දිනය සමරමින් පරිසර අමාත්‍යාංශය හා කොළඹ මහනගර සභාව විසින් සංවිධාන කරන ලද මේ පලතුරු උද්‍යානය ස්ථාපිත කිරීම ඉතා වැදගත්. අපේ ගමේ ගොඩේ වැවුණු පලතුරු රැසක් මේ උද්‍යානයේ තිබෙනවා. හිඟුටු වැනි දේශීය පලතුරු වර්තමානයේ දරුවන්ට දකින්න ලැබෙන්නේ පින්තූරවලින් පමණයි.

අද බොහෝ දෙනෙක් සිතන්නේ පරිසරය සුරැකීම යනු ගස්වැල් රෝපණය කිරීම පමණයි කියායි. නමුත් අද මුළු ලෝකයටම බරපතළ තර්ජනයක් ප්ලාස්ටික් හා පොලිතීන් මගින් එල්ල වෙනවා. ලෝකයෙන්ම ලන්ච් ෂීට් පාවිච්චි කරන එකම රට අපේ රටයි. අපේ රටේ ජනගහනය මිලියන 21ක්. දිනපතා ලන්ච් ෂීට් මිලියන 10ක් අපේ රටේ ජනතාව විසින් පරිසරයට එක් කරනවා.

ඒ වගේම ෂොපිං බෑග් වසරකට බිලියනයක් අපේ පරිසරයට මුදාහරින බව සුපිරි වෙළෙඳසල් ජාලය තහවුරු කරනවා. ඒ කොයි හැටි වුණත් මේ සියල්ල එක්වෙන්නේ අපේ ගංගා ඇළදොළවලට. අවසානයේ මහා සාගරයට. ඒ නිසා මිහිතලය සුරැකීමට අපි හැම දෙනාටම විශාල වගකීමක් තිබෙනවා. අපි අරඹන ලද හුස්ම දෙනතුරු වැඩසටහන යටතේ රුක් රෝපණය කරනවා. ඒ වගේම නීතියක් නොව විනයක් වැඩ පිළිවෙළ යටතේ ඉවත ලන කාබන් පෑන් හා දත් බුරුසු එකතු කිරීමට අපි විශේෂ බහාළුමක් හඳුන්වා දුන්නා.

සමහර විට ඔබ නොදන්නවා වුණත් ඉවත ලන කාබන් පෑන් නිසා විශාල පරිසර හානියක් සිදුවෙනවා. අපේ පාසල් පද්ධතියෙන් පමණක් දිනකට කාබන් පෑන් කිලෝ ග්‍රෑම් 80-100ක් අතර ප්‍රමාණයක් මුදාහරිනවා.

ඒ නිසා තමයි මම ප්ලාස්ටික් හා පොලිතීන් නිෂ්පාදන වර්ග කීපයක් තහනම් කිරීමට පියවර ගත්තේ. ඇත්තටම එම තීන්දුව ඓතිහාසිකයි. මින් පෙර කිසිම පරිසර ඇමැතිවරයෙක් මේ කාරණයට අත ගැහුවේ නැහැ. මම දන්නවා තව මාස කීපයකින් සැෂේ පැකට් අලෙවිය අපේ රටෙන් තුරන් කෙරෙනවා.

කොළඹ නාගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය -

කොළඹ නගරයට දිනකට ලක්ෂ 10ක් පමණ මිනිසුන් පිරිසක් පැමිණෙන බවත්, ඒ හා සමාන වාහන ප්‍රමාණයක් කොළඹ නගරයට ඇතුළුවීම නිසා සිදුවන පාරිසරික දූෂණය ඉතා ඉහළ අගයක් ගන්නා බවත් පැවසුවාය.

ඒ නිසා කොළඹ නගර සභාව හා පරිසර අමාත්‍යාංශය එක්ව කොළඹ නගර සභා බල සීමාවේ පැළ ලක්ෂයක් රෝපණය කිරීම ඊයේ (22) ආරම්භ කර බව ද ඇය පැවසුවාය.මෙහිදී ඇමැතිවරයා අතින් කාබන් පෑන් හා දත්බුරුසු බහලුම් බෙදා දීම සිදු විය.

කොළඹ නගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය, අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, විදේශ තානාපතිවරුන්, ඇතුළු ප්‍රභූන් රැසක් ද මේ අවස්ථාවට සහභාගි වූහ.

බළන්ගොඩ මහවලතැන්නට පිවිසෙන මඟ පිළිසකර කෙරේ

අනුර ප්‍රේමලාල්

ලෝකයේ ප්‍රථම අගමැතිනිය වූ දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය උපන්ගම වූ බළන්ගොඩ මහවලතැන්නට පිවිසෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කෙරේ.

එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම පෙරේදා (21) ආරම්භ කෙරිණි. මහවලතැන්න චන්දසේකර මුදලින්දාරාම මහා විහාරාධිපති නායක මාහිම්පාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මහතාගේ මෙහෙයවීමෙන්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ හා බලංගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති සුනිල් ප්‍රේමසිරි මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කෙරිණි.

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී සචින්ත කේෂාන් මහතා ඇතුළු ප්‍රදේශවාසීහු පිරිසක් මේ අවස්ථාවට එක්වූහ.

අඩුආදායම්ලාභී පාසල් ළමයින්ට පාසල් උපකරණ බෙදා දීමක්...

Korea Cavitation ආයතනයේ පූර්ණ අනුග්‍රහයෙන් කොටහේන ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පාසල් ළමයින්ට පාසල් උපකරණ බෙදාදීමක් පෙරේදා (21) පස්වරුවේ කොටහේන නගරය කේන්ද්‍රගතව පැවැත්විණි. ප්‍රකට ව්‍යාපාරික KCL මෙටරෝලින්ක් ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය පී.ආර්. එල්. මයිකල් මහතාගේ ධන පරිත්‍යාගයෙන් සහ සංවිධාන ශක්තියෙන් වැඩසටහන ක්‍රියාත්මක වූ අතර කොටහේන ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පවුල් 150ක දරු දරියන්ට මේ ඔස්සේ ත්‍යාග ප්‍රදානය කිරීම ආරාධිතයන් අතින් සිදු කෙරිණි. උත්සවයේ ආරාධිත අමුත්තන් ලෙස අගමැති සම්බන්ධීකරණ ලේකම් සුගත් හේවාපතිරණ, පාර්ලිමේන්තු මන්ත්‍රී කුලසිංගම් දිලීපන්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බිලුමැන්ඩල් සංවිධායිකා එම්. සයුරි කාවින්දි ප්‍රනාන්දු සහ මානව හිමිකම් ක්‍රියාකාරි ආර්. ඒ. පත්මනාදන් මහත්ම මහත්මීහු මේ අවස්ථාවට සහභාගි වූහ.

ඡායාරූප -තුෂාර ප්‍රනාන්දු

S-lon සමාගම COVID-19 සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය හිමි කර ගනී

ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන S-lon Lanka (පුද්.) සමාගම පසුගිය දා COVID-19 සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණය හෙවත් SLS 1672:2020 සහතිකකරණය හිමි කර ගැනීමට සමත් විය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පැවති උත්සවයකදී එහි සභාපති නුෂාඩ් පෙරේරා මහතා විසින් මෙම සහතිකකරණය S-lon සමූහ අධ්‍යක්ෂ එස්. සී. වීරසේකර මහතා වෙත නිල වශයෙන් පිරිනමන ලදි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහ S-lon Lanka (පුද්.) සමාගමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට එක් වූහ. මෙම සහතිකකරණය හඳුන්වා දීමට බලපෑ හේතු පැහැදිලි කළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සභාපතිතුමන්, COVID-19 සම්බන්ධයෙන් අදාළ සියලුම විධිවිධාන හා මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිය සේවක සේවිකාවන් අතර මෙන්ම සමාජය තුළ ද වයිරසය පැතිර යාමේ අවදානම අවම කිරීම සඳහා S-lon ආයතනය දක්වන උනන්දුව අගය කළේය. මෙම ආරක්ෂක විධිවිධාන තම කර්මාන්තශාලා පරිශ්‍රයන් තුළ මෙන්ම කාර්යාලයීය පරිශ්‍රයන් තුළ ද ක්‍රියාත්මක කිරීමට Slon ආයතනය කටයුතු කර ඇත.

"S-lon යනු ඉතාමත් සංවේදී ක්ෂේත්‍රයක් වන ජල සම්පාදන ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන සිදු කරන සමාගමකි. ඒ නිසා මෙම සහතිකකරණය S-lon සන්නාමය සමඟ සම්බන්ධතා පවත්වන සැමගේ මෙන්ම මුළුමහත් රටේම විශ්වාසය තහවුරු කරන සාධකයක් ලෙස හැඳින්වීමට පුළුවන්. මෙය රට තුළ COVID-19 පැතිරීම පාලනය කිරීම සඳහා නිසි ආරක්ෂක විධිවිධාන අනුගමනය කරමින් මෙම සහතිකකරණය හිමි කර ගැනීම සඳහා අනෙකුත් සමාගම් හා ආයතන ද දිරිගන්වන ආදර්ශවත් පියවරක් වනු ඇතැයි කියා අප විශ්වාස කරනවා."

යැයි නිෂාඩ් පෙරේරා මහතා වැඩිදුරටත් පැවසී ය.

"පාරිභෝගිකයන් මෙන්ම අප කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව වෙනුවෙන් කැපවී සිටින සමාගමක් ලෙස අප කල්තබාම නිසි ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කර තිබූ නිසා අපට මේ සහතිකකරණය ලබාගැනීමේ ක්‍රියාවලිය ඉතාමත් පහසු වුණා. වයිරසයේ පැතිරීම පාලනය කිරීම සඳහා ආයතනික මට්ටමින් මෙන්ම පෞද්ගලික මට්ටමින් නොපමාව නිසි පියවර ගැනීම වෙනුවෙන් මා කළ මනාකාරිත්වයටත් සියලුම සේවක සේවිකාවන්ටත් ස්තූතිවන්ත වෙනවා." S-lon Lanka (පුද්.) සමාගම වෙනුවෙන් අදහස් දක්වමින් එස්. සී. වීරසේකර මහතා පැවසීය. 1957 වසරේදී ආරම්භ කරන ලද S-lon Lanka (පුද්.) සමාගම,කැපිටල් මහරාජා සමූහ ව්‍යාපාරයට අනුබද්ධ සමාගමකි.

දේශීය ව්‍යවසායකයන් ශක්තිමත් කරන්නට Daraz වෙතින් "Seller Promises 2021"

දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛතම විද්‍යුත් වාණිජ වෙබ් අඩවි ජාලය වන Daraz, දේශීය ව්‍යවසායකයන් තවදුරටත් ශක්තිමත් කරමින් ඉදිරි මාස කිහිපය ඇතුළත විශේෂ සහය සේවා රැසක් ක්‍රියාත්මක කරන බව පසුගියදා නිවේදනය කළේය. අන්තර්ජාලය ඔස්සේ පසුගියදා පැවැති විශේෂ සාකච්ඡාවකදී Daraz Group ප්‍රධාන විධායක නිලධාරී Bjarke Mikkelsen මහතා විසින් Daraz සමග ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ ලබමින් එක්ව සිටින අලෙවිකරුවන්ගේ අඛණ්ඩ වර්ධනය හා සමගාමීව අදාළ කලාපයේ ආර්ථික සංවර්ධනය සිදු වන ආකාරය පැහැදිලි කළේ ය.

Mikkelsen මහතා අදහස් දක්වමින් "විකුණුම්කරුවන් Daraz අපගේ හදවත යැයි කිව්වොත් වඩා නිවැරදියි. 2021 වසරේ අපගේ ප්‍රධාන ඉලක්කය පහසු හා කඩිනම් Sign හත ක්‍රියාවලියක් ඇති කිරීම, ඉක්මනින් විකුණුම් ආරම්භ කිරීම සහ අන්තර්ජාලයේ ඔවුන්ගේ ව්‍යාපාර ස්ථාවර මට්ටමක් දක්වා ගොඩනැංවීමයි. 2021 වසරේදී අප සමග එක්ව සිටින විකුණුම්කරුවන් මූලික මට්ටමේ සිට වෘත්තීමය සාර්ථක අලෙවිකරුවන්ගේ මට්ටමට රැගෙන එන පොරොන්දුව Seller Promises 2021 වැඩපිළිවෙලයි." යැයි පැවසීය.

Daraz ප්‍රධාන විධායක නිලධාරියා විසින් නිකුත් කළ නිවේදනයේ ඇතුළත් මූලික කරුණු අතර,

1. පහසු හා කඩිනම් signing හත ක්‍රියාවලියක් සමග නව අලෙවිකරුවන්ට පැය 24ක් ඇතළත තම විකුණුම් ඇරඹීමේ හැකියාව

2. විකුණුම්කරුවන් වෙනුවෙන් පෙර පැවැති දින 14 ගෙවීම් ක්‍රමවේදය දින 7 දක්වා අඩු කිරීම

3. කාර්යාලීය වේලාවන් තුළදී live chat පහසුකම හරහා විකුණුම්කරුවන් විසින් යොමු කරන ගැටලු සඳහා තත්පර 30 ක කාලයක් ඇතුළතදී පිළිතුරු දීමේ කඩිනම් සේවාව ඇරඹීම

4. අපේක්ෂිත විකුණුම් ඉලක්ක සපුරාගත නොහැකි විකුණුම්කරුවන් පිළිබඳ විශේෂ අවධානය යොමු කොට ඔවුන්ගේ ව්‍යාපාරික ගැටලු විසඳ ගැනීමට විශේෂ සහය සේවා ලබා දීම

5.claim පහසුකම අවශ්‍ය විටෙකදී පෙරටත් වඩා පහසු හා කඩිනම් සේවාවක් ලබා දීම විශේෂයෙන් කැපී පෙනෙයි.

මෙම ක්‍රියාවලීන් හා අඛණ්ඩ ආයෝජන කටයුතු සමග ගනුදෙනුකරුවන්ගේ ප්‍රමාණය ඉහළ නංවා ගනිමින්, විකුණුම්කරුවන්ගේ ප්‍රමාණය ද දෙගුණ කර ගනිමින් ඔවුන් හරහා ඩොලර් 1000 කට අධික මාසික ආදායමක් මේ වසර අවසානයට පෙර ළඟා කර ගැනීමට Daraz අපේක්ෂා කරයි.

COVID සමග සාමාන්‍ය විකුණුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණයකට ලක්ව විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රයේ ඇති වූ නව පිබිදීමත් සමග සෑම මාසයකදීම Daraz සමග සිය දහස් ගණනින් ව්‍යවසායකයන් එක් වෙමින් සිටියි. කෙසේ වුවද මේ කලාපය තුළ අන්තර්ජාලගත අලෙවිකරණ වෙළෙඳපොළ ප්‍රතිශතය තවමත් පහළ මට්ටමක පවතින බවත් දකුණු ආසියානු කලාපය ඉදිරියේදී ශීඝ්‍රයෙන් දියුණු මට්ටමකට පැමිණීමට නියමිත බවත් Daraz සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී Bjarke Mikkelsen මහතා පැවසීය. වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා "විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රය හා එක්ව සිටින අපි සියලු දෙනා මේ ගත කරන්නේ ඉතාමත් තීරණාත්මක කාල සීමාවක්. COVID සමග ඇති වූ ආර්ථික තත්ත්වය වටහා ගනිමින් ක්‍රියා කළ අපට 2021 වසර විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රයේ ස්වර්ණමය වසර බවට පත් කරගන්නට පුළුවන්. ඒ වෙනුවෙන්, අප පිළිබඳ විශ්වාසයෙන් රැඳී සිටින අපගේ හදවත බඳු වටිනා විකුණුම්කරුවන් ශක්තිමත් කරන්නට අපගේ උපරිම දායකත්වය දෙනවා." යැයි පැවසීය.

Daraz ශ්‍රී ලංකා වෙනුවෙන් අදහස් දැක්වූ එහි කළමනාකාර අධ්‍යක්ෂ රබිල් ප්‍රනාන්දු මහතා "Daraz ශක්තිමත් කරමින් අප සමග රැඳී සිටින කොටස්කරුවන් හා විකුණුම්කරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් අපි විශේෂ අවධානයක් සැමවිටම යොමුකරනවා. ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරලීම, ඔවුන්ගේ ගැටලු සඳහා පිළියම් ලබා දීම හරහා ඔවුන් මෙන්ම Daraz ජාලයත් ශක්තිමත් වෙනවා. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයටත්, අප කලාපය තුළ සමස්ත විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙනුත් මේ වන විටත් විශාල දායකත්වයක් සපයන්නට Daraz අපට හැකිව තිබෙන අතර, 2021 වසර වෙනුවෙන් අප ක්‍රියාත්මක කරනු ලබන Seller Promises 2021 වැඩපිළිවෙල සමග Daraz කණ්ඩායමටත් අප හා එක්ව සිටින විකුණුම්කරුවන්ටත් අපේ රටේ විද්‍යුත් වාණිජ ක්ෂේත්‍රයටත් ප්‍රතිලාභ රැසක් හිමිවෙනවා." යැයි පැවසීය.

Daraz සතුව ඇති අති නවීන තාක්ෂණය, භාණ්ඩ බෙදාහැරීමේ විධිමත් ක්‍රමවේදය හා ව්‍යවසායකයන් වෙත ලබාදෙන ව්‍යවසායක යටිතල පහසුකම් සියල්ල සමග "Seller Promises 2021" සාර්ථකව ඉටු කර ගනිමින් විකුණුම්කරුවන්ටත් ශ්‍රී ලාංකීය ආර්ථිකයටත් දැවැන්ත සවියක් වන්නට විවපවල කැපව සිටියි.

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය ජාත්‍යන්තරයට රැගෙන යෑමට විශේෂ වැඩපිළිවෙළක්

ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය (SLGJA) විසින් සංවිධානය කළ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය සම්බන්ධ ප්‍රධාන විද්වත් සමූළුවේ දෙවන රැස්වීම පසුගියදා සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා, SLGJA සභාපති අත්සාන් රිෆායි සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන බියුරෝවේ සභාපතිනිය කිමාලි ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සාර්ථකත්වය උදෙසා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන බියුරෝව සමග අත්වැල් බැඳ ගැනීම අරමුණු කර ගත් මෙම අවස්ථාවට SLGJA විධායක සාමාජිකයන්, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ (NGJA) නියෝජිතයන් හා දේශීය මැණික් ව්‍යාපාරිකයන් රැසක් සහභාගි වූහ.

SLGJA සභාපති අත්සාන් රිෆායි මහතා මැණික් හා ස්වර්ණාභරණ අපනයනය සම්බන්ධ කාර්ය සාධක කමිටු රැස්වීමේදී අදහස් දක්වමින් "පරම්පරා ගණනාවක් තිස්සේ අපේ රටෙන් හමුවන නිල් මැණික් ඇතුළු මැණික් සම්පතට ලෝකයේ ඉහළ පිළිගැනීමක් ලැබී තිබෙනවා. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග එක්ව ප්‍රවර්ධන කටයුතු ඇරඹීමට හැකිවීම අපේ රටේ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ දියුණුවට ඉමහත් ශක්තියක්. ශ්‍රී ලංකාවේ ස්වභාවික සෞන්දර්යය පිළිබඳ දැනුවත්ව එය තැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අපේ රටේ මැණික් පතල් ආශ්‍රිත ක්‍රියාවලිය දැක බලාගන්නටත් උසස් තත්වයේ මැණික් හා ස්වර්ණාභරණ මිල දී ගැනීමටත් ආකර්ෂණය කරගැනීමට එමගින් හැකි වෙනවා. ලොව වටා සංචාරය කරමින් ඒ ඒ රටවලට අනන්‍ය වූ භාණ්ඩ මිල දී ගැනීමට උනන්දුවක් දක්වන සංචාරකයන් හා මැණික් ආශ්‍රිත නිෂ්පාදනයන්ට විශේෂ උනන්දුවක් දක්වන විදේශිකයන් ශ්‍රී ලංකාවේ නිල් මැණික් කෙරෙහි ආකර්ෂණය වන ආකාරයෙන් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය ශක්තිමත් කළ හැකිය." යැයි පැවසීය.

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන බියුරෝවේ සභාපතිනිය කිමාලි ප්‍රනාන්දු මහත්මිය වෙත ශ්‍රී ලංකාවේ මැණික් පිළිබඳ ප්‍රවර්ධනය සඳහා නිකුත් කරන ලද 'Sri Lanka Gems' පොත පිළිගන්වමින්

සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා අදහස් දක්වමින් "අපේ රටේ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය රැක ගැනීමත් ප්‍රවර්ධනය කිරීමත් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ අප සියලු දෙනාගේ වගකීමක්. අපේ රටේ සුන්දරත්වය ප්‍රවර්ධනය කරමින් සංචාරකයන් මෙරටට ආකර්ෂණය කරගැනීමෙහිලා අප ක්‍රියාත්මක කොට ඇති වැඩපිළිවෙල තුළදී මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයද ප්‍රවර්ධනය වන ආකාරයෙන් විශේෂයෙන් කටයුතු කිරීමට අප සැලසුම් සකස් කොට තිබෙනවා." යැයි පැවසීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන බියුරෝව වෙනුවෙන් එහි සභාපතිනිය කිමාලි ප්‍රනාන්දු මහත්මිය සිය අදහස් දක්වමින් සංචාරක ක්ෂේත්‍රයත් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයත් එකිනෙක ඒකාබද්ධ වෙමින් කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළාය. මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා අදහස් දක්වමින් "මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා විශේෂ අවධානයක් යොමු කළ ගරු සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාටත් එතුමාගේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයටත් මා බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. එහිදී අපේ රටේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ දියුණුවට සමගාමීව සංචාරක ව්‍යාපාරයේ වර්ධනයක් සිදුවන නිසා මේ සමග රැඳී සිටින සියලුම පාර්ශ්ව වලට ප්‍රතිලාභ රැසක් හිමිවෙනවා." යැයි පැවසීය.

"FACETS" ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේ සභාපති අල්තාෆ් ඉක්බාල් මහතා අදහස් දක්වමින් "පවතින තත්වය අනුව 2022 වසරේ ජනවාරි මාසයේදී FACETS වෙළෙඳ ප්‍රදර්ශනය පවත්වන්නට හැකිවනු ඇතැයි අප විශ්වාස කරනවා. FACETS වෙළෙඳ ප්‍රදර්ශනයට විශාල වශයෙන් විදේශීය ගැනුම්කරුවන් පැමිණෙන නිසා එය අපේ රටේ සංචාරක කර්මාන්තයටත් සැබෑ අත්වැලක් සපයනවා.." යැයි පැවසීය.

SLGJA ස්වර්ණාභරණ අංශයේ උප සභාපති අතුම් කාසිම් මහතා අදහස් දක්වමින් "මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සමග බැඳුනු ශ්‍රී ලංකා ඉතිහාසයේ අතීත ශ්‍රී විභූතියත් වටිනාකමත් ගැන සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් තුළදී අන්තර්ගත කිරීම ඉතා වැදගත්. නිල් මැණික් සඳහා ලොව සුපතල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවර්ධනය කිරීම හරහා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සංචාරකයන් අපේ රටට වැඩි වැඩියෙන් ගෙන්වාගැනීමට මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අපත් සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ සියලු දෙනාත් එක්ව අත්වැල් බැඳ ගැනීමෙන් දෙපාර්ශවයටත් රටටත් ප්‍රතිලාභ රැසක් සැලසෙනවා. " යැයි පැවසීය.

ක්‍රීඩා SPORTS

sports.dinamina@lakehouse.lk

නප්මුල් සහ මොමිනුල්ගෙන් ද්විත්ව ශතක සබඳතාවක්

බංග්ලාදේශ පළමු ඉනිම කඩුලු 4කට ලකුණු 474යි

ද්විත්ව ශතක සබඳතාවක් එක් කළ නප්මුල් සහ මොමිනුල්

නප්මුල් හොසේන් ෂැන්ටෝ සහ නායක මොමිනුල් හක්ගේ වාර්තාගත සබඳතාව හේතුවෙන් ශ්‍රී ලංකා කණ්ඩායම සමඟ පල්ලේකැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පැවැත්වෙන පළමු ටෙස්ට් තරගයේ දෙවැනි දිනය නිමා වන විට පළමු ඉනිම සඳහා ලකුණු 474ක් රැස් කිරීමට සංචාරක බංග්ලාදේශ කණ්ඩායම සමත් වූයේ කඩුලු 4ක් පමණක් අහිමි කර ගනිමිනි.

අයහපත් ආලෝක තත්ත්වය හේතුවෙන් ඊයේ පස්වරු 4.00ට පමණ ක්‍රීඩාව නතර කිරීමට සිදු වූ අතර, එම නිසා ඔවර 25ක් පමණ තරගයට අහිමි විය. ඒ වන විට මුෂ්ෆිකුර් රහීම් ලකුණු 43ක් සහ ලිටන් දාස් ලකුණු 25ක් රැස් කරමින් නොදැවී කඩුල්ලේ රැඳී සිටියේ 5 වැනි කඩුල්ලට ලකුණු 50ක සබඳතාවක් සමඟිනි.

පන්දු 107කට මුහුණ දුන් රහීම් හතරේ පහර 4ක් එල්ල කළ අතර, දාස් හතරේ පහර 2ක් සහ හයේ පහරක් ඉනිමට එක් කර ගත්තේ පන්දු 39කිනි.

තෙවැනි කඩුල්ලට ලකුණු 150ක නොබිඳුණු සබඳතාවක් සමඟින් ඊයේ තරගය ආරම්භ කළ නප්මුල් හොසේන් සහ මොමිනුල් හක් දිවා විවේකය වන විටත් එම සබඳතාව බිඳ දැමීමට ශ්‍රී ලංකා පන්දු යවන්නට අවස්ථාවක් නොදෙමින් තවත් ලකුණු 76ක් ඉනිමට එක් කර ගත්හ.

දිවා විවේකයෙන් අනතුරුව යැවූ 7 වැනි ඕවරයෙන් පළමු පන්දුවෙන් එම සබඳතාව නිමා කිරීමට ළහිරු කුමාර සමත් වූයේ ඔහු විසින් නප්මුල්ගේ පිත්තෙන් ඇදී ආ උඩ පන්දුව රැක ගැනීමෙනි. මුළු ලකුණු 394දී තෙවැනි කඩුල්ල ලෙස නප්මුල් දැවී යන විට මොමිනුල් සමඟින් ගොඩනඟා තිබූ සබඳතාව ලකුණු 242කි. එය බංග්ලාදේශ පිතිකරුවන් දෙදෙනකු විසින් තෙවැනි කඩුල්ල සඳහා එක් කළ ඉහළම සබඳතාව ලෙස ද වාර්තා අතරට එක් විය. ඉන් පෙර 2018 වසරේ චිතගොංහිදී මොමිනුල් සහ මුස්ෆිකුර් රහීම් තෙවැනි කඩුල්ලට ලකුණු 236ක් එක් කර තිබුණේ ද ශ්‍රී ලංකා පිලට එරෙහිවය. මිනින්තු 531ක් කඩුල්ලේ රැඳී සිටි නප්මුල් ලකුණු 163ක් රැස් කළේ හතරේ පහර 17ක් සහ හයේ පහරක් සමඟිනි. ඒ සඳහා ඔහු පන්දු 378කට මුහුණදී තිබිණි.

තවත් ලකුණු 30ක් එක් කර ගැනීමෙන් පසු මොමිනුල් පිටියෙන් ඉවත් කිරීමට ධනංජය ද සිල්වාට හැකි වූයේ ළහිරු තිරිමාන්න උඩ පන්දුවක් රැක ගැනීම හේතුවෙනි. පන්දු 304කට මුහුණ දුන් මොමිනුල් සිය ටෙස්ට් දිවියේ 11 වැනි ශතකය ලෙස ලකුණු 127ක් රැස් කළේ හතරේ පහර 11ක් සමඟිනි.

පස්වරු 3.10ට පමණ ක්‍රීඩාංගණයට වර්ෂාව පතිත වීමෙන් මිනිත්තු 10ක් පමණ තරගය නතර විය.

අද තරගයේ තෙවැනි දිනයයි.

බංග්ලාදේශ පළමු ඉනිම

ටී. ඉක්බාල් ඇ.තිරිමාන්න ප.විශ්ව	90
එස්. හසන් ක.මු.ක. ප.විශ්ව	0
එන්. ෂැන්ටෝ ඇ. සහ ප.කුමාර	163
එම්. හක් ඇ.තිරිමාන්න ප.සිල්වා	127
එම්. රහීම් නොදැවී	43
එල්. දාස් නොදැවී	25
අතිරේක	26
එකතුව කඩුලු 4ක් දැවී (ඕවර 155)	**474**

කඩුලු බිඳ වැටීම: 1-8, 2-152, 3-394, 4-424

පන්දු යැවීම: ලක්මාල් 31-12-74-0, වි. ප්‍රනාන්දු 28-8-75-2, කුමාර 28-4-88-1, මැතිව්ස් 7-1-14-0, සිල්වා 27-1-112-1, හසරංග 33-2-94-0, කරුණාරත්න 1-0-6-0.

තරුණ සේවා-රූපවාහිනී වොලිබෝල් ජාතික මට්ටමේ තරග අද-හෙට

ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය සහ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශ එක්ව සංවිධාන කරන 34 වැනි "තරුණ සේවා-රූපවාහිනී" අභියෝග ශූරතා වොලිබෝල් තරගාවලියේ ජාතික මට්ටමේ මූලික තරග (23) සහ හෙට (24) ගම්පහ මහා නගර සභා ක්‍රීඩාංගණයේදී හා තරුණ සේවා සභාවේ තරුණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන (සුමේධ) ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

ශ්‍රී ලංකාව පුරා විසිරි පැතිර සිටින යෞවන සමාජ තරුණ තරුණියන් උදෙසා වූ මේ අභියෝග ශූරතා තරගාවලිය සඳහා දිස්ත්‍රික්ක 26 නියෝජනය කරමින් කාන්තා හා පිරිමි කණ්ඩායම් 26 බැගින් සහභාගි වීමට නියමිත බව ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්/ සභාපති දමිත වික්‍රමසිංහ මහතා පැවසීය.

මෙහි සමාරම්භක උලෙළ අද පෙ.ව 8.30ට ප්‍රදේශයේ මැති ඇමතිවරුන්ගේ හා ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්/ සභාපති දමිත වික්‍රමසිංහ, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් අජිත් නාරගල සහ සභාපති වෛද්‍ය නිහාල් ජයතිලක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ගම්පහ මහා නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

ෆස්ට් ඩු ජ්ලෙසිස්

චෙන්නායි දිනයි

අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ 15 වැනි තරගයෙන් කොල්කටා නයිට් රයිඩර්ස් කණ්ඩායමට එරෙහිව ලකුණු 18ක ජයක් හිමි කර ගැනීමට චෙන්නායි සුපර් කිංග්ස් පිල සමත් විය.

මුම්බායිහිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් චෙන්නායි පිල ලකුණු 220ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹා ගිය කොල්කටා පිලට 19.1කදී සියල්ලන් දෙනා දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 202ක් පමණි. කොල්කටා ඉනිමේ මුල් කඩුලු 5 ලකුණු 31ක් තුළ බිඳ වැටුණු අතර, ඇන්ඩ්‍රි රසල් සහ පැට් කමින්ස් වේගවත් පිතිහරඔයක නිරත වෙමින් කණ්ඩායම ජයග්‍රහණය කරා ගෙන යෑමට උත්සාහ කළද එය අසාර්ථක විණි.

රසල් පන්දු 22කින් ලකුණු 54ක් සහ කමින්ස් පන්දු 34කදී නොදැවී ලකුණු 66ක් රැස් කළ අතර, පන්දු යැවීමේදී දීපක් චහාර් කඩුලු 4ක් සහ ලුන්ගි එන්ගිඩි කඩුලු 3ක් දවා ගත්තේය.

චෙන්නායි ඉනිමට වේගවත් ආරම්භයක් දුන් ෆෆ් ඩු ප්ලෙසිස් නොදැවී ලකුණු 90ක් රැස් කළ අතර, ඔහුට අනගි සහායක් දුන් රුටුරාජ් ගයික්වාඩ් ලකුණු 64ක් රැස් කළේය. හතරේ පහර 9ක් සහ හයේ පහර 4ක් එල්ල කළ ප්ලෙසිස් පන්දු 60කට මුහුණ දුන් අතර, ගයික්වාඩ් පන්දු 42කදී හතරේ පහර 6ක් සහ හයේ පහර 4ක් ඉනිමට එක් කර ගෙන තිබිණි.

මේ අතර, මේ තරගයේ නියමිත කාලය තුළ ඕවර සංඛ්‍යාව සම්පූර්ණ නොකිරීම හේතුවෙන් කොල්කටා පිලේ නායක ඔයින් මෝගන්ට ඉන්දීය රුපියල් ලක්ෂ 12ක දඩයක් නියම කෙරිණි.

අයිපීඑල් චර්යාධර්ම සංග්‍රහය යටතේ කොල්කාටා පිල සිදු කළ පළමු වරද මෙය වන අතර, මෙය පළමු අවස්ථාව බැවින් ලක්ෂ 12ක දඩයක් නියම කෙරුණ ද එම වරද දෙවැනි වරටත් සිදු කළ හොත් නායකයාට දඩ මුදල දෙගුණයක් (ලක්ෂ 24ක්) වන අතර, කණ්ඩායමේ සෙසු ක්‍රීඩකයන්ට තරග ගාස්තුවෙන් සියයට 25ක් හෝ ඉන්දීය රුපියල් ලක්ෂ 6ක දඩයක් නියම කෙරේ.

මින් පෙර තරගාවලියේ 13 වැනි තරගයේදී මුම්බායි ඉන්දියන්ස් නායක රෝහිත් ශර්මාට ද මේ වරද හේතුවෙන් ඉන්දීය රුපියල් ලක්ෂ 12ක දඩයක් නියම කෙරිණි.

බාබර් විස්සයි20නුත් උඩ එයි

අන්තර්ජාතික විස්සයි20 ක්‍රිකට් පිටියේ නවතම පිතිකරුවන් ශ්‍රේණිගත කිරීම් අනුව දෙවැනි ස්ථානය දක්වා ඉහළට ඒමට පාකිස්තාන නායක බාබර් අසාම් සමත් වෙයි.

අයිසීසී නව ශ්‍රේණිගත කිරීම් අනුව බාබර් ප්‍රසාද ලකුණු 844ක් රැස් කර ගෙන ඇති අතර, පළමු ස්ථානයේ සිටින එංගලන්ත පිතිකරු ඩේවිඩ් මාලන් සතුව ඇති ප්‍රසාද ලකුණු සංඛ්‍යාව 892කි.

කෙසේ වෙතත් සිම්බාබ්වේ පිල සමඟ මේ දිනවල පැවැත්වෙන තරගාවලියෙන් බාබර්ට ඉදිරිය යෑමට අවස්ථාවක් තිබේ. එහෙත් තරග 3කින් සමන්විත එම තරගාවලියේ පෙරේදා පැවැති පළමු තරගයේදී ඔහුට රැස් කළ හැකි වූයේ ලකුණු 2ක් පමණි.

මින් පෙර ජගත් එක්දින ක්‍රිකට් පිටියේ පිතිකරුවන් ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණ ගැනීමට ද බාබර් අසාම් සමත් විය. එහිදී ඔහු ප්‍රසාද ලකුණු 865ක් හිමි කර ගත්තේ වෘත්තීය ක්‍රිකට් දිවියේ ඉහළම ලකුණු ලෙසිනි.

42 වැනි OBSERVER – SLT - MOBITEL

වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සම්මාන උළෙල

"ප්‍රතිභාව හඳුනාගනිමින් - ශ්‍රේෂ්ඨත්වය කරා..."

2021 අප්‍රේල් මස 21 වැනි දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්වුණු 42 වැනි ඔබ්සවර් - එස්.එල්.ටී - මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩක සම්මාන උළෙල 2021 අප්‍රේල් මස 25 වැනි දින ඉරිදා රාත්‍රී 10.15 ට ස්වාධීන රූපවාහිනී සේවයෙන් විකාශනය කෙරේ.

1979 වසරේ සිට සියලුම පසුගිය ජයග්‍රාහකයින් පිළිබඳ මතක සටහන් රැසක් සමඟ ඔප කඩදාසියේ මුද්‍රිත වර්ණ පිටු 16 ක සුවිශේෂ සැමරුම් අතිරේකය 42 වැනි ඔබ්සවර් - එස්.එල්.ටී - මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උළෙලේ උත්කෘෂ්ඨ අවස්ථා සැමරුම් රැසක්ද සමඟින් 2021 අප්‍රේල් මස 25 වැනි දින සන්නේ ඔබ්සවර් පුවත්පත සමඟ නිකුත් වේ.
ඔබේ පිටපත දැන්ම වෙන් කරවා ගන්න!

LAKE HOUSE SUNDAY OBSERVER
SLTMOBITEL The Connection
ITN SriLanka
SLSCA

දැරණියගල වික්‍රමලාගේ ගොක් කොළ වික්‍රමය

ධාරාණිපාත වැසි මැද බණ්ඩාර ගමන පිටත් වූයේ මැදියම ගෙවී හෝරාවක් ගිය තැනදීය. ගමනෙහි නිශ්චිත අරමුණක් වුවද ගමනාන්තයක් හරිහැටි ඔහු සහ පිරිවර දැන උන්නේ නැත. අරමුණ ගොක් කොළ නිර්මාණ නිමැවුම්කරුවකු සෙවුම වුවද ඒ නිමැවුම්කරුවා සිටින ඉසව්ව බණ්ඩාර සහ පිරිස දැන උන්නේ යන්තම්නි.

"දැරණියගල ඉන්නවා නියම ගොක් කොළ වැඩකාරයෙක්"

බණ්ඩාරට මිතුරකු කීවේ සති කිහිපයකට පෙරාතුවය.

ඔවුන් මේ වෙහෙසෙන්නේ පත්තර මහගෙදර එක් සුවිශේෂී අංගයක් සඳහා ගොක් කොළ පිරිත් මණ්ඩප්පයක් සැකසීමටය. කවදත් රටට දැයට ආදර්ශවත් ක්‍රියාවලීන්ට පෙර මං කී පත්තර මහගෙදර නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ ගුණ සමරන්නට පත්තර මහගෙදර ඇත්තෝ නිරතුරුවම අමතක නොකරති. ඩී.ආර් විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ 115 වැනි ජන්ම දිනය පසුගිය දා යෙදුණි. ඒ වෙනුවෙන් සෑම වසරකම සර්වරාත්‍රික පිරිත් පිංකමක් ලේක් හවුස් පරිශ්‍රයේදී පැවැත් වේ.

ඒ වෙනුවෙන් අත්‍යාලංකාර පිරිත් මණ්ඩපයක් ඉදි කිරීමේ වගකීම මෙවර භාර ගනු ලැබුවේ බණ්ඩාර ප්‍රමුඛ පත්තර මහගෙදර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සහෘදයන් පිරිසයි.

බණ්ඩාර සහ පිරිස දැරණියගල බලා පිටත්වන්නේ ඒ වගකීම ඉටු කිරීමට අවශ්‍ය නිර්මාණකරුවා හමුවීමටයි.

සීතල දැරණියගල තෙතබරියම් කරමින් ඇදහැළුණු මහ වරුසාව මැද බණ්ඩාර ඇතුළු පිරිස දැරණියගලට ළඟා වන්නේ බලාපොරොත්තු රැසක් හිත මත තබා ගනිමිනි.

අවසානයේ මේ සුවිශේෂී ගොක් කොළ නිර්මාණකරුවා ඔවුනට හමු වන්නේ ගොම්මනට ඔන්න මෙන්න කියා තිබියදීය.

කෙසේ හෝ කතිකා කර ගත් පරිද්දෙන් ගොක් කොළ නිර්මාණකරුවා ඇතුළු ඔහුගේ සහෘද නිර්මාණ පිරිවර පත්තර මහහෙදරට පසුගිය දා පැමිණෙන්නේ බණ්ඩාර ඇතුළු පිරිසගේ බලාපොරොත්තුව ඉටු කිරීමටය.

ගොක් කොළ එකින් එක කපමින් නවමින් කැටයම් කරමින් පිරිස කඩිමුඩියේ කඩිරැළ සේ තම කටයුත්තේය. අපට ඔවුන් හමු වන්නේ ඒ අතරතුරදීය.

නඩේ ප්‍රධානියා හේවාවික්‍රමය. හේවාවික්‍රම ගොක් කොළයෙන් වික්‍රම පාන්නෙකි. ඔහු අත ඇති ගෙවී ගිය කුඩා පිහි තලය ඒ වික්‍රමවල අතීතය කියා පාන සාක්ෂියක් වැනිය. ඉරටුව වටා පිහිතුඩ යවමින් ඔහු දිගු බර කල්පනාවකය. ඇස් හතරැස් කරමින් ඔහු අදහස් එක| රැස් කරන්නේ නිර්මාණය සාර්ථක කරගැනීමටය. හීනි දිග නොකිළිටි ගොක් තීරු එකින් එක පිරියම් කරමින් හේ තම දේව කාර්යයේය.

කොච්චර කල් වෙනව ද ගොක් කොළ නිර්මාණවලට බැහැල? වැඩබිමේම ඇඳිගත් අප අපේ මහගෙදරට ආ අමුත්තා සමඟ කතාව පටන් ගන්නේ එසේය.

අවුරුදු 20ක් වගේ ඇති මයෙ හිතේ..

වැඩට බාධාවක් වනවාට ඔහු අකැමැති සෙයක් පෙන්වූවද කතාවට අකමැත්තක් මුහුණු බසෙහි සඳහන් නොවිණි. අප කෙටි ප්‍රශ්න සහ උත්තර අතරය.

පරම්පරාවෙන් එන එකක් ද?

සාම්ප්‍රදායික ප්‍රශ්නය අපේ පැත්තෙනි.

නෑ ..

කෙටි පිළිතුරක් සමඟ බර හුස්මකි. මේ කතාව හරි හැටි ඇරඹෙන්නේ එතැනිනි.

එහෙනම්..

දිග කතාවට ප්‍රවේශයකි.

"පුංචි සන්ධියේ ඉඳලම කලාවට තමා හිතේ බර තිබ්බේ. ඒ නිසාම කලාව එක්ක ඇසුරක් තිබුණා. ඒත් ගොක් කොළ කලාවයි මමයි අතර කිසිම සම්බන්ධයක් තිබුණෙ නෑ. කවදාවත් මම ගොක් කොළ කර්මාන්තය ගැන ඉගෙන ගෙන නැහැ. මේක මට සහජයෙන්ම ආව හැකියාවක් කියලයි මම හිතන්නේ. මොකද දැක පුරුද්දක්, කළ පුරුද්දක් කිසිම දෙයක් තිබ්බෙ නෑ පළවෙනියට වැඩේට අත ගහද්දී. මුලින්ම ගැහුවෙ පෝරුවක්. ඒක හැදුවේ යාළුවකුට. ඒ රටා හිතේ මවාගෙන ගොක් කොළයෙන් කපලා එදා පෝරුව හැදුවම හැමෝම ඒක බලල පුදුමත් වුණා. බොරු කියන්න ඕන නැනේ ඇත්තටම ඒක හැදුවෙ මම කියල මටත් අදහගන්න බැරි වුණා. ඒකයි මම කිව්වෙ මේ කලාව මට ආවේ උප්පතියෙන්මයි කියල.

වික්‍රම නැවතත් ගොක් කොළ අතර සීරුවට පිහිතුඩ යවයි. සිරිස් බිරිස් ගා කැපෙන ගොක් පත් රටා එකිනෙක සකසා ඇති මණ්ඩප්ප තට්ටුවේ ඇලවෙයි. එය බලාසිටින්නකුට පහසුවට පෙනුණද මනස මෙන්ම ගත ද වෙහෙස කරවන ක්‍රියාවලියකි. ඒ නිසාම ඒ නිර්මාණ භාවනාවෙන් මිදීමට ඔවුනට හිත නොදෙයි. නමුත් තවත් යමක් ඔවුන් සමඟ කතා බහ කළ යුතුව තිබේ.

මණ්ඩප තට්ටුව මත ගොක් කොළ තට්ටුව අලවන වික්‍රම නැවතත් ඈතට ගොස් ඒ දෙස බොහෝ වේලා බලා සිටී. දැන් අපේ වාරයයි

මේ වෙනකොට කොච්චර මණ්ඩප හදල තියෙනව ද?

පැනය අපෙනි.

පිරිත් මණ්ඩප්ප දෙසීයක් විතර හදල ඇති මයෙ හිතේ. පෝරු නම් එකසිය පනහක් විතර. රස්සාව විදියට නෙවේ නේ කරන්නේ. කවුරුහරි ඉල්ලීමක් කළොත් ඒ අනුව වැඩේ කරල දෙනවා. ඒක නේ කලාව කියන්නේ. මේක රස්සාව විදියට කරන්න බැහැ. රස්සාවක් විදියට ගත්තම වැඩේ කරන්න වෙන්නෙ නෑ. අපි හැමෝම හැමදාම වෙහෙසෙන්නේ ලස්සන නිර්මාණයක් කරන්න. ඒක දැකල ගන්න සතුට සල්ලිවලින් මනින්න බෑ.

වික්‍රම ගොක් කොළ රටා මවමින්

ගොක් කොළ තීරු ඉරමින් පීරමින් වික්‍රම තම නිර්මාණ කටයුත්තේමය.

මෙහෙමයි මේක වෙනම කලාවක්. ඒ වෙලාවට හිතෙන දේ තමයි. ඉස්සෙල්ල සැලසුම් කරල මේක කරන්න බෑ. මම හදන හැම නිර්මාණයක්ම මුලින්ම ඇඳෙන්නෙ මගේ හිතේ. හිතේ තියෙන දේ තමයි ගතේ වීරියෙන් මවන්නෙ.

ඔහු තමන්ගේ පිරිවරට උපදෙස් දෙමින් මණ්ඩපය අපූරුවට ඉදි වන දෙස බලා සිටී. බණ්ඩාර ඇතුළු පිරිස ද ලහි ලහියේ වික්‍රමට අත් උදවු සපයන්නේ මණ්ඩපයේ අනගි නිමාව දකිනු රිසියෙනි.

ගොක් කොළ, ලා පොල් කොළ සහ මැදි වයසේ ගොක් අතු එකිනෙක පැටලේ. ඒ මත මනරම් සියුමැලි රටා මැවේ. ඒ රටා අතර සියල්ලන්ගේම දෑස් ඔබමොබ සැරිසරයි.

"දැන් ගොක් කොළ වැඩ කෙරෙනවා අඩුයි. මිනිස්සුන්ට ඕන ක්ෂණික වැඩ. මේක හරියටම භාවනාවක්. ඒකට අවශ්‍ය කාලය අනිවාර්යයෙන් මිඩංගු කරන්නම ඕනෑ. එහෙම නැත්නම් නොකර ඉන්න ඕනෑ.

සැබෑවට මෙය භාවනාවක් බව බලාසිටින්නකුට මැනවින් වැටහේ.

මම එක මණ්ඩප්පයක් ගහන්නේ එක පාරයි. ආයේ මේ විදියේ මණ්ඩපයක් කාටවත් දකින්න ලැබෙන්නෙ නෑ. මේ රටාව ආයේ කොහෙවත් ගහන්නෙ නෑ. ගහන්නත් බෑ. ඒක තමා ඇත්ත. මගේ හිතේ තියෙන රටාව මේක හදල ඉවර වුණ ගමන් මැකිල යනවා. ආයේ එන්නෙ අලුත් එකක්. හිතේ තියෙන රටාව තමා නිතරම කරන්නෙ.

දැන් හදන්නේ පුන් කළසය. පොල් මල් සුවඳින් පිරී ගිය ලේක් හවුස් බිම ඒ වන්දාභිමානී මොහොතට ලහි ලහියේ හැඩ වෙයි. වික්‍රම භාවනානුයෝගියකු සේ තම වැඩයේ හැඩය අමුණමිනි. ඒ අතර ඔහු අප සමඟ කෙටි කතාබහට ද එක් වෙයි.

"දැන් ගොක් කොළ, පොල් කොළ හොයාගන්න එක හරිම අමාරුයි. ඒවගේම මේ කලාවේ අගය දන්න අය ඉන්නෙත් අතළොස්සයි. ඒ හේතු ඔක්කොම එකතු කරල ගත්තම තව ටික දවසකින් මේ කලාව නැතිම වෙලා යයි. හැබැයි මේ ගැන අගය දන්න අය දන්නවා. ඒ නිසාම ඒ අය නිතරම කලාව ගැන දැනුම්වත්.

වික්‍රම කියන්නේ ගොක් කොළ කලාවේ අනාගතය පිළිබඳ දුක්බර කතාවකි. දැරණියගල ජනහිතගම උපන් මේ ජනතාව ශ්‍රී ලංකාවේ හතර කොණටම ගොක් කොළ කලාවේ විස්මයජනක දේ ඉදි කරමින් සිටිති. කලාව විකුණා ගෙන කනවා වෙනුවට තමාගෙන් ඉටු විය යුතු සේවය කලාවට ඉටු කිරීමට ඔවුන් වෙහෙසෙති.

අපිට පුළුවන් තාක් කල් මේ කලාව රැක ගන්න වෙහෙසෙනවා. මේ වගේ වැඩ කළාම හිතට දැනෙන්නෙ සතුටක්. ඒ සතුට ඇතුළෙ තියෙන්නෙ අභිමානයක්. මම හිතනවා මේ කලාව අනාගතය වෙනුවෙන් අපි ඉතිරි කරන්න ඕනෑ. එතකොට අපේ ජාතියේ කලා කුසලතා ලෝකයම දකිවී. මගේ ප්‍රාර්ථනාව ඒකයි.

ඉරි කොටු රවුම් කළස් මැද ඉදිවන ගාම්භීර මණ්ඩපයේ දැන් වැඩ නිමවෙන්නට ළඟය. සැබෑවටම ඒ මණ්ඩපය හරහා අපට කියන්නේ හෙළ කලාවේ ඇති විස්මිතබව මෙන්ම සියුම් බවයි. ඒ සියුම්බව තුළ බොහෝ රළු දේ සැඟව තිබේ.

වික්‍රමලා වික්‍රමපාන්නේ ඒ රළු බව සිනිඳු කිරීමටය. බණ්ඩාරලා එයට දෙන රුකුළ මෙතෙකැයි කියා නිම කළ නොහැකිය. පත්තර මහගෙදර උතුම් පින්කමට ගොක් කොළ මණ්ඩපයක් සැකසීම හරහා රටට දෙන ආදර්ශ බොහෝය.

වික්‍රමලා රකිමින් වැළලී යන කලාවන් රකිමින් මේ සියල්ල හෙට වෙනුවෙන් අද ඉතිරි කළ යුතුය. එය කිසිදා කල් ඉකුත් නොවන සංස්කෘතික ආයෝජනයක් වන්නේය.

එවැනි දේ රකින්න හදන අයටත් අපේ හෙළ කලා රකින්නට වෙහෙසෙන අයටත් රටේ ගෞරවය හිමි විය යුතුමය.

චතුර ගීතනාත් බණ්ඩාර
ඡායාරූප - නිශංක ද සිල්වා

ජනතා මණ්ඩපය

පරිසරයම වනසන විද්‍යුත් අපද්‍රව්‍ය

පරිසරය යනු අප ආරක්ෂා කරන මුර දේවතාවන්ය. අතීතයේදී මිනිසා ඉර හඳට ගහ කොළට වැඳුම් පිදුම් කළ ආකාරය අප මුතුන් මිත්තන් පහදා දී තිබේ. නූතන අපි ඒවා දැක්කේ හරිම මෝඩ සිතුවිලි බවටය. එසේම අද අපට පසක් වන්නේ එදා ජීවත් වූ හෙළයන් මොනතරම් පරිසරයේ තිබූ වැදගත්කම පිළිබඳ දැන සිටියාද යන්නය. පරිසරය පිළිබඳ අප මුල්ම පාඩම ඉගෙන ගන්නේ අප සම්බුදු පියාගෙනි. ගසක් යට උප්පත්තිය ලබා ගසක් යටම බුදු වී ගසක් යටම පරිනිර්වානය කිරීමට තරම් සොබා දහමට කලගුණ දැක් වූ චරිතයක් නැවත බිහි නොවනු ඇත. පරිසරයට වඩාත්ම තර්ජනය එල්ල වන්නේ පරිසරයෙන් හෝ සතා සිවුපාවාගෙන් නොව අපගේ ක්‍රියාකාරකම් හේතුවෙන්ම බව ඔබ නොසිතුවේද? මානව ක්‍රියාකාරකම් ඔස්සේ සිදු වන කැලෑ එළි පෙහෙළි කිරීම , ඉඩම් අතපත් කර ගැනීම පමණක් නොව ඉවතලන ප්ලාස්ටික් බෝතලේ සිට පොලිතින් බෑග් එක පවා භාරගැනීමට සිටින්නේ පරිසරයම පමණි. මෙම සියලු තර්ජන මැද පරිසරයට අලුතින්ම එකතු වූ තර්ජනය වන්නේ විද්‍යුත් ගණ අපද්‍රව්‍ය මුදා හැරීමය. වසර ගණනාවක් ගියත් දිරා නොයන ජංගම දුරකතන , බැටරි, පරිගණක උපාංග, විදුලි උපකරණ කොටස් ආදී නොයෙකුත් ගණ අපද්‍රව්‍ය පරිසරයට එල්ල කරන තර්ජනය සුලුපටු නොවේ. දියුණුයැයි සම්මත රටවල මේ තත්ත්වය යම් මට්ටමකට පාලනය කර ගැනීමට විනය ගරුක පුද්ගලයන් සමත් වී තිබේ. එහෙත් අපේ රටේ මිනිස්සු ගෙඩි පිටින්ම මෙම අපද්‍රව්‍ය පරිසරයට මුදා හරිති.

ගංගා ඇළ දොළවල පවා ඔබ නිරීක්ෂණය කළ හොත් මොනතරම් ජංගම දුරකතන බැටරි ප්‍රමාණයක් විසි කර දමා ඇති ආකාරයක් දැකගත හැකි නේද. මහමග විනය, ආයතන විනය සේම පරිසර විනය ද අප විසින්ම ඇති කර ගත යුතු නොවේද සමස්ත ලෝකයටම තර්ජනයක් වී ඇති මෙම ගණ විද්‍යුත් අපද්‍රව්‍ය නිසි කළමනාකරණයකට යටත් කිරීමට කාලයයි මේ.

චන්දන වන්නිආරච්චි
දෙහිඅත්තකන්ඩිය

ඔසුසල් රට පුරා දෙන්න

බොහෝ නගරවල රාජ්‍ය ඔසුසල් නොමැති නිසා පොදු ජනතාවට ඖෂධ මිල දී ගැනීමේදී අනවශ්‍ය ලෙස විශාල මුදලක් වැය කිරීමට සිදු වේ.

හෘද රෝග, දියවැඩියාව, වකුගඩු රෝග වැනි මෙරට ජනතාව වැඩියෙන් පීඩා විඳින රෝග සඳහා අවශ්‍ය ඖෂධවල මිල අධිකය. නියමිත මිලට හෝ එම ඖෂධ ගැනීමට ඇති එකම ස්ථානය රාජ්‍ය ඔසු සලයි.

එම නිසා සෑම නගරයකම රාජ්‍ය ඔසුසලක් පිහිටුවීම අත්‍යාවශ්‍ය කාරණයකි. මේ පිළිබඳව ජනාධිපතිතුමාගේත් සෞඛ්‍ය අමාත්‍යතුමියගේත් අවධානය නොපමාව යොමු වනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

වසන්ත ද සිල්වා - වැලිගම

කා.ක.ස. ගැනත් හිතන්න

රාජ්‍ය වේවා, පෞද්ගලික වේවා අදාළ රාජකාරිමය කටයුතු පහසු කරවීම උදෙසා පරිපාලනමය ව්‍යුහයක් සෑම ආයතනයක් විසින්ම ගොඩ නඟාගෙන තිබේ. කාර්යාල කාර්ය සහායක සේවාවද මෙම ව්‍යුහයෙ ඇති කුඩාම ඒකකයක් ලෙස හැඳින්විය හැක.

රාජ්‍ය ආයතන තුළ විධායක මට්ටමේ සිට විවිධ තනතුරු ගලා යන ආකාරයන් දක්නට ලැබේ. මෙසේ වර්ගීකරණයට ලක් කොට තනතුරු නාමයන් ප්‍රදානය කර ඇත්තේ පරිපාලනමය කටයුතු පහසු කිරීම පිණිසය. සෑම පෞද්ගලික ආයතනයකම මෙන්ම සෑම රාජ්‍ය ආයතනයකම කාර්යාල සහායකයකුගේ සේවාව ලබා ගන්නා බව අප දනිමු.

කාර්යාල සහායක සේවාව යනු ආයතනයකට නැතිවම බැරි සේවාවකි. දෛනිකව ඔවුන්ගෙන් ආයතනයට ලැබෙන සේවය අතිමහත්ය. සාමාන්‍යයෙන් රාජ්‍ය සේවයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද නිශ්චිත වැඩ ලැයිස්තුවක් ඇතත් අප රට තුළ නම් මෙම සේවාව තුළ එය දක්නට නොලැබේ. පිළිගත් දියුණු රටවල තත්ත්වය එසේ නොවේ. වගකීම ලිඛිතවම නිශ්චිත වශයෙන් පවරා තිබේ. අපගේ ආයතනවල මෙම සේවාව ක්‍රියාත්මක වන්නේ හුදෙක් ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදිය. ඔහු කියන ඕනෑම රාජකාරියක් කිරීමට කාර්යාල කාර්ය සහායක සේවකයා සූදානමින් සිටිය යුතුය. සාමාන්‍යයෙන් කාර්යාල කාර්ය සහායකයකුට දෛනිකව ඉටු කළ යුතු වැඩ කොටසක් තිබේ. දිනපතා කාර්යාලය පිරිසිදු කිරීම් මෙන්ම බැංකු කටයුතු වෙනත් රාජ්‍ය ආයතනවලට පණිවුඩ රැගෙන යාම මෙන්ම තේ පිළියෙල කිරීම , ෆොටෝ කොපි ලබා ගැනීම ආදී බහුවිධ රාජකාරිමය වැඩ කොටසක් පැවරී තිබේ. මේ සියල්ල අතරේම හාම්පුතාට කඩේ යාමද නිල නොවන වශයෙන් ඉෂ්ට කළ යුතුය. ඇතැම් විට හාම්පුතාගේ ගෙදර වැඩට පවා යාමට සිදු වුව හොත් එය අරුමයක් නොවේ. අප කුමන රැකියාවක නිරත වුව ද ඒ සෑම පුද්ගලයකුටම වෘත්තීය ගරුත්වයක් ඇතිව එම රැකියාවේ නිරත වීමට අවශ්‍ය පසුබිම සකසා දිය යුතුය. සෑම වෘත්තියකටම නිශ්චිත රාජකාරි ලැයිස්තුවක් අදාළ ප්‍රධාන ආයතන මඟින්ම සේවකයා අතට පත් කළ යුතුය. එසේ නොමැතිවීම තුළ තරුණ පරපුරේ කිසිවකු කාර්යාල කාර්ය සහායකයකු ලෙස කිසි දිනෙක මෙම ක්ෂේත්‍රයට නොපිවිසෙනු ඇත.

ඩබ්.කේ.මොහාන් - දෙහිඅත්තකණ්ඩිය.

අබලන් මගී ආවරණයක්

කොළඹ - නුවර මහා මාර්ගයේ බල්ලපාන නගරයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටා ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට ඉදි කොට තිබෙන මගී ආවරණ වහල ගැලවී අබලන් තත්ත්වයට පත්ව තිබේ. දැනට මෙම නගරයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අමතරව , දිස්ත්‍රික්ක වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, සහකාර ඉඩම් කාර්යාලය සහ වෙනත් රාජ්‍ය ආයතන රැසක් පිහිටා ඇත. එම නිසා දිනකට විශාල ජනතාවක් මෙම ප්‍රදේශයට පැමිණෙති. මෙම මගී ආවරණයට බස් රථවලට ගොඩ වීමට විශාල පිරිසක් පැමිණෙති. ඔවුනට අව්වට , වැස්සට මෙම මගී ආවරණය සෙවණ සලසයි. දැනට මෙම මගී ආවරණයේ වහල ගැලවී යෑම නිසා වැසි දිනයන්හි ජනතාව මහත් අපහසුතා පත්ව සිටිති. මෙම මගී ආවරණය සැකසීමට කටයුතු කරදෙන මෙන් ඉල්ලමි.

මනහර මහින්ද
වෑකඩ - බෙලිගල

පාරවල් අබලන් වීමට මෙන්න තව හේතුවක්

ජල නළ එළීම සඳහා සිදු කරන කැණීම් නැවත නිසි ලෙස යථා තත්ත්වයට පත් නොකිරීම නිසා මාර්ගයේ ගමන් කරන පිරිස් දැඩි දුෂ්කරතාවට පත් වෙති. මහා මාර්ග දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන ආයතන මඟින් හොඳ තත්ත්වයේ මාර්ග සහ අලුත් වැඩියා කිරීම් සිදු කළද ජල මණ්ඩලය සහ මාර්ග බලධාරීන් අතර නිසි අවබෝධයක් නොමැති වීම මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන හේතුවක් බවට පත්ව තිබේ. මෙම තත්ත්වය තුළ මහජන මුදලින් ඉදිකරන සහ නඩත්තු කරන මාර්ග පද්ධතිය අකාලයේ අබලන් වීම කනගාටුවට හේතුවකි. එමෙන්ම මෙහි ඇති අනෙක් කරුණ වන්නේ මාර්ගවල ජල එළීම සඳහා ඇති කළ කඩතොලු නිසා මාර්ග අනතුරු ප්‍රමාණයද ඉහළ ගොස් තිබේ. එනිසා බලධාරීන් කළ යුතුව ඇත්තේ මේ ගැන නිසි අවධානය යොමු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කිරීමය.

ප්‍රසන්න වෙල්ගම

ක්‍රීඩාංගණයේ වැඩ අතරමඟ

බේරුවල අධ්‍යාපන කොට්ඨාස බල ප්‍රදේශයට අයත් "ක/හල්කඳවිල මහ විදුහල් ක්‍රීඩාංගණය' සංවර්ධනය කර ඉදි කිරීම මේ වන විට වසර කීපයක් තිස්සේ සම්පූර්ණයෙන්ම නතර වී ඇත.

මෙම විදුහල් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම නතර වීම නිසා හල්කඳවිල මහ විදුහලේ දරුදැරියන් විශාල පිරිසකට ක්‍රීඩා කුසලතාවයන් නංවා ගැනීමට අපහසු වී ඇත. හිටපු සෞඛ්‍ය ඇමැති රාජිත සේනාරත්න යුගයේ ඉදි කිරීම් ආරම්භ කළ මේ ක්‍රීඩා පිටිය. සංවර්ධනය කර දීමට වත්මන් ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මැතිතුමාගේ විශේෂ අවධානය යොමු වේවායි පතමි.

බෙන් කලපුගේ - බේරුවල

රෝගී පුතු රැක ගන්න මවකගෙන් ඉල්ලීමක්

දස මාසයක් කුසයේ දරාගෙන මවක් පුතෙක් බිහි කරන්නීය. ඒ මව දුක් ගන්නේ පුතුන් හදන්නටය. ඒ පුතුන් රජුන් කරන්නටය. එසේ වුව ද සියලු පුතුන් රජුන් වන්නේ ද නැත. පුතුන් රජ නොවුණට මව දුක් වන්නේද නැත. ඊට හේතුව කිරුළ නොපැලඳුවද පුතු ඒ මවට හැමදාම රජෙක්ම වන නිසාය.

මහනුවර පූජාපිටිය ප්‍රදේශයේ කුලී නිවෙසක ජීවත් වන 47 හැවිරිදි නයනා සුමුදිනී ජයකොඩි නම් මවද හසිත සෙනෙවිරත්න නම් වූ පුතු මෙලොවට ජාතික කළේ ද අනාගතයේදී තම පුතු රජෙක් කරන්නට සිතාගෙනය. නමුත් කිරුළ නොපැලඳි ඒ පුතු නයනා මවට පමණක් සීමා වූ ලෝකයක රජකු වන්නේ දෛවයේ කුමන සරදමක් නිසාදැයි යන්න ගැටලුවකි. හසිත පුතුගේ වයස වසර දහ අටක් වුව ද මනසින් තාමත් ඔහු ළදරුවෙකි. සිතාමතා කිසිවක් කරගැනීමේ හැකියාවක් හෝ ශක්තියක් ඔහුට නැත. ඔහු දන්නේ මුවට මව ළං කළ ඕනෑම දෙයක් ගිල දැමීමට පමණය. ඊට එහා දෙයක් කර ගැනීමට හසිත පුතුට වැටහීමක් නැත. ඒ හසිත පුතු මන්දමානසික රෝගියකු වන නිසාය. වසර දහ අටක් පුරා රෝහල් කරාගෙන ගිය ද මේ දක්වාත් හසිත පුතුට සුවයක් ලැබී නැත. හසිත පුතුගේ සියලු කටයුතු සිදු වන්නේ නයනා මව අතිනි. කැවීම, නෑවීම පමණක් නොව අනිකුත් සියලු උවටැන් සිදු වන්නේද ඇය අතිනි. වසර දහ අටක් පුරා පුතුගේ සියලු කටයුතු කරන්නීය.

නයනාගේ සැමියා මීට වසර දහසයකට පමණ පෙර ඇය අතහැර ගොස් ඇති අතර පවුලේ අය ද අතහැර දැමූ ඇය තම නැඟනිය විසින් ගත් කුලී නිවෙසක තාවකාලිකව දිවි ගෙවන්නීය. සියලු දේ අහිමි කරගත් නයනා අම්මාට සිතට විනා තම පුතුව කයට බරක් නැත. තම පුතු වෙනුවෙන් ඕනෑම දුකක් විඳීමට ඇය සූදානම්ය.

"මට මගේ පුතා වෙනුවෙන් ඕනම දුකක් විඳින්ඩ පුළුවන්. මට මං ගැන දුකක් නෑ. මට දුක මගෙ පුතා ගැන. පුතාගෙ මේ අසනීප තත්ත්වය නිසා පුතාව කවුරුත් බාර ගත්තෙත් නෑ. බෙහෙත් දෙනවා. ඒත් සුවයක් නෑ. මෙහෙම දරුවන් ආරක්ෂා කර ගන්න තැන් තියෙනවා. ඒත් ඒ තැන්වලිනුත් පුතාව බාර ගන්ඩ බෑ කියනවා. මං පුංචි රස්සාවක් කරනවා. ඉන්න ගෙට කුලී ගෙවීවාම ඉතිරි මුදලෙන් අපිට ජීවත් වෙන්ඩ අමාරුයි. මයෙ දරුව මට බරක් නෙවෙයි. මට පුළුවනි මගෙ දරුව බලාගෙන ජීවත් වෙන්න. ඒ නිසා මේ දකින හැමෝගෙන්ම මං ඉල්ලා හිටින්නෙ පුළුවන්නම් මටයි, දරුවටයි ජීවත් වෙන්ඩ පුංචි කාමර කෑල්ලක් හරි අපිට හදල දෙන්ඩ. පිං අයිතිවෙයි." ඇය ඉල්ලා සිටින්නීය. ඇගේ ලිපිනය අංක 68/1,බොක්කාවල පාර, පූජාපිටිය.

බී. ගුණරත්න

ආදාහනාගාරයක් දෙන්න

වඳුරාමුල්ල ඇතුළු ග්‍රාම සේවා වසම් කිහිපයකටම කෙනෙකුන් මියගිය පසු භූමදානය කිරීමට ස්ථාන කිහිපයක්ම ඇත.

නමුත් ආදාහනය කිරීමට පානදුර ග්‍රාමයට ආසන්නව ආදාහනාගාරයක් නොමැත. එසේ වුව හොත් බණ්ඩාරගමට , හොරේතුඩුවට හෝ වාද්දූවට යා යුතුය. එම නිසා බලධාරීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනුයේ පානදුර නගර සීමාව තුළ ආදාහනාගාරයක් ස්ථාපිත කර දෙන ලෙසය.

වඳුරාමුල්ලවත්තේ
ලයනල් ජයලත් - පානදුර

විනයගරුක මාවතක්

මෙවර බක් මාසයෙ හි පවත්වනු ලැබූ සිංහල හා හින්දු අලුත් අවුරුදු උළෙල නිමිතිකොට ගෙන අප්‍රේල් 14 වෙනි දිනට යෙදී තිබූ සිංහල අලුත් අවුරුදු දිනයෙහිදී පමණක් රට තුළ සිදුවන ලද සියලු රිය අනතුරු සංඛ්‍යාව 121 ක් බැව් ද ඉන් 12ක් අධිවේගී මාර්ගයෙහිදී සිදුවන ලද රිය අනතුරු වන අතර මෙම එක් දින තුළ දී සිදු වූ සමස්ත රිය අනතුරු මරණ ගණන 14ක් ද නීතියේ රැහැනට හසුවන ලද බීමත් රියැදුරන් සංඛ්‍යාව 758 ක් ලෙසින් ද සිදුකරන ලද විමර්ශණයක ප්‍රතිඵලයක් ලෙස මෙම දත්තයන් හුවා දක්වමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයන් තුළින් පැවැසීය.

අප්‍රේල් අවුරුදු සමයෙහිදී මෙබඳු මාරක සිද්ධීන් සිදුවිය හැකි බැව් එහි අදීනව ගෙනහැර පාමින් ශ්‍රී ලංකාවාසී සමස්ත ජනතාව දැනුම්වත් කරමින් උත්සව සමයට පෙර දිනයන්හිසිට ඒ මහතා මාධ්‍යයන් හමුවෙහි ප්‍රකාශ කර සිටි අයුරු සිහියට නැඟෙන්නේය. රියැදුරෙකු ලෙස කටයුතුසිදු කරන අවස්ථාවෙහිදී ස්වකීය ශරීරයෙහි සියලු අවයවයන් ක්‍රියාත්මක වන බැව් ද ලොවෙහි තිබෙන්නාවූ අමාරුම කර්තව්‍යය වන රිය පැදවීම ලෙහෙසිම කාර්යය ලෙස ලඝු කොට සිතමින් කටයුතු කරන හෙයින් රිය අනුතරු සිදුවීමේ වර්ධනයෙහි ප්‍රවණතාවය දක්නට ලැබෙන බැව් රූපවාහිණියෙහි විකාශය වන 'දොරමඬලාව' වැඩසටහන වෙත සහභාගීවෙමින් ඒ මහතා වරක් අවධාරණය කරමින් ප්‍රකාශ කර සිටියේය.

මාර්ග නීති කඩ කිරීම, බීමත්කම, නින්ද යෑම, වේගය පාලනය කරගත නොහැකි වීම, අපරික්ෂාකාරි බැව් රිය අනතුරු වළකාලීම වස් රිය අනතුරු සිදුවීමේ ප්‍රභේදයන් ලෙස පොලීසිය, මාධ්‍යයන් රියැදුරන් දැනුම්වත් කළ ද ඉන් මිය යනු ලබන්නේ වටිනා මිනිස් ජීවිතයන්ය. එහෙයිනි, එහෙයින් රියැදුරන් කල්පනාකාරීව සහ විනය ගරුකව රිය ධාවනය කළ යුතුය.

සරත් ලියනගේ - රන්මුතුගල

කිංකල්පනා

නිදහස් ගසේ මල් අතු අග	සුපිපේවා
අදහස් සැමගෙ පිවිතුරු ලෙස	සුදිලේවා
උදහස් නොවන සිතිවිලි ලොව	රැව්දේවා
දෙදහස් විසි එකේ රෝ බිය දුරු	වේවා
ජනතා මණ්ඩපයෙන් ගෙන ආ මතක	කතා
දැන් නැත පල වෙන්නෙ කවුරුත් නොමැත	කතා
දිනමිණ පුවත් පත තොරතුරු රසට	ගොතා
කරනා මෙහෙවරට පැතුමක් පතමි	සිතා
ආයු බල වර්ණ ප්‍රඥා ඇති	වෙන්න
රෝ බිය වසංගත ලෙඩ දුක් නැති	වෙන්න
සතුටින් සාමයෙන් මනු සිත	පිබිදෙන්න
කවුරුත් එකා මෙන් සිට අවුරුදු	කන්න
සිහළ දමිල මුස්ලිම් ජා	බර්ගර්ලා
එක මවකගේ දරුවන් ලෙස	ඉඳපල්ලා
"කොරෝනාව" මුළු ලෝකෙන්	පන්නාලා
කවුරුත් එකා මෙන් අවුරුදු	කාපල්ලා

ජයලත් - පානදුර

දිනමිණ දිසත දස අත ම එක තැන

විභාගය සමත් වුණත් පත්වීම් නෑ

පිටුව 16

මහකුඹුක්කඩවල ගමට වනඇලි බියක්

පිටුව 16

වැල්ලවාය ප්‍රාදේශීය සභාව

පිටුව 17

ඩී. මිහිඳුකුල - කොච්චිකඩේ

සුරපිට රිය පැදවූ මීගමු ව්‍යාපාරිකයාගේ ලයිසන් කැන්සල්

වාහන 2කට හා සිවිදෙනකුට හානි කරලා

ලක්ෂ ගාණක දඩයකුත් ගෙවන්න වෙයි

පොලිස් යතුරුපැදියකට සහ ත්‍රීවීල් රථයකට අලාභ හානි සිදු කරමින් පුද්ගලයන් හතරදෙනකුට තුවාල සිදු කළ බවට චෝදනා ලැබ සිට වරද පිළිගත් ව්‍යාපාරිකයකුට මීගමුව ප්‍රධාන මහෙස්ත්‍රාත් ටී. එන්. එල්. මහවත්ත මහත්මිය රුපියල් හතළිස් දෙදාස් පන්සීයක දඩයක් ගෙවන ලෙස නියම කළාය.

අමතරව තුවාල ලැබූ සිවිදෙනාට රුපියල් දෙලක්ෂ අනූදාහක වන්දියක් ගෙවීමටත් එම අනතුරේදී විත්තිකරු විසින් හානියට පත් කළ පොලිස් යතුරුපැදියට සහ ත්‍රිරෝද රථයට රුපියල් දෙලක්ෂ හැත්තෑපන්දහසක වන්දියක් ගෙවීමටත් නියම කළාය. මෙලෙස වරද පිළිගත් විත්තිකරු වූයේ කටුනේරිය බෑන්කඩ හන්දිය ප්‍රදේශයේ පදිංචි ඩබ්ලිව්. මධුර චින්තක රොද්‍රිගු නමැති ව්‍යාපාරිකයෙකි.

බීමතින් අපරික්ෂාකාරීව රිය පැදවීම ඇතුළු චෝදනා හයක් සැකකරුට එරෙහිව පොලිසිය ගොනු කර තිබුණි. විත්තිකරුගේ රිය ධාවන බලපත්‍රයද මාස දෙකක කාලයකට අධිකරණය මඟින් අත්හිටුවිය. මේ අනතුර 2020 අප්‍රේල් මස 9 වැනි දින මීගමුව කොළඹ ප්‍රධාන මාර්ගයේ ගල්කන්ද හන්දිය ප්‍රදේශයේදී සිදුව ඇති බව අධිකරණයේදී අනාවරණය වූ අතර අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සකුල ගුණතිලක මහතා සමඟ ජ්‍යෙෂ්ඨ නීතිඥ නෙල්සන් කුමාරනායක යන මහත්වරු පෙනී සිටියහ. මීගමුව පොලිසියේ රථ වාහන අංශයේ සැරයන් (41380) එම්. එල්. තිලකරත්න මහතා පැමිණිල්ල මෙහෙයවන ලදි.

කල්පනී පද්මපෙරුම - අවිස්සාවේල්ල විශේෂ

සීතාවක අවුරුදු සිරි

සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සේවක සේවිකාවන් හා ඔවුන්ගේ සමීපතමයන් එක්ව අවුරුදු උත්සවයක් පසුගියදා සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදි. මේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූයේ කොළඹ ප්‍රධාන දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න මහතායි. ප්‍රාදේශීය ලේකම් කේ. එස්. දිල්හානි මහත්මිය, සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපති ජයන්ත රෝහණ මහතා, අතිරේක දිස්ත්‍රික් ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් පවිත්‍රා ගමගේ මහත්මිය ඇතුළු සේවක සේවිකාවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් එක්ව පැවැත්වූ උත්සවය අවුරුදු විශේෂාංග රැසකින් සමන්විත වූ අතර සියලුම අවුරුදු චාරිත්‍ර ඉටු කිරීම ද විශේෂත්වයකි.

මහානාම විතානගේ - මල්වාන සමූහ

ගෙයක් කුලියට අරන් ජයටම ගංජා බිස්නස් කරලා

මාකොළ සිරි මංගල පාර ප්‍රදේශයේ නිවෙසක් කුලියට ගෙන කේරළ ගංජා අලෙවි කළ හා බෙදා හැරීමේ යෙදුණු ජාවාරම්කරුවකු කිරිබත්ගොඩ පොලිසිය මඟින් පෙරේදා (21) කිරිබත්ගොඩ - මාකොළ ප්‍රධාන මාර්ගයේදී අත්අඩංගුවට ගන්නා ලදි. ඒ සමඟම එම ජාවාරම්කරු ළඟ තිබී රුපියල් ලක්ෂ දහයක් පමණ වටිනා කේරළ ගංජා කිලෝග්‍රෑම් දෙකයි මිලිග්‍රෑම් එකසීයක් ද පොලිස් භාරයට ගෙන තිබේ. කොළඹ, ගුණසිංහපුර ප්‍රදේශයේ පදිංචි එම ජාවාරම්කරු මාකොළ ප්‍රදේශයේ එම නිවෙස මාසිකව රුපියල් පහළොස්දහසකට කුලියට ගෙන ජාවාරම සිදු කර ඇත. ජාවාරම්කරු මහර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

කිරිබත්ගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රදීප් කුමාර මහතාගේ උපදෙස් අනුව අපරාධ විමර්ශන අංශයේ උප පොලිස් පරීක්ෂකවරුන් වන බණ්ඩාර, මහේෂ්, පො.කො. ජයලත් (73251), මාලක (86146), අගාර (34647) හා ධනුක (68896) යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

ඒ. ඒ. එල්. ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ

අනවසර ඌරු කොටුවලින් ලෙඩ රෝග වැඩි වෙලා

මාතලේ දිස්ත්‍රික්කයෙහි ඌරු මස් පිණිස ඌරන් ඇති කරනා වහකෝට්ට සහ ඒ අවට ප්‍රදේශයන්හි අනවසර ඌරු කොටු පවත්වාගෙන යෑමෙන් දැඩි පරිසර හානියක් සිදු වන බවත් මේ තත්ත්වය වැළැක්වීමට සෞඛ්‍ය නිලධාරීන් මෙන්ම අදාළ අංශද මෙතෙක් කිසිදු පියවරක් ගෙන නැති බවටත් ප්‍රදේශවාසීහු පවසති. මේ හේතුවෙන් ඇති වී තිබෙනා පරිසර හානියෙන් විවිධ රෝගාබාධ පැතිර යෑමේ ප්‍රවණතාවක්ද දක්නට ඇතැයි ඔවුහු පවසා සිටිති.

මේ ඌරු කොටුවලින් එක්රැස් වන අපද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් ඒ අවට රක්ෂිත බිම් වෙත මුදාහැරීන් මෙලෙස පරිසර හානි උග්‍ර වී තිබේ. මේ පිළිබඳ සෞඛ්‍ය බලධාරීන්ගේ අවධානය යොමු කර කඩිනමින් විසඳුමක් දෙන මෙන් ප්‍රදේශවාසීහු ඉල්ලා සිටිති.

ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

හැළඹවටවන වෙල් යායක අත් බෝම්බයක්

ආරච්චිකට්ටුව හැළඹවටවන ප්‍රදේශයේ වෙල් යායක තිබී විදේශ රටක නිෂ්පාදිත අත් බෝම්බයක් පෙරේදා (21) සොයා ගෙන තිබේ. මේ අත්බෝම්බය මුලින්ම දැක ඇත්තේ ප්‍රදේශයේ ගොවි මහතෙකි. බෝම්බය බහාලුමක දමා තිබීම හේතුවෙන් මෙය නිධානයක් යැයි සිතා ඇති අතර පසුව බහාලුම විවෘත කර බැලීමේදී බෝම්බයක් බව අනාවරණය වී ඇත. ඒ බව ආරච්චිකට්ටුව පොලිසිය වෙත දැනුම්වත් කිරීමෙන් අනතුරුව ආරච්චිකට්ටුව පොලිසිය මඟින් පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් කැඳවා බෝම්බය නිෂ්ක්‍රිය කිරීමට කටයුතු කර තිබිණි. මේ බෝම්බය ආරක්ෂක හමුදාවන් භාවිත කරනා එම් 75 වර්ගයේ අත් බෝම්බයක් බව මූලික නිරීක්ෂණයේදී අනාවරණය වී ඇත. ආරච්චිකට්ටුව පොලිසිය මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

සීගිරිය විශේෂ

කණ්ඩලම ඇළක නාදුනන මළ සිරුරක්

දඹුල්ල කණ්ඩලම ජලාශයට ජලය රැගෙන යන ඇළ මාර්ගයේ පාවෙමින් තිබූ නාදුනන පිරිමි මළ සිරුරක් දඹුල්ල මූලික රෝහලට රැගෙන ගොස් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා හරහා පීසීආර් පරීක්ෂණයකට ලක් කොට පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන ලෙස දඹුල්ල වැඩබලන මහෙස්ත්‍රාත් ජයම්පති රත්න දිවාකර මහතා පෙරේදා (21) පස්වරුවේ පොලිසියට නියෝග කර තිබේ. බෝවතැන්න ජලාශය හරහා කණ්ඩලම වැවට ජලය රැගෙන යන ඇළ මඟේ පෙරේදා (21) පස්වරුවේ මළ සිරුරක් පාවෙමින් තිබෙනා බවට දඹුල්ල පොලිසියට ප්‍රදේශවාසීන්ගෙන් තොරතුරක් ලැබී තිබිණි. ඒ අනුව දඹුල්ල පොලිසිය පැමිණ පරීක්ෂා කොට බැලීමේදී පුද්ගල මළ සිරුර සොයාගෙන ඇත.

මේ මළ සිරුර පිළිබඳව දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව දඹුල්ල වැඩබලන මහෙස්ත්‍රාත් ජයම්පති රත්න දිවාකර මහතා එම ස්ථානයට පැමිණ දඹුල්ල පොලිසියේ පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් මඟින් ඇළ මඟේ පාවෙමින් තිබූ මළ සිරුරු ගොඩට ගෙන තිබේ. ඒ අනුව මළ සිරුර ගොඩගෙන පොලිසිය සහ මහෙස්ත්‍රාත්වරයා ඉදිරි පරීක්ෂණ සිදු කර තිබේ. මිය ගොස් දින කිහිපයක් ගත වීම හේතුවෙන් මළ සිරුර බෙහෙවින් නරක් වී තිබී ඇති ඇත. එමෙන්ම මියගිය පුද්ගලයා පිරිමි පුද්ගලයකු බව ද මෙතෙක් කාගේ කවුරුන්ද යන්න හඳුනා ගැනීමට නොහැකි තරමට මළ සිරුර විකෘති වී ඇතැයි ද පොලිස් නිලධාරීහු පැවසූහ. දඹුල්ල පොලිසියේ වැඩබලන මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්. එම්. කරුණාරත්න මහතාගේ උපදෙස් පරිදි අපරාධ අංශයේ නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ

කඩ 4ක් කඩා ලක්ෂ 13ක බඩු උස්සලා

බළන්ගොඩ නගරයේ රන් භාණ්ඩ වෙළෙඳසලක්, රෙකොඩ්බාර් එකක්, මැණික් ගල් වෙළෙඳසලක් සහ රෙදි කඩයක් පෙරේදා (21) රාත්‍රියේ සොරුන් විසින් කඩා රුපියල් දහතුන් ලක්ෂයක වටිනාකමක් ඇති දේපළ සහ මුදල් සොරකම් කරගෙන ගොස් ඇති බවට එහි හිමිකරුවන් විසින් පැමිණ පොලිසියට පැමිණිල්ලක් කර තිබේ.

රන් භාණ්ඩ වෙළෙඳසල කඩා රුපියල් 280,000 වටිනා පවුම් දෙකහමාරක රන් මුද්දක්, රුපියල් 220,000ක වටිනාකමක් ඇති මුදු 36ක්, රුපියල් 505,000ක් වටිනා රන් භාණ්ඩ සහ රුපියල් 6000ක මුදල් සොරකම් කරගෙන ගොස් ඇති බවට පැමිණිල්ලේ සඳහන් කර ඇත. මේ අතර රෙකෝඩ්බාර් එකෙන් රුපියල් 15,300ක දේපළ සහ මුදල් ද මැණික් ගල් වෙළෙඳසලෙන් රුපියල් 33,000ක මුදල් සහ දේපළ ද සොරකම් කර ගෙන ගොස් ඇත.

ප්‍රදීප් කුමාර ධර්මරත්න - අරණායක

හකුරුගම්මන සමෘද්ධි සංවර්ධන නිලධාරිනියකට කොරෝනා

අරණායක හකුරුගම්මන සමෘද්ධි සංවර්ධන නිලධාරිනියකට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වීමෙන් හකුරුගම්මන සමෘද්ධි ප්‍රජා මූල බැංකුව ඊයේ (22) පෙරවරුවේ සිට වසා දැමීමට පියවර ගෙන තිබේ. සමෘද්ධි බැංකුවේ කළමනාකරු, කාර්ය මණ්ඩලයේ සේවය කරනා නිලධාරීන්, අතුළුව රාජ්‍ය නිලධාරීන් 16 දෙනකු නිරෝධායනයට යොමු කිරීමට පියවර ගත් බව අරණායක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ප්‍රකාශ කළේය. අරණායක හකුරුගම්මන වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරිනිය සහ ඇගේ සැමියාද කොවිඩ් ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇති අතර ඔවුන් ප්‍රතිකාර සඳහා කොවිඩ් ප්‍රතිකාරක මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ. සමෘද්ධි බැංකුව ඊයේ (22) සිට වසා දැමීම හේතුවෙන් රජය මඟින් සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් ලබාදෙන රුපියල් 5000 දීමනාව ද පොරොත්තු ලේඛනවල සිටිනා අඩු ආදායලාභී පවුල්වලට ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් ද ඇති වී තිබේ.

බී. ටී. තඹවිට - මතුගම

රියැදුරු මඟින් බස්සා කොන්දොස්තර බසය පදවලා

කොළඹ සිට මතුගම දක්වා ධාවනය වූ පෞද්ගලික බස් රථයක රියැදුරා මඟින් බැස බස් රථය කොන්දොස්තරවරයා විසින් අපරික්ෂාකාරී අන්දමින් පදවාගෙන යන බවට එම බස් රථයේ ගමන් කළ මඟීන් විසින් කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයෙහි නිලධාරීන් පෙරේදා (21) අත්අඩංගුවට ගෙන ඇත. දෙහිවල ප්‍රදේශයේ පුද්ගලයකුට අයත් මේ බස් රථය කොළඹ - මතුගම මාර්ග බලපත් ලබා ධාවනය කර ඇති අතර පෙරේදා (21) දහවල් කොළඹින් මතුගම බලා ධාවනය කරමින් සිටියදී යටදොල ප්‍රදේශයේදී බස් රථයේ රියැදුරා බස් රථයෙන් බැස ඉවත් වී ගොස් ඇති අතර එම ස්ථානයේ සිට බස් රථය ධාවනය කර ඇත්තේ බස් රථයේ කොන්දොස්තරවරයා විසිනි.

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

තණ කමින් සිටි මී ගවයෝ 16ක් දුම්රියට බිලි

කන්කසන්තුරේ සිට කොළඹ කොටුව බලා ධාවනය වෙමින් තිබූ නගරාන්තර ශීඝ්‍රගාමී දුම්රියට ඊයේ (22) උදෑසන වවුනියාව ඕමන්ත ප්‍රදේශයේදී මී ගවයන් රංචුවක් ගැටීම හේතුවෙන් මී ගවයෝ 16 දෙනකු එම ස්ථානයේදීම මිය ගොස් තවත් හය දෙනකු තුවාල ලබා තිබේ. මියගිය මී ගවයන් ගව පට්ටි හිමියන් දෙදෙනකුට අයත් අතර ඔවුන් කියා සිටියේ මී ගවයන් 16 දෙනා මිය යෑම හේතුවෙන් රුපියල් ලක්ෂ තිහක පමණ පඩුවක් සිදුව ඇති බවයි.

මේ දිනවල වවුනියාව ඕමන්ත ප්‍රදේශයේ තණබිම් නියඟයට හසුවී විනාශ වී ගොස් තිබීමත් මී ගවයන්ට ලැහීම සඳහා ප්‍රමාණවත් ජලය ඇති තැන් නැති වීමත් හේතුවෙන් මී ගවයන් හා එළ ගවයන් රංචු පිටින් දුම්රිය මාර්ගය දෙපස ඇති තණකොළ කෑමට පුරුදුව ඇති බවට ගව හිමිකරුවෝ පවසා සිටිති. දුම්රිය අනතුරට ලක් වූ මී ගවයන් 16 දෙනාද එසේ තණකොළ කමින් සිට දුම්රිය පැමිණෙනු දැක බියට පත්ව දුම්රිය මාර්ගය දිගේ දිව යෑම හේතුවෙන් මෙසේ අනතුරට පත්ව තිබේ.

ඊ. සී .ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

මහකුඹුක්කඩවල ගමට වනඅලි බියක්

තනි දළයා ජීවිත හතරක් බිල්ලට අරන්

මේ දිනවල ගම්වැදී සිටින සය දෙනකුගෙන් සමන්විත වන අලි රංචුවක් විසින් තම ප්‍රදේශයන්හී භවභෝග විනාශ කරමින් සිදු කරණු ලබන හානි වලට කිසිදු පිළිසරණක් නැති බැවින් තමන් රාත්‍රී කාලයේ දී ජීවිත ආරක්ෂා කර ගැනීමේ බියෙන් යුතුව ජීවත් වන බව මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාව පෙන්වා දෙති. ගතවූ දින කිහිපය තුළ මෙම වන අලි රංචුව පූනවිටිය, මහකුඹුක්කඩවල, මොහොරිය, කොහොඹගස්වැව, කාකුපඩියාව, එගොඩගම, යන ගම්මානයන්හී රාත්‍රී කාලෙය් දී නිදැල්ලේ ගැවසෙන බවත් ඒ අතර තනි දළයා නමින් හඳුන්වනු ලබන එක් දළයක් පමණක් ඇති අලියකු ද සිටින බවත් කියයි. පසුගිය දිනවල පූනවිටිය ප්‍රදේශයට වන අලි හානි වැඩිවූ බවත් කියති. මෙම තනි දළයා පසුගිය දිනවල පුද්ගලයින් සිව් දෙනෙකුට පහර දි ඝාතනය කළ බවත් මෙම තත්ත්වය තුළ මෙම මිනිමරු තනි දළයාට ප්‍රදේශවාසීන් දැඩි බියක් දක්වන බවත් පැවැසේ. පසුගිය කාලයේ ප්‍රදේශයේ කුඹුරුවලට කඩා පැන පීදුන ගොයම කා දැමූ මෙම වන අලින් මේ වන විට ගොයම් කපා අස්වනු ගෙට ගෙනැවිත් ඇති නිසා ගම්මානය පුරා නිදැල්ලේ සැරි සරමින් සෙසු වගා විනාශ කරමින් සිටින බවත් ගම්වාසීන් පෙන්වා දෙති. මේ නිසා මේ වන විට පොල්, කොස්, අඹ, කජු, කෙසෙල් වගාවන් මුළුමනන්ම විනාශ කර ඇති බවත් මෑතක දී සිටුවන ලද පොල් පැල ගලවා එම ගෙඩි පාගා බිඳ ඒ තුළ ඇති පැලපී ගෙඩිය කා දමා ඇති බවත් කියති. මෙම බියකරු තත්ත්වය තුළ රාත්‍රී කාලයේ දි ගම්මුන් එළි පහලියට යෑමට පවා දැඩි ලෙසින් බිය වෙති. පුත්තලම සහකාර වනජීවි අධ්‍යක්ෂ එරන්ද ගමගේ මහතා පෙන්වා දුන්නේ මෙම වන අලින් ගම්වැදීමේ ගැටලුව ගැන ගම්වාසින් තමන් දැනුවත් කර ඇති බවත් ඒ අනුව වනජීවි නිලධාරින්ගෙන් සමන්විත විශේෂ කණ්ඩායමක් එම ප්‍රදේශයට යවා පරීක්ෂා කරණු ලබන බවත් මෙම ප්‍රදේශයට අරක්ගත් අලීන්ගෙන් මෙම සංඛ්‍යාව පමණක් ඉතිරිව සිටින අතර මෙම අලින් පලවා හැරීමට කඩිනමින් පියවර ගන්නා බවත්ය.

පී. පී. ජී. සුගතදාස - තිහගොඩ සමූහ

පිටබැද්දර වසම් 40ක සංවර්ධන ව්‍යාපෘතිවලට ලක්ෂ 800ක්

පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොදියුණු ගම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මත කෙරේ. යෝජිත සංවර්ධන ව්‍යාපෘති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක බවත්, ඒ යටතේ සංවර්ධනය සඳහා සියලුම ග්‍රාම නිලධාරි වසම් තෝරාගෙන තිබෙන බවත් පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ සභාපති මහින්ද සිරිවර්ධන මහතා පවසයි. ග්‍රාමීය නොදියුණු මාර්ග සංවර්ධනයට මෙහිදී ඉහළ ප්‍රමුඛත්වය ලබාදී ඇත. ඒ අනුව පොදුජනගම මාර්ගය, කලුබෝවිටියන සෞඛ්‍ය මධ්‍යස්ථාන මාර්ගය, උඩවකන්ද මාර්ගය, දෙලකුඩහේන රජවත්ත මාර්ගය, 2 පියවර 48 අතුරු මාර්ගය, එලමල්දෙණිය පාසල් මාවත හා බොරදිය ඇල්ල මාර්ගය ඇතුළු ග්‍රාමීය අබලන් මාර්ග 142ක් දැනටමත් සංවර්ධනය කර තිබෙන බව පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ සභාපති මහින්ද සිරිවර්ධන මහතා කීය. මාර්ග කොන්ක්‍රීට් කිරීම, කැටගල් ඇතිරීම, ගල් අතුරා තාර දැමීම, කාපට් කිරීම,පැති බැම්, මාර්ග දෙපැති කාණු පද්ධති හා බෝක්කු අලුතින් ඉදිකිරීම හා අලුත් වැඩියා කිරීම එම සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉටුකර තිබේ. ග්‍රාම නිලධාරී වසමක සංවර්ධනය සඳහා වැයකර තිබෙන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ලක්ෂ 20කි.

ඒ අනුව කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 40 සංවර්ධනය සඳහා වැයකරන ලද සම්පූර්ණ මුදල රුපියල් ලක්ෂ 800කි. මධ්‍යම රජය අවශ්‍ය ප්‍රතිපාදන ලබාදී තිබෙන බව සභාපති මහින්ද සිරිවර්ධන මහතා වැඩිදුරටත් පැවසීය.

බී. ඩබ්ලිව්. ඩී. ධර්මකීර්ති - තලාව සමූහ

රුපියල් 5000 නැතිව මැදගම වැසියෝ විරෝධතාවක

ගල්ගමුව මැදගම ජනතාව පසුගිය 21 වැනිදා නිහඬ විරෝධතාවක නියැළිණි .රුපියල් 5000 අවුරුදු දීමනාව ලැබුණු නැති බව කියමින් ඔවුහු මෙසේ උද්ඝෝෂණයක නිරත විය. ගල්ගමුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක87 ,මැදගම ග්‍රාම නිලධාරී වසමේ ජනතාව අනුරාධපුර මාර්ගයේ මැදගම සමෘද්ධි බැංකුව ඉදිරිපිටදී මෙය පැවැත්විණි. කුලීවැඩ හා කම්කරු රැකියාව කරමින් ජීවත් වන තමන්ට මෙම දීමනාව ලබානොදී ස්ථිර ආදායම් මාර්ග ඇති පිරිසට මෙම දීමනාව ලබාදීමට නිලධාරීන් කටයුතු කළ බවට එම ජනතාව මෙහිදී චෝදනා කළහ. මෙම ග්‍රාම නිලධාරි වසමේ පවුල් 600ක් ජීවත්වන අතර ඉන් 100කට අධික පිරිසකට මෙම දීමනාව අහිමිවූ බව පැවසේ. පැය දෙකකට ආසන්න කාලයක් විරෝධතාව පැවතියද වගකිවයුතු කිසිදු බලධාරියකු මෙම ස්ථානයට නොපැමිණීම දැඩි පිළිකුලෙන් හෙලාදකින බවද ඔවුහු පැවසුහ.

මොල්ලිපොතාන සමූහ

කින්නියා කුරුන්වන්කර්නි පාලමේ ඉදිකිරීම් අරඹයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කින්නියා - කුරුන්වන්කර්නි මාර්ගයේ කුරුන්වන්කර්නි කළපුව හරහා "කුරුන්වන්කර්නි පාලමේ" ඉදිකිරීම් කටයුතු පසුගිය (10) වැනිදා ආරම්භ කෙරිණි. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් කරමින් ක්‍රියාත්මක වන ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ මෙම පාලමේ ඉදිකිරීම් ආරම්භ කරනු ලැබිය. මෙම පාලම ඉදිකිරීමෙන් කින්නියා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා කින්නියා නගර සභා බල ප්‍රදේශ දෙක යා කෙරෙනු ඇත. ප්‍රදේශයේ ජනතාව කුරුන්වන්කර්නි හා කින්නියා අතර ගමනා ගමන කටයුතු සඳහා ප්‍රවාහන මාධ්‍යයක් ලෙස මේ වන විට බෝට්ටු යොදා ගනු ලැබේ. මෙම පාලම ඉදිකිරීමෙන් ලක්ෂයකට වැඩි පිරිසකගේ ගමනා ගමන කටයුතු පහසු කරලනු ඇත. කුරුන්වන්කර්නි කළපුව හරහා ඉදිකරනු ලබන මෙම පාලමේ දිග මීටර් 120කි. ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 750කි. අදියර තුනක් යටතේ ඉදිකිරීම් සිදු කරනු ලැබේ.

දිනමිණ දිසත දස අත ම එක තැන

පී. මද්දුමගේ - මාවරල සමූහ

යල කන්නයට පොහොර බෙදා දීම සාර්ථකයි

2021 යල් කන්නය සඳහා මාතර දිස්ත්‍රික්කයේ වගා කරන කුඹුරු හෙක්ටයාර 14826ක් වෙනුවෙන් අවශ්‍ය පොහොර බෙදා හැරීමට කටයුතු කර ඇති බව පොහොර ලේකම් කාර්යාලයේ,මාතර දිස්ත්‍රික් අධ්‍යක්ෂ බී.එච්.කේ.අජිත් මහතා පැවැසීය. මහාවාරි මාර්ග ජල පෝෂිත කුඹුරු හෙක්ටයාර 3557 ක්ද,සුළු වාරිමාර්ග ජල පෝෂිත කුඹුරු හෙක්ටයාර 4475 ක්ද ,අහස් දියෙන් වගා කරන කුඹුරු හෙක්ටයාර 6794 ක්ද මෙවර යල කන්නයේ වගා කිරීමට ඇස්තමේන්තු කර ඇති අතර ,ඒ සඳහා යූරියා පොහොර මෙට්‍රික් ටොන් 1973.82 ක්ද,ටී.එස්.පී පොහොර මෙට්‍රික් ටොන් 330.98 ක්ද, එම්.ඕ.පී. පොහොර මෙට්‍රික් ටොන් 1194.87 ක්ද වශයෙන් මෙට්‍රික් ටොන් 3499.67 ක ප්‍රමාණයක් දැනට දිස්ත්‍රික් ගබඩාවල ඇති බවද ඒ මහතා වැඩිදුරටත් පැවැසීය.

දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සංවර්ධන මධ්‍යස්ථාන 22ක් මඟින් මෙම පොහොර ගොවි ජනජතාව වෙත බෙදා හැරීමට ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය පියවර ගෙන ඇති බවද අජිත් මහතා කීවේය.

ජස්ටින් පතිරගේ - බද්දේගම මධ්‍යම විශේෂ

වදුරඹ ස්ථානාධිපතිට තර්ජනය කිරීම: බද්දේගම ප්‍රා. සභා මන්ත්‍රී යළි රිමාන්ඩ්

බද්දේගම ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරයකු පසුගිය දින වදුරඹ පොලිස් ස්ථානාධිපතිවරයාට බැණ තර්ජනය කළැයි කියන සිද්ධියක් සම්බන්ධව සැකපිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කළ අදාළ මන්ත්‍රීවරයා ලබන මැයි මස 03වැනි දින දක්වා යළි රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස බද්දේගම ප්‍රධාන මහෙස්ත්‍රාත් එච්.යූ.කේ. පැල්පොල මහතා පසුගියදා නියෝග කරන ලදී. මොහු පිළිබඳ පැවති නඩුව බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයේදී පසුගියදා යළි කැඳවූ අවස්ථාවේදී බද්දේගම මහේස්ත්‍රාත් වරයා එම නියෝගය දෙන ලදි. මෙම මන්ත්‍රීවරයාට ඇති චෝදනාව අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ 2015 අංක 04 දරණ පනතින් නඩුව පවත්වාගෙන යෑමට හැකිද යන්න පිළිබඳ නීතිපති උපදෙස් මෙතෙක් අධිකරණයට ලැබී නොමැති බවට කරුණු ඉදිරිපත් විය. මන්ත්‍රීවරයා වෙනුවෙන් නීතිඥ නයන කිර්ති අබේධීර මහතා, ප්‍රියංකර ලියනගේ මහතා, ජානක ගමගේ මහතා, තුසිත ජාගොඩ මහතා මන්ත්‍රීවරයාගේ පාර්ශවය වෙනුවෙන් බද්දේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටියහ.

ඇම්. පී. මුනිදාස - ඉඳුරුව සමූහ

කොළඹ ශාස්ත්‍ර පීඨ ලියෝවරු බෙන්තොට වෙරළ පිරිසුදු කරති

ජාත්‍යන්තර සිංහ සමාජයට අනුබද්ධිත යොවුන් සංවිධානයක් වන කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ලියෝ සමාජයේ මූලික අරමුණක් වන ජලජ ජීවී සම්පත හා වන සම්පත ආරක්ෂා කිරීම යටතේ nature unleash ව්‍යාපෘතියේ අදියර කිහිපයක් සාමාජික සාමාජිකාවන් 35 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පසුගියදා බෙන්තොට හා ඉඳුරුවේදී ඉතා සාර්ථක අයුරින් ක්‍රියාවට නැගුණි. බෙන්තොට වෙරළ තීරය පිරිසුදු කිරීම, ඒ අවට පොල් පැළ සිටුවීම, ඉඳුරුව කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයේ කැස්බෑවන් පිළිබඳ අධ්‍යයනය කිරීම, හා එම සතුන් පිරිසුදු කිරීමට දායක වීම, මේ ව්‍යාපෘතියට සම්බන්ධව දවසක් පුරා ක්‍රියාත්මක කෙරිණි. තරුණ පරපුරේ නායකත්ව කුසලතා වර්ධනය කිරීමට සමාජ සේවා ක්‍රියාකාරකම්වල නිරත වීම මෙම සමාජයේ ප්‍රධාන පරමාර්ථය වන අතර තාරුණ්‍ය සවිබල ගැන්වීම, යහපත් සෞඛ්‍ය ක්‍රම හුරු කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති කිරීම, දුප්පත් කම පිටු දැකීම, පරිසර සංරක්ෂණය, ආදී තේමාවන් යටතේ මෙම ලියෝ සමාජය විසින් විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබන බව එහි වත්මන් සභාපතිනිය වන ලියෝ මල්මි කුරුප්පු මෙනෙවිය පැවසුවාය. මෙහි සම්බන්ධීකාරක කටයුතු හා මෙහෙයවීම සිදු කළ එහි උප සභාපතිනිය වන ලියෝ සජානී විජේසූරිය මෙනෙවිය පැවසුවේ මෙදින තම කටයුතු සාර්ථක කර ගැනීමට බෙන්තොට සංචාරක නිවාඩු නිකේතන බාර නිලධාරි නුවන් මහවත්ත මහතා හා කැස්බෑ මධ්‍යස්ථානයේ නිලධාරීන් දැක් වූ සහයෝගය අගය කරන බවයි.

ආර්. එම්. විජේරත්න - හාලිඇළ සමූහ

විභාගය සමත් වුණත් පත්වීම් නෑ ඌවේ ගුරු පුරප්පාඩු 2000ක්

මෙතෙක් පත්වීම් නොලද ඌව පළාතේ ගුරු විභාග සමත් සියලු දෙනාට කඩිනමින් පත්වීම් ලබාදෙන ලෙස ඉල්ලා ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරි සංගමය හා ඌව පළාතේ ඉංග්‍රීසි උසස් ජාතික ඩිප්ලෝමා සමතුන් සමඟ එක්ව ඌව පළාත් ගුරු විභාග සමතුන්ගේ සංගමය විසින් සංවිධාන කළ විරෝධතා උද්ඝෝෂණයක් පසුගිය (21) වැනිදා ඌව පළාත් සභාව ඉදිරිපිටදී පැවැත්විණි. බදුල්ල සේනානායක පිටියේ සිට බැනර් හා පුවරු ප්‍රදර්ශනය කරමින් නගරය හරහා ඌව පළාත් සභාව අසලට පාගමනින් පැමිණි පිරිස පළාත් සභාව ඉදිරියේදී විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් විරෝධතා පාඨ කියමින් උද්ඝෝෂණයේ යෙදුණහ. මේ වන විට ඌව පළාතේ පාසල්වල විශාල ගුරු හිඟයක් පවතින අතර පාසල් රැසක් ගුරු හිඟය හේතුවෙන් වැසීගොස් ඇතැයිද පළාත තුළ ගුරු පුරප්පාඩු 2000 කට අධික සංඛ්‍යාවක් තිබියදී පළාතේ මේ වන විට සිටින ගුරු විභාගය සමතුන් 1000කට අඩු පිරිසට පත්වීම් ලබාදීමට බලධාරීන් කටයුතු නොකරන බවද ඔවුහු චෝදනා කරති. එසේම සෙසු පළාත්වල මෙම ගුරුවිභාග සමතුන්ට පත්වීම් ලබාදී ඇතත් ඌව පළාතේ ගුරු විභාග සමතුන්ගේ රැකියා ප්‍රශ්නයට හා පාසල්වල ගුරු හිඟයටද විසඳුම් ලබාදීමට ඌව ආණ්ඩුකාරවරයා හා පළාතේ අධ්‍යාපන බලධාරීන් මෙතෙක් අපොහොසත්ව ඇතැයිද ඔවුහු පවසති. මේ සම්බන්ධයෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබාදෙන මෙන් ඉල්ලා තිබුණද ආණ්ඩුකාරවරයා වෙනුවට පළාත් ප්‍රධාන ලේකම් පී.බී.විජේරත්න මහතා තමන් සමඟ සාකච්ඡා කළ බවද පළාතේ ප්‍රාථමික අංශ ගුරු පුරප්පාඩු නොමැති බැවින් පත්වීම් ලබාදීමට හැකියාවක් නැතැයි ප්‍රධාන ලේකම් පැවසූ බවද සඳහන් කළ ඌව පළාත් ගුරු විභාග සමතුන්ගේ සංගමයේ ලේකම් කේ.ඒ.සී. ජේ.නන්දසේන මහතා, ප්‍රධාන ලේකම්වරයා එසේ පවසන නමුත් තම සංගමය කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලින් ලබාගත් තොරතුරු අනුව පළාත තුළ ප්‍රාථමික අංශ ගුරු පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින නමුත් ඒ බව අධ්‍යාපන බලධාරීන් නොපිළිගන්නා බව ගැටලුවක් යැයිද සඳහන් කළේය.

ඩබ්. ක්‍රිස්පිල් බෙනඩික් ප්‍රනාන්දු - පුත්තලම සමූහ

මීඔය පාලම අනතුරේ

ආණමඩුව ගල්ගමුව ප්‍රධාන මාර්ගයේ මහඋස්වැව පිහිටි මීඔය පාලමේ පැතිබැම් තදබල ලෙස සේදී යෑමට ලක්වෙමින් එම බැම් කැඩී යෑමට පටන්ගෙන පාලම ඉතාමත් අවදානම් මෙන්ම අනතුරුදායක තත්ත්වයට පත්ව ඇත. මී ඔය හරහා ඉදි කර ඇති මේ පාලම මතින් දිනපතා දිවා රාත්‍රියේ වාහන විශාල සංඛ්‍යාවත් ධාවනය වේ. ඊට හේතුව හලාවත දෙස සිට අනුරාධපුර දෙසට ධාවනයට ඉතා සුදුසු හා කෙටිම මාර්ගය වීමය.

මී ඔය පාලම නමින් හැඳින්වෙන මේ පාලමේ පැති බැම් සහිත ස්ථාන තුනකින් සේදී ගොස් කඩා වැටීමට ආසන්න තත්ත්වයක පවතින අතර, මේ පිළිබඳව අවධානය යොමු කර ඇති මාර්ග සංවර්ධන අධිකාරිය මේ පාලම අවදානම් තත්ත්වයක පවතින බව පෙන්වා දීමේ පුවරු කිහිපයක් පාලමට ඇතුළු වෙන ස්ථාන දෙකෙහි සවි කිරීම හැර ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ කිසිදු පියවරක් මෙතෙක් ගෙන නොතිබීම කනගාටුවට කරුණක් බව ප්‍රදේශවාසීහු පවසති.

දිනමිණ දස අත ම එක තැන

ඉංගිරිය මධ්‍යම සමූහ - ප්‍රියදර්ශනී කහවල

වැල්මිල්ල-දියකඩ මාර්ගයේ ප්‍රධාන පාලම ගිලා බැහැලා: කැඩී ගියොත් විශාල හානියක් සිදු වෙනවා

ප්‍රියන්ත පනාගොඩ (ශ්‍රීලපොපෙ)

හොරණ ප්‍රාදේශීය සභාව

හොරණ ප්‍රාදේශීය සභාව මඟින් සිදුකරන මහජන සුබසාධක කටයුතු වලට අදාළව මෙම වසරේ අයවැය ප්‍රතිපාදන මත ප්‍රජා වැඩසටහන් රැසක්ම සිදුකිරීමට සැලැසුම් සකස් කර අවසන් බව හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති අශෝක රණතුංග මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය.

සභාපතිවරයා මේ බව පැවසුවේ පසුගියදා ඉංගිරිය මහජන පුස්තකාලයීය ශ්‍රවණාගාරයේදී පැවති හොරණ ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී ය.

සභාපතිවරයා මෙසේද කීය.

මේ යටතේ ප්‍රජා මණ්ඩල සඳහා ප්ලාස්ටික් පුටු, මඩු හා ආවරණ ලබාදීම, වැසිකිළි ආධාර ලබාදීම, ප්‍රජා ශාලා වැඩිදියුණු කිරීම, සුසාන භූමි පවිත්‍ර කිරීම, බිලිඳු දරුවන් සඳහා "සහන ප්‍රදාන" ලබාදීම ආදී වැඩසටහන් දාහතරක් ක්‍රියාත්මක කළයුතු බවට මා යෝජනා කරනවා.

සනත් විපුලජීව මහතා (ශ්‍රීලපොපෙ) - ප්‍රජා මණ්ඩල සඳහා බුලේ සෙට් එකක් සහ අත සේදීමට සින්ක් එකක් ලබාදීමත් එම යෝජනා වලටම ඇතුළත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඒ වගේම දරුවන් හතරකට වඩා සිටින පවුලකට සහන මල්ලක් ලබාදෙන ලෙසටත් යෝජනා කරනවා.

ප්‍රියන්ත පනාගොඩ මහතා (ශ්‍රීලපොපෙ) - වැල්මිල්ල මාරගස් හන්දියේ සිට තැඩගංගොඩ දියකඩ දක්වා ඇති මාර්ගයේ ප්‍රධාන පාලම දැනට දෙපැත්තෙන් ගිලා බැහැලා. මේක කැඩීගියොත් විශාල හානියක් සිදුවෙනවා වගේම විශාල මුදලකුත් ප්‍රතිසංස්කරණයට වැයවෙනවා. මෙම පාලම අලුත්වැඩියා කිරීම ඉක්මනින් සිදුකළ යුතුයි.

රංජිත් චන්ද්‍රසිරි මහතා (ශ්‍රීලපොපෙ) - මේ පාලම අඩි 40ක් විතර දිග එකක්. මෙය කැඩී ගියොත් නැවත සෑදීමට ලක්ෂ 200කට අධික මුදලක් වියදම් කිරීමට සිදුවෙනවා. එසේ හෙයින් කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීම ඉතා වැදගත්.

ප්‍රියන්ත පනාගොඩ මහතා (ශ්‍රීලපොපෙ) - වාහන වල බර ප්‍රමාණය සඳහන් කරලා පාලම් අසළ බෝඩ් එකක් ගහන්න කියලා අපි ඉල්ලීම් කරන්නේ දීර්ඝ කාලයක ඉඳලා. ඒත් අද වෙනකම් කිසිම තැනක එහෙම සවිකරපු බෝඩ් අපි දැකලා නැහැ.

රේණුකා දමයන්ති මහත්මිය (එජාප) - ඒ ප්‍රදේශය ඉතාම ජනාකීර්ණ ප්‍රදේශයක්. ඉතා ඉක්මනින් මෙම පාලමේ කටයුතු ඇරඹිය යුතුයි.

අජිත් බැද්දගේ මහතා (ශ්‍රීලපොපෙ) - දකුණු උඩුව, මාලොස් ඇළ මාර්ගය කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කළයුතු බව මා යෝජනා කර සිටිනවා. ඒ වගේම දකුණු උඩුව දේවාල මාර්ගයේ පින් ළිඳ අසළ ඇති බෝක්කුවත් අලුත්වැඩියාවට ලක්විය යුතුයි.

ප්‍රියන්ත රත්නසේකර මහතා (ශ්‍රීලපොපෙ) - බොරළුගොඩ ප්‍රජා ශාලාවේ පවත්වාගෙන යන රුවන් පෙර පාසල ප්‍රාදේශීය සභාවෙන් ක්‍රියාත්මක කරන පෙර පාසලක් බවට පත්කිරීමට මා යෝජනා කරනවා. එම පෙරපාසලට අවශ්‍ය ශාලා පහසුකම්, උපකරණ සහ අනෙකුත් සම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහාත්, මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේත් ලබාදීමට කටයුතු කර තිබෙනවා. ඒ වගේම පෝරුවදණ්ඩ, බොරළුගොඩ සල්උයන් කන්ද ජනපදයේ පොදු සුසාන භූමියේ ආවරණයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවක් අනුව මෙම වසරේ මාපුටුගල කොට්ඨාසයට වෙන්ව ඇති රුපියල් ලක්ෂ 5ක මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් වෙන්කරන ලෙසත් යෝජනා කර සිටිනවා.

සභාපති අශෝක රණතුංග මහතා (ශ්‍රීලපොපෙ) - හොරණ ප්‍රාදේශීය සභාව සතු වාහන වෙනුවෙන් ජීපීඑස් තාක්ෂණය හඳුන්වා දීමට සැලැසුම් කර තිබෙනවා. මෙහිදී මාස හයක කාල සීමාවක දත්ත ගබඩාවීම සිදුවෙනවා. එහිදී අපිට එම වාහන ආගිය ස්ථාන, නවතා තැබූ කාල සීමාව, ගමන්ගත් මාර්ග ආදී සියලු විස්තර දැනගන්න පුළුවන්. මෙහි පළමු අදියර යටතේ කසළ රථ, කම්පැක්ටර් යන්ත්‍ර, ට්‍රැක්ටර්, ටිපිලාම්පු නඩත්තු කරන වාහන, ටිපර් ආදී වාහන වලට මෙම තාක්ෂණය යොදාගන්නවා.

සනත් විපුලජීව මහතා (ශ්‍රීලපොපෙ) - ප්‍රධාන කාර්යාල, උප කාර්යාල ආදිය සතු අත්‍යවශ්‍ය වාහන ප්‍රමාණය කොතෙක්දැයි ගණන් බලා මෙම තාක්ෂණය ලබාදීමට කටයුතු කිරීම වඩා සුදුසු බව මම යෝජනා කර සිටිනවා.

සභාපති අශෝක රණතුංග මහතා (ශ්‍රීලපොපෙ) - මෙම වසරේ සාහිත්‍ය මාසය වෙනුවෙන් හොරණ ප්‍රාදේශීය සභාව මඟින් වාර්ෂිකව පවත්වනු ලබන "සාහිත්‍ය ප්‍රදීප" සාහිත්‍ය උත්සවය සහ ඊට සමගාමීව පවත්වන සාහිත්‍ය තරඟ සඳහා ඉදිරිපත්ව ජයග්‍රහණය කරන්නන්ට ත්‍යාග ලබාදීමටත්, උත්සවයේ කටයුතු සඳහාත් උත්සව/තරඟ සඳහා ගෙවීම් සිදුකරනු ලබන අයවැය ඇස්තමේන්තුව යටතේ රුපියල් ලක්ෂ නමයක මුදලක් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් වැයකිරීමට යෝජනා කර සිටිනවා.

ආර්. ඇම්. කරුණාතිලක- උඩුබද්දාව සමූහ

පාරවල්වලට නොගැළපෙන වාහන යද්දී බෝක්කු කැඩෙනවා

- සභාපති රාජ් සිසිර කුමාර (ශ්‍රීලපොපෙ)

උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

ගොවියාට මහ ජනතාවට නොපෙනෙන වාසි රැසක් වර්තමාන රජය ලබා දී තිබෙන බවත්,විදේශ රටවල අයගේ නොපැමිණීම නිසා අප රටට ආදායම් අඩු වී තිබෙන බවත්, ජනපතිතුමා කාටවත් ගස් කපන්න කියලවත් විෂ පොල් තෙල් අපරටට ගේන්න කියලවත් නැතැයිද රජය මේවාට එකඟ නම් පරීක්ෂා නොකර ඉන්න තිබූ බවත්, රජය ඒවා පරීක්ෂා කරන්න තිබූ නිසා ඒවා පරීක්ෂා කළ බවත් උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ උප සභාපති නිහාල් ජයසිංහ මහතා පැවැසීය.

උප සභාපති නිහාල් ජයසිංහ මහතා මෙසේ ප්‍රකාශ කළේ උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමේදීය. සභාපති රාජ් සිසිර කුමාර මහතා ගේ ප්‍රධානත්වයෙන් රැස්වීම උඩුබද්දාව ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

ආර්.ඇම්. ගුණවර්ධන මහතා (ශ්‍රීලපොපෙ) - සභාවේ බල පත්‍රයක් නැතිව වැලි අදින අයගෙන් යම් මුදලක් අය කිරීම සුදුසුයි.

සභාපති රාජ් සිසිර කුමාර මහතා (ශ්‍රීලපොපෙ) - බලපත්‍ර දෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.

ජගත් ජීවන්ත මහතා (ශ්‍රීලනිප) - මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල් හැර අනෙක් පාරවල් වල කියුබ් 3ට වැඩියෙන් අදින වාහන භාවිතා කළ හැකිද? බර වැඩි වාහන ගියාම පාරවල්වලට හානි සිදු වෙනවා.එහෙම ගියාම කැඩිල යන පාරවල් කෙතරම් ද ඒවාට අරගෙන තියෙන පියවර මොකක්ද?

සභාපති රාජ් සිසිර කුමාර මහතා (ශ්‍රීලපොපෙ) - අපට ප්‍රශ්න ආවේ හේනේගෙදර, නෑවකඩ බොරළු වළුවල් වලින්. පාරවල්වලට නොගැලපෙන වාහන යද්දී පාරවල්වල බෝක්කු කැඩෙනවා. කර්මාන්ත පුරයට කියලා ලෝඩ් යනවිට කොටසක් යන්නෙ කර්මාන්ත පුරයට තව කොටසක් යන්නෙ පිටතට.

ආර්.ඇම්. ගුණවර්ධන මහතා (ශ්‍රීලපොපෙ) - මාර්ගස්ථ හානි කාර්මිකයකු ලවා නිරීක්ෂණය කර බලා බලපත්‍ර දීම සුදුසුයි.

විජිත කුමාර නරසිංහ මහතා (ශ්‍රීලපොපෙ) - අපිට ලෝඩ් ගාණකට මුදල් ගෙවලා තව ලෝඩ් ගණනාවක් අදිනවා.

විපක්ෂ නායක සංජීව ප්‍රසන්න මහතා (එජාප) - ජනතාව ප්‍රාදේශීය සභාව දෙස නිතරම බලන්නේ .මාර්ගය හානිවීමට ගන්න පුළුවන් මුදලක් ගන්න එකයි අපිට කළ හැක්කේ. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට බොරළු කැපීම් පිළිබඳ ප්‍රශ්න වලට මූණ දීමට සිදුවෙනවා.

සභාපති රාජ් සිසිර කුමාර මහතා (ශ්‍රීලපොපෙ) - කර්මාන්තපුර ප්‍රදේශය දැන් ශීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතිනවා. බොරළු වැලි එතනට අදින මුවාවෙන් වෙන තැන් වලට අදිනවා.

උප සභාපති නිහාල් ජයසිංහ මහතා (ශ්‍රීලපොපෙ) - සුසාන භූමි වෙන් කරද්දී ඒ. ඒ. ආගමික අයට ඉඩ දුන්නා. සමෘද්ධි බැංකුව පොදු ජනතාවට ණය ලබා දෙන බැංකුවක්. සමෘද්ධි බැංකුව පොදු ජනතාවට විශාල සේවයක් සලසන තැනක්. දුම්මලසූරිය සමෘද්ධි බැංකව 2019වර්ෂයේ නොවැම්බර් මාසයේ ගිවිසුම් කාලය ඉවරවෙලා. ආයේ බදු දෙද්දී එහි බදු මුදල වැඩි වෙලා. රුපියල් 32000 මුදල 50% කින් අඩු කරල කොමසාරිස් අනුමැතිය ඇතිව ලබා දෙමු. සමෘද්ධි බැංකුවෙන් ජනතාවට වන සේවය අසීමිතයි.

එච්. එම්. හිෂාන් මහතා (එජාප) - දුම්මලසූරිය සමෘද්ධි බැංකුවෙන් දුප්පත් අයට විශාල සේවයක් සිදු වෙනවා.

උපාලි වීරසිංහ මහතා (ජවිපෙ) - යගම්වෙල කානු පද්ධතිය නිසි පිළිවෙළකට නෑ. ජලය බැස යෑමක් නෑ.

නිලන්ත ගුරුගේ මහතා (ශ්‍රීලපොපෙ) - යන්ත්‍රෝපකරණ ඇණ හිටියම සභාවේ වැඩ යන්නේ නෑ.

සභාපති රාජ් සිසිර කුමාර මහතා (ශ්‍රීලපොපෙ) - ගව ඝාතකාගාර තුනක් පිළිබඳ ප්‍රශ්න සභාවට ඇවිත්ලා තියෙනවා. අපට මුදල් බැඳලා තියෙනවා.

දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

සාමූහිකව වැඩ කරන බවක් අද ගම්වල දකින්න නෑ

ඩබ්ලිව්. රවිදු ප්‍රභාත් ජයරත්න (ශ්‍රීලපොපෙ)

වරකාපොළ ප්‍රාදේශීය සභාව

වරකාපොළ නගරයේ ජල පද්ධතිය සෑමදාම වාගේ පුපුරන නිසා. නගරයේ සහ අවට ජනතාවට නිතරම වගේ ජලය නොමැතිව අපහසුතාවන්ට ලක් වීමට සිදුවන බව වරකාපොළ ප්‍රාදේශීය සභාවේ සභාපති සරත් සුමනසූරිය මහතා (ශ්‍රීලපොපෙ) පැවැසීය.

සරත් සුමනසූරිය මහතා එසේ පැවසුවේ වරකාපොළ ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී පැවති ප්‍රාදේශීය සභා මාසික රැස්වීමට සහභාගි වෙමිනි.

ඩබ්ලිව්.රවිදු ප්‍රභාත් ජයරත්න මහතා (ශ්‍රීලපොපෙ) - නගරබද අය නළ මාර්ගයෙන් ජලය ලබා ගන්නෙ. ඒ නිසා පොදු ළිං පාවිච්චිය අතහැරලා තිබෙන්නේ ඉඩෝරයක් ආවිට තමයි ළිං ශුද්ධ කර ගන්නට වෙන්නෙ. අපි පාරවල් කොන්ක්‍රීට් කරලා අඩි 8 ට සමහර පාරවල් කාපට් දානව. සමහර පාරවල් තාර දමනවා. ඒත් ගම් වල අය ශ්‍රමදාන ආදියට කිසිම සූදානමක් නැහැ. සාමූහික වැඩ කරන වැඩ පිළිවෙළක් අද අද ගම්වල නැහැ. කාලයත් සමඟම මිනිසුන්ගෙ සිතුවිලි වල වෙනස්වීම සිදුවෙලා.

සභාපති සරත් සුමනසූරිය මහතා (ශ්‍රීලපොපෙ) - සභාවෙන් හදපු ළිඳක් ශුද්ධ කරන්න ඕනෑ සභාවෙන් ගිහිල්ලද? ගමේ ඉන්න මන්ත්‍රීවරු දැනගන්න ඕනෑ ගමේ ඉන්න ප්‍රජාවත් එක්ක එකතු වෙලා මේවා හදා ගන්න. ගමේ හදන අඩි 8 පාරටත් පහුවදා වන විට වැට ගහනව නම් කාගෙන්ද මේවා ආරක්ෂා කරන්නෙ මන්ත්‍රීවරු හැටියට ඔබතුමන්ලා වගකීමෙන් කටයුතු කළ යුතුයි. මාහේන ආදාහනාගාරයෙ ජෙනරේටරය කැඩිලා. මේ ජෙනරේටරය අරගෙන තියෙන්නෙ වැට් ගෙවන්න ලියාපදිංචි වුණු වැට් කොම්පැනියකින් නොවෙයි. විගණන විමසුමක් තියෙනව මේ වැට් නොගෙවන තැනකට වැට් ගෙව්වෙ කොහොමද කියලා. මේ ප්‍රශ්නය දිගටම ඇදිල තිබෙනවා. තාම විසඳා ගන්නට බැහැ. මේ ප්‍රශ්න නිසා ජෙනරේටරය හදා ගන්න විදියක් නැහැ. ජෙනරේටර් 2 ක් හෝ 3 ක් ගත්විට එකක් නොමිලේ දෙනවා නේද. එහෙම එකකුත් වෙලා තියෙනවා. දැන් ජෙනරේටරය ගෙනාව තැනක් නැහැ. වරකාපොළ ප්‍රාදේශීය සභාවට ඒ කොම්පැනියෙන් ජෙනරේටරයක් මිලදී ගෙන නැහැ.

එම්. බී. මොහොමඩ් ෂරිප් මහතා (එජාප) - දැන් පරණ ඒව හදල අමාරුවෙ වැටෙන්න බැහැ. මම නම් අත් උස්සන්නෙ නැහැ. මගේ කණ්ඩායම අත උස්සන්නෙ නැහැ. සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම මෙතනින් යන්වා. ඒත් ලේකම්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලය මේකට වගකියන්න වෙනවා. ඒ නිසා අලුත් එකක් ගන්න. ඒත් වර්තමානයෙ මිනිසුන් සිතාගෙන ඉන්නෙ ගමේ ඉන්න මන්ත්‍රීවරයා පාරවල් ශුද්ධ කරලා, ශ්‍රමදාන දාලා, සියල්ල කරන්න ඕනෑ කියලා සිතුවිලි වල තමයි හැසිරෙන්නෙ. මිනිසුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයි. පොදු ළිං ගත් විට සමහර ළිං වැහිලා ගිහිල්ල. සමහර ළිං මිනිසුන් අල්ල ගෙන ඉන්නවා.

එස්.ආර්.කේ. ලොක ගලප්පත්ති මහතා (ශ්‍රීලනිප) - අපේ ප්‍රදේශයේ මොන්රෝවියා වත්තේ පස් කැපවීමක් සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. මෙය 2015 වර්ෂයේ දී නැවැත්වූවා. නැවත වරක් කපන්නයි හදන්නේ . දෙගොල්ලක් තමයි මේක කරන්න යන්නේ. මොන්රෝවියා වත්තේ එක කොටසක් තියෙනවා ඒ. එස්. පී. ග්‍රූප් එකට ඊට අමතරව තමයි මොන්රෝවියා බදු දීල තියෙනවා. මේ කඳුවැටියෙන් ඇළුවල් 06 ක් පටන් ගන්නවා. එනිසා අපි මේවා ආරක්ෂා කල යුතුයි.

එච්. සේනක ප්‍රියන්ත කුමාර මහතා (එජාප) - වරකාපොළ නගරයේ ඉදිකල ළමා උද්‍යානය හා ඇවිදින මංතීරුව පිළිබඳව විවිධ කාරණා ජනතාව ප්‍රකාශ කරනවා. සභාවේ යන්ත්‍ර උපකරණ භාවිතා කර, සභාවේ කම්කරුවො යොදවලා පස් ගොඩකරල එහි සල්ලි ටික සභාපති ගත්තා කියන රාවයක් සමාජ ගත වෙලා තියෙනවා. සභාවේ වාහන භාවිතා කරල වැයවන මුදල් සභාපතිවරයා ගත්තද කියල අහනවා . මම කිව්ව එහෙම දෙයක් වෙලා නැහැ කියල.

සභාපති - හරියට ඇස්තමේන්තු හැදුවොත් මෙයට පස් පුරවන්න කෝටි තුනක් විතර යනවා. ඒ පස් ඔක්කොම නිකං ගත්තෙ.මම දැන් ඕකෙන් ගසා කෑව කියලනෙ කියන්නෙ. ලක්ෂ තිස් දෙකක් වියදම් කරල මේකෙත් ගසා කෑවනම් කීයද මේකෙන් ගසා කන්න පුළුවන්. මට මේකෙන් මුදල් හම්බ කර ගන්න තිබුණා. රෝහල් ගොඩනැඟිල්ලේ පස් ටික කපල මංතීරුවට මෙහා පැත්තෙ පාරට ගොඩකරල සල්ලි ගත්තෙ නැද්ද කියල බලන්නකො පසුගිය සභා වාර්තාව වලින්. ඒත් මම ගත්තෙ නැහැ. ලක්ෂ 32 යි මේකට ගිහිල්ල තියෙන්නෙ.

වැල්ලවාය විශේෂ - ජී. අයි. ආර්. ගරුසිංහ

පොඩි මනුස්සයාගෙන් සල්ලි ගන්නවා නම් මහ පරිමාණ තැබෑරුම්වලින් මුදල් අයකර නොගන්නේ ඇයි?

කැලුම් ප්‍රදීප් (එජාප)

වැල්ලවාය ප්‍රාදේශීය සභාව

සභාවේ ගෞරවයට හානියක් වන ලෙස පසුගිය සබාවේ දි හැසිරුනානම් මම සමාව ඉල්ලා සිටිනවා. මම එදා කියන්න උත්සාහ කළේ කුඩාඔය ප්‍රදේශයේ සුරාසලක් ආරම්භ කරලා තියෙනවා ඒකට විරෝධය පළ කළා. එදා සභාපතිතුමාත් සභානායක තුමත් ඇවිල්ලා ඒක නවත්වනවා කියලා පොරොන්දුවක් දුන්නා. ඒත් ඒක එහෙම වුණේ නෑ. පාර අයිනේ බඩු තියාගෙන ඉන්න මනුස්සයාගෙන් සල්ලි ගන්නවා නම් ත්‍රීවීල් එකෙන් රුපියල් 3000 -5000ක් මුදලක් සභාවෙන් අය කරගන්නව නම් මහා පරිමාණයෙන් ව්‍යාපාර කරන තැබෑරුම්වලින් මුදල් අයකරගන්නේ නැත්තේ ඇයි කියලා මට දැනගන්න ඕනේ යැයි මන්ත්‍රී කැලුම් ප්‍රදීප් මහතා (එජාප) කියා සිටියේය.

වැල්ලවාය ප්‍රාදේශිය සභාවේ උප සභාපති ඩබ්. එම්. චන්ද්‍රසේන වීරකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් වැල්ලවාය ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ රැස්වීම පවත්වන ලදි.

මන්ත්‍රීවරයා මෙසේද කියා සිටියේය.

ආදායම උපයන මොනම ව්‍යාපාරයකින් හෝ බදු මුදල් අයකලයුතුයි කියලා පනතේ පැහැදිලිව තියෙනවා. ඔබතුමාලා මුදල් අය නොකර කරන්නේ වැරැද්දක්. අහිංසකයාගෙන් මුදල් අයකරන්න පුලුවන්නම් ඇයි තැබෑරුමෙන් මුදල් අය කතරන්න බැරි.

විපක්ෂ නායක නිලන්ත අබේ බණ්ඩාර මහතා (එජාප) - මහතා මන්ත්‍රීවරයෙක් අදහස් දැක්වූ විට ඊට පිළිතුරු දෙන්නත් අවස්ථාවක් දෙන්න වැල්ලවායේ යලි කුඩු ජවාරම වගේම සොරකම් වැඩිවෙලා කියලා මාධ්‍යයෙන් දැක්කා . ඒක සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.වැල්ලවායේ පීසීආර් පරීක්ෂණ නතරවෙලා. ලොකේ බොහෝ රටවල් වල මේ අවධානම වැඩිවෙලා .වැල්ලවායේ ජනතාව ආරක්ෂා කරගන්න දැන්වත් කිරීමේ වැඩපිළිවෙළක් වත් හදන්න.

සම්පත් විජේසිංහ මහතා (එජාප) - වැල්ලවාය ආයුර්වේදයේ බෙහෙත් නෑ. ගම්වල අසරණ ජනතාව බෙහෙත් ගන්න ඇවිල්ලා හිස් අතින් යනවා. පසුගිය අයවැයෙන් මුදල් වෙන් කළා නේද. බස්නැවතුමේ අනතුරුදායක ස්ථාන තාවම හදලා නෑ. ඒ ගැන අවධානය යොමු කරන්න.

ශ්‍යමන් කුරුප්පුආරච්චි මහතා (ශ්‍රීලපොපෙ) - කුඩාඔය සතිපොළට තියෙන දවසට වතුර බවුසරයක් යවන්න වැසිකිළියට යන්නවත් වතුර නෑ. සභාපතිතුමා, ලේකම් තුමා කිව්වට බවුසරේ ගෙනියන්නේ පොළ දවසට දවල්ට. පහුගිය දවසක ගෙනියන්න කිව්වම රියදුරු බිලා ඉඳලා .මහජනතාවට පිටින් එන වෙළෙඳුන්ට ජලය ලබාදෙන්න කටයුතු කරන්න. සභාවේ කතාබහ ඉදිරියට ගෙනියන්න සම්බන්ධීකරණ කමිටුවට යොමුකළා. එහි සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ශෂේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා තීරණයක් ගත්තා ඉඩම් දෙන එක පරිසරයට හානිවෙන සිදුවීම් සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරලා නියෝජිතයන් නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක්ට දාලා තීරණය කරනවා කියලා. තාවකාලිකව තහනම් කළා. ඒක නිසා අපිට ඉඩම් හා පරිසරය සම්බන්ධයෙන් විශාල ආරක්ෂාවක් තාවකාලිකව ලබා ගැනීමට හැකිවුණා. ඒක නිසා අපේ වගකීමක් තියෙනවා පක්ෂ විපක්ෂ සියලු දෙනා යමක් දැක්කොත් එතුමාගේ අවධානයට යොමු කරවීම. ඒ වගේම ඇතිලිවැව යෝජිත බාර් එක සම්බන්ධයෙන් කතාකළා. සම්බන්ධීකරණ කමිටුවේදි අනුමැතිය ලබාදුන්නේ නෑ. කුඩාඔය බාර් එකට කමිටුවේ අනුමැතිය ලැබිලා තියෙනවා. පස්සේ තමයි අපි දැනගත්තේ.

බී.ටී. තඹවිට - මතුගම

චොපර් එකෙන් යන ඇමැතිවරුන් පාරක යනකොට ජනතාව විඳින දුක දන්නේ නෑ

සභාපති මෙරිල් මුණසිංහ

මතුගම ප්‍රාදේශීය සභාව

රුපියල් කෝටි 11 ක වියදමින් පසුගිය රජය මතුගම වැල්කන්දල පාර ඉදිකිරීම් ආරම්භ කළත් එම සංවර්ධන කටයුතු අතරමඟ නතරකර දැමීම නිසා එම මාර්ගය භාවිතා කරන ජනතාව දැඩි ලෙස පීඩාවට පත් වෙනවා. කුමන ගැටලු පැවතියත් අප එම මාර්ගය ජනතාවට නිරුපද්‍රිතව ගමන කළ හැකි තත්ත්වයට සකසා දීමට කටයුතු අරනවයැයි මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපති මෙරිල් මුණසිංහ මහතා මතුගම ප්‍රාදේශීය සභාවේ මාසික සභාව ආරම්භ කරමින් පැවැසීය.

මතුගම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවති මාසික සභාවේදී සභාපති වරයා මෙසේද පැවසීය.

පසුගිය රජයේ ඇමැතිවරයකුට අයත් සමාගමක් අයි. රෝඩ් ව්‍යාපෘතියෙන් මාර්ග ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළත් එම සියලු මාර්ග ඉදිකිරීම් කටයුතු අතරමඟ නතරකර දමා ගොස් තිබෙනවා. මෙම තත්ත්වය නිසා එම මාර්ග තිබුණු තත්ත්වයටත් වඩා අබලන් වීම නිසා ජනතාව පීඩාවට පත්වී තිබෙනවා. චොපර් එකෙන් යන හිටපු ඇමැතිවරයකු ජනතාව පාරක යනකොට විඳින දුක දන්නේ නැහැ. ගමේ පාරක් හදන ගමේ සමිතියක් හරියට වැඩ නොකළොත් ආසාදු ලේඛනයට ඇතුළත් කරනවා. ඒත් මෙම සමාගමට එහෙම කරලා නැහැ.පාර හදන කාලේ එම පක්ෂයේ නියෝජිතයන් ඉදිකිරීම් පිළිබඳව සොයා බැලුවානම් මෙහෙම වෙන්නේ නැහැ.කෙසේ වෙතත් අප ප්‍රදේශයේ බදු ගෙවන ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් වැල්කන්දල මාර්ගය පිළිසකර කිරීමට කටයුතු කරනවා.

පුෂ්පා නන්දනී මහත්මිය (එජාප) - අපේ රජය කාලේ වැල්කන්දල මාර්ගයේ ඉදිකිරීම කටයුතු එම සමාගම අතරමඟ නතරකර දමා ගියා. අප එයට විරෝධය දැක්වුවත් වැඩක් වුණේ නැහැ. ඒ කාලේ වගකිවයුතු නිලධාරීන් සාධාරණය ඉටුකළේ නැහැ. ජනාධිපතිතුමාට දැනුම් දී හෝ මෙම මාර්ගය හදන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මෙම පාර හදන්න ඉදිරිපත්වීම පිළිබඳව මතුගම ප්‍රාදේශීය සභාවට ස්තුතිවන්ත වෙනවා.

ලීලා මුණසිංහ මහත්මිය (එජාප) - මතුගම 805 බී.උතුර ග්‍රාම නිලධාරී වසමේ හොරකඳමුල්ල මාර්ගයේ ජල සම්පාදන නළ එළීමේදී අක්‍රමවත් කැණීම් නිසා ජනතාවට විශාල අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවී තිබෙනවා. ඔවුන් ක්‍රමවත් ආකාරයෙන් කැණීම් කරන්නේ නැහැ. මේ පිළිබඳ සභාවේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනවා.

උප සභාපති ලලිත් රණසිංහ මහතා (ශ්‍රීලපොපෙ) -

ජලසම්පාදන ව්‍යාපෘතිය නිසා මතුගම පාරවල් ටික ඉවරෙටම ඉවරයි.ජලය අවශ්‍ය නිසා නිශ්ශබ්දව සිටියත් පාරවල් ටික විනාශයි. නිසි ක්‍රමවේදයකට ජල ව්‍යාපෘතියේ වැඩ සිදුවෙන්නේ නැහැ.

සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා (ස්වාධීන) -

බෝක්කු වලට අවශ්‍ය සැලසුම් නැති නිසා මාර්ග කටයුතු අවසන් කරන්න බැහැ. කළුතර මතුගම පාරේ ප්‍රධාන පාලම වලට සැලසුම් ඇවිත් නැහැ. ප්‍රධාන සමාගමෙන් උප සමාගම් වලට අවශ්‍ය දේවල් නොලැබීම නිසයි එහෙම වෙන්නේ. භූගත දුරකථන රැහැන් පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දන්නේ නැහැ.ඒ නිසා පාරවල් කඩ කඩ හදන්න සිදුවෙලා.

අතුල මද්දුමගේ මහතා (ශ්‍රීලපොපෙ) - පෙත්තකන්ද මාර්ගය අවසාන කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට සභාවට යෝජනා කරනවා.

මහජන බැංකුව

රන් භාණ්ඩ උකස් වෙන්දේසිය

මහජන බැංකුවේ පොළොන්නරුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයට අයත් පහත සඳහන් ශාඛා සහ සේවා මධ්‍යස්ථානවල 2019-12-31 දින දක්වා උකස් කරන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හි සහ ස්ථානයන්හි පෙ.ව. 9.00 ට ආරම්භ කර වෙන්දේසි කරනු ලැබෙන බව මෙයින් දන්වා සිටිමු.

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැනුම්දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල්දැමීම, ඒකාබද්ධ කොට පැවැත්වීම හෝ මෙවැනි යම් කටයුත්තක් කිරීමේ අයිතිය බැංකුව සතුය.

ශාඛාව/ සේවා මධ්‍යස්ථානය	පහත දින දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ	වෙන්දේසියට යෝජිත දිනය	වෙන්දේසි පරිශ්‍රය
වැලිකන්ද සෙවනපිටිය සේවා මධ්‍යස්ථානය	2021-05-12	2021-05-13	වැලිකන්ද ශාඛාව
දෙහිඅත්තකණ්ඩිය සිරිපුර සේවා මධ්‍යස්ථානය සඳුන්පුර සේවා මධ්‍යස්ථානය	2021-05-14	2021-05-15 2021-05-16	දෙහිඅත්තකණ්ඩිය ශාඛාව
මැදිරිගිරිය දියසෙන්පුර සේවා මධ්‍යස්ථානය			මැදිරිගිරිය ශාඛාව
හබරණ ශාඛාව			හබරණ ශාඛාව
අරලගංවිල ශාඛාව	2021-06-04	2021-06-05 2021-06-06	අරලගංවිල ශාඛාව
පොළොන්නරුව නගර ලංකාපුර සේවා මධ්‍යස්ථානය ජයන්තිපුර සේවා මධ්‍යස්ථානය	2021-06-04	2021-06-05	පොළොන්නරුව නගර ශාඛාව
බකමූණ දියබෙදුම සේවා මධ්‍යස්ථානය			බකමූණ ශාඛාව
පොළොන්නරුව කඳුරුවෙල සේවා මධ්‍යස්ථානය	2021-06-11	2021-06-12	කඳුරුවෙල සේවා මධ්‍යස්ථානය
හිඟුරක්ගොඩ ශාඛාව			හිඟුරක්ගොඩ ශාඛාව
තඹාල ශාඛාව	2021-06-18	2021-06-19	තඹාල ශාඛාව

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, නව නගරය, පොළොන්නරුව.
දුරකථන අංක : 027-2223900/2224404/
2225760/2226626/2226625.

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද බව දන්වනු ලැබේ.

සමාගමේ නම :
ජාඩ් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 00211175
ලියාපදිංචි කාර්යාලය :
ඩීන්ස් බිල්ඩිං හොටෙල්, ආරුගම්බේ 18.
සංස්ථාගත කළ දිනය : **2019-04-18 දින**
සමාගම් ලේකම්.

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද බව දන්වනු ලැබේ.

සමාගමේ නම :
මයික්‍රෝ ලයිට්න්ග් Z-K (පීවීටී) එල් ටී ඩී
සමාගමේ අංකය : PV 130313
ලියාපදිංචි කාර්යාලය :
නො.42, කුමාර වීදිය, කොළඹ 11.
සංස්ථාගත කළ දිනය : **2018-02-28 දින**
සමාගම් ලේකම්.

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද බව දන්වනු ලැබේ.

සමාගමේ නම : **ට්‍රෙන්ඩ්ස් ඉන්ජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී**
සමාගමේ අංකය : PV 00214623
ලියාපදිංචි කාර්යාලය : 68C, ජාමියා නලිමියා පාර, අඹෙපිටිය, බේරුවල.
සංස්ථාගත කළ දිනය : 2019-08-16 දින
සමාගම් ලේකම්.

වින්ඩිපෝස් ලිමිටඩ්.
PB00234079.

ලියාපදිංචි අංක PB00234079 දරන වින්ඩිපෝස් ලිමිටඩ් සමාගමේ 2021 අප්‍රේල් මස 22 වෙනි දින තිබූ සමාගමේ කොටස් හොඳැති කොටස් හුවමාරුවේ ප්‍රධාන මණ්ඩලයේ අනුමැතිකරන ලද අයුරු,
ඒ අනුව එම සමාගමේ රහිත කොටස් අතර ඇති "සමාගම" යන වචනයට පූර්වයෙන් "හොඳ" (සී.එල්.ඩී) යන වචනය එකතු කිරීම මගින් සමාගමේ පනතේ 8 වන වගන්තියේ (1) උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව නම වෙනස් කිරීම පිළිබඳ යෝජනා පමණක සාධාරණ ලැබූ බලය සලකනු ලැබිය යුතුය.

කොළඹදිස්ට්‍රික් කොම්පැනිස් සෙක්‍රටරිවරුන්.

ITN SriLanka

ලංසු කැඳවීමේ ආරාධනය

සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය

Broadcast Scheduling පද්ධතියක් ප්‍රසම්පාදනය කර ගැනීම

මිල කැඳවුම් අංකය : ITN/Q/15/2021

සී/ස. ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් Broadcast Scheduling පද්ධතියක් ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා පිළිගත් සංවර්ධකයින් / සේවා සපයන්නන්ගෙන් මුද්‍ර තබන ලද ලංසු කැඳවනු ලැබේ.

සී/ස. ස්වාධීන රූපවාහිනී සේවයේ කළමනාකරු (ප්‍රසම්පාදන) වෙතට ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන රු. 7,560.00 (8% වැට් බද්ද සහිත) ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අදළ ලංසුපත් 2021 මැයි මස 14 වෙනි දින ප.ව. 3.00 දක්වා සතියේ වැඩ කරන දිනවලදී නිකුත් කරනු ලැබේ.

මේ සඳහා වන පූර්ව ලංසු රැස්වීම 2021 මැයි මස 06 වෙනි දින පෙ.ව. 10.30 ට සී/ස ස්වාධීන රූපවාහිනී සේවයේ බත්තරමුල්ල, වික්‍රමසිංහපුර පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ.

වැඩි විස්තර සඳහා සී/ස. ස්වාධීන රූපවාහිනී සේවයේ www.itn.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය,
වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.
2021.04.23

ගල්කිස්ස දිසා අධිකරණ නඩු අංක 8239/M/19 දරන නඩුව සම්බන්ධවයි.

මෙම නඩුවේ 2 වන විත්තිකරු වන **කොඩිමරක්කලගේ ගිහාන් වසන්ත රුදිගෝ (අංක 2බී, රේල්වේ ක්වාටර්ස්, රත්මලාන) පදිංචිව සිටි යන අයගේ දැනගැනීම පිණිසයි.**

ගල්කිස්ස දිසා අධිකරණයේ දිසා විනිසුරුගේ නියෝගය මත මෙම දැන්වීම පළකරන අතර ඔබට විරුද්ධව **සිතුම් විහන්සා කලුආරච්චි** යන අය විසින් ගල්කිස්ස දිසා අධිකරණයේ ගොනු කොට ඇති 8239/M/19 නඩුව 2021-04-28 වන දින කැඳවීමට නියමිතව ඇති බවද, එදිනට අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙසද මෙයින් ඔබ වෙත දන්වා සිටිමි.

පැමිණිලිකාරියගේ නීතිඥ,
(ජයමුදිතා ජයසූරිය)

තරුණියන්ගේ කාන්තාවන්ගේ මවුවරුන්ගේ

හද බැඳි කාන්තා පත්තරය
සෑම බදාදාවකම
තරුණී

දකුණු පළාත් සභාව

අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

තනතුරු ඇබෑර්තු කැඳවීම අවලංගු කිරීම

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ආශ්‍රිත නිලධාරී (MA-3) හා කළමනාකරණ සහකාර (තා.නො.) (MA 1-2) යන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමට අදළව 2020.09.14 දින දිනමිණ හා ඩේලි නිව්ස් පුවත්පත් වල පළ කරන ලද දැන්වීම අවලංගු කිරීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව දන්වමි.

සාමාන්‍යාධිකාරී,
දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.

දැන්වීම් කාර්යාල

ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න

නුගේගොඩ
සව්සිරි වෙළඳ සංකීර්ණය
4 වන මහල, හයිලෙවල් පාර,
011 282 8114

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10 | 1949

ජනතා සන්තක බස් සමාගම්වල සේවා නියුක්තව සිටි කොටස් හිමියන් වෙත කෙරෙන දැනුම්දීමයි.

1990 දී ශ්‍රී ලංගම බස් ඩිපෝ ජනතාකරණය සිදුකෙරෙන අවස්ථාවේදී නිකුත් කරන ලද කොටස් සඳහා 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 33 (3) වගන්තිය ප්‍රකාරව එම කොටස්වල සම අගය මත ප්‍රවාහන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ වන්දි මුදල් ගෙවීම් කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණ මගින් දැනුම් දී ඇත.
ඒ සඳහා මූලික කටයුතු මේ වන විට අවසන් වී ඇති අතර කොටස් හිමියන් සඳහා වන්දි මුදල් පහත පියවර අනුගමනය කරමින් ගෙවා නිම කිරීමට අපේක්ෂා කෙරේ.

01. කොටස් හිමියන් 2021/04/27 දින සිට 2021/05/31 දක්වා කාලය තුළ අවසන් වශයෙන් සේවය කළ කොටස් සහතික නිකුත් කරනු ලැබූ ඩිපෝවට වාර්තා කිරීම. පැමිණෙන විට රැගෙන ආ යුතු ලේඛණ
    i. කොටස් සහතිකයේ මුල් පිටපත එහි ඡායා පිටපත
    ii. තම අනන්‍යතාව තහවුරු කළ හැකි ලේඛණයේ මුල් පිටපත සහ ඡායා පිටපතක් (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය)
02. වන්දි හිමිකම් ඉල්ලුම් අයදුම්පත ඩිපෝ කළමනාකාර වෙතින් ලබාගැනීම සහ එහි පළමු කොටස හිසි පරිදි සම්පූර්ණ කර ඩිපෝ කළමනාකාර වෙත භාරදීම.
03. කොටස් සහතිකයේ මුල් පිටපත සහ එහි ඡායා පිටපත අනන්‍යතාවය තහවුරු කිරීමේ හැඳුනුම්පත සහ එහි පිටපත ඉහත 02 හි සඳහන් ඉල්ලුම්පත සමග භාරදීම.
04. වන්දි හිමිකම් අයදුම්පතෙහි දෙවන කොටස ඩිපෝ කළමනාකාර වෙතින් සම්පූර්ණ කර අත්සන් කර එහි පිටපතක් ද, කොටස් සහතිකයේ ඩිපෝ කළමනාකරු සහතික කරන ලද ඡායා පිටපතද කොටස් හිමියා විසින් නැවත ලබාගැනීම.
05. ඉහත 04 හි සඳහන් ලිපි ලේඛණ වන්දි මුදල් ලබාගැනීමට පැමිණීමේ දී ඉදිරිපත් කළයුතු බැවින් ඉතා සුරක්ෂිතව තබා ගැනිම අත්‍යවශ්‍ය කරුණක් වේ.
06. ඔබගෙන් ලබාගන්නා කොටස් සහතිකයේ මුල් පිටපත, ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය සහ අනන්‍යතාවය තහවුරු කිරීමේ හැඳුනුම්පතෙහි පිටපත ඩිපෝව අයත් ප්‍රාදේශීය කාර්යාලය වෙත ඩිපෝ කළමනාකාර විසින් යොමු කර ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් තව දුරටත් තහවුරු කර ගැනීම සිදු කරනු ලැබේ.
07. වන්දි ගෙවීමට අදාළ චෙක්පත් මුද්‍රණය කර අත්සන් කිරීමෙන් අනතුරුව ඒ බව අදාල කොටස් හිමියන් වෙත දැනුවත් කරනු ඇත.
08. ඉහත 07 හි සඳහන් පරිදි වන්දි මුදල් ගෙවීමට අදාළ චෙක්පත් සූදානම් බව දැනුම් දීමෙන් පසුව වන්දි මුදල් ලබා ගැනීමේදී ඉහත 04 හි සඳහන් ලිපි ලේඛණ ඩිපෝ සහකාර කළමනාකාර - මුදල් වෙත ලබා දීමෙන් අනතුරුව ඔබගේ නමට ලියන ලද චෙක්පත ඔබට ලබා ගැනීමේ හැකියාව ඇත.

සැ.යු : හිමිකම් සහතිකපත් අස්ථානගතවීම, මුල් සහතිකය නොමැතිවීම, හිමිකරු මිය ගොස් තිබීම හිමිකරු විදේශගතවීම වැනි අවස්ථාවලදී එම කොටස් නිකුත්කළ ඩිපෝවට පැමිණ අදාළ මූලික තොරතුරු ඊට අදාළ ඉල්ලිම්පතෙහි සම්පූර්ණ කර ඩිපෝ කලමනාකර තැන වෙත බාරදීමෙන් අනතුරුව ශ්‍රී ලංගම නීති අංශය වෙත යොමු කර ඒ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

වැඩි විස්තර : **011 7 706 000 අමතන්න.**

සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
නො.200, කිරුළ පාර,
නාරාහේන්පිට,කොළඹ 05.

ශ්‍රී ලංගම S.L.T.B

වාහන විකිණීමක්

ත්‍රීරෝද රථ		වර්ෂය	අංගනය
AAH-9108	බජාජ්	2013	අනුරාධපුර
මෝටර් කාර් රථ		**වර්ෂය**	**අංගනය**
CBE-6068	සුසුකි/වැගන් ආර්	2018	රාගම
KI-7677	නිසාන්/එක්ස්-ට්‍රේල්	2003	මහනුවර
ද්විත්ව කාර්යය රථ		**වර්ෂය**	**අංගනය**
PT-7867	මහින්ද්‍රා/මැක්සිමෝ	2012	කුරුණෑගල
PD-3340	ටොයෝටා/ඒස්	2006	රාගම
මෝටර් ලොරි		**වර්ෂය**	**අංගනය**
HT-3847	මිට්සුබිෂි/කැන්ටර්	1997	රාගම

මෙම වාහන අපගේ වාහන අංගනයන්හිදී පරීක්ෂා කළ හැකි අතර වෙන්දේසි ක්‍රමයට විකිණේ.

රාගම	මහනුවර	කුරුණෑගල
0113 288 893	0812 051 010	0374 943 738

අනුරාධපුරය
0772 385 714
චමිල්

ප්‍රසම්පාදන දැන්වීමයි

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව - කොළොන්නාව

SUPPLY, INSTALLATION, AND COMMISSIONING, OF A BRAND-NEW METAL LASER CUTTING MACHINE.

ප්‍රසම්පාදන අංකය : 3/1/4/21Q/07/CE/FA/741

ඉහත ප්‍රසම්පාදනයට අදාළ මිල ගණන් භාර ගන්නා අවසාන දිනය හා මිල ගණන් විවෘත කරන දිනය 2021-05-06 දින 11.00 පැය දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රසම්පාදනයේ මාතෘකාව "Supply, Installation, and Commissioning of a Brand-New Metal Laser Cutting Machine" යනුවෙන් වෙනස් කරන ලදී.

ලංසු වලංගු කාලය සහ ලංසු සුරැකුමේ වලංගු කාලය නොවෙනස් වන අතර 2021-05-05 දින දක්වා ලංසුපත් නිකුත් කරනු ලැබේ.

සංශෝධන සඳහා අතිරේක අංක 01 නිකුත් කරනු ලැබේ.

මුල් ප්‍රසම්පාදන දැන්වීම 2021-03-30 දින දිනමිණ, තිතකරන් හා ඩේලි නිව්ස් පුවත්පත්වල පළ කරන ලදී.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව, තුන්වන මහල,
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොළොන්නාව.
2021-04-22

ලංසු ආරාධනය සඳහා සංශෝධනයයි

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

වාරිමාර්ග අමාත්‍යාංශය

(ජාතික තරගකාරී ලංසුකරණය)

ලංසු ආරාධනා අංක : CRIWMP/NCB/VIS/2021/Packages from 12 to 30

දිනය : 2021.04.23

ලංසු සඳහා ආරාධනය : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මොරවැව හා ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාමීය වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය.

යොමුව : 2021 අප්‍රේල් 12 දින දිනමිණ, තිතකරන් හා ඩේලිනිවුස් පුවත්පත්වල පළකරන ලද දැන්වීම හා බැඳේ.

ඉහත සඳහන් ලංසු ආරාධනාවේ ඇතුළත් පහත සඳහන් කාලවේලා පේළි එහි සඳහන් පරිදි සංශෝධනය කොට ඇත.

අ) **පෙර - ලංසු හමුව පවත්වනු ලබන දිනය හා වේලාව :**
පෙර සඳහන් ස්ථානයේදීම 2021 අප්‍රේල් 29 වන දින 1000 පැය ලෙස සංශෝධනය කොට ඇත.

ආ) **ලංසු ලේඛන නිකුත් කිරීමේ කාලයද** 2021 මැයි 07 වන දින 1500 පැය දක්වා දීර්ඝ කොට ඇත.

ඇ) **ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව** : පෙර සඳහන් ස්ථානයේදීම, 2021 මැයි 10 දින 1400 පැය ලෙසට වෙනස් කොට ඇත.

පෙර පළකරන ලද ලංසු ආරාධනා දැන්වීමෙහි සඳහන් **අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතී.** මේ සම්බන්ධයෙන් යම් අපහසුතාවයක් සිදුවූයේ නම් ඒ පිළිබඳව බලවත් කණගාටුව ප්‍රකාශ කරන්නෙමු.

ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන්,
ව්‍යාපෘති අධ්‍යක්ෂ,
දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය.
වාරිමාර්ග අමාත්‍යාංශය,
12 වන මහල, 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

මහජන බැංකුව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයයි

වර්ෂ 2019 ක් වූ මැයි මස 17 වෙනි දින පවත්වන්නට යෙදුණු තම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.05.17 දින පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බවට මෙහිදී දැනුම් දෙනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කර ඇත්තා වූ ද, ලියාපදිංචි අංක PV5815 දරන සහ කොළඹ 03, ශාන්ත මයිකල් පාර, අංක 18 දරන ස්ථානයෙහි තම ලියාපදිංචි ස්ථානය පිහිටා ඇති සමාගමක් වන වෝකර්ස් පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්.ඒ.සී. කුමාරසිරි විසින් ලියා සහතික කළ 2018 අගෝස්තු 06 දිනැති අංක 1985 දරන උගස් බැඳුම්කරයද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2015 ඔක්තෝබර් 12 දිනැති අංක 480 දරන උගස් බැඳුම්කරය ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2016 ජනවාරි 20 දිනැති අංක 548 දරන උගස් බැඳුම්කරයද සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2016 ජනවාරි 20 දිනැති අංක 549 දරන උගස් බැඳුම්කරයද මත අයවීමට ඇති ගෙවීම් පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කර මත රුපියල් එකසිය තිස්නව මිලියන භාරසිය දහඅට දහස් තුන්සිය හැට නවයයි ශත අනූ තුනක (රු.139,418,369.93) මුදලක් පොලියද සමග මහජන බැංකුව වෙත දැන් අයවීමට හිඟව සහ ලැබිය යුතුව තිබේ.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්.ඒ.සී. කුමාරසිරි විසින් ලියා සහතික කළ 2018 අගෝස්තු 06 දිනැති අංක 1985 දරන, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2015 ඔක්තෝබර් 12 දිනැති අංක 480 දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.එස්. මහවත්ත විසින් ලියා සහතික කළ 2016 ජනවාරි 20 දිනැති අංක 548 දරන ඉහත කී උගස් බැඳුම්කර මගින් එකී බැංකුව වෙත උගස් කළ සහ මෙහි පහත පළමු සහ දෙවන උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇති යන්ත්‍ර රුපියල් එකසිය තිස් නව මිලියන භාරසිය දහඅට දහස් තුන්සිය හැට නවයයි ශත අනූ තුනක (රු.139,418,369.93) ඉහත කී මුදලද, රුපියල් තිස් හතර මිලියන දෙසිය පනස් තුන්දහස් තුන්සිය දහතරයි ශත පහළොවක (රු.34,253,314.15) ක මුදලක් මත වාර්ෂිකව සියයට දහඅට (18%) බැගින් වැඩිදුර පොලියද සහ 2019.05.13 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් අනූ මිලියන තුන්සිය පනස් නවදහස් තුන්සිය හැත්තෑ පහයි ශත අසූ නවයක (රු.90,359,375.89) මුදලක් මත වාර්ෂිකව සියයට දහනවයයි දශම දෙකයි තුන (19.23%) බැගින් පොලියද සහ ගාස්තු ද සහ එකී මහජන බැංකු පනතේ 29(ඕ) වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද ඉන් අනතුරුව යම් මුදලක් ලැබී ඇත්නම් එය අඩු කොට අයකර ගැනීම සඳහා කොහුවල, දුටු ගැමුණු වීදිය ඔබ්බෙන් කල්දේරා උදෑනය, අංක 146/3 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරුවන් වන ඩලස් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකුණනු ලැබීමට මෙහිදී යෝජනා සම්මත කරනු ලැබේ.

ඉහත සඳහන් කළ උපලේඛනය

01. ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ හෙයියන්තුඩුව සමෘද්ධි මාවත, අංක 427ඒ දරන ස්ථානයෙහි හෝ එකී උගස් බැඳුම්කරය අඛණ්ඩව පවතින අතරතුරදී එම යන්ත්‍ර රැගෙන යා හැකි හෝ ඉවත් කරගෙන යා හැකි යම් වෙනත් පරිශ්‍රයක තබා ඇති පහත සඳහන් කරනු ලබන යන්ත්‍ර සියල්ල එනම්,

	විස්තරය	අනුක්‍රමික අංකය
1.	BG 15#1051 - Base Machine	1051
2.	SR 250 OVI Rall Machine	10SR00530001
3.	MS Casing 1020 mm*10m 48 NO of MS Casing	PMMSC PR00091
4.	Boring Tools Desander RMT 250	Rock Augur - 1800mm dia Core Barrel - 1800 mm dia Boring Bucket - 1800mm dia and 1134
5.	Roc Auger, Boring Buckets, Roller Core Barrel, Rock Auger, Roller Core Barrel, Boring Buckets	Rock Auger - 1800mm dia -RA-HC2 Boring Buckets- 1800mm dia-RB-HK2 Roller Core Barrel - 1800mm dia -CR-HB Rock Auger 2000mm dia-dia-RA - HC2 Roller Core Barrel -2000mm dia- CR-HB Boring Buckets - 2000mm dia - RB-HK2
6.	MS Casing 1020mm*10mm*6m	PMMSC PR00091
7.	Rock Augur, Core Barrel, Rock Bucket	Rock Augur - 800mm dia - RAHC2 Core Barrel - 800mm dia - CRHB Rock Bucket - 800mm dia - RBHK1
8.	Desander with capacity of 250M3/H.	ZH200- 250 & ZX 200 -250

ඉහත සඳහන් කළ දෙවන උපලේඛනය

02. ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාත් කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 03, තැපැල් පෙට්ටිය 166, ශාන්ත මයිකල් පාර, අංක 18 දරන ස්ථානයෙහි හෝ එකී උගස් බැඳුම්කරය අඛණ්ඩව පවතින අතරතුරදී එම යන්ත්‍ර රැගෙන යා හැකි හෝ ඉවත් කරගෙන යා හැකි යම් වෙනත් පරිශ්‍රයක තබා ඇති පහත සඳහන් කරනු ලබන යන්ත්‍ර සියල්ල එනම්,

1. SANY Crawler Crane SCC5550 (H.S. Code 8426910) – 01 Unit
2. Kelly Nar BK 40/394/3/39 along with standard accessories
3. One unit Bauer BG 28 on BS80 along with standard accessories

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණපරිදි,
සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) මහජන බැංකුව,
අයකිරීම් අංශය,
10 වන මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
2019.05.14

මහජන බැංකුව
PEOPLE'S BANK
www.peoplesbank.lk

ලංසු සඳහා ආරාධනයයි (2021/04)

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, මුලතිව්.

01. මුලතිව් හි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් **ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** විසින්, පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කාර්ය ඉටුකිරීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. **ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB)** තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛන ගතවූ අයකු නොවිය යුතු අතර, පහත වගුවේ සඳහන් ශ්‍රේණියේ, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඩා) ලියාපදිංචි වී සිටිය යුතුය.

04. සුදුසුකම් අවශ්‍යතා, ලංසු ලේඛනයන්හි 4 කොටසේ සඳහන්ව ඇත. අමතර විස්තර, **ලංසු දත්තයන්හි සහ** SBD **01 (5 කොටස)** SBD **03 සඳහා වන උපලේඛනයෙහි** සඳහන්ව ඇත.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, **පහත 6 හි සඳහන් ලිපිනයෙන්** ලබාගත හැකි අතර, එම ස්ථානයේදීම, රාජකාරී දිනවල, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැකිය.

06. **ආපසු ගෙවනු නොලබන ගාස්තු පහත වගුවේ සඳහන් ප්‍රමාණයන්ගෙන් ගෙවීමෙන් හා මුලතිව්, උනප්පුලාවුහි කොක්කුලායි පාරේ, මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, **2021-04-22** දින සිට **2021-05-11** දින දක්වා, **පෙරවරු 9.00** හා **පස්වරු 3.00 අතර** කාලය තුළ. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ.

07. ලංසු (මුල් පිටපත හා අනුපිටත ලෙස) පිටපත් දෙකක් වශයෙන්, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, කොක්කුලායි පාර, උණප්පුලාවූ, මුලතිව්** යන ලිපිනය වෙත, **2021-05-12** දින **පෙරවරු 10.30 ට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ ලංසු අංකය සඳහන් කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන්වූ වහාම, පැමිණි සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

08. මේ සම්බන්ධව පෙර - ලංසු හමුවක්, මුලතිව්හි උණප්පුලාවූ, කොක්කුලායි පාරේ, **මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්මන්ත්‍රණ ශාලාවේදී, 2021-05-04 දින පෙරවරු 11.00 ට** ආරම්භ වීමට නියමිතය.

09. සියලුම ලංසු සමග පහත වගුවේ සඳහන් පරිදි වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

ලංසු අංකය	කාර්ය විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන	කොන්ත්‍රාත් කාලය -දින-	අවශ්‍ය ශ්‍රේණිය	අවශ්‍ය ලංසු ඇපකරය		ආපසු නොගෙවන ගාස්තු -රුපියල්-
					ඇපකර මුදල -රුපියල්-	වලංගු කාලය	
NP/ MU/2021/04/ PSSP/B2/01	ඔඩ්ඩුසාඩාන්හි දිස්ත්‍රික් රෝහලේ හෙද නිල නිවාස ඉදිකිරීම	12.77	147	C6 හා C5 (ගොඩනැගිලි)	128,000.00	2021-07-28 දින දක්වා	5,000.00
NP/ MU/2021/04/ PSDG/B2/02	මාන්කුලම් හි මූලික රෝහලේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය (250m) ඉදිකිරීම	1.5	74	C9 හා C8 (මාර්ග)	15,000.00	2021-06-30 දින දක්වා	2,000.00
NP/ MU/2021/04/ PSSP/B2/03	තුනුක්කායි හි PMCU හි බාහිර රෝගී අංශය - විකරණ කටයුතු හා වැඩි දියුණු කිරීම්	1.93	78	C9 හා C8 (ගොඩනැගිලි)	20,000.00	2021-06-30 දින දක්වා	2,000.00
NP/ MU/2021/04/ PSDG/B2/04	මුලතිව්හි , පුතුකුඩුයිරුප්පු හි මූලික රෝහලෙහි වැඩි දියුණු කිරීම් කටයුතු (කාන්තා පිරිමි වාට්ටුව ආහාර ගන්නා ප්‍රදේශය හා රථ ශාල) සහ වහළ වැහි පිහිලි අලුත්වැඩියා කටයුතු (පිරිමි වාට්ටු බැවුම් මග ප්‍රදේශය)	1.00	70	C9 හා C8 (ගොඩනැගිලි)	10,000.00	2021-06-30 දින දක්වා	2,000.00
NP/ MU/2021/04/ PSDG/B2/05	මල්ලාවි මූලික රෝහලෙහි පවුල් සෞඛ්‍ය සේවිකා නිල නිවාස අංක 01 නවීකරණය	1.67	76	C9 හා C8 (ගොඩනැගිලි)	17,000.00	2021-06-30 දින දක්වා	2,000.00
NP/ MU/2021/04/ PSDG/B2/06	මල්ලාවි මූලික රෝහලේ පවුල් සෞඛ්‍ය සේවිකා නිල නිවාස අංක 03 නවීකරණ කටයුතු	1.67	76	C9 හා C8 (ගොඩනැගිලි)	17,000.00	2021-06-30 දින දක්වා	2,000.00
NP/ MU/2021/04/ Line/B2/07	මල්ලාවි මූලික රෝහලේ ඖෂධ ගබඩාව වැඩිදියුණු කිරීම හා නවීකරණ කටයුතු	1.46	74	C9 හා C8 (ගොඩනැගිලි)	15,000.00	2021-06-30 දින දක්වා	2,000.00

ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකිරීමට නියමිත කාර්යයන්හි ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 50 ට අඩු හෙයින් (වැට් හා අනෙකුත් බදු හැර) 2021-02-18 දිනැති අංක 04/2016(iii) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රමුඛතාව හා සීඩා ශ්‍රේණි පුමුඛතාව අදාළ වන අතර, පිළිවෙලින් 2020-10-09 දිනැති හා 2021-01-11 දිනැති අංක 03/2020 හා අංක 03/2020 (i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ද යොදාගනු ලැබේ.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය,
මුලතිව්.

ටෙන්ඩර් දැන්වීමයි

මල්ටි ෆිනෑන්ස් ආයතනයේ පහත සඳහන් වාහන විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

NW CAQ-7153 - MITSUBISHI ATTRAGE - YOM 2016

නො:165/බී, පට්ටිවිල පාර, හෝනවල, කෑළණිය යන ස්ථානයේදී සතියේ දිනවල පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා වාහන පරීක්ෂා කළ හැක,

ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2021.04.29

මල්ටි ෆිනෑන්ස් පීඑල්සී

නො:100, මුත්හමුව පාර, රාජගිරිය. දුර: 0114-645555

071-872 9989, 071-531 2682

බප/ජය/කොට්ටාව ධර්මපාල මහා විද්‍යාලය

මිල ගණන් කැඳවීමයි

2021 වර්ෂය සඳහා විද්‍යාලයේ ආරක්ෂක පහසුකම් සැපයීම් වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

අදාළ විස්තර හා අයදුම්පත් 2021.04.27 සිට 2021.04.30 දක්වා සතියේ දිනවල පෙ.ව. 8.30 සිට දහවල් 12.30 දක්වා විද්‍යාලයීය ගිණුම් අංශයෙන් ලබාගත හැක.

අයදුම්පත් ගාස්තු රු. 1,000/- කි.

විමසීම් : භාණ්ඩාගාරික - 0719961157

පාසල් සංවර්ධන විධායක කමිටුව,
කොට්ටාව ධර්මපාල මහා විද්‍යාලය,
හොරණ පාර, කොට්ටාව.

ප්‍රසම්පාදන දැන්වීමයි

කෘෂිකර්ම අමාත්‍යාංශය

ණය අංක 63460

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ උලගල්ල එල්ලංගා පද්ධතියේ වගයක්කුලම වැව පුනරුත්ථාපනය කිරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙතින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ (CSIAP) පිරිවැය අරභයා ඇ.ඩොලර් මිලියන 125 ක වටිනාකමට විවිධ මුදල් වර්ගයන්ගෙන් ණය මුදලක් ලැබී ඇති අතර එහි ලැබීම් වලින් කොටසක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උලගල්ල එල්ලංගා පද්ධතියේ වගයක්කුලම වැව පුනරුත්ථාපනය සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ යෝග්‍ය ගෙවීම් සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

02. වාරිමාර්ග අමාත්‍යාංශයේ CSIAP ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ උලගල්ල එල්ලංගා පද්ධතියේ වගයක්කුලම වැව පුනරුත්ථාපනය කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතා පූර්ණ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙයින් මුදා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	ඇස්තමේන්තු ගත සිවිල් පිරිවැය වැටි හැර (රු. මිලියන)	අවශ්‍ය ශ්‍රේණිය	අවශ්‍ය ලංසු සුරක්ෂණය	
				ලංසු සුරක්ෂණ මුදල (රු.)	වලංගු කාලය
LK/MOA-226876 - CW-RFB	අනුරාධපුර දිස්ත්‍රික්කයේ උලගල්ල එල්ලංගා පද්ධතියේ වග යක්කුලම වැව පුනරුත්ථාපනය කිරීම	මිලියන 11	C 6 හෝ C 5	165,000.00	2021 සැප්තැම්බර් 6

03. ඉහත ප්‍රසම්පාදනය සඳහා ඉහත දැක්වෙන පරිදි ලංසු සුරක්ෂණය වලංගු දිනය හා සමග ඉහත කාර්යය සඳහා 2021 සැප්තැම්බර් 6 දින තෙක් මිල ගණන් ඉදිරිපත් කිරීමට ලංසුකරුවන්ට අවසරය ලැබේ. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවූවකු වියයුතු අතර ඉහත වගුවේ සඳහන් ශ්‍රේණිය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ඉදිකිරීම් (කර්මාන්ත) ක්ෂේත්‍රයේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. ලෝක බැංකුව මගින් අනුමත ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයවනු ලැබේ.

05. යෝග්‍යතා පූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් (දුරකථන : 0112871293, ෆැක්ස් : 0112053167, විද්‍යුත් තැපැල : pdcsiap@gmail.com) ලබා ගත හැකි අතර, 2021 අප්‍රේල් 23 දින සිට 2021 මැයි 13 දින තෙක් 0900 පැය සිට 1500 පැය දක්වා ඕනෑම කාර්යාල දිනයක ඉහත ලිපිනයේදීම ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

06. රාජගිරිය, මාදින්නාගොඩ, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, නො. 61/1, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපාති අධ්‍යක්ෂ වෙත හෝ පහත සඳහන් ඕනෑම නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයක් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 5,000.00 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2021 අප්‍රේල් 23 දින සිට 2021 මැයි 13 දින තෙක් 0900 පැය සිට 1500 පැය දක්වා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

01. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වයඹ පළාත - 51, මිහිඳු මාවත, "යග්ගපිටිය" නිවස, කුරුණෑගල. 037-2227950

02. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය දකුණු පළාත - දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලය, පරිපාලන සංකීර්ණය, 3 වන මහල, හම්බන්තොට. 047-2256304

03. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය උතුරු මැද පළාත - 596/15, බණ්ඩාරනායක මාවත, අදියර 1, අනුරාධපුර. 025-2054227

04. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය ඌව පළාත - නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, 12, 1 වන පටුමග, වැල්ලවාය පාර, මොණරාගල. 055-2277734

05. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය නැගෙනහිර පළාත - ලව්ලේන්, උප්පුවේලි, ත්‍රිකුණාමලය. 026-2054999

06. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය උතුරු පළාත - කෝවිදන්කඩෙයි හන්දිය, වට්ටකච්චි පාර, කිලිනොච්චිය. 021-2284881 / 021-2284882

07. ලංසු, රාජගිරිය, මාදින්නාගොඩ, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත. නො. 61/1, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ PMU ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත 2021 මැයි 17 දින 1430 පැයට හෝ ඊට පෙර ගෙනැවිත් භාර දිය යුතුය. විද්‍යුත් ලංසුකරණයට අවසර නොලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගැනේ. 2021 මැයි 17 දින 1430 පැයට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේදී (PMU) ලංසුකරුවන් හෝ එම අවස්ථාවට සහභාගි වීමට කැමැති ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.

08. ලංසු 2021 අගෝස්තු 2 දින දක්වා වලංගු විය යුතුය.

09. සම්පූර්ණ කළ ලංසු මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. "මුල් පිටපත" හා "පිටපත" වශයෙන් පිළිවෙළින් ලකුණු කොට මුදා, තැබූ කවර දෙකක වෙන් වෙන්ව බහා එම කවර දෙකම **"අනුරාධපුර දිස්ත්‍රික්කයේ උලගල්ල එල්ලංගා පද්ධතියේ වගයක්කුලම වැව පුනරුත්ථාපනය කිරීම (LK-MOA-226876-CW-RFB)"** යනුවෙන් වම් ඉහළ කෙළවරේ සඳහන් කළ මුදා, තැබූ එක් කවරයක බහා ලිය යුතුය.

10. පූර්ව - ලංසු රැස්වීම 2021 මැයි 6 දින 1030 පැයට පහත සඳහන් ලිපිනයේදී පැවැත්වේ.

සභාපති,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,
නො. 61/1, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත,
මාදින්නාගොඩ, රාජගිරිය.
දිනය : 2021.04.23

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

මිල ගණන් කැඳවීම

දකුණු පළාත් සභාව

දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දකුණු පළාත් මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ ලියාපදිංචි දකුණු පළාතේ සුදුසුකම්ලත් කොන්ත්‍රාත් ආයතන වෙතින් පහත සඳහන් වැඩ සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

අනු අංකය	ව්‍යාපෘති අංකය	ප්‍රා. ඉ. කාර්යාලය	වැඩ විස්තරය	CIDA අවම ලියාපදිංචිය	ආපසු නොගෙවන ඇප තැන්පතුව (රු.)	ලංසු ඇපකර වටිනාකම (රු.)
01	SPRD/BA/ DEF/03/2020	බද්දේගම	ලබුදූව රජයේ නිල නිවාස ප්‍රවේශ මාර්ගය කාපට් කිරීම හා කානු පද්ධතිය සකස් කිරීම	C6	3,500.00	130,000.00

(වගුව අංක 01)

1. ඉහත සඳහන් කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් අසාධු ලේඛනගත වූ අයකු හෝ කටයුතු පැහැරහැරි කොන්ත්‍රාත්කරුවෙකු බවට රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතන මගින් තීරණය කළ අයෙකු නොවිය යුතු අතර, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ (CIDA) C-06 ශ්‍රේණිය (මාර්ග) හෝ ඉහළ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
2. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර අක්මීමන, ලබුදූව, දක්ෂිණපාය, පළමු මහල, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙතින් (දුරකතන අංක 091-2242776/ 0912030702) ලබාගත හැකි අතර, ඉහත ලිපිනයේදී කාර්යාල වේලාවන් තුළදී (09.00 පැය හා 15.00 පැය) ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
3. ඉහත සඳහන් ආපසු නොගෙවනු ලබන ගාස්තු අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණකාධිකාරී වෙත ගෙවා ලබාගත් ලදුපත සමග පහත(ඡේදය 03) සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2021.04.23 දින සිට 2021.05.06 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 අතර කාලය තුළ රාජකාරී දිනවලදී උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. (ගෙවීම් මුදලින් පමණක් සිදුකළ යුතුය.)
4. ඉදිරිපත් කරනු ලබන ලංසුපත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ කර්මාන්තයේ නම හෝ ව්‍යාපෘති හඳුනා ගැනීමේ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය. සියලුම ලංසුපත්වල මිල ගණන් සඳහන් කරන තීරු සෙලෝටේප් කළ යුතුය. ලංසුපත් විවෘත කරන අවස්ථාවේදී ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයෙකුට පැමිණ සිටිය හැක. ලංසු ඉදිරිපත් කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන කිසිදු ආකාරයක පිරිවැයක් නැවත ගෙවීම් නොකරන අතර, සියලු වියදම් ලංසුකරු විසින් දැරිය යුතුය.
5. ලංසුපත් පිටපත් දෙකකින් යුක්තව **ලේකම්, අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය, "දක්ෂිණපාය" ලබුදූව.** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ එම ලිපිනයේම තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතු අතර, 2021.05.07 දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසුපත් ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීම් කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ බලයලත් නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. (මුල් පිටපත හා අනුපිටපත නිවැරදිව සඳහන් කර, කවර දෙකක දමා නැවත එක් කවරයක බහාලිය යුතුය.)
6. සියලුම ලංසුකරුවන් මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කර්මාන්තයන්ට අදාළව ඉහත සඳහන් වටිනාකමින් යුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිළිගත් බැංකුවකින් පමණක් ලේකම්, ද. ප. අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය, ලබුදූව, ගාල්ල තමට ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලූ විට ගෙවන, අවලංගු කළ නොහැකි 2021.05.07 දින සිට 2021.09.13 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් ප්‍රසම්පාදන ලියවිලි සමග ඉදිරිපත්කළ යුතුය.
7. ලංසුපත් 2021.05.07 දින සිට 2021.08.06 දින දක්වා වලංගුවිය යුතු අතර, අසම්පූර්ණ ලංසුපත් ප්‍රතික්ෂේප කරන අතර, ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

සභාපති, ප්‍රසම්පාදන කමිටුව,
දකුණු පළාත් අධ්‍යාපන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
පළමු මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.

රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවල තනතුරු සඳහා පත් කෙරෙන / නම් කෙරෙන පුද්ගලයන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව මගින් මෙහි පහත දක්වා ඇති තනතුරු සඳහා පත්කර ඇති / නම්කර ඇති අයගේ යේග්‍යතාවය පරීක්ෂා කර බැලීමට නියමිතය :

අංකය	නම සහ ලිපිනය	තනතුර
01	එස්.එච්.යූ. දිසානායක මහත්මිය නො. 145/11, 13 වන පටුමග, එදිරිසිංහ පාර, නුගේගොඩ.	ඉතියෝපියානු ෆෙඩරල් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ශ්‍රී ලංකා තානාපතිතිය වශයෙන් නම් කරන ලද
02	අමරනන්ද වීරසිංහ මහතා නො. 18/1, දෙවන මාවත, අරුප්පොල, මහනුවර.	ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද
03	ආචාර්ය ජටාල් ඩී. මාන්තප්පෙරුම මහතා නො. 376/2, හීරස්සගල පාර, මහනුවර.	වී අලෙවි මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද
04	විංග් කමාන්ඩර් (විශ්‍රාමික) බී.ඩී. අබේසූරිය මහතා නො. 56/10, ද සේරම් පාර, ගල්කිස්ස.	ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද
05	ආචාර්ය ලක්තාත් වෙලගෙදර මහතා නො. 103/01, කුරුණෑගල පාර, මැදවල, ගෙලගෙදර.	ජාතික අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද
06	කේ.ජී. සවුන්දරරාජත් මහතා නො. 06, චාල්ස් ඩ්‍රයිව්, කොළඹ 03.	වැවිලි කලාපය සඳහාවූ නව ගම්මාන අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද
07	මුදිත විජේසිංහ මහතා නො. 59/1, පොලිස් උද්‍යාන පටුමග, මිරිහාන, නුගේගොඩ.	සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද
08	එච්.ජී. විජේතුංග මහතා නො. 691/2, මුත්තෙට්ටුගොඩ පාර, බත්තරමුල්ල, තලංගම.	මාන්තයි සෝල්ට් ලිමිටඩ් හි සභාපති වශයෙන් පත් කරන ලද
09	ඉංජි. නීල් වත්තුහේවා මහතා "පිය නිවස", හොරබොක්ක, ඌව / පැල්වත්ත.	කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි සභාපති වශයෙන් පත් කරන ලද
10	ඒ.කේ.එස්.ඒ. ජයසේන මහතා නො. 420/5, වැලිපාර, තලවතුගොඩ.	ලංකා අශෝක් ලේලන්ඩ් සහ ලංකා ලේලන්ඩ් ලිමිටඩ් හි සභාපති වශයෙන් පත් කරන ලද
11	අතිල් රණසිංහ මහතා නො. 140, ගංගාරාම පාර, වේරහැර, බොරලැස්ගමුව.	සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද
12	ඩබ්.ඒ. චමින්ද වෙලේගම මහතා නො. 389/7, හෝකන්දර පාර, හෝකන්දර දකුණ.	සීමාසහිත බී.සී.සී. ලංකා සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද
13	අනුෂ්ක ගුණසිංහ මහතා නො. 21/16, තව රෝහල පාර, පමුණුව, මහරගම.	ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද
14	ආචාර්ය ජේ. ඩී. සමරසිංහ මහතා නො. 256/16, 6 වන පටුමග, පන්සල පාර, තලපත්පිටිය, නුගේගොඩ.	ජල සම්පත් මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලද
15	මහාචාර්ය ඒ. නවරත්නරාජා මහතා නො. 6/3/2, ඉන්ද්‍ර පටුමග, කොළඹ 04.	ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ සභාපති වශයෙන් පත් කරන ලද
16	කපිතාන් නිහාල් කැප්පෙට්පොල මහතා නො. 264/බී2, හතරවන පටුමග, ශාන්තිපුර, තලවතුගොඩ.	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති වශයෙන් පත් කරන ලද
17	එල්.ඒ.පී. හර්ෂාන් ද සිල්වා මහතා නො. 68, අලුබෝගහවත්ත, ඇත්ඩසන් පාර, දෙහිවල.	නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද
18	සරණ කරුණාරත්න මහතා නො. 1/17, ගුවන් තොටුපල පාර, පීල්ලවත්ත, යටියන, මිනුවන්ගොඩ.	සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති වශයෙන් පත් කරන ලද
19	ඉංජි. ඩී.පී.එම්. චන්දන මහතා නො. 31/9සී, සමුද්‍රසන්න පෙදෙස, ගල්කිස්ස.	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සභාපති වශයෙන් පත් කරන ලද
20	ජේ.බී. හීන්කෙන්ද මහතා නො. 08, පන්සල වත්ත පාර, කුණ්ඩසාලේ.	භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනයේ සභාපති වශයෙන් පත් කරන ලද
21	එම්. සෙනෙවිරත්න මහතා නො. 509/6, අමරසේකර පෙදෙස, රංවල, කෑගල්ල.	ඕෂන් ට්‍රිප් ඩිවලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි සභාපති වශයෙන් පත් කරන ලද

ඉහත පත් කිරීම් / නම් කිරීම් සම්බන්ධයෙන් කරුණු දැක්වීමට කවර හෝ සංවිධානයක් හෝ පුද්ගලයකු කැමැත්තේ නම්, යථා පරිදි අත්සන් කරන ලද ලිඛිත සංදේශ *2021 මැයි මස 07* වැනි දින හෝ ඊට පෙර **"ලේකම්, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, කාරක සභා කාර්යාංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් එසේ කළ හැකිය. එසේ නැතහොත්, ෆැක්ස් අංක 011-2777300 වෙත ෆැක්ස් මගින් හෝ highposts_c@parliament.lk යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් ද එවිය හැක.

එකී ලිඛිත සංදේශවලට අමතරව වාචික සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට ද කාරක සභාව විසින් නියම කළ හැකිය. මෙම දැන්වීම පාර්ලිමේන්තු වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත. (www.parliament.lk)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.
2021 අප්‍රේල් 23

කාරක සභාවේ ලේකම්
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

යුද හමුදාවේ 243ක තවත් කණ්ඩායමක් මාලි රාජ්‍යයට

මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායිතාව ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා යුද හමුදා සාමාජිකයන් 243කගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද හමුදා සංග්‍රාමික රථ ආරක්ෂක භට කණ්ඩය පෙරේදා (21) උදෑසන දිවයිනෙන් පිටත් වූහ.

දිවයිනෙන් පිටත්ව ගිය යුද හමුදා භට පිරිස් වෙත සුබපැතීමට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති සහ කොවිඩ් -19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ජනරාල් ශවේන්ද්‍ර සිල්වා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කීප දෙනෙකු ගුවන් තොටුපොළ වෙත පැමිණ සිටියහ. ශ්‍රී ලංකා යුද හමුදාවේ රෙජිමේන්තු 12ක් නියෝජනය කරන නිලධාරීන් සහ සෙසු නිලයන් 212කගෙන් මේ සංග්‍රාමික රථ ආරක්ෂක භට කණ්ඩය (Combat Convoy Company) සමන්විතය.

තුන්වන අදියර යටතේ ප්‍රථමයෙන් මාලි රාජ්‍ය බලා පිටත්වීමට නියමිත සංග්‍රාමික රථ ආරක්ෂක කණ්ඩයේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් දිනේෂ් බුලත්සිංහල සහ දෙවනුව මාලි රාජ්‍ය බලා පිටත්වීමට නියමිත සංග්‍රාමික රථ ආරක්ෂක කණ්ඩයේ දෙවන අණදෙන නිලධාරී මේජර් එල් උඩගෙදර ඇතුළු මාලි රාජ්‍ය බලා පිටත්ව යන සංග්‍රාමික රථ ආරක්ෂක භට කණ්ඩයේ (Combat Convoy Company) සාමාජිකයන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගත් යුද හමුදාපතිවරයා ඔවුන් සියලු දෙනාට සුබපැතුම් එක් කිරීමෙන් අනතුරුව දිවයිනෙන් පිටත්ව යන යුද හමුදා සාමාජිකයන් විසින් යුද හමුදා සම්ප්‍රදායානුකූල සමු ගැනීමක් සිදු කෙරිණ.

දැනට මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි ඉටුකරමින් සිටින ශ්‍රී ලංකා යුද හමුදා සාමාජිකයන් 240කගෙන් සමන්විත සංග්‍රාමික රථ ආරක්ෂක කණ්ඩය (Combat Convoy Company) (දෙවන අදියර) රාජකාරි ඉටුකිරීමෙන් අනතුරුව අදියර දෙකක් යටතේ දිවයිනට පැමිණීමට නියමිතය.

සිය මෙහෙවරට හදිසියේ සමු දුන් ලලිත් ඇතුළත්මුදලි

අදට (23) යෙදෙන ලලිත් ඇතුළත්මුදලි ගුණ සමරුව නිමිත්තෙනි.

එක්සත් ජාතික පක්ෂය මෙරටට බිහි කළ නායකයන් ප්‍රමාණය අප්‍රමාණය. එම නායකත්ව මුතුවලින් දිදුලන මුතු ඇටයකි මීට වසර 28කට පෙර දැයට අහිමි වූ ලලිත් ඇතුළත්මුදලි නම් දේශපාලන නායකයා.

එක්සත් ජාතික පක්ෂයට එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය සමඟ විශාල සම්බන්ධතාවක් ඇතැයි දේශපාලන විරුද්ධවාදීන් ගොඩනැගූ මතයක් ඇත. එය නිවැරදියැයි ජනතාවට ඒත්තු ගැන්වීමට එජාප විරෝධීන් සැමවිටම උත්සාහ ගත් අතර, ජනතාව ද විචාර බුද්ධියකින් තොරව එය පිළිගත් බවක් මැතිවරණවලදී දුටුවෙමු. නමුත් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයෙන් එක්සත් ජාතික පක්ෂයේ නායකයන් එකා පිට එකා මරා දමන අයුරු මෙරට ජනතාවට නොරහසකි. එසේ මිය ගිය නායකයන් අතර ලලිත් ඇතුළත්මුදලි, රණසිංහ ප්‍රේමදාස, ගාමිණී දිසානායක, වීරසිංහ මල්ලිමාආරච්චි, දොස්තර ගාමිණී විජේසේකර, ඔසී අබේගුණසේකර, රන්ජන් විජේරත්න ආදී නම් රාශියකි.

අද අප විසින් සිහිපත් කරනු ලබන ලලිත් ඇතුළත්මුදලි මහතා දේශපාලනයට පිවිසියේ එක්සත් ජාතික පක්ෂයෙනි. හිටපු අගමැති එජාප නායක ඩඩ්ලි සේනානායක මහතා අවසන් වරට පත් කළ එජාප ආසන සංවිධායකවරයා ලලිත් ඇතුළත්මුදලි මහතාය. ඔහු අගලවත්ත ආසනයට පත්විය. එවකට අගලවත්ත වාමාංශික බලකොටුවකි. එහි නායකයා වූයේ ආචාර්ය කොල්වින් ආර්.ද. සිල්වා මහතාය. ඔහු ලංකා සම සමාජ පක්ෂය ආරම්භක සභාපතිවරයා විය. ඩඩ්ලි සේනානායක මහතාගේ හදිසි අභාවය සමඟ ඇති වූ එක්සත් ජාතික පක්ෂයේ සභාපති පුරප්පාඩුවට පත් වූයේ විපක්ෂ නායක පදවිය හෙබ වූ ජේ.ආර්.ජයවර්ධන මහතාය. පක්ෂයේ නව නායකයා ලෙස ජේ.ආර්. ජයවර්ධන මහතා ප්‍රථමයෙන් පත් කළ ආසන සංවිධායකවරයා ලලිත් ඇතුළත්මුදලි මහතා විය. 1970 පිහිට වූ මැතිනියගේ පෙරමුණු රජය ජනතාව අතර පිරිහෙන විට අගලවත්තේ සම සමාජ බලකොටුව ලලිත් ඇතුළත්මුදලි මහතාගේ සංවිධාන ශක්තිය මත දියවෙන්නට විය. මැතිවරණයකදී ලලිත් අතින් කොල්වින් පරදින බව ජේ.ආර්ට වැටහිණි.

1977 ජූලි මස 21 දින පැවති මහ මැතිවරණය ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණ ඉතිහාසයේ 8 වන මහ මැතිවරණය විය. මේ මැතිවරණයේදී අභිනව රත්මලාන කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළ ලලිත් ඇතුළත්මුදලි මහතා ජයග්‍රහණය කළේ ඡන්ද 19,972 ක් ලබා ගනිමිනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළ අපේක්ෂකයන්ට වඩා ලලිත් වැඩි ඡන්ද 7,831 ලබාගෙන තිබුණි. මැතිවරණයෙන් දින දෙකකට පසු ජූලි මස 23 වැනිදා ජේ.ආර්. ජයවර්ධන රජයේ නව ඇමැති මණ්ඩලය දිවුරුම් දුන් අතර, ඇමැතිවරු 24 දෙනෙක් විය. මෙහිදී ලලිත් ඇතුළත්මුදලි මහතා වෙළෙඳ ඇමැතිවරයා ලෙස දිවුරුම් දී වැඩ බාර ගත්තේය.

ලලිත් ඇතුළත්මුදලි මහතාට පෙර මේ ඇමැති ධූරය දැරුවේ සමඟි පෙරමුණු රජයේ ටී.බී. ඉලංගරත්න මහතාය. 1977 මහ මැතිවරණයේදී ඔහුට මන්ත්‍රී පදවිය ද අහිමි විය. වෙළෙඳ ඇමැතිවරයා රටටම එපා වී සිටියේය. මිනිසුන්ට වෙළෙඳ පොළකට ගොස් එදිනෙදා ජීවත්වීමට අවශ්‍ය දෙයක්වත් ගැනීමට නොහැකි ලෙස රටම තියුණු භාණ්ඩ හිඟයකින් වෙළාගෙන තිබුණි. ජනතාව ඇවිදින ඇටසැකිලි බවට පත්ව හාමතේ මිය ගිය තොරතුරු පුවත්පත්වල පළ විය. රජය පිළිතුරු

සෙවීවේ භාණ්ඩ සුලභ කිරීමෙන් ඒවා හෙළි කරන පුවත්පත් තහනම් කිරීමෙනි.

නව වෙළෙඳ ඇමැති ඇතුළත්මුදලි මහතා එසේ පැවති ඇහිරුණු සංවෘත ආර්ථිකය විවෘත කළේ පැවති භාණ්ඩ හිඟය අකා මකා දමමිනි. මෙතුළින් මෙරට විවෘත ආර්ථිකය ආරම්භ විය. වෙළෙඳ ඇමැතිධූරය දරමින් සිදු කළ මෙහෙවරෙහි ප්‍රගතිය දුටු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මහතා ලලිත්ට තවත් භාර ධූර ඇමැති පදවියක් 1978 සැප්තැම්බර් 07 වන දින පැවරුවේය. ඒ නාවික ඇමැති පදවියයි. ඒ අනුව ලලිත් වෙළෙඳ හා නාවික ඇමැති විය.

මහපොල අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය අරඹා සිදු කළ මෙහෙවරෙන්ද වෙළෙඳාම ද අධ්‍යාපනය ද එක්තැන් කළ සේවය අද ද ලක්වැසි ජනතාවගේ සරසවි දූ පුතුන්ට සෙත සලසන ක්‍රමයක් වී ඇත. 1980 ජනවාරි මස 2 වන දින ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම ප්‍රදේශයෙන් ඇරඹුණු මහපොල වෙළෙඳ ප්‍රදර්ශනය රට පුරාම ව්‍යාප්ත විය. මහපොල ලොතරැයිය, මහපොල ඥානදර්ශන පාසල් පුස්තකාල සේවය එතුළින් ලද මහඟු දායාද විය. මීට අමතරව මහපොල ධර්ම යාත්‍රාව, මහපොල තාක්ෂණික පුහුණු ආයතනය, ඥානදර්ශන පුවත්පත මහපොලින් බිහි වූ තවත් විශිෂ්ට සේවාවන් වූහ.

දේශපාලකයකුට තිබිය යුතු ඉවසීම හොඳින්ම ප්‍රගුණ කළ තැනැත්තා ජේ.ආර්.ජයවර්ධන මහතාය. දෙවැන්නා රනිල්ය. නමුත් ගාමිණී, ලලිත් දෙපළ ඉවසිය යුතුම තැන නොඉවසා සිටීම මෙරට දේශපාලනය උඩු යටිකුරු වී ඔවුන්ගේ ජීවිතවලින් වන්දි ගෙවීමට තරම් බේදජනක විය. ඉන්පසු ප්‍රතිපලය වූයේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයෙන් එම දේශපාලන වියරුව ඔවුන්ගේ අරමුණු සඳහා ඉලක්ක කර ගැනීමය. මේ නිසා මෙරට සිටි එඩිතර බුද්ධිමත් දේශපාලන නායකයකු මීට වසර 28 කට පෙර අදවන් දිනක ජාතියෙන් සමුගත්තේ පිරිමැසිය නොහැකි පාඩුවක් රටට, දැයට හිමි කරමිනි. අද එතුමා සිහිපත් කරන්නට ඉතිරිව ඇත්තේ එක්සත් ජාතික පක්ෂය පමණක් බව අපට අමතක කළ නොහැක. ඇතුළත්මුදලි මහතා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්ව ගියත්, එක්සත් ජාතික පක්ෂයේ නායක කාරකාදීන් සහ පාක්ෂිකයන් ඔහුගේ ගුණ සෑම වර්ෂයකදීම අනුස්මරණය කරන්නේ පක්ෂයෙන් ගිය කෙනෙකු ලෙස සලකා නොව පක්ෂයේ සිටින පුද්ගලයකු ලෙස සිතාය.

එදා කුමන බාධක හමුවේ වුවද ප්‍රේමදාස, ගාමිණී, ලලිත් නායකයන් අසමඟි නොවී සමඟිව සිටියා නම් මෙරට දේශපාලන වංශ කතාවේ අද ලිය වී ඇති පරිච්ඡේද ලියැවෙනුයේ මීට වඩා හාත්පසින්ම වෙනස් ආකාරයකිනි. දැයක් බුද්ධියේ ප්‍රභවයෙන් බැබළවූ දේශපාලන නායකයානි! ඔබේ මෙහෙවර යුග යුග සදානුස්මරණීය වේ !

වජිර අබේවර්ධන,
එක්සත් ජාතික පක්ෂ සභාපති, පළාත් සභා හා පළාත් පාලන හිටපු ඇමැති

ජයග්‍රාහකයන් තෝරමින්

සී/ස උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් (පෞද්ගලික) සමාගමේ අනුග්‍රහයෙන් පවත්වන 'දිනමිණ' උස්වත්ත ටිපිටිප් හරස්පද ප්‍රහේලිකා 38 වැනි වාරයේ ජයග්‍රාහකයන් තේරීම පසුගියදා (08) දිනමිණ කර්තෘ මණ්ඩල පරිශ්‍රයේදී සිදු කෙරිණි. දිනමිණ ප්‍රධාන කර්තෘ ගාමිණී ජයලත් මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරී අනුරු මාධ්‍ය සේවා කළමනාකාර අදියුරු ගාමිණී රූපානන්ද, දිනමිණ ප්‍රධාන උප කර්තෘ සෙනෙහෙලතා මල්ගම්මන මහත්ම මහත්මිහු මෙම අවස්ථාවට එක් වූහ.

ඡායාරූපය -සමන්ත වීරසිරි

Uswatte 66 රස මිනුරු

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි අනුග්‍රහයෙනි

රුපියල් තිස්දහසක තෑගි

ත්‍යාග රටාව

පළමුවන ත්‍යාගය රුපියල් 10,000 — දෙවන ත්‍යාගය රුපියල් 5000
තෙවැනි ත්‍යාගය රුපියල් 3000 — රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි.

ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරදි විසඳුම් දිනමිණ පත්‍රයේ පළ වේ. ත්‍යාග මුදල් තෙමසක් ඇතුළත පිරිනැමේ.

කොන්දේසි

සතියට දෙවරක් පළවන මෙම ප්‍රහේලිකාව සඳහා මුදලින් රුපියල් තිස්දහසක් මාසිකව පිරිනැමේ. දිනමිණ පත්‍රයේ පළවන ප්‍රහේලිකා විසැඳුම් පුරවා එය 6 X 3 සාමාන්‍ය කවරවල පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපියේ ඉහළින් වම් කෙළවරේ දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා අංක 39 යනුවෙන් සඳහන් කර දිනමිණ ප්‍රහේලිකාව තැ.පෙ. 1134, කොළඹ යන ලිපිනයට 2021 මැයි මස 29 වැනිදා හෝ ඊට පෙර උස්වත්ත Tipi Tip හෝ බිස්කට් දවටන දෙකක් සහිතව එවිය යුතුය. ලියුම් කවරයේ ඔබේ ආපසු ලිපිනය ද ලියන්න. ඡායාපිටපත් ප්‍රතික්ෂේප කැරේ. ලේක්හවුස් ආයතනයේ සහ උස්වත්ත සමූහ ව්‍යාපාරයේ සේවක සේවිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ට තරගයට ඉදිරිපත් විය නොහැකිය.

Tipi Tip ටිපි ටිප් — දිනමිණ

ප්‍රහේලිකා අංක - 39



නම: ----------
ලිපිනය: ----------

දිනය: ---------- ----------
අත්සන:

උපකාරක පද

හරහට

1. රේල්ලුව / දුම්රිය
4. ශෝක නැත්තා
7. කාමය නිසා හටගන්නා බැඳීම / බාන
9. ගවයාගෙන් ගන්නා රස වර්ග පහ
10. නාග හෝ නියපොත්ත හෝ
11. වේගය / බලය
12. බාලයා /දරුවා
15. කෙලෙස්
17. ප්‍රමාද
18. අසත්‍ය / මුසා
19. දෙවනපැතිස් රජු කර වූ වැව
21. නොමියෙමි / තුංමංහන්දිය ලියූ ප්‍රබුද්ධ සාහිත්‍යධරයා

පහළට

1. කොළ කැඳ සෑදීමට ගන්නා කොළ වර්ගයකි
2. කම්කරු දින සමරුවේ සමාරම්භය සිදුවූ අමෙරිකා නගරය
3. අපායෙහි අධිපති
4. අන්‍ය / අනුන්ට අයත්
5. ශුද්ධ කිරීම හෝ පවිත්‍ර කිරීම හෝ
6. රනින් කළ / රන්මය
8. ලක්දිව මුල් ම වැව
13. මහා ප්‍රමුඛයා / මහරජ
14. අඩි තුනක් මේවා එකකි
16. කෙටිකතා රචනයක් නිසා රැඳවුම් භාරයේ සිටි සිංහල ලේඛකයා
20. සරු

● සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරු මාධ්‍ය සේවා)
078 - 4625925

දිනමිණ උස්වත්ත ටිපිටිප් ප්‍රහේලිකාව අංක 38 නිවැරදි විසඳුම

අ 1	වු 2	න්	ස 3	න්	සු 4	කී 5	
	හා		රු		ච 6	ර	ක 7
නි 8	න්	ද 9		මි 10	රි	වැ	ඩි
ර්		ස 11	කු 12		ත 13	ල්	
වි 14	ළ		දි 15	ල්	වා	ලේ	
න්		ස 16	ර		දී		ව 17
ද 18	හ	මි	ම	ග		ස 19	ස
න		මා 20	ලේ		කු 21	මි	භ

දිනමිණ උස්වත්ත ටිපිටිප් ප්‍රහේලිකාව අංක 38 ජයග්‍රාහකයෝ

පළමුවන ත්‍යාගය- රුපියල් 10,000
ඩබ්ලිව්.ඩී. ජයන්ත ලාල් පෙරේරා, 181/4ඒ, කුරුප්පු වත්ත, මහවිල, පානදුර

දෙවන ත්‍යාගය -රුපියල් 5000
විහගි එස්. රත්නායක, අංක 46, උඩ පේරාදෙණිය, පේරාදෙණිය

තෙවන ත්‍යාගය -රුපියල් 3000
පී.ආර්. කොඩිකාර හේවගේ, නො. 20/7, සමාන්තර පාර, වාද්දුව

රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි

1, බී.එම්.ජේ. බාලසූරිය, නො. 140, අත්තනගල්ල පාර, එල්ලක්කල
2, එච්.එම්. ප්‍රසන්න (අයේෂා නානායක්කාර බාරේ) අංක 46/1ඒ, බෝවත්ත, උකුවෙල
3, එම්.එම්.එම්. රිල්වාන්, අංක 12, ජුම්මා මස්ජිඩ් පාර, පෙරියමුල්ල, මීගමුව
4, ඒ.පී.එස්. හත්තොටුව, දර්ශන, උහන්ඕවිට, පිටිගල
5, එම්.ජී. ගුණරත්න, 395/3 ලක්ෂපාන වත්ත, තල්දූව, අවිස්සාවේල්ල
6, ඒ.විතාරණ, 50/03/01, හීනැටිකුඹුර පාර, තලංගම උතුර, බත්තරමුල්ල
7, එච්.බී.එස්. හේරත්, බදුල්ලවල, හක්බෙල්ලාවක, යටියන්තොට
8, එච්.එම්. රොබට් විජේවර්ධන, දේදුනුපිටිය ස්ටෝර්ස්, දේදුනුපිටිය, මහනුවර
9, සිල්වරින් ප්‍රියදර්ශනී සැමුවෙල්, අංක 13/24බී, ග්‍රේලයින් පාර්ක්, ඒකල, ජාඇල
10, එස්.ඒ. සුමනදාස, තිළිණ, වීරපුර, කුලියාපිටිය
11, ඩබ්ලිව්.ඒ. විශෝධා වගආරච්චි, නො. 11, නව නිවාස, ජයවර්ධනපුර, අම්පාර

දවසේ රාහු කාලය

උදේ 10.36 සිට 12.09 දක්වා රාත්‍රි 10.40 සිට 12.09 දක්වා

දින තත්ත්වය

මේෂ රවි 10 භාග බක් පුර එකළොස්වක තිථිය ලත් කිව් දින ඉර උදාව 05.59ට ඉර බැසීම 06.18ට මා නැකත උදේ 07.41න් ගෙවී පුවපල් නැකත ලබා පුර දොළොස්වක තිථිය ලබයි. වෘධි යෝගය දහවල් 02.35න් ගෙවී ධෘව යෝගය ලබයි. වණිජකරණය දහවල් 10.44න් ගෙවී විෂ්ටිකරණය ලබා එය රාත්‍රි 09.44න් ගෙවී බවකරණය උදා වේ.

විෂ කලාව - නළල / අමෘත කලාව - ඇස

මරු සිටින දිසාව - ගිනිකොන / යෝගිනි - ගිනිකොන / සුබ දිසාව - නැගෙනහිර

සුබසෙත
ජ්‍යෙෂ්ඨ කර්තෘ
ප්‍රවීණ
ජ්‍යෙතිෂවේදී
අජිත්
ධර්මසිරි

2021.04.23 සිකුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

උදේ
05.59 සිට 06.59 දක්වා - සිකුරු හෝරාව
06.59 - 07.59 දක්වා - බුධ හෝරාව
07.59 - 08.59 දක්වා - සඳු හෝරාව
08.59 - 09.59 දක්වා - සෙනසුරු හෝරාව
09.59 - 10.59 දක්වා - ගුරු හෝරාව
10.59 - 11.59 දක්වා - කුජ හෝරාව

සවස
11.59 -12.59 දක්වා - රවි හෝරාව
12.59 - 01.59 දක්වා - සිකුරු හෝරාව
01.59 - 02.59 දක්වා - බුධ හෝරාව
02.59 - 03.59 දක්වා - සඳු හෝරාව
03.59 - 04.59 දක්වා - සෙනසුරු හෝරාව
04.59 - 05.59 දක්වා - ගුරු හෝරාව

රාත්‍රී
05.59 - 06.59 දක්වා - කුජ හෝරාව
06.59 - 07.59 දක්වා - රවි හෝරාව
07.59 - 08.59 දක්වා - සිකුරු හෝරාව
08.59 - 09.59 දක්වා - බුධ හෝරාව
09.59 - 10.59 දක්වා - සඳු හෝරාව
10.59 - 11.59 දක්වා - සෙනසුරු හෝරාව

අලුයම
11.59 -12.59 දක්වා - ගුරු හෝරාව
12.59 - 01. 59 දක්වා - කුජ හෝරාව
01.59 - 02.59 දක්වා - රවි හෝරාව
02.59 - 03.59 දක්වා - සිකුරු හෝරාව
03.59 - 04.59 දක්වා - බුධ හෝරාව
04.59 - 05.59 දක්වා - සඳු හෝරාව

ලබන සමුළු

මෙදින උදේ 07.41 දක්වා මා නැකත උදාව පවතින නිසා එතෙක් උපදින දරුවන්ට ම,මි,මු,මෙ අකුරු ද ඉන්පසු උපදින දරුවන්ට පුවපල් නැකත අනුව ටො,ට,ටි,ටු අකුරු ද, දිනට අදාළව ච,ජ,ඡ අකුරු ද මුල් කොට දරුවාට නමක් තැබීම සුබයි.

පාකිස්තානයේ බලුකිස්තාන්හි සැප හෝටලයක බෝම්බ පිපිරීමක්

5ක් මරුට: 12කට තුවාල

ඉලක්කය චීන තානාපතිලු

පාකිස්තානයේ බලුකිස්තාන් පළාතේ අගනුවර වන වන ක්වේටාහි සුඛෝපභෝගී හෝටලයක බෝම්බ පිපිරීමකින් පුද්ගලයන් 5ක් මිය ගොස් 12 දෙනකු තුවාල ලබා තිබේ.

පාකිස්තාන තලේබාන් සංවිධානය සෙරීනා හෝටලයේ රථගාලේ පිපිරීම පිටුපස සිටින බවත්, එය පොලිස් නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් ඉලක්ක කර ගත් බවත් පැවසීය.

තලේබාන් ප්‍රකාශකයකු එය විස්තර කළේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු පුපුරන ද්‍රව්‍ය පිරවූ මෝටර් රථයක් භාවිතා කරමින් එල්ල කළ ප්‍රහාරයක් ලෙසය. මූලික වාර්තා සඳහන් කර තිබුණේ බෝම්බයේ ඉලක්කය චීනයේ තානාපතිවරයා බවයි.

තානාපති නොන් රොං ක්වේටාහි සිටින බව සත්‍ය වුවත් බදාදා ප්‍රහාරය සිදු වන අවස්ථාවේ එම හෝටලයට පැමිණ සිටියේ නැත. පාකිස්තාන තලේබාන් සංවිධානය සිය ප්‍රකාශවල චීන තානාපතිවරයා ගැන සඳහන් කර නැත.

මෑත මාසවලදී මේ කණ්ඩායම සහ අනෙකුත් සටන්කාමී සංවිධාන ඇෆ්ගනිස්තානයේ දේශ සීමාව අසල ගෝත්‍රික ප්‍රදේශවලට ප්‍රහාර වේගවත් කර තිබේ. ඇෆ්ගනිස්තාන දේශ සීමාව අසල බලුකිස්තාන් පළාත ඉස්ලාමීය අන්තවාදීන් සහ බෙදුම්වාදීන් ඇතුළු සන්නද්ධ කණ්ඩායම් කීපයක් වාසය කරති.

බෙදුම්වාදීන්ට අවශ්‍ය වන්නේ සෙසු පාකිස්තානයෙන් නිදහස ලබා ගැනීම සහ ප්‍රදේශයේ ප්‍රධාන චීන යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට විරුද්ධ වීමයි.

දවසේ ලග්න පලාපල

මේෂ ලග්නය - ඥාති පාර්ශ්වයෙන් සහාය

මේෂ ලග්නයට අනුව අද ඔබට සුබයි. ඒ කාලයක් තිස්සේ බලාපොරොත්තුව සිටි දරු සම්පතකට හිමිකම් කීම, නව ආයෝජන කටයුත්තකට අත ගැසීම ආදි වශයෙනි. තම ඥාති පාර්ශ්වයේ සහාය ඔබට හිමි වන අතර විවිධ සමිති සමාගම්වල නිලතල දැරීමට ද ඔබට සිදු වනු ඇත. පිරිසක් එකතු වන ස්ථානයකදී ඔබට කිසියම් ප්‍රසාදජනක ආරංචියක් ද ලැබෙනු ඇත.

වෘෂභ ලග්නය - විවිධ ආකාරයේ ලැබීම්

වෘෂභ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. ඒ විවිධ ලැබීම්වලට හේතු වන නිසාය. රැකියාගත වේවා, වෙළෙඳ ව්‍යාපාරගත වේවා යහපත් ප්‍රවේශයකට ඉඩ ඇති දිනකි. තමාට කලක් සතුරුකම් කළ පිරිසක් මිතුරු වන ලකුණු පෙනේ. කිසියම් උත්සවයකට සහභාගිවීම නිසා එහි වගකීම් රැසකට මුහුණ දීමට ද සිදු වේ. ආර්ථික වශයෙන් ද සුබ වන මෙදින උගුරේ ආපදා මුත්‍රගත ආපදා පෙන්වනු ඇත.

මිථුන ලග්නය - දේපළ හිමිකමක්

මිථුන ලග්නයට අනුව අද ඔබට ඉතා වාසනාවන්ත දිනක් වනු ඇත. වටිනා පුණ්‍ය කර්මයකට සහභාගි වීමට අවස්ථාව උදා වන අද දින නිවසේ කටයුතු බහුල වනු ඇත. තම සම්පතමයින් හා තමා යටතේ සිටින සේවක සේවිකාවන් එකට එකතුව කෙරෙන කටයුත්තක මුල් තැන ගෙන කැපවීමට සිදු වේ. දරුවන්ගේ කටයුතුවල නියැළීමට සිදු වන දිනක් මෙන්ම දේපළකට හිමිකම් කීමට ද හැකි වනු ඇත.

කටක ලග්නය - කටයුතුවල කාර්යක්ෂම භාවයක්

කටක ලග්නයට අනුව අද ඔබට තම ආර්ථිකයට නව ක්‍රමෝපායන් එකතු වන දිනකි. හදිසි ධන සම්පතකට හිමිකම් කීමට පුළුවන. එදිනෙදා කරගෙන ආ කටයුතුවල වෙනසක් හා කාර්යක්ෂම භාවයක් පෙනෙන්නට තිබේ. උගුරේ ආපදා, තුනටියේ ආපදා පෙන්වයි. හදිසි ගමන් බිමන් යෙදෙනු ඇත. ඒ කොයි හැටි වෙතත් එබඳු ගමන් අතිශය විශ්වාසවන්ත අය සමඟ පමණක් සිදු කරන්න.

සිංහ ලග්නය - අනාගත ආයෝජනයකට ඉඩ

සිංහ ලග්නයට අනුව අද ඔබට ජීවිතයේ සුඛවාදීම දිනකි. ඒ අනුව තම ගෘහ ජීවිතයේ සතුට අභිවෘද්ධිය උදා වේ. තමා කෙනකුට දී තිබූ පොරොන්දුවකට අනුව එය ක්‍රියාත්මක කෙරෙනු ඇත. පිටස්තර අයකු තම නිවසට පැමිණීම තුළ අනාගත ආයෝජන කටයුත්තකට මාර්ගය සැලසෙනු ඇත. තමා විසින් කරන යහපත් ක්‍රියාවන් අන් අයගේ පැසසුමට ලක් වේ. ඒ නිසා ඔබ දිරිමත් ලෙස කටයුතුවලට පෙලඹෙනු ඇත.

කන්‍යා ලග්නය - පදිංචියේ වෙනසක්

කන්‍යා ලග්නයට අනුව අද ඔබට නිවසින් බොහෝ දුරට යාමට සිදු වේ. සමහර විට පදිංචිය පවා වෙනස් කිරීමට සිදු වන දිනකි. ප්‍රියයන්ගෙන් වෙන්වීම, කටයුතු අපිළිවෙළ සහගතවීම නිසා දියුණුව ඇනහිටින තත්ත්වයක් පෙනෙන්නට තිබේ. තම මව් පාර්ශ්වයේ කෙනකු වෙතින් බාධා කිරීම් ද එළඹෙන අතර ආර්ථික පීඩනය ආදායම් සීමාවන ලකුණු පෙනෙන්නට තිබේ

තුලා ලග්නය - බලාපොරොත්තු නොවූ ආර්ථික වාසියක්

තුලා ලග්නයට අනුව අද ඔබට ඔබ ජීවිතයේ ඉතා සොඳුරු අත්දැකීමකට හේතු වෙයි. කිසිවිටක බලාපොරොත්තු නොවූ ආර්ථික වාසියකට හේතු වෙයි. ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රබල ඇගයීමකට ලක් වෙයි. තම දූ පුතුන් වෙතින් ද විවිධ ප්‍රසාදාත්මක පණිවුඩ අසන්නට ලැබේ. තමා මෙතෙක් කරගෙන ආ ව්‍යාපාර කටයුත්තක් නව මුහුණුවරකින් කරගෙන යාමට අවශ්‍ය පියවර ගැනෙනු ඇත.

වෘශ්චික ලග්නය - රැකියාවේ උසස් වීමක්

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට තම රැකියාගත අභිවෘද්ධිය උදා වේ. තමා සමඟ එකට කටයුතු කළ බොහෝ දෙනෙකු එකට එකතුව තමාට පරිත්‍යාගයක් සිදු කෙරේ. ඒ තම රැකියාගත උසස් වීමක් ද සමඟය. අවිවාහක අයට මංගල සීනු හැඬවෙන දිනකි. තම ඉදිරි පුණ්‍ය කටයුත්තකට සැලසුම් සකස් කෙරෙන අතර හුදෙකලාව සිට බොහෝ සැලසුම් කටයුතු සිදු කිරීමට සිතන දිනකි.

ධනු ලග්නය - ලොතරැයි ජය

ධනු ලග්නයට අනුව අද ඔබට ඉතා පුණ්‍යවන්ත කටයුත්තකට යොමු වීමට හැකි වේ. තමාට උරුම වීමට තිබූ දෙයක හිමිකමක් පෙනෙන්නට තිබේ. පියා විසින් තමාගේ අයිතිවාසිකම් පවරා දීමට පෙලඹේ. ඒ නිසාම තමාගේ එදිනෙදා කටයුතුවල කාර්යබහුලතාවක් පෙනෙන්නට තිබේ. තරග විභාග ජය, ලොතරැයි ජය මේ අතර තමාට හිමි වන ලකුණු පෙනේ.

මකර ලග්නය - සතුරු බලවේගයක්

මකර ලග්නයට අනුව තම ජීවිතයේ කනගාටුදායක සිදු වීමකට මුහුණ දීමට ඉඩ ඇති දිනකි. පිටස්තර ස්ථානයකදි තමාට සිදු විය හැකි සතුරු බලවේගයක් නිසා නීතියේ පිහිට පැතීමට පවා ඔබට සිදු වනු ඇත. එය සිතට දැඩි කම්පනයක් ගෙන දෙනු ඇත. විවාහගත දෙදරායාම් වුව ද වීමට ඉඩ ඇති නිසා ඉවසීමෙන් කටයුතු කරන්න. තම සහකරු හෝ සහකාරිය වෙතින් ද විවිධ දෝෂාරෝපණ අසන්නට ලැබේ.

කුම්භ ලග්නය - වාහන ඉඩම් ලාභ

කුම්භ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. තම නිවසේ උත්සවශ්‍රීයක් උසුලන දිනකි. වාහන, ඉඩම් ලාභ, මුදල් ලාභ, රැකියා උසස්වීම් පෙනෙන්නට ඇත. දිනපතා කරගෙන ආ රාජකාරියක් මඳකට නතර කර මානසික කායික සුවය උදා කර ගැනීමට සිතනු ඇත. ඒ තුළින් නව ආර්ථික ක්‍රම අනුගමනය කරමින් තම ව්‍යාපාරික ස්ථානය වැඩි දියුණු කර ගැනීමට සිත යොමු කරනු ඇත.

මීන ලග්නය - නීති ගැටලුවක්

මීන ලග්නයට අනුව අද ඔබට ප්‍රවේශමෙන් කටයුතු කිරීමට සිදු වේ. තම මුදල් පසුම්බියක් නැති වීමට ඉඩ ඇත. පැවතුණු නීති ගැටලුවක් තව තව දුරදිග යාමට ද ඉඩ ඇත. ඒ නිසා තමා තනි තීන්දු තීරණ නොගෙන වැඩිහිටි පාර්ශ්වයේ පිහිට අවවාද අනුශාසනා පිළිපැදීමට සිතා ගන්න. තම ආගමික කටයුතු කෙරේ ද සිත යොමු කරමින් සන්සුන් බව ඇති කර ගැනීමට උනන්දු වන්න.

රට පුරා උග්‍ර ඔක්සිජන් හිඟයක්

ඉන්දියාවේ කොවිඩ් දෙවන රැල්ල දරුණු අතට

සෞඛ්‍ය සේවා පද්ධතිය දැඩි අනතුරක

AROUND THE WORLD
ලොව වටා

පසුගිය පැය 24 තුළ ඉන්දියාව විසින් නව කොරෝනා වයිරස් රෝගීන් 314,835 ක් වාර්තා කර ඇති අතර එය ලොව ඕනෑම තැනක වාර්තා වූ ඉහළම එක්දින වාර්තාවයි.

එම කාලයේ මරණ 2,104කින් ඉහළ ගොස් ඇති අතර එය ඉන්දියාවේ උපරිම දෛනික මරණ සංඛ්‍යාවයි. එමඟින් රටේ සමස්ත තහවුරු වූ රෝගීන් මිලියන 16 කට ආසන්න සංඛ්‍යාවක් වන අතර එය දෙවනු වන්නේ එක්සත් ජනපදයේ මිලියන 31.9ට පමණි.

ඉන්දියාව දරුණු දෙවන රැල්ලක ග්‍රහණයේ සිටින අතර උග්‍ර ඔක්සිජන් හිඟයක් නිසා එහි අධික සෞඛ්‍ය සේවා පද්ධතිය පිළිබඳව වැඩි බියක් ඇති වේ. නගරයේ ඔක්සිජන් අර්බුදය සම්බන්ධයෙන් මධ්‍යම රජය කටයුතු කිරීම සම්බන්ධයෙන් දිල්ලියේ ඉහළම අධිකරණය ප්‍රසිද්ධියේ විවේචනය කිරීමට එය හේතු වී තිබේ. මෙය හාස්‍යජනකයි. ඉන්දියාව පුරා ඔක්සිජන් සැපයීම සම්බන්ධයෙන් මධ්‍යස්ථානය කරන්නේ කුමක්දැයි දැන ගැනීමට අපට අවශ්‍යයැයි විනිසුරුවරුන් කියා සිටියේ පෞද්ගලික රෝහල් හයක හිමිකරු විසින් කරන ලද පෙත්සමක තීන්දුව කියවමිනි.

කර්මාන්තශාලාවලින් ඉන්දියාව පුරා රෝහල් වෙත ඔක්සිජන් සැපයීම ආරක්ෂිතව සිදු කරන ලෙස එය රජයට නියෝග කළේය.

කොපමණ සංඛ්‍යාවක් දැයි දැනගත නොහැකි වුවද, රට පුරා පුද්ගලයන් ඔක්සිජන් බලාපොරොත්තුවෙන් මිය ගොස් ඇත. ඉන්දියානු සමාජ මාධ්‍ය ද ඔක්සිජන් සඳහා වන ආයාචනාවලින් පිරී තිබේ.

අතුරුදන් නාවික සබ්මැරීනයක කාර්ය මණ්ඩලයේ 53ක්

බේරා ගැනීමට ඉන්දුනීසියාවට පැය 72ක්

අතුරුදන් වූ නාවික සබ්මැරීනයක කාර්ය මණ්ඩල සාමාජිකයන් 53 දෙනෙකු ඔක්සිජන් නොමැති වීමට පෙර බේරා ගැනීමට ඉන්දුනීසියාවට පැය 72ක් පමණ ඉතිරිව ඇති බව නාවික හමුදාව පවසයි.

කේආර්අයි නන්ගල 402 නෞකාව බාලි වෙරළට සැතපුම් 60 ක් (කි.මී. 100) පමණ මුහුදේ දී බදාදා (21) අලුයම අතුරුදන් වී ඇතැයි විශ්වාස කෙරේ.

යුද නැව් හයක්, හෙලිකොප්ටරයක් සහ 400 දෙනෙක් මේ සෝදිසි මෙහෙයුමට සම්බන්ධ වේ.

සිංගප්පූරුව සහ මැලේසියාව නැව් යවා ඇති අතර එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ප්‍රංසය සහ ජර්මනිය ආධාර ලබා දී ඇත.

ජර්මනියේ ඉදිකරන ලද සබ්මැරීනය සරඔයක් පවත්වා ඇති නමුත් නැවත වාර්තා කිරීමට අපොහොසත් වූ අතර සම්බන්ධතා නැති විය. "අපි ප්‍රදේශය දන්නවා නමුත් එය තරමක් ගැඹුරුයි" පළමු අද්මිරාල් ජුලියස් විඩ්ජොජෝනෝ ඒඑෆ්පී ප්‍රවෘත්ති ඒජන්සියට පැවසීය.

ගැඹුරු මුහුදට කිමිදීමට අවසර දීමෙන් පසු සබ්මැරීනය සමඟ සම්බන්ධතා නැති වූ බව ඇතැම් වාර්තා පවසයි. මේ අතර, සබ්මැරීනය කිමිදුණු ස්ථානයට ආසන්නයේ ඇති තෙල් කාන්දුවක් ඉන්ධන ටැංකියට වූ හානියක් විය හැකි බව හෝ කාර්ය මණ්ඩලයේ සංඥාවක් විය හැකි බව නාවික හමුදාව පවසයි.

සිරියානු ගුවන් යානා නාශක මිසයිලයක් දකුණු ඊශ්‍රායලයේදී පුපුරා ගිහින්

සිරියානු ගුවන් යානා නාශක මිසයිලයක් දකුණු ඊශ්‍රායලයේදී පුපුරා ගොස් ඇති බවත් ඒ රහසිගත න්‍යෂ්ටික බලාගාරයක සිට කිලෝමීටර් 30ක් (සැතපුම් 20 ක්) දුරින් බවත් වාර්තාවේ.

ඩිමෝනා ප්‍රදේශයේ විශාල පිපිරීමක් ඇසීමට පෙර අනතුරු ඇඟවීමේ සයිරන් ක්‍රියා විරහිත විය. කෙසේ වෙතත් කිසිදු තුවාලයක් හෝ හානියක් වාර්තා වී නොමැත.

ඊශ්‍රායල් හමුදාව පැවසුවේ මිසයිලය මීට පෙර ඊශ්‍රායල ගුවන් යානයකට වෙඩි තැබූ කීපයකින් එකක් බවයි. එයට ප්‍රතිචාර දැක්වූයේ සිරියාවේ ගුවන් ආරක්ෂක ප්‍රහාරක ඒකක කීපයකට පහර දීමෙනි.

සිරියාවේ හමුදාව පැවසුවේ ඊශ්‍රායල මිසයිල දමස්කස් අවට ස්ථාන ඉලක්ක කර ගත් බවයි.

බොහෝ මිසයිල බාධා කර පහතට ඇද දැමූ නමුත් සිරියානු සොල්දාදුවන් සිව් දෙනෙකු තුවාල ලබා ඇති අතර "යම් ද්‍රව්‍යමය හානියක්" සිදුවී ඇතැයි ද එය සඳහන් කරයි.

මව ඝාතනය කර කැබලි කොට ආහාරයට ගත් ස්පාඤ්ඤයේ මනුසතෙක් උසාවිය හමුවට

ස්පාඤ්ඤයේ මිනිසතකු තම මව ඝාතනය කිරීම, ඇගේ සිරුර කපා දැමීම සහ ඇගේ දේහය අනුභව කිරීම යන චෝදනා යටතේ නඩු විභාගයකට මුහුණ දී තිබේ.

ඇල්බර්ටෝ සාන්චෙස් ගෝමස් 2019 දී අත්අඩංගුවට ගනු ලැබුවේ ඔහුගේ 66 හැවිරිදි මවගේ නිවෙසේ දී ය. ඒ පොලිසියට ඔහුගේ මිතුරෙකුගෙන් ලැබුණු ඔත්තුවක් හේතුවෙනි.

පොලිසිය පැවසුවේ ශරීර කොටස් මහල් නිවාසය පුරා විසිරී තිබූ බවයි. සමහර ඒවා ප්ලාස්ටික් බහාලුම්වල තබා ඇත.

විත්තිකරු අධිකරණයට පවසා ඇත්තේ තම මව කැබලි කොට ආහාරයට ගැනීම තමාට මතක නැති බවයි. ඔහු අත්අඩංගුවට ගැනීමට පෙර පෞරුෂ ආබාධයකින් මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයෙන්ද පෙළෙන බව වාර්තා වේ.

ස්පාඤ්ඤ මාධ්‍ය පවසන්නේ ඔහුගේ මව වන මාරියා සොලෙඩාඩ් ගෝමෙස්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ඔහු පොලිසිය දැන සිටි බවත් ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු තහනම් නියෝගයක් උල්ලංඝනය කර ඇති බවත්ය.

2019 පෙබරවාරි මාසයේදී නැගෙනහිර මැඩ්රිඩ් හි නිවෙසේදී පොලිසිය විසින් සොයා ගන්නා ලද අගෝහන දර්ශන ගැන අධිකරණයට දැනගන්නට ලැබුණි.

සමහර මිනිස් දේහ පිසීමේ ක්‍රියාවලියේ තිබූ අතර අනෙක් ඒවා බහාලුම්වල ගබඩා කර ඇති බව එල් මුන්ඩෝ පුවත්පත වාර්තා කරයි.

ඒ වන විට 26 හැවිරිදි වියේ පසුවූ විත්තිකරු තම මවගේ ගෙල සිරකර මරා දැමූ බව පාපොච්චාරණය කර ඇති අතර, ඔහු සමහර විට ශරීර කොටස් අනුභව කර ඇති අතර සමහර විට ඒවා බල්ලාට කෑමට දී ඇත.

නඩු විභාගය දිගටම පැවැත්වේ.

MARKET PRICE

පොල් මිල

පොල් සංවර්ධන අධිකාරිය - ප්‍රකාශිත දිනය 2021-04-22

1. පොල් මිල
(අ) වෙළෙඳ පොළ මිල ගණන් 2021.04.02 -2021.04.08 (මූලාශ්‍රය - HARTI)

		තොග මිල	සිල්ලර මිල
ලොකු ප්‍රමාණය	ගෙඩියක මිල රු.	70.00 -72.00	80.00 - 90.00
කුඩා ප්‍රමාණය	ගෙඩියක මිල රු.	60.00 - 65.00	60.00 - 75.00

(ඈ) දේශීය ගොවිපළ මිල රු/ගෙඩි 1000ක් (ලෙලි නොගසන)
රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද)

කුරුණෑගල දිස්ත්‍රික්කය	58,000 - 70,000	110,000 -120,000
පුත්තලම් දිස්ත්‍රික්කය	58,000 - 65,000	108,000 -112,000
ගම්පහ දිස්ත්‍රික්කය	57,000 - 60,000	108,000 -115,000
හම්බන්තොට දිස්ත්‍රික්කය	60,000 - 80,000	108,000 - 110,000

2.දිසිදි පොල්
සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශිය) (රු./කි.ග්‍රෑ.1 ක්) 525 - 535 සා
(රු./කි.ග්‍රෑ.1 ක්) 525 - 535 සා
ශ්‍රී ලංකා - නැවතෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්)
3.පොල් තෙල් (තොග මිල)
දේශිය මිල (රු./මෙ.ටො.1ක්) 620, 000 - 660,000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.04.15) (රු./මෙ.ටො.1ක්) 316,150
5. පුන්නක්කු (රු./මෙ.ටො.1ක්) 60,000 - 80,000 වි
6. ගුදිරි කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 950 - 1,400 වි
7. ඕමැට් කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 3,750 - 5,000 වි
8. මිශ්‍ර කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 1,500 - 1,750 වි
9. බ්‍රිස්ටල් කොහු බැම් 1 (රු./කි.ග්‍රෑ.50 ක්) 5,000 - 7,000 වි
10. බ්‍රිස්ටල් කොහු බැම් 2 (රු/කි.ග්‍රෑ. 50ක්) 7,500 - 8,500 වි
11. පොල් ලෙලි මිල (16-03-2021)

දිස්ත්‍රික්කය	පොල් ලෙලි 1000ක මිල (රුපියල්)
පුත්තලම	4,500 - 5,000
ගම්පහ	4,500 - 5,000
මාතර	4,500 - 5,000
කුරුණෑගල	4,500 - 5,500

තෙතමනය 50% වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.00
තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.50
තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 8.50
තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 9.50
තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 10.50
තෙතමනය 10% අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 13.00
12. පොල් කටු (රු/මෙ. ටො. 1ක්) 29,500 - 30,500 වි
13. පොල් කටු අඟුරු (2021-03-19 - 2021-03-25)
(රු/මෙ.ටො. 1ක්) 110,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
14. පොල් ඉරටු (රු./මෙ.ටො. 1ක්) 42,000 - 44,000 වි
වි - විකුණුම් මිල සා.- සාමාන්‍ය මිල

මෙඩිහෙල්ප් රෝහලට
තරුණ ව්‍යවසායකයා සම්මාන දෙකක්

සෞඛ්‍ය සත්කාර සේවයේ ප්‍රමුඛයකු වන මෙඩිහෙල්ප් රෝහල් සමූහය ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) සංවිධාන කළ වසරේ ව්‍යවසායකයා සම්මාන උලෙළේදී ජාතික මට්ටමේ මහා පරිමාණ කාණ්ඩයේ, විශිෂ්ටතම තරුණ ව්‍යවසායකයාට හිමි සම්මානයෙන් සහ බස්නාහිර පළාතේ, මහා පරිමාණ කාණ්ඩයේ, විශිෂ්ටතම තරුණ ව්‍යවසායකයාට හිමි සම්මානයෙන් පිදුම් ලැබීය. කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඇතුළු මැති ඇමැතිවරුන් රැසකගේ ප්‍රධානත්වයෙන් පැවති උත්කර්ෂවත් සම්මාන ප්‍රදානෝත්සවයේදී මෙඩිහෙල්ප් විධායක අධ්‍යක්ෂ චන්දික විජේසිරිවර්ධන මහතා වෙත සම්මාන පිරිනමන ලදි. "මෙඩිහෙල්ප් කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උසස් තත්ත්ව පාලනය මෙන්ම පාරිභෝගික ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය මේ ජයග්‍රහණයට දායක වුණා. ඔවුන් සියල්ලන්ටම කෘතඥතාව පුද කරන අතර තව දුරටත් උසස් තත්ත්වයේ සේවාවක් සැපයීමට මෙඩිහෙල්ප් ඇප කැප වනවා." මෙඩිහෙල්ප් විධායක අධ්‍යක්ෂ චන්දික විජේසිරිවර්ධන මහතා පැවසීය.

හොරණ නගරයෙන් ඇරඹි මෙඩිහෙල්ප් සමූහය දැරිය හැකි මිලට සැමට සුවසෙත සලසමින් සිය 35 අවුරුදු වාරිකාව තුළ පිළියන්දල, බණ්ඩාරගම, හෝමාගම, මොරටුව, කළුතර, පානදුර, මතුගම, බුලත්සිංහල, ඉංගිරිය, බේරුවල ආදි ප්‍රදේශවල බාහිර රෝගී සත්කාරක මධ්‍යස්ථාන 12ක් පිහිටුවමින් සුවිශාල ප්‍රගතියක් අත් කර ගෙන ඇත. රෝගියා කේන්ද්‍ර කර ගත් ප්‍රවේශයක් අනුගමනය කරන මෙඩිහෙල්ප් රෝහල් වෙතින් දියවැඩියාව, ප්‍රසව හා නාරිවේදය, උගුර-කන-නාසය, හෘද රෝග, පිළිකා, සාමාන්‍ය ශල්‍ය, ළමා රෝග, විකලාංග, ස්නායු රෝග, මුත්‍රා රෝග, චර්ම රෝග, අක්ෂි රෝග ඇතුළු රෝග ගණනාවක් පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් 250කට වැඩි පිරිසකගේ සේවය ගත හැකිය. එමෙන්ම නවීනතම වෛද්‍ය පහසුකම් සපිරි මෙඩිහෙල්ප් රෝහල් වෙතින් රසායනාගාර සේවා, ඔසුසල්, සෞඛ්‍ය පරීක්ෂා, බාහිර රෝගී සහ හදිසි සත්කාර සේවා, ස්කෑන් සහ එක්ස් රේ ආදී සේවාද දැරිය හැකි මිලකට කඩිනමින් ගත හැකිය.

The Pharo හෝටලය
නිට්ටඹුවේදී විවෘත වෙයි

ශ්‍රී ලාංකේය හෝටල් ක්ෂේත්‍රයේ නිම් වලලු පුළුල් කරමින්, නිට්ටඹුව The Pharo සුඛෝපභෝගී හෝටලය The British Way English Academy සභාපති ආචාර්ය ගීතදේව මහතාගේ සුරතින් පසුගියදා විවෘත විය. The British Way English Academy ආයතනයට අනුබද්ධ, සියලු පහසුකම්වලින් සමන්විත අංග සම්පූර්ණ The Pharo හෝටලය සිය අමුත්තන්ට ඉහළ මට්ටමේ ආගන්තුක සත්කාර සැපයීමට සූදානමින් සිටියි.

මහනුවර - කොළඹ පාරේ නිට්ටඹුව නගරයේ පිහිටි The Pharo හෝටලය ටී කොෆී මේකර්, හොට් වෝටර්, මිනි බාර් ආදි සියලු පහසුකම්වලින් සපිරි, වායුසමනය කළ ෆැමිලි සහ සුපර් ඩිලක්ස් කාමරවලින් සමන්විතය. එසේම අමුත්තන් 350 බැගින් සහභාගි විය හැකි The Grand Ballroom සහ The Lavendra Ballroom නමින් අලංකාර ලෙස නිමවූ උත්සව ශාලා දෙකක්ද හෝටලය සතුය.

විවාහ මංගලෝත්සවවල සිට වෙනත් ඕනෑම උත්සවයක් සඳහා මේ උත්සව ශාලා කදිමට ගැළපේ. හෝටලයේ ඉහළම මහලේ නාන තටාකය සමඟ Sky Lounge අවන්හල පිහිටා ඇත. උපන්දින උත්සව මෙන්ම මිතුරු හමුවීම් සඳහා එය කදිම පරිසරයක් නිර්මාණය කරයි. The Let Berry සහ The Palm Court නමින් අවන්හල් දෙකකින්ද, The Traven Blue නමින් බාර් එකකින්ද, Brew How නම් කැෆේ එකකින්ද The Pharo හෝටලය සමන්විතය. "පවතින කොවිඩ් තත්ත්වය පිළිබඳ මනාව සැලකිලිමත් වෙමින් සියලු කටයුතු සංවිධාන කර ඇති නිසා ඕනෑම අයකුට සෞඛ්‍යාරක්ෂිතව තමන්ගේ සතුට භුක්ති විඳින්න The Pharo හෝටලයේදී පුළුවන්. හෝටල් කලාවේ නවමු වෙනස අත්විඳින්න එන්නැයි අප හැමෝටම ආරාධනා කරනවා." සාමාන්‍යාධිකාරි ජානක ද අල්විස් මහතා පැවසීය.

රට වටා මිල ගණන්

	නාරාහේන්පිට ආ. ම.	රත්මලාන ආ. ම.	වැලිසර. ආ. ම.	මීගොඩ ආ. ම.	තඹුත්තේගම ආ. ම.	දඹුල්ල ආ. ම.	නුවරඑළිය ආ. ම.	මිල රුපියල්
පහත රට එළවළු	සිල්ලර මිල රු.	සිල්ලර මිල රු.	තොග මිල රු.	තොග මිල රු.	තොග මිල රු.	තොග මිල රු		තොග මිල රු.
වට්ටක්කා	80	120	50	60-70	50	-	ගෝවා	80
අළු කෙසෙල්	80	120	60	-	20-40	-	කැරට්	120
පිපිඤ්ඤා	60	120	40	-	20	10-15	ලීක්ස්	50
වැටකොළු	160	160	50	70	50-80	65-70	රාබු	40
බණ්ඩක්කා	80	120	50	60-70	50-60	35-40	බීට්රූට්	50
කරවිල	120	160	90	60-80	70-100	65-70	අර්තාපල්	100
පතෝල	80	120	50	70	40-50	25-30	අර්තාපල් රතු	90
මාළු මිරිස්	240	280	190	150-160	160	110-120	නෝකෝල්	60
බටානා	-	120	80	60-70	180	-	බෙල්පෙපර් රතු	400
මුරුංගා	300	-	240	-	-	-	කහ	400
එළබටු	120	-	70	80	40-60	35-40	කොළ	300
කැකිරි	60	120	30	20	15-20	10-15	බැසිල්	300
නෝකෝල්	80	-	90	80	60	25-30	චයිනීස් කැබේජ්	150
මඤ්ඤොක්කා	80	80	50	-	30-35	30-35	රෙඩ් කැබේජ්	700
බතල	-	-	60	-	40-50	50-55	සැල්දිරි	400
දඹල	140	160	100	100	70-80	75-80	කොත්තමල්ලි කොළ	180
මැකරල්	80	120	80	60-70	50-60	25-30	අයිස්බර්ග්	180
උඩරට එළවළු							සලාද	50
බෝංචි	160	160	120	100	100-110	40-80	රතුසලාද	300
ගෝවා ගෙඩි	160	160	130	80	110-120	40-80	මිංචි	200
කැරට්	160	200	160	140-160	160-170	120-130	පාස්ලි	250
ලීක්ස්	120	140	80	80	75-90	45-55	රුබා	50
රාබු	60	100	50	-	20-30	10-15	රෝස්මරි	600
තක්කාලි	100	140	50	-	40-50	30-40	බ්‍රොකෝලි	250
බීට්රූට්	90	120	50	60	110	45-55	මල්ගෝවා	350
සලාද	-	210	250	-	150	-	රතුරාබු	300
ගෝවා කොළ	80	-	100	30-40	-	-	පැචර්ලි	150
පලතුරු							සුකිනි	150
අන්නාසි	130	130	120	110	120-130	110-130	කහ සුකිනි	150
ඇඹුල් කෙසෙල්	150	140	70	90	35-70	70-80	දිගරාබු	80
කෝලිකුට්ටු	280	220	220	240	160-200	150-200	තක්කාලි	200
සීනි කෙසෙල්	160	140	90	90	35-70	70-75	මාළුමිරිස්	250
ඇම්බුන්	200	200	180	-	130-160	-		
ගස් ලබු (රෙඩ්ලේඩ්)	-	110	160	-	60-80	85-90		
ගස් ලබු	180	120	150	100	-	85-90		
ඇපල් (ආනයනික)	60 - 80	230	65	-	-	-		
මිදි (දේශිය)	-	-	-	-	-	-		
මිදි (ආනයනික රතු)	1100	1200	1000	-	-	-		
මිදි (ආනයනික කොළ)	1000	1200	900	-	-	-		
මස්								
කුකුළු මස් - අලුත් (සම රහිත)	480 - 720	800	630	-	550	-		
කුකුළු මස් - ශීත කළ (සම සහිත)	560	650	700	-	-	-		
අනෙකුත්								
අමු මිරිස්	200	300	160	-	-	130-140		
දෙහි	160	200	120	-	-	75-80		
අමු ඉඟුරු	-	500	260	-		200-220		
සහල්								
රතු නාඩු	105	110	108	-	96			
සුදු නාඩු	105	105	105	-	-			
රතු කැකුළු	100	95	95	100	-			
සුදු කැකුළු	100	100	100	90-100	93-94			
සුදු කැකුළු සම්බා	108	-	120	90-94	130			
තම්බපු කැකුළු සම්බා	110	135	120	94-96	-			
කීරි සම්බා	180	190	190	115	-			

දැනගෙන ගන්න
රන් මිල

කැරට් 21 - 94.937
කැරට් 22- 99.458
කැරට් 24- 108500

කොළඹ කොටස් වෙළෙඳපොළ

2021. 04 . 22 දින වෙළෙඳපොළ දත්ත

කොටස් වෙළෙඳපොළ

SHARE MARKET

සුරැකුම	සුරැකුම්පත් ප්‍රමාණය	බර තැබූ සාමාන්‍ය අවසන් පෙර මිල	විවෘත	උපරිම	අවම	බර තැබූ සාමාන්‍ය අවසන් මිල	වෙනස (රු.)
ප්‍රධාන පුවරුව							
එයිරිකන් ස්පෙන්ස් හොටෙල්ස් හෝල්ඩිංග්ස්	102	31.40	31.10	31.10	31.00	31.10	(0.30)
අබාන්ස්	402	151.00	151.50	151.50	150.00	150.00	(1.00)
ඇක්සස් ඉන්ෂු. ශ්‍රී ලංකා	292,381	23.50	23.50	23.50	22.50	22.70	(0.80)
ඒ.සී.එල්.	485,505	40.20	40.20	40.20	38.00	38.30	(1.90)
ඒ.සී.එල්. ප්ලාස්ටික්	955	261.75	255.25	260.00	242.50	254.25	(7.50)
ඇක්මි	425,073	6.60	6.50	6.60	6.50	6.60	0.00
අගලවත්ත	6,963	26.00	26.00	26.00	25.60	26.00	0.00
ඇහොට් ප්‍රොපටීස්	6,001	38.40	37.90	37.90	36.10	36.20	(2.20)
එයිරිකන් ස්පෙන්ස්	74,348	57.40	55.50	56.00	55.00	55.20	(2.20)
එලායන්ස්	550	49.10	49.30	49.30	49.00	49.10	0.00
අමානා බැන්ක්	97,813	3.20	3.30	3.30	3.20	3.20	0.00
අමායා ලෙෂර්	3,933	17.90	17.20	19.40	17.20	17.40	(0.50)
ඒෂියා ඇසෙස්ට්	12,703	6.30	6.30	6.30	6.00	6.10	(0.20)
ආසිරි	77,350	26.10	26.20	26.30	25.00	25.50	(0.60)
ආසිරි සර්ජිකල්	1,023	13.60	13.90	13.90	13.50	13.50	(0.10)
ඔටෝ ඩ්‍රෝම්	24	70.50	73.10	73.10	71.10	70.50	0.00
බයිරහා ෆාම්ස් XD	13,459	133.75	136.00	136.00	130.00	130.25	(3.50)
බලන්ගොඩ	6,240	10.80	10.50	10.90	10.50	10.90	0.10
බුකිරි ඩාරා	50,702	306.50	315.00	315.00	300.00	300.00	(6.50)
සී.එම්. හෝල්ඩිංග්ස්	6,613	82.90	83.00	83.00	80.00	80.00	(2.90)
සී.ටී. හෝල්ඩිංග්ස්	22,114	176.00	173.00	176.00	173.00	173.00	(3.00)
කාගිල්ස්	4,180	234.00	238.00	238.00	231.00	231.00	(3.00)
කාගෝ බෝට්	101	66.20	61.20	65.00	61.20	61.20	(5.00)
කාසන්ස්	1,606	278.50	285.00	285.00	279.00	281.50	3.00
සී.ඩී.බී.	10	110.00	105.75	105.75	105.75	110.00	0.00
සී.ඩී.බී (CDB. X0000)	1,524	75.00	79.40	79.40	75.20	75.30	0.30
සෙන්ට්‍රල් ෆිනෑන්ස්	61,368	86.50	85.50	85.50	84.90	85.00	(1.50)
සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස්	44,530	115.00	107.50	117.00	107.50	109.25	(5.75)
සෙලින්කෝ ඉන්ෂුවරන්ස්	17	2,087.25	1,951.00	1,985.00	1,852.00	2,087.25	0.00
සෙලින්කෝ ඉන්ෂුවරන්ස් (CINS. X0000)	142	1,080.00	1,066.00	1,066.00	1,065.00	1,065.25	(14.75)
සිලෝන් ගාර්ඩියන්	5,013	120.25	118.00	119.00	118.00	118.00	(2.25)
සිලෝන් ඉන්වෙස්මන්ට්	4,137	62.80	62.00	63.50	62.00	62.00	(0.80)
සිලෝන් ටූබැකෝ	302	980.00	980.00	980.00	977.75	978.00	(2.00)
කොම්නෙක්ස්	801	77.10	80.00	80.00	76.40	76.40	(0.70)
චේව්රෝන්	69,202	93.70	94.70	94.70	92.50	92.60	(1.10)
සී.අයි.සී	24,710	56.60	56.50	56.50	54.00	55.20	(1.40)
සී.අයි.සී (CIC.X0000)	160,866	47.00	47.90	48.00	41.00	45.00	(2.00)
සිට්‍රස් ලෙෂර්	7,249	8.80	8.80	8.80	8.60	8.60	(0.20)
කෝල්ඩ් ස්ටෝර්ස්	19,314	584.50	585.00	585.00	583.00	584.75	0.25
කළමිබු සිටි	37	877.00	888.00	888.00	888.00	877.00	0.00
කළමිබු ලෑන්ඩ්	35,178	23.50	23.00	23.00	22.50	22.70	(0.80)
කොමර්ෂල් බැන්ක් XD	159,600	84.90	85.00	85.00	83.50	83.90	(1.00)
කොමර්ෂල් බැන්ක් (COMB.X0000)	49,040	76.40	76.90	77.30	75.00	75.10	(1.30)
කන්වෙන්ෂන්ස් ෆුඩ්	565	1,245.00	1,245.25	1,285.00	1,245.25	1,250.50	5.50
ඩන්කොටුව පෝසිලේන්	450,599	11.70	11.70	12.60	11.30	11.90	0.20
ඩී.එච්.සී.සී.බැන්ක් (PLC)	199,569	59.80	59.90	60.00	58.00	58.00	(1.80)
ඩයලොග්	210,291	12.90	13.00	13.00	12.80	12.80	(0.10)
ඩිමෝ	20	528.25	524.00	524.00	524.00	528.25	0.00
ඩිජිඩි ප්‍රඩක්ට්ස්	3,446,445	57.70	57.80	58.10	55.10	56.50	(1.20)
ඩොක්යාඩ්	30	75.00	77.90	77.90	77.90	75.00	0.00
ඩොල්ෆින් හොටෙල්ස්	13,193	23.00	24.20	25.00	23.00	23.10	0.10
ඩර්ඩන්ස්	1	104.00	103.75	103.75	103.75	104.00	0.00
ඊ.බී.ක්‍රීසි	7,513	29.80	29.60	30.10	29.50	29.50	(0.30)
ඊස්ට් වෙස්ට්	10,436	10.60	10.70	10.70	10.50	10.50	(0.10)
ඊස්ටන් මර්චන්ට්	71,150	6.00	5.80	5.80	5.50	5.50	(0.50)
එක්ස්ජෝ ලංකා	1,962,582	49.60	49.50	49.50	47.40	47.80	(1.80)
ෆෝරිලෑන්ඩ්	10,300	12.70	13.30	13.30	12.60	12.60	(0.10)
ග්‍රේන් එළිවේටර්ස්	91,380	133.00	133.00	133.00	125.00	126.00	(7.00)
හේකාබි	606,566	108.00	108.00	109.50	103.00	104.00	(4.00)
හේලීස්	1,474,431	78.40	78.50	78.50	75.00	76.20	(2.20)
හේලීස් ෆැබ්රික්	1,133,354	16.00	16.00	16.10	15.00	15.60	(0.40)
හේලීස් ෆයිබර්	22,414	52.10	51.00	51.50	48.50	48.70	(3.40)
එච්.ඩී.එෆ්.සී	1,150	34.90	34.50	34.50	34.00	34.30	(0.60)
හේමාස් හෝල්ඩිංග්ස්	270,945	82.20	80.50	83.00	80.50	82.30	0.10
එච්.එන්.බී.	52,804	132.00	131.00	131.00	129.50	130.00	(2.00)
එච්.එන්.බී. ඇෂුවරන්ස් XD	214	57.00	58.00	58.00	56.50	56.60	(0.40)
එච්.එන්.බී.(HNB. X0000)	42,204	99.30	99.10	99.90	98.10	98.50	(0.80)
හොරණ	2,600	21.20	21.00	21.00	21.00	21.00	(0.20)
හොටෙල් සිගිරිය	1,131	64.80	58.50	65.00	58.50	61.50	(3.30)
හොටෙල් කෝපරේෂන්	552	11.00	11.10	11.10	11.10	11.10	0.10
ඉන්ඩස්ට්‍රියල් ඒ.එස්.පී.එච්.	892,785	0.40	0.50	0.50	0.40	0.40	0.00
ජේ.කේ.එච්.	489,329	146.75	146.25	148.00	146.00	146.25	(0.50)
කැන්ඩි හොටෙල්ස්	30	5.00	5.30	5.30	5.30	5.00	0.00
කෑගල්ල XD	5,209	104.50	104.50	104.50	100.50	101.00	(3.50)
කැලණි කේබල්ස්	879	124.25	124.25	125.00	112.00	112.00	(12.25)
කැලණි ටයර්ස්	68,581	87.00	87.00	87.40	84.00	85.00	(2.00)
කැලණිවැලි	3,513	38.30	39.80	39.80	38.00	38.10	(0.20)
කිංන්ස්බරි	908	6.10	6.30	6.30	6.00	6.10	0.00
කොටගල	10,512	5.70	5.60	6.00	5.60	5.80	0.10
එල්.ඕ.එල්.සී.හෝල්ඩිංග්ස්	217,521	329.50	330.00	330.00	315.00	319.75	(9.75)
ලේක්හවුස් ප්‍රින්ටර්ස්	10	144.25	148.00	148.00	148.00	144.25	0.00
ලංකා ඇලුමිනියම්	438,933	20.20	20.30	20.50	18.60	19.20	(1.00)
ලංකා හොස්පිටල්ස්	6,900	44.00	42.30	42.30	41.00	41.60	(2.40)
ලංකා අයි.ඕ.සී	66,055	19.50	19.20	19.40	18.50	19.00	(0.50)
ලංකා ටයිල්ස්	490,877	50.00	50.10	50.10	47.50	48.10	(1.90)
ලංකා වෝල්ටයිල්ස්	611,732	50.90	51.10	51.10	48.10	49.10	(1.80)
ලාෆ්ස් ගෑස්	7,125	21.50	22.80	22.80	20.50	21.00	(0.50)
ලාෆ්ස් ගෑස් (LGL.X0000)	12,050	14.60	14.60	14.60	14.50	14.60	0.00
ලක්ෂපාන XD	4,671	14.00	14.00	14.50	14.00	14.40	0.40
එල්. බී. ෆිනෑන්ස්	497,906	58.60	58.60	58.60	50.00	56.10	(2.50)
ලී හෙජරිස්	32	67.00	65.40	65.40	63.70	67.00	0.00
ලයන් බෲවරි	227	580.00	590.00	590.00	590.00	590.00	10.00
එල්.එම්.එෆ්	33,051	171.75	174.75	174.75	166.25	169.25	(2.50)
එල්. වී. එල්. එනර්ජි	124,992	10.00	10.00	10.00	9.90	10.00	0.00
මල්වත්ත	101	12.30	12.00	12.00	12.00	12.00	(0.30)
මල්වත්ත (MAL.X0000)	1,389	8.00	8.40	8.40	8.00	8.00	0.00
මෙල්ස්ට්‍රා කෝප්	211,816	47.80	47.80	47.80	45.20	45.70	(2.10)
මර්ක් ෂිපින්	10	67.50	68.00	68.00	68.00	67.50	0.00
මර්චන්ට් බැන්ක්	2,550	7.10	6.90	7.20	6.90	7.20	0.10
මුලර්ස්	57,001	1.10	1.20	1.20	1.10	1.10	0.00
නමුණුකුල XD	119	162.75	162.50	167.00	162.00	162.25	(0.50)
නැෂනල් ඩිවලප්මන්ට් බැන්ක් XR	52,780	77.90	77.90	78.70	76.00	76.40	(1.50)
නේෂන්ස් ට්‍රස්ට්	7,340	54.20	54.90	54.90	54.00	54.00	(0.20)
නව්ලෝක	9,704	5.00	5.10	5.20	4.90	5.00	0.00
නෙස්ලේ	6,164	1,000.00	1,010.00	1,010.00	1,002.00	1,005.25	5.25
ඕවර්සීස් රියැල්ටි	1,550,705	16.00	16.00	16.00	15.50	15.50	(0.50)
පෑන් ඒෂියා	759,724	15.90	16.00	16.00	15.00	15.20	(0.70)
පෑන් ඒෂියන් පවර්	384,161	3.70	3.70	3.70	3.60	3.70	0.00
පීපල්ස් ඉන්ෂුවරන්ස්	8,620	30.50	31.60	31.60	30.50	30.70	0.20
පීපල්ස් ලීසිං	195,486	12.20	12.30	12.30	12.10	12.20	0.00
පිරමිල් ග්ලාස්	10,992,183	11.60	11.50	11.60	11.40	11.50	(0.10)
ආර්. අයි. එල්. ප්‍රොපටි	137,829	6.40	6.50	6.50	6.20	6.30	(0.10)
රේඩියන්ට් පේමේන්ට්	220	26.70	26.00	26.00	25.40	25.80	(0.90)
රෙගිනිස්	3,306	48.20	47.50	49.80	47.50	49.00	0.80
රේණුකා ඇග්‍රි	123,907	4.00	3.90	4.00	3.90	3.90	(0.10)
රේණුකා ෆුඩ්ස්	3,914	13.70	13.90	14.00	13.00	13.20	(0.50)
රේණුකා ෆුඩ්ස් (COCO X0000)	3,101	11.60	11.00	11.60	10.70	10.80	(0.80)
රේණුකා හෝල්ඩිංග්ස්	16,946	15.30	15.00	15.30	14.80	14.80	(0.50)
රෙසියුස් එනර්ජි	1,537	25.70	25.70	25.70	24.00	24.10	(1.60)
රිචඩ් පීරිස් XD	53,783	16.90	16.80	16.80	16.40	16.40	(0.50)
එස්.එම්.බී. ලීසිං	80,217	0.50	0.40	0.50	0.40	0.50	0.00
එස්.එම්.බී. ලීසිං (SEMB.X0000)	519,749	0.30	0.30	0.30	0.20	0.20	(0.10)
සම්පත්	2,375,465	51.60	51.80	51.90	50.90	51.00	(0.60)
සැම්සන් ඉන්ටර්නැෂනල්	201	145.75	145.00	145.00	132.00	134.75	(11.00)
සණස ඩිවෙලොප්මන්ට්ස් බැන්ක්	21,687	53.10	52.70	53.00	52.00	52.40	(0.70)
සෙලාන් බැන්ක්	265,126	50.00	50.00	50.00	48.40	49.90	(0.10)
සෙලාන් බැන්ක් (SEYB.X0000)	457,371	42.00	42.00	42.50	41.00	42.00	0.00
සෙලාන් ඩිවෙලොප්මන්ට්ස් XD	39,117	14.90	14.70	15.00	14.50	14.50	(0.40)
සියරා කේබල්ස්	291,715	6.70	6.70	7.00	6.60	6.60	(0.10)
සීගිරිය විලේජ්	9,613	38.90	34.70	40.00	34.50	39.20	0.30
සිංගර් ෆිනෑන්ස්	70,655	15.20	15.40	15.50	14.90	15.00	(0.20)
එස්.එල්.ටී.	21,932	35.00	35.50	35.70	34.50	35.00	0.00
සන්ෂයින් හෝල්ඩිංග්ස්	162,852	24.90	24.90	24.90	23.80	24.00	(0.90)
ස්විස්ටෙක්	734,106	30.60	30.50	31.00	29.30	29.60	(1.00)
තලවතුලේ	12,275	41.20	42.00	42.00	40.50	40.70	(0.50)
ටැංජරින්	20	41.10	41.00	41.00	41.00	41.10	0.00
ටී ස්මෝල් හෝල්ඩර්ස්	3	38.70	38.00	38.00	38.00	38.70	0.00
ටී. ජේ. ලංකා	59,867	41.00	40.80	41.30	40.50	40.50	(0.50)
ත්‍රී ඒකර් ෆාම්ස්	5,826	205.25	205.00	205.00	195.00	196.50	(8.75)
ටෝකියෝ සිමෙන්ට්	124,191	72.50	72.50	74.00	70.80	71.10	(1.40)
ටෝකියෝ සිමෙන්ට් (TKYO.X0000)	176,048	66.70	67.00	67.50	63.50	64.60	(2.10)
යුනියන් බැන්ක් XD	124,330	10.70	10.70	11.00	10.60	10.80	0.10
යුනිසිස්ටි	132,026	8.20	8.40	8.40	7.80	8.00	(0.20)
යුනයිටඩ් මෝටර්ස්	51	61.50	61.00	61.00	58.50	61.50	0.00
වැලිබල්	784,117	7.60	7.70	7.70	7.50	7.50	(0.10)
වැලිබල් ෆිනෑන්ස්	15,878	118.25	117.25	119.75	114.50	115.75	(2.50)
විදුල් ලංකා	610,151	5.70	5.70	5.80	5.60	5.60	(0.10)
විටවල	6,118	50.90	50.60	50.60	50.00	50.00	(0.90)
යෝර්ක් ආකේඩ්	41	166.00	158.25	168.75	158.25	166.00	0.00
දෙවන පුවරුව							
අබාන්ස් ෆිනෑන්සියල්	50	28.50	28.60	28.60	28.60	28.50	0.00
ඇම්බියොන් කැපිටල්	168,054	5.00	5.10	5.90	5.10	5.40	0.40
ඒෂියා කැපිටල්	1,820	5.60	5.70	5.70	5.40	5.40	(0.20)
බ්‍රවුන්ස් චීව්	42,957	10.70	10.70	10.70	9.90	10.00	(0.70)
කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස්	8,055	6.30	5.90	6.30	5.90	6.00	(0.30)
ඩිස්ටිලරීස්	8,918	20.50	20.50	20.60	20.00	20.10	(0.40)
ෆස්ට් කැපිටල් XD	59,610	46.30	47.50	48.00	46.30	46.40	0.10
හුන්නස් ගෝල්ස්	10	179.00	170.00	170.00	170.00	179.00	0.00
ජනශක්ති ඉන්ෂුවරන්ස්	16,822	28.00	29.00	29.00	28.00	28.00	0.00
ලංකා රියල්ටි	15,250	36.30	33.10	33.10	33.00	33.10	(3.20)
එල්.ඕ.එල්.සී. ඩිවලප්මන්ට් ෆයිනෑන්ස්	76	70.00	70.00	74.40	65.00	70.00	0.00
එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස්	283,411	6.30	6.00	6.20	6.00	6.10	(0.20)
මඩොල්සිම	26,042	8.00	8.30	9.90	8.20	8.30	0.30
ඔඩෙල් පී.එල්.සී.	11,158	19.00	19.30	19.30	19.00	19.30	0.30
ඔරියන්ට් ෆිනෑන්ස්	2,120	13.30	13.50	13.50	13.00	13.50	0.20
පිඩීඑල්	435	122.25	110.00	116.75	110.00	112.50	(9.75)
පීපල්ස් මර්චන්ට්	1	6.80	7.00	7.00	7.00	6.80	0.00
සෙරන්ඩිබි ලෑන්ඩ්	35	2,707.40	2,210.00	2,555.00	2,110.00	2,707.40	0.00
සිංගර් ශ්‍රී ලංකා	84,175	20.10	19.00	20.50	18.90	19.00	(1.10)
දිරිසවි පුවරුව							
ඇග්ස්ටාර් පී.එල්.සී.	15,850	8.10	7.70	8.00	7.70	7.70	(0.40)
ඇලුමෙක්ස් පී.එල්.සී.	852,608	12.40	12.40	12.40	11.90	12.00	(0.40)
අමානා තකාෆුල්	1,000	7.80	8.20	8.20	7.70	7.80	0.00
ඇම්බියොන් හෝල්ඩිංග්ස්	728,148	19.30	19.80	22.00	19.80	21.30	2.00
ඒ. එම්. එෆ්. කෝපරේෂන් ලිමිටඩ්	633	250.00	245.00	245.00	241.00	241.00	(9.00)
ආර්පිකෝ ඉන්ෂුවරන්ස්	338	22.50	22.60	22.60	21.80	22.30	(0.20)
ඒෂියා සියාකා	643,535	2.70	2.60	2.70	2.50	2.50	(0.20)
බන්සෙයි රිසෝට්	1,001	8.40	8.30	8.40	8.30	8.30	(0.10)
බේරුවල රිසෝට්	50,200	0.80	0.80	0.80	0.80	0.80	0.00
බෝගල ග්‍රැෆයිට්	44,987	25.00	25.00	25.50	25.00	25.40	0.40
බොගවන්තලාව	580	11.00	10.90	10.90	10.80	10.80	(0.20)
බී.පී.පී.එල්. හෝල්ඩිංග්ස්	363,997	15.00	14.70	15.40	14.50	15.10	0.10
බ්‍රවුන්ස්	18,647	180.25	177.00	181.00	171.25	174.50	(5.75)
බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස්	44,592,395	6.40	6.50	6.50	6.20	6.30	(0.10)
සී.ටී.ලෑන්ඩ්	1,053	26.30	27.50	27.50	26.00	26.20	(0.10)
සී. ඩබ්. මැකී	3,250	44.40	43.00	43.00	41.00	41.40	(3.00)
සිලෝන් බේව්රෙජ්	2	779.75	780.00	780.00	780.00	779.75	0.00
සිලෝන් ටී බ්‍රෝකර්ස්	30,110	3.20	3.20	3.30	3.20	3.30	0.10
සී.එෆ්.අයි.	1,000	64.60	64.50	64.50	58.10	60.00	(4.60)
සිට්‍රස් හිත්කඩුව	14,565	4.90	5.00	5.00	4.90	4.90	0.00
සිට්‍රස් වස්කඩුව	62,651	3.10	3.10	3.10	2.90	3.00	(0.10)
කොමර්ෂල් ක්‍රෙඩිට්	970	21.10	22.30	22.30	21.00	21.00	(0.10)
කොමර්ෂල් ඩිවලොප්මන්ට් XD	703	110.25	110.75	111.00	110.75	110.75	0.50
ඩිල්මා සිලෝන්	17	636.75	636.00	676.00	636.00	636.75	0.00
ඊ එනලින්	61,345	5.90	5.70	5.70	5.20	5.30	(0.60)
ඒඩන් හොටෙල් ලංකා	367,353	10.00	10.40	10.40	10.00	10.00	0.00
ඇල්පිටිය	6,561	40.30	40.50	40.50	38.40	38.70	(1.60)
ඉක්විටි ටූ පී.එල්.සී.	135	50.00	49.80	49.80	48.00	48.90	(1.10)
ෆෝට්‍රස් රෙසෝර්ට්ස්	1,700	10.50	10.60	10.80	10.50	10.60	0.10
ගලදාරි	2,000	7.90	7.80	7.80	7.80	7.80	(0.10)
ගාඩියන් කැපිටල්	699	30.20	30.30	30.30	30.20	30.20	0.00
හැටන්	2	9.00	9.00	9.00	9.00	9.00	0.00
එච්. එන්. බී. ෆිනෑන්ස්	20,054	8.30	8.30	8.30	8.00	8.10	(0.20)
එච්. එන්. බී. ෆිනෑන්ස් (HNBF X0000)	501	6.50	6.60	6.60	6.20	6.60	0.10
එච්. ඒ. ඒ. ෆුඩ්ස්	5,218	5.20	5.00	5.20	5.00	5.20	0.00
ජෙට්වින් සිම්පොනි	28,993	9.00	9.00	9.70	9.00	9.70	0.70
ජෝන් කීල්ස්	100	70.00	68.30	68.30	68.30	68.30	(1.70)
කහවත්ත	18,014	28.50	28.60	28.60	27.50	27.50	(1.00)
කීල්ස් ෆුඩ්	67	150.50	152.25	152.25	152.25	150.50	0.00
කීල්ස් හොටෙල්ස්	59,481	10.00	10.00	10.00	9.50	9.60	(0.40)
ලංකා සෙරමික්	5	125.00	133.25	133.25	133.25	125.00	0.00
ලංකෙමි සිලෝන්	702	29.20	29.00	29.00	28.60	28.70	(0.50)
ලාෆ්ස් පවර්	5,389	8.80	8.90	8.90	8.40	8.40	(0.40)
ලාෆ්ස් පවර් (LPL X0000)	2	6.10	6.20	6.20	6.10	6.10	0.00
ලයිට් හවුස් හොටෙල්	20	30.30	32.50	32.50	32.50	30.30	0.00
ලෝටස් හයිඩ්‍රෝ	5,609	9.80	9.70	9.90	9.70	9.70	(0.10)
මහවැලි කොකනට් XD	9,430	30.20	30.90	31.50	30.00	30.00	(0.20)
මහවැලි එඩි	300	12.70	12.70	12.70	12.10	12.40	(0.30)
මාරවිල රෙසෝට්	185,148	1.90	1.80	1.90	1.70	1.70	(0.20)
මස්කෙලිය	4,022	10.70	10.80	10.80	10.60	10.70	0.00
මිලේනියම් හවුස්	30,535	6.00	6.00	6.00	5.80	5.90	(0.10)
නුවරඑළිය	2	1,020.00	1,057.00	1,057.00	1,057.00	1,020.00	0.00
ඔන්ඇලි	3	31.60	32.50	32.50	32.50	31.60	0.00
ෆාම් ගාර්ඩන් හොටෙල්	500	25.40	25.50	25.50	25.50	25.50	0.10
පෙගාසස් හොටෙල්ස්	542	31.10	29.20	31.10	29.20	29.20	(1.90)
ප්‍රයිම් ෆිනෑන්ස්	12,701	13.30	12.70	12.70	12.50	12.50	(0.80)
රයිගම් සෝල්ටර්ස්	232,657	6.30	6.40	6.40	5.80	5.90	(0.40)
රම්බෝඩ ගෝල්ස්	26	17.60	17.60	17.60	17.60	17.60	0.00
රේණුකා කැපිටල්ස්	24,615	6.00	5.80	5.90	5.70	5.90	(0.10)
රිචඩ් පීරිස් එක්ස්පෝර්ට් XD	1,308	355.25	356.00	356.00	348.00	350.25	(5.00)
රෝයල්ස් ෆාම්ස්	250	15.50	15.00	15.00	15.00	15.00	(0.50)
සතොස මෝටර්ස්	16	217.00	221.00	221.00	218.00	217.00	0.00
සෙරන්ඩිබි ඉංජිනියරින් ග්‍රෘප්	211	6.00	6.30	6.50	6.30	6.30	0.30
සෙරන්ඩිබි හොටෙල්ස්	1,000	14.80	14.10	14.10	14.00	14.10	(0.70)
සිංගර් ඉන්ඩස්ට්‍රීස්	110	48.10	47.50	49.90	47.50	49.90	1.80
සිංහ හොස්පිටල්ස්	107,072	2.00	2.10	2.10	2.00	2.00	0.00
සොෆ්ට්ලොජික්	96,302	11.60	11.60	12.20	11.20	11.50	(0.10)
සොෆ්ට්ලොජික් කැපිටල්	61,129	3.80	3.70	3.90	3.70	3.70	(0.10)
සොෆ්ට්ලොජික් ෆිනෑන්ස්	1,268	9.80	9.90	9.90	9.80	9.80	0.00
සොෆ්ට්ලොජික් ලයිෆ්	10,585	30.10	30.20	30.90	30.20	30.60	0.50
ටී.ඒ. එල්. ලංකා	183	13.40	13.60	13.60	13.20	13.20	(0.20)
උඩුපුස්සැල්ලාව	2,300	20.50	20.50	20.60	20.10	20.60	0.10
වැලිබල් එන්	1,230,389	58.40	58.40	58.40	55.00	56.30	(2.10)
වෝච් ලිස්ට්							
ඇනිලානා හොටෙල්ස්	131,035	1.20	1.10	1.20	1.00	1.10	(0.10)
බිම්පුත් ෆිනෑන්ස්	4,191	6.40	6.30	6.30	6.20	6.20	(0.20)
බ්ලූඩයමන්ඩ්ස්	437,801	0.80	0.80	0.90	0.70	0.80	0.00
බ්ලූඩයමන්ඩ්ස් (BLUE-X0000)	2,117,057	0.40	0.40	0.50	0.30	0.40	0.00
ලංකෙමි ඩිවලොප්මන්ට්	126,487	3.50	3.30	3.60	3.30	3.50	0.00
මැක්වුඩ්ස් එනර්ජි	135,156	2.80	2.70	2.90	2.70	2.70	(0.10)
මල්ටි ෆිනෑන්ස්	2,321	6.90	7.20	7.30	7.20	7.30	0.40
නේෂන් ලංකා	50,638	0.80	0.80	0.80	0.70	0.80	0.00
සිංහපුත්‍ර ෆිනෑන්ස්	3,550	3.70	3.30	3.80	3.30	3.40	(0.30)

වෙළෙඳපොළ දත්ත

කොටස් සම්බන්ධ දත්ත	අද දින	කලින් දින
පිරිවැටුම් වටිනාකම (රු.)

දිනමිණ The Dinamina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගෙළිඔය, පෙතියාගොඩ අංක 96A2 දරන ස්ථානයේ පදිංචි **අටුගෙදර සෝරාජපති සිසිර ප්‍රේමලාල්** (ජාතික හැඳුනුම්පත් අංකය 683282774V) වන මා මාස්වෙල, මාවෙල ස්ථානයේ පදිංචි **අටුගෙදර සෝරාජපති සුසන්ත ප්‍රේමචන්ද්‍ර** (ජාතික හැඳුනුම්පත් අංක 761802801V) අය අයට ඒ.එම්.එල්.ඩබ්. අත්තනායක 2013-09-04 වන දින සහතික කළ අංක 1690 දරන ඇටෝනි බලපත්‍රය මෙයින් අවංලගු කරමි. බල රහිත කරමි.

මෙම දිනයෙන් පසු එම **අටුගෙදර සෝරාජපති සුසන්ත ප්‍රේමචන්ද්‍ර** මෙම ඇටෝනි බලපත්‍රයට අදාළව කරන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ලංකා රජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

අටුගෙදර සෝරාජපති සිසිර ප්‍රේමලාල්.

මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන පනතේ 29 බී (29 D) වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය

මහජන බැංකුව

ගොඩනැගිලි සහිත වටිනා යාබද ඉඩම් කොටස් දෙකක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - සියඹලාපේ

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 247 C දරන සියඹලාපේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි "කැකුනගහ මූකලාන" නොහොත් "කැකුනගහවත්ත" නමින් හඳුන්වනු ලබන 1995.01.24 දින බලයලත් මිනින්දේරු එම්.ඩබ්. ඩී.එස් ද සිල්වා සාදන ලද අංක 2748 දරන පිඹුරේ අංක 01 දරන ඉඩම් කැබැල්ලේ මායිම් **උතුරට :** 1991.03.03 දින දරන 1559 දරන පිඹුරේ බිම් කොටස් අංක 01, **නැගෙනහිරට :** එස්.එම්. ආර්. විමලදසගේ ඉඩම, **දකුණට :** අංක 02 දරන බිම් කොටස, **බස්නාහිරට :** පාර යන මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් විස්සයි දශම එකක් (A1.Ro.P20.1) නොහොත් අංක 2748 පිඹුර අනුව හෙක්ටයාර් 0.45548 බිම් ප්‍රමාණය සහ ගොඩනැගිලි, ගහ කොළ සහ එහි තුළ පිහිටි සියලු දේ සමග ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් ලේඛනයේ N 70/29 යටතේ ලියාපදිංචි වී ඇති ඉඩම.

"කැකුනගහ මූකලාන" නොහොත් "කැකුනගහවත්ත" නමින් හඳුන්වනු ලබන 1995.01.24 දින බලයලත් මිනින්දේරු එම්. ඩබ්.ඩී.එස් ද සිල්වා සාදන ලද අංක 2748 දරන පිඹුරේ අංක 02 දරන ඉඩම් කැබැල්ලේ මායිම් **උතුරට :** 2748 පිඹුරේ බිම් කොටස් අංක 01, **නැගෙනහිරට :** එස්.එම්.ආර්. විමලදසගේ ඉඩම, **දකුණට :** පුද්ගලික කතත්ත සහ එච්.ඩී. චාර්ල්ස් අප්පුහාමිගේ ඉඩම, **බස්නාහිරට :** පාර යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි (A0.R2.P0) නොහොත් අංක 2748 පිඹුර අනුව හෙක්ටයාර් 0.20232 බිම් ප්‍රමාණය සහ ගොඩනැගිලි, ගහ කොළ සහ එහි තුළ පිහිටි සියලු දේ සමග ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් ලේඛනයේ N 70/30 යටතේ ලියාපදිංචි වී ඇති ඉඩම.

මහජන බැංකුව විසින් මා හට පවරන ලද බලය යටතේ

ඉහත සඳහන් දේපළ 2021 මැයි මස 10 වන සඳුදා දින පෙරවරු 10.30 ට මහජන බැංකුව, කිරිබත්ගොඩ ශාඛාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දැනුම් දෙමු.

දේපළ සඳහා වූ ප්‍රවේශය

සපුගස්කන්ද ඛනිජ තෙල් නීතිගත සංස්ථා මංසන්ධියේ සිට බියගම FTZ මාර්ගයට ප්‍රවිෂ්ට වී එම මාර්ගය ඔස්සේ ඩිමෝ හත්දිය දක්වා පැමිණ ඉන් අනතුරුව දකුණු දෙසට ඇති මාහේන මාර්ගයේ මීටර නවසියයක් පමණ පැමිණෙන්න. ඉහත සඳහන් දේපළ වම් දිශාවෙන් ඇති අතර, එය සී.ඩබ්. මැකී ගබඩා සංකීර්ණයට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පිහිටා ඇත.

විකිණීමේ නිවේදනය සඳහා

කරුණාකර වැඩි විස්තර සඳහා 2019 අගෝස්තු 23 වන දින රජයේ ගැසට් පත්‍රය සහ ඩේලි නිව්ස්, දිනමිණ සහ තිතකරන් පුවත්පත් පරිහරණය කරන්න.

ගෙවීමේ ක්‍රමය

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින්, මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

01. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්)
02. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු
03. ගැනුම් මිල මත වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්)
04. විකුණුම් පිරිවැය සහ අනෙකුත් සියලුම ගාස්තු තිබේ නම්
05. විකුණුම් සහතිකය සඳහා වූ මුද්දර ගාස්තු
06. මිලදී ගත් මිලෙන් ඉතිරිය 90% ක් වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ප්‍රධාන කළමනාකරු, අයකිරීම් දෙපාර්තමේන්තුව, 10 වන මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත එම මුදල නොගෙවන්නේ නම්, දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහෝසි කර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුව පවතී.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත ලිපිනයෙන් ලබාගත හැකිය.

පෙර දැනුම් දීමකින් තොරව වෙන්දේසිය පැවැත්වීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රධාන කළමනාකරු (අයකිරීම්),
අයකිරීම් දෙපාර්තමේන්තුව,
10 වන මහල, ප්‍රධාන කාර්යාලය,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.
දු. ක. : 011-2481569, 011-2481443

ඩැලස් කෙලාට්

බලයලත් වෙන්දේසිකරුවන්
අංක 146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය, කොහුවල.
දුරකථනය : 011-4367467, 011-4367111

මහජන බැංකුව PEOPLE'S BANK www.peoplesbank.lk

ශික්ෂණ රෝහල - රත්නපුර ලංසු සඳහා ආරාධනයයි

රත්නපුර ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ප්‍රසම්පාදන සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

අනු අංකය	ලිපිගොනු අංකය / ලංසු අංකය	අයිතමය / විස්තරය	ලංසු ඇපකරයේ වටිනාකම (රු)
01	THR/FBA/SG/13/2021	ටයර් මිලදී ගැනීම	30,000.00
02	THR/FBA/SG/05/2021	මෙට්ට මිලදී ගැනීම	20,000.00
03	THR/FBA/SG/06/2021	කාර්යාල උපකරණ මිලදී ගැනීම (Furniture)	25,000.00
04	THR/FBA/SG/07/2021	කාර්යාල උපකරණ මිලදී ගැනීම (Steel)	20,000.00
05	THR/FBA/SC/06/2021	බෙහෙත් කවර, සී.ටී. කවර, MRI කවර ආදිය මිලදී ගැනීම	35,000.00

- එක් එක් ලංසු අංකයන් සඳහා වෙන් වෙන් වශයෙන් රු. 2,000.00 ක ආපසු නොගෙවන ලිපි ලේඛන ගාස්තු ගෙවීමෙන් අනතුරුව ටෙන්ඩර් ලිපි ලේඛන කට්ටල පහත සඳහන් ලිපිනයේදී ලබාගත හැක.
- ටෙන්ඩර් ලිපි ලේඛන 2021.05.19 දින දක්වා රාජකාරි දිනයන්හිදී (රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල හැර) පෙ. ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා නිකුත් කරනු ලැබේ.
- එක් ලංසුකරුවෙකුට ඉහත සඳහන් ලංසු අංක ඕනෑම ප්‍රමාණයක් සඳහා ලංසු ඉදිරිපත් කළ හැකි නමුත් ඒ සඳහා වෙන වෙනම ලංසු ලියවිලි ලබාගත යුතුය. (විකල්ප ලංසු භාරගනු නොලැබේ)
- මුදු, තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අධ්‍යක්ෂ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය.
- ටෙන්ඩර් භාරගැනීම 2021.05.19 දින පෙ.ව. 10.30 ට අවසන් කෙරෙන අතර, ඉන්පසු ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.
- 2021.05.19 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.
- ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු අංකය / ලිපිගොනු අංකය පහත සඳහන් පරිදි සටහන්කර එවිය යුතුය.

  උදා: **"THR/FBA/SG/13/2021"**
- මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයිතම සියල්ල සඳහාම පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට සකස් කරන ලද සාම්පල් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එසේ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඕනෑම ටෙන්ඩරයක් හෝ එහි කොටසක් කිසිදු හේතුවක් නොදක්වා පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සතුය.
- අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ලංසු ලිපි ලේඛන ලබා ගැනීමට පැමිණීමට පෙර කරුණාකර 045-2222261 (307) අංකය අමතන්න.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල, රත්නපුර.

මහජන බැංකුව බේරා නොගත් උකස් රන් භාණ්ඩ වෙන්දේසිය

අනුරාධපුර ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා සහ සේවා මධ්‍යස්ථානයන්හි 2020.02.28 දින දක්වා වසරක කාලයක් සඳහා උකස් තබන ලද, පහත උපලේඛනයේ සඳහන් දින දක්වා බේරා නොගත් උකස් රන් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හිදී සහ ස්ථානයන්හිදී පෙ.ව. 9.00 ට ආරම්භ කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශාඛාව	සේවා මධ්‍යස්ථානය	බේරාගත යුතු අවසන් දිනය	වෙන්දේසි දිනය හා ස්ථානය
නොච්චියාගම	සාලියවැව	2021.05.21	2021 මැයි මස 22 සහ 23 නොච්චියාගම ශාඛා පරිශ්‍රයේදී
තඹුත්තේගම	දම්සෝපුර		
	රාජාංගනය		
	රැජින හත්දිය		
තලාව	-		
අනුරාධපුර	අනුරාධපුර		2021 මැයි මස 22 සහ 23 අනුරාධපුර ශාඛා පරිශ්‍රයේදී
	නාච්චාදූව		
	රඹෑව		
නුවරවැව	විලච්චිය		
	මිහිත්තලේ		
	තිරප්පනේ		
ගල්කිරියාගම	-		
කැකිරාව	මරදන්කඩවල		2021 මැයි මස 22 සහ 23 කැකිරාව ශාඛා පරිශ්‍රයේදී
	ගනේවල්පොල		
එප්පාවල	-		
ගල්නැව	බුල්නැව		
මීගලැව	-		
මැදවච්චිය	-		2021 මැයි මස 22 සහ 23 මැදවච්චිය ශාඛා පරිශ්‍රයේදී
පදවිය	පදවි පරාක්‍රමපුර		
	පදවි ශ්‍රීපුර		
කැබිතිගොල්ලෑව	-		
කහටගස්දිගිලිය	-		2021 මැයි මස 22 සහ 23 කහටගස්දිගිලිය ශාඛා පරිශ්‍රයේදී
ගලෙන්බිඳුණුවැව	-		
හොරොව්පොතාන	-		

ඉහත දිනයන්හිදී පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසි නැවත දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීම හෝ මෙම කවර කටයුත්තක් වුවද සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මෛත්‍රීපාල සේනානායක මාවත,
අනුරාධපුර.

මහජන බැංකුව PEOPLE'S BANK www.peoplesbank.lk

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව - පොළොන්නරුව වත්කම් බදුදීම (කඩ කාමර)

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වත්කම් (කදුරුවෙල - මඩකලපුව ප්‍රධාන මාර්ගයට යාබදව ගල්ලැල්ල හන්දියේ අලුතින් ඉදිකරන ලද කඩ කාමර 04) බදුදීම සඳහා මා විසින් මිල ගණන් කැඳවනු ලැබේ. (කාර්යාල දිනයන්හි පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා)

ටෙන්ඩර් ඉල්ලුම්පත් නිකුත් කිරීම - 2021.04.27 දින සිට 2021.05.05
ටෙන්ඩර් ඉල්ලුම්පත් භාරගැනීම අවසන් කිරීම - 2021.05.10 පෙ.ව. 10.00
ටෙන්ඩර් විවෘත කිරීම - 2021.05.10 පෙ.ව. 11.00

විමසීම් - 027-2555575

අනු අංකය	වත්කම් විස්තරය	ආපසු නොගෙවන පෝරම ගාස්තු (රු.)	ආරක්ෂක ඇප තැන්පතු මුදල (රු.)	අවම ලංසුව (වාර්ෂික) (රු.)
01	කඩ කාමර 01 (අඩි 12 X 06)	2,000.00	24,000.00	24,000.00
02	කඩ කාමර 02 (අඩි 12 X 06)	2,000.00	24,000.00	24,000.00
03	කඩ කාමර 03 (අඩි 12 X 06)	2,000.00	24,000.00	24,000.00
04	කඩ කාමර 04 (අඩි 12 X 10)	2,000.00	30,000.00	30,000.00

ප්‍රේමසිරි මුණසිංහ
සභාපති,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

මධ්‍යම පරිසර අධිකාරිය

ගාල්ල දිස්ත්‍රික්කයේ දොඩන්දූව, කටුදම්පේ, යෝජිත සංචාරක හෝටල් ව්‍යාපෘතිය සම්බන්ධව සකස් කරනු ලැබූ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවේ

අවසාන තීරණය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

ජාතික පාරිසරික පනතේ 23 ආ ආ (4) වගන්තිය යටතේ දැනුම් දීමයි

උක්ත ව්‍යාපෘතියට අදාළ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව අධ්‍යයනයෙන් අනතුරුව නිශ්චිත වශයෙන් සඳහන් කළ කොන්දේසිවලට යටත්ව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අංක 1159/22 දරන 2000 නොවැම්බර් 22 දිනැති ගැසට් පත්‍රය මගින් සංශෝධිත 1993 අංක (01) දරන ජාතික පාරිසරික (ව්‍යාපෘති අනුමත කිරීම සඳහා කාර්යය පටිපාටිය) නියෝගයන්හි අංක 9 (1) වගන්තිය ප්‍රකාරව, නාවල, 5 වන පටුමග, අංක 56 ලිපිනයේ පදිංචි සමන්ත රාජපක්ෂ මහතා වෙත අනුමැතිය ලබාදීමට මධ්‍යම පරිසර අධිකාරිය තීරණය කර ඇති බව මහජනතා වෙත මින් දැනුම් දෙනු ලැබේ. 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධිත) පනතට අනුව මෙම මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව රාජ්‍ය ලේඛනයක් වශයෙන් සලකනු ලබන අතර, එය මධ්‍යම පරිසර අධිකාරියේ පුස්තකාලයෙහි තබා ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය,
"පරිසර පියස",
අංක 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

මහජන බැංකුව බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසිය

මහජන බැංකුවේ හි පහත සඳහන් කාල පරිච්ඡේදයට අනුව 2020-03-31 වන දින දක්වා උකස් තබා ශාඛා හා සේවා මධ්‍යස්ථානවලදී බේරා නොගත් රන් භාණ්ඩ පහත සඳහන් දිනයන්හි මහජන වෙන්දේසියේ අලෙවි කරනු ඇත.

වෙන්දේසිය පෙ.ව. 9.00 සිට පහත දිනයන් හා ස්ථානයන්හි දී පවත්වනු ලබන බව මෙයින් දන්වමු.

ශාඛාව / සේවා මධ්‍යස්ථානය		2020-03-31 දක්වා උකස් කරනු ලදුව පහත දිනට බේරා නොගත්	වෙන්දේසි දිනය	ස්ථානය
හැටන්	දික්ඔය	2021-05-16	2021-05-17	හැටන් ශාඛාව
	කොටගල			
ගිනිගත්හේන	වටවල			
මස්කෙළිය	අප්කොට්			
බගවන්තලාව				
තලවකැලේ	ආගරපතන			
පූඩඑඔය ශාඛාව	තවලන්තැන්න			
	හපුගස්තලාව			
හඟුරන්කෙත	හේවාහැට	2021-05-17	2021-05-18	හඟුරන්කෙත ශාඛාව
රිකිල්ලගස්කඩ	පදියපැලැල්ල			
	අධිකාරිගම			
තිල්දණ්ඩාහින්න	වලපනේ			
රාගල	රාගල	2021-05-18	2021-05-19	රාගල ශාඛාව
උඩපුස්සැල්ලාව				
නුවරඑළිය	කඳපොල			
	නාතුඔය			

ඉහත සඳහන් පරිදි දිනයන් හා කාල වකවානු ප්‍රසිද්ධ කර තිබුණ ද, බැංකුවේ අභිමතය පරිදි වෙනත් දැනුම්දීමකින් තොරව වෙන්දේසි අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල් දැමීමේ අයිතිය මහජන බැංකුව සතුය. .

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නුවරඑළිය.

මහජන බැංකුව PEOPLE'S BANK www.peoplesbank.lk

මහජන බැංකුව

ත්‍රිකුණාමලය ප්‍රාදේශීකය

බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුව, පහත සඳහන් ශාඛාවන්හි 2020.03.31 දින දක්වා උකස් කර පහත සඳහන් දිනයන්හි බේරා නොගන්නා ලද රන් භාණ්ඩ පහත සඳහන් දිනවල පහත සඳහන් ස්ථානවලදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශාඛා හා සේවා මධ්‍යස්ථාන	දිනට බේරා නොගත්	වෙන්දේසි දිනය හා වෙන්දේසි ස්ථානය
කන්තලේ ශාඛාව (090) මුල්ලිපොතාන සේ.ම. (842) මුතූර් ශාඛාව (095) තෝප්පූර් සේ.ම. (958) සේරුනුවර ශාඛාව (233) ඊච්චලම්පත්තු සේ.ම. (594) කින්නියා ශාඛාව ((094) කච්චකුඩිතිව් සේ.ම. (959) පුල්මුඩේ ශාඛාව (352)	2021.05.05	2021.05.06 ත්‍රිකුණාමලය ශාඛාව (066)
ත්‍රිකුණාමලය ශාඛාව (066) පාලයියුත්තු සේ.ම. (841) උප්පුවේලි සේ.ම. (881) කුච්චවෙලි සේ.ම. (593) ගෝමරන්කඩවල සේ.ම. (938) ත්‍රිකුණාමලය නගර ශාඛාව (255) මැදපාර සේ.ම. (501) දෙවන නගර ශාඛාව (789)	2021.05.06	2021.05.07 ත්‍රිකුණාමලය ශාඛාව (066)

උකස් වෙන්දේසිය කිසිදු දැනුම් දීමකින් තොරව අවලංගු කිරීම ඒකාබද්ධ කිරීම හෝ කල් දැමීමේ අයිතිය බැංකුව සතුව ඇත.

ප්‍රාදේශීය කළමනාකාර,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මහජන බැංකුව,
අංක 128, නුවර පාර, ත්‍රිකුණාමලය.

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk

මහජන බැංකුව

කඩුගන්නාව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 27-08-2019 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජීවපාති රත්නායක මහත්මිය විසින් සහතික කරන ලද 2014.08.04 දිනැති අංක 4234 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක : 175 නුවර පාර, කඩුගන්නාව යන ස්ථානයෙහි පදිංචි ජයසේකර මුදියන්සේලාගේ ආසිරි ප්‍රසන්න කුමාර ජයසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 4234 දරන උකස්කරය යටතේ දැනට රු. 2,227,067.20 ක (රුපියල් විසි දෙලක්ෂ විසිහත්දහස් හැටහතයි ශත විස්සක) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින් එම මුදල් සහ එකී රු 2,227,067.20 ක (රුපියල් විසි දෙලක්ෂ විසිහත්දහස් හැටහතයි ශත විස්සක) මුදල සඳහා 2019.04.12 වන දින සිට වර්ෂයකට AWPLR+ 5.5 % බැගින් පොලිය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රියංජනි කුමාරි අබේකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2016.04.01 වන දිනැති අංක 10804 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක 175- නුවර පාර, කඩුගන්නාව ස්ථානයෙහි පදිංචි ජයසේකර මුදියන්සේලාගේ ආසිරි ප්‍රසන්න කුමාර ජයසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද එකී අංක 10804 දරන උකස්කරය යටතේ දැනට රු. 1,999,900.18 (රුපියල් දහනවලක්ෂ අනූනමදහස් නවසියයයි ශත දහඅටක) මුදල සහ එකී රු. 1,999,900.18 (රුපියල් දහනවලක්ෂ අනූනමදහස් නවසියයයි ශත දහ අටක) මුදල සඳහා 2019.04.12 වන දින සිට වර්ෂයකට AWPLR +4.5% බැගින් පොලිය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ගලේවාසල රාජපක්ෂ මුදියන්සේලාගේ කුමුදුනී පාලමකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2018.01.02 වන දිනැති අංක 6904 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක : 175, නුවර පාර, කඩුගන්නාව යන ස්ථානයෙහි පදිංචි ජයසේකර මුදියන්ස්ලාගේ ආසිරි ප්‍රසන්න කුමාර ජයසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 6904 දරන උකස්කරය යටතේ දැනට රු. 3,692,153.85 (රුපියල් තිස්හය ලක්ෂ අනුදෙදහස් එකසිය පනස්තුනයි ශත අසුපහක) මුදල සහ එකී රු. 3,692,153.85 (රුපියල් තිස්හය ලක්ෂ අනුදෙදහස් එකසිය පනස්තුනයි ශත අසුපහක) මුදල සඳහා 2019.04.12 වන දින සිට වර්ෂයකට AWPLR + 6.5 % බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අතතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඩලාස් ක්ලෙයාට් විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජීවපාති රත්නායක මහත්මිය විසින් සහතික කරන ලද 2014.08.04 දිනැති අංක 4234 උකස්කරය ප්‍රකාරව සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රියංජනී කුමාර් අබේකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2016.04.01 වන දිනැති අංක 10804 දරන උකස්කරය ප්‍රකාර සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ගලේවාසල රාජපක්ෂ මුදියන්සේලාගේ කුමුදුනී පාලම කුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2018.01.02 වන දිනැති අංක 6904 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් යටතේ බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 මහජන බැංකු පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර කඳුපළාත කෝරළේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුගන්නාව නගර සභා සීමාව තුළ කඩවත්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි අම්බලපිටිය කුඹුර තැඹැති ඉඩම සඳහා අවසරලත් මිනිත්දෝරු ඩබ්.එම්.එම්. අශෝක විජයකෝන් මහතා විසින් 2004 ඔක්තෝම්බර් මස 02 වැනි දින මැන සාදන ලද අංක 1561 පිඹුරේ කැබලි අංක 01 දරන කොටසින් තැවත එකී මිනිත්දෝරු තැත විසින් එකී පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් අංක 01 C - 01 F දරන කොටසක් වන **උතුරට** : කැබලි අංක 01 E සහ 01D ද, **නැගෙනහිරට** : එම ඉඩමේ ඉතිරි කොටස වෙන් වන කම්බි වැටද, **දකුණට** : කොළඹ - නුවර ප්‍රධාන පාරද, **බස්නාහිරට** : කැබලි අංක 01 B හා 01D (නාමල් ජයසේකරට අයත්) යන කොටස්ද මායිම් වූ පර්චස් අටයි දශම දෙකයි නවයයි (අක් : 00 යි රූඩ් : 00 යි, පර්චස් 8.29) පමණ විශාල බිම් වාසිය හා ඊට අයිති සියලුදේත්වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්තිරු අංක B 540/112 දරන පත්ඉරුවල ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පදි
ප්‍රාදේශීය කළමනාකාර

මහජන බැංකුව,
ප්‍රාදේශිය ප්‍රධාන කාර්යාලය,
17, දළදා වීදිය, මහනුවර.

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk

රා තැබෑරුම් රේන්ද විකිණීම 2021 / 2022 වර්ෂය

පුත්තලම් දිස්ත්‍රික්කයේ

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2021.07.01 දින සිට 2022.06.30 දක්වා කාලය තුළ පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් 2021.05.07 දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා 2021.04.23 දින පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලන්න.

උපලේඛනය

අනුක්‍රමික අංකය	කොට්ඨාසය	ග්‍රාමය	ටෙන්ඩර් තැන්පත් මුදල
1	නාත්තන්ඩිය	මූදුකටුව	රු. 1,000.00
2	නාත්තන්ඩිය	කටුතේරිය	රු. 1,000.00

ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.
2021.04.06

මහජන බැංකුව

කඩුගන්නාව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 24/01/2020 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලි දයාරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2011.04.27 දිනැති අංක 2530 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක 421, නුවර පාර - කඩුගන්නාව යන ස්ථානයෙහි පදිංචි උඩහ හේවගේ සාලිය ප්‍රසන්න සෙනෙවිරත්න සහ උඩහ හේවගේ සෙනෙවිරත්න හේවාගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 2530 දරන උකස්කරය යටතේ දැනට රු. 1,211,366.67 ක (රුපියල් දෙළොස් ලක්ෂ එකොළොස් දහස් තුන්සිය හැටහයයි ශත හැටහතක) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින් එම මුදල සහ රු. 1,211,366.67 ක (රුපියල් දෙළොස් ලක්ෂ එකොළොස් දහස් තුන්සිය හැටහයයි ශත හැටහතක) මුදල සඳහා 2019.09.25 වන දින සිට වර්ෂයකට 17 % බැගින් පොලිය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජීවපාති රත්නායක මහත්මිය විසින් සහතික කරන ලද 2017.03.13 වන දිනැති අංක 5367 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක: 421 , නුවර පාර - කඩුගන්නාව යන ස්ථානයෙහි පදිංචි උඩහ හේවගේ සාලිය ප්‍රසන්න සෙනෙවිරත්න සහ උඩහ හේවගේ සෙනෙවිරත්න හේවාගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද එකී අංක 5367 දරන උකස්කරය යටතේ දැනට රු. 3,921,807.97 (රුපියල් තිස්නව ලක්ෂ විසිඑක් දහස් අටසිය හතයි ශත අනූහතක) මුදල සහ රු. 3,665,872.30 (රුපියල් තිස්හයලක්ෂ හැටපන්දහස් අටසිය හැත්තෑ දෙකයි ශත තිහක) මුදල සඳහා 2019.09.25 වන දින සිට වර්ෂයකට 20% බැගින් පොලිය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලි දයාරත්න මහත්මිය විසින් 2018.07.12 දින අංක 5944 උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක : 421, නුවර පාර - කඩුගන්නාව යන ස්ථානයෙහි පදිංචි උඩහ හේවගේ සාලිය ප්‍රසන්න සෙනෙවිරත්න සහ උඩහ හේවගේ සෙනෙවිරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී අංක 5944 දරන උකස්කරය යටතේ දැනට රු. 13,583,044.10 ක (රුපියල් එක්කෝටි තිස්පන්ලක්ෂ අසූතුන් දහස් හතළිස් හතරයි ශත දහයක) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින් එම මුදල සහ රු.13,583,044.10 ක (රුපියල් එක් කෝටි තිස්පන් ලක්ෂ අසූතුන් දහස් හතළිස් හතරයි ශත දහයක) මුදල සඳහා 2019.09.25 වන දින සිට වර්ෂයකට 24 % බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද, මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අතතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකරු ඡොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලි දයාරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2011.04.27 දිනැති අංක 2530 දරන උකස්කරය සහ, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජීවපාති රත්නායක මහත්මිය විසින් සහතික කරන ලද 2017.03.13 වන දිනැති අංක 5367 දරන උකස්කරය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලි දයාරත්න මහත්මිය විසින් 2018.07.12 දින අංක 5944 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් යටතේ බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 මහජන බැංකු පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර කඳුපළාත කෝරළේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුගන්නාව නගර සභා සීමාව තුළ කඩවත්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කඩවත්ගම ගමේ පිහිටා ඇති නිලිගමුවේ කුඹුර තැඹැති ඉඩමට අවසරලත් මිනිත්දෝරු ඩී. ආර්. අබේකෝන් මහතා විසින් 2010 මාර්තු මස 10 වැනි දින මැන සාදන ලද අංක 2344 දරණ පිඹුරේ කැබලි අංක 01 දරන කොටසට මායිම් **උතුරු නැගෙනහිරට** : සිරිමාන්න ජයසිංහට අයිති නිලිගමුවේ කුඹුරද, **නැගෙනහිරට:** වරිපතම් අංක: 243 ද, **දකුණු නැගෙනහිරට:** කොළඹ - නුවර මහා මාර්ගයද, **දකුණු බස්නාහිරට :** ටී.ජී. ගුණරත්නට අයිති නිලිගමුවේ කුඹුර දැනට වත්තද, **උතුරු බස්නාහිරට :** දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමද යන මායිම් තුළ පිහිටි වපසරිය පර්චස් 27 (අක්: 00, රූ.00, ප. 27) ඉඩම සහ ගොඩනැඟිලි සහ ඊට අයත් සෑම සියලු දේද සමඟ වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක B508/235 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි
ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය.

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk

දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න
අනුරාධපුර
හරිස්චන්ද්‍ර මාවත, බැංකු පෙදෙස
025 222 2370
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

සත වෙත සිරිසෙත සලසන සතිපත
දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි
සුබසත

කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය - වේයන්ගොඩ

ටෙන්ඩර් දැන්වීමයි

ආර්ථික මධ්‍යස්ථානය වෙත ඇතුළත්වන වාහන සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම

2021 අගෝස්තු/ 2022 ජූලි දක්වා වර්ෂය වෙනුවෙන් අදාළ කාර්යය සිදු කිරීම සඳහා පහත කොන්දේසි යටතේ මිල ගණන් කැඳවනු ලැබේ.

01. ඇතුල්වන ත්‍රිරෝද සඳහා රු. 10.00 ක්ද, කාර්/ වැන්වලින් රු. 20.00 ක්ද, ලොරි රථවලින් රු. 30.00 ක මුදලක්ද පමණක් අයකළ හැකිය. එමෙන්ම ආර්ථික මධ්‍යස්ථාන වෙළඳ පරිශ්‍ර කඩ හිමියන්ගේ රථ වාහනවලින් අය කිරීම සිදු කළ නොහැකිය.

02. දින 14 ක දැනුම් දීමකින් අනතුරුව ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම නැවැත්වීමේ අයිතිය වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණභාරය සතු වන අතර, තෝරාගත්තා කොන්ත්‍රාත්කරු නීත්‍යානුකූල ගිවිසුමකට එළඹිය යුතු අතර, ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කරනු ලැබුවහොත් වහාම කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කළමනාකරණභාරය සතු බව පිළිගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

03. රු.20,000/= ආපසු ගෙවනු නොලබන ඇප තැන්පතු මුදලක්ද ටෙන්ඩර්පත් ලබාගැනීම සඳහා වේයන්ගොඩ මහජන බැංකු ශාඛාවේ අංක 079100180010068 දරන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණභාර ගිණුමට රු. 10,000 ක මුදලක් ගෙවා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. පසුව රු. 9,000/= මුදලක් ටෙන්ඩරයේ මූලික කටයුතු අවසන් වූ පසු නැවත ගෙවීමට සලකා බලනු ලැබේ. ටෙන්ඩර්පත් කාර්යාල දිනවල වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථාන කාර්යාල මගින් ලබාගත හැක.

04. තෝරාගත්තා ලද ටෙන්ඩර්කරු ඉල්ලුම් කළ ටෙන්ඩර් මුදල සෑම මසකම 15 දිනට ප්‍රථම ගෙවිය යුතු අතර, අදළ දිනට පසු ගෙවීම් සිදු කළහොත් 10% ක අමතර දඩ කුලී මුදලක් අයකරගනු ලැබේ. එසේම ගිවිසුමට එළඹීමට පෙර වාර්ෂික මුළු වටිනාකම 10% ක් වන මුදලක් කාර්ය සාධන ඇපකරයක් ලෙස කළමනාකරණ ගිණුමේ තැන්පත් කිරීම හෝ කළමනාකරණ භාරයේ තමට එම වටිනාකමට බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. එම මුදල කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු නිදහස් කරනු ලබන අතර, මේ සඳහා පොලී ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. ඔබ විසින් නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර්පත් 2021.05.06 දින පෙරවරු 10.00 ට පෙර **ලේකම්, කළමනාකරණභාරය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අත්තනගල්ල** වෙත ලියාපදිංචි තැපැල් මගින් ලැබීමට සැලැස්වීම හෝ අතින් ගෙනවිත් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුය.

06. 2021.05.06 දින පෙරවරු 10.30 ට ටෙන්ඩර්පත් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී විවෘත කරනු ලබන අතර, අවසාන තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

මේ සම්බන්ධ අවසාන තීරණය කළමනාකරණභාරය සතුවේ.

ලේකම්, කළමනාකරණභාරය,
විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය,
වේයන්ගොඩ.

කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය - වේයන්ගොඩ

ටෙන්ඩර් දැන්වීමයි

වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා සුදුසු ආයතනයක් / පුද්ගලයෙක් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ

කොන්දේසි,

1. මෙම කොන්ත්‍රාත් කාලය වර්ෂයක කාල සීමාවකට බල පැවැත්වේ. (2021 ජූලි 05 වන දින සිට 2022 ජූලි මස 04 වන දින දක්වා)
2. ටෙන්ඩර්පත් ඉදිරිපත් කරනු ලබන සෑම ආයතනයක්ම/ පුද්ගලයෙක්ම ක්ෂේත්‍රය සම්බන්ධව ඇති නිපුණත්වය ඉදිරිපත් කළ යුතුය.
3. විදුලි බල්බ, ජල නළ උපාංග හා අනෙකුත් හානියට පත්වන උපාංග සවි කර ගැනීම කොන්ත්‍රාත්කරු විසින් කළ යුතුය.
4. වැසිකිළිය සඳහා **රු 20.00 ක** මුදලක්ද, කැසිකිළි සඳහා **රු 10.00 ක** මුදලක් ද දිය නැම සඳහා **රු. 30.00 ක** මුදලක් ද අය කරනු ලබන අතර, ගාස්තු සංශෝධනය කළමනාකරණභාරය විසින් තීරණය කරනු ලැබේ.
5. මෙහිදී ප්‍රමුඛතාවය හිමි වන්නේ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවටය. එහිදී කළමනාකරණභාරයට ගෙවනු ලබන මාසික කුලිය මාසයේ මුල් **දින** 14 ඇතුළත ගෙවිය යුතුය.
6. තෝරා ගන්නා අය විසින් රු. 20,000/= **ක** ඇපයක් හෝ බැඳුම්කරයක් ලබාදිය යුතු අතර, අදළ කාල සීමාව අවසානයේදී එය නිදහස් කරනු ඇත.
7. තෝරාගත් කොන්ත්‍රාත්කරු කළමනාකරණභාරය සමග නීත්‍යානුකූල ගිවිසුමකට එළඹිය යුතු අතර, ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරනු ලැබුවහොත් වහාම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලය කළමනාකරණභාරය සතු වනු ඇත.
8. ටෙන්ඩර්පත් ලබාගැනීම සඳහා වේයන්ගොඩ මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුම් අංක 079100180010068 දරන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ ගිණුමට ආපසු නොගෙවන රු. 500/= ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත් කාර්යාල දිනවල වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයේදී ලබාගත හැක.
9. ඔබ විසින් නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර්පත් 2021.05.06 දින පෙරවරු 10.00 ට පෙර **ලේකම්, කළමනාකරණභාරය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිට්ටඹුව** වෙත ලියාපදිංචි තැපැල් මගින් ලැබීමට සැලැස්වීම හෝ අතින් ගෙනවිත් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුය. ටෙන්ඩර්පත් එදින පෙරවරු 10.30 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.
10. තෝරාගනු ලබන අය විසින් 2021.07.05 දින සිට සනීපාරක්ෂක සේවා සැපයීමේ කටයුත්ත සිදු කළ යුතු අතර, නොඑසේ නම් මිළඟ ටෙන්ඩර්කරු වෙත අදළ ටෙන්ඩරය ලබාදෙනු ඇත.
11. මේ සම්බන්ධව අවසාන තීරණය කළමනාකරණභාරය සතුවේ.

ලේකම්, කළමනාකරණභාරය,
විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය,
වේයන්ගොඩ.

ඇටෝර්නි බලකරය අවලංගු කිරීමයි

ගම්පොල, ගම්පොළවෙල, අංක 44/1 දරන ලිපිනයෙහි පදිංචි ජා.හැ.ප. අංක. 891514182V දරන **ඉලන්දාරි ආරච්චිලාගේ දිනේෂ් ගැමුණු බණ්ඩාර** වන මා ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් එල්.ජී. ලලිත් වීරසේන මහතා ලියා සහතික කොට ඇති අංක 3891 හා 2017-10-31 දිනැති ඇටෝර්ති බලකරය මගින් මාගේ සහෝදරයා වන **ඉලන්දාරි ආරච්චිලාගේ ප්‍රසාද් සම්පත් බණ්ඩාර** හට දී ඇති විදේශ විශේෂ ඇටෝර්ති බලකරය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් ඔහුට මින් මතු කිසිම බලයක් නොපිහිටන බවත් ශ්‍රී ලංකා ජනරජය වෙත හා ශ්‍රී ලංකාවාසී සියලුදෙනා හට මා මෙයින් ප්‍රසිද්ධ කර සිටිමි.

ඉලන්දාරි ආරච්චිලාගේ දිනේෂ් ගැමුණු බණ්ඩාර.
2021-04-21

දැන්වීමයි

සීමාසහිත වැල්ලවාය සිත්තරම් පළාත සමුපකාර ග්‍රාමීය බැංකු සමිතිය

මෙම සමිතියේ මහ සභා නියෝජිතයින් තෝරා පත් කරගැනීම සඳහා

ඌව පළාතේ, පළාත් සභාවේ 2011 අංක 03 දරන ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ අංක 3.1 වගන්තිය හා අංක 01 උපලේඛනය ප්‍රකාරව අදාළ ග්‍රාමීය බැංකු ශාඛාවන්හි.

✳ **නාම යෝජනා භාරගැනීම**

2021 මැයි මස 09 දින

පෙ.ව. 8.00 සිට පෙ.ව. 9.00 දක්වා ද

✳ **විරෝධතා භාරගැනීම.**

2021 මැයි මස 09 දින

පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා ද

✳ **ඡන්ද විමසීම**

2021 මැයි මස 16 දින

පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා ද

සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.

2021-04-22 දින

සීමාසහිත වැල්ලවාය සිත්තරම් පළාත,
සමුපකාර ග්‍රාමීය බැංකු සමිතිය,
වැල්ලවාය.

මෙයට,
එම්.ඒ. නාලිකා මංජු ශ්‍රී අබේසේකර,
ඡන්ද නිලධාරි.

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘෂිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය

(ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවාරණ වෙළඳාම් මණ්ඩලය)

2021 වර්ෂය සඳහා දෙහිවල ඇග්‍රෝප්‍රෙෂ් අලෙවිසැල සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ දෙහිවල ඇග්‍රෝප්‍රෙෂ් අලෙවිසැලේ 2021 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචිය වෙනුවෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

අංකය	ප්‍රධාන අයිතම	අනු අයිතම
1	ධාන්‍ය සහ ආහාර ද්‍රව්‍ය	සියලුම ධාන්‍ය වර්ග, පාරම්පරික වී ඇතුලු සියලුම වී හා ධාන්‍ය වර්ග, වෙනත් ඇසුරුම් කරන ලද හා ඇසුරුම් නොකරන ලද ආහාර ද්‍රව්‍ය, එළවලු වර්ග, පලතුරු වර්ග ඇතුලු සියලුම කෘෂි නිෂ්පාදන, බිස්කට් වර්ග, කිරි, පොල්, බිත්තර,මස් වර්ග, වියලි ආහාර සහ මත්ස්‍ය ආහාර, සත්පාරක්ෂක ද්‍රව්‍ය ඇතුලු සියලුම ප්‍රොසර අයිතම, ගොවීන් / ව්‍යවසායකයින් විසින් සපයන ලද කෘෂි නිෂ්පාදන හා අතය එකතු කළ නිෂ්පාදන හා සේවා (ප්‍රවාහනය ඇතුලුව)
2	කෘෂි යෙදවුම් හා අනෙකුත් සේවා	සියලුම පැල වර්ග, බීජ, රසායනික සේවා හා කාබනික පොහොර, පලිබෝධ නාශක, පෝලිච් වර්ග ඇතුලු සියලුම කෘෂි යෙදවුම් ආශ්‍රිත සේවා (ප්‍රවාහනය ඇතුලුව)

කොන්දේසි

1. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන්නේ **2021.05.17 සවස 3.00** වේ. වෙත්පත් මත කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවසන් දිනෙන් හා වේලාවෙන් පසුව අයදුම්පත් භාරගනු නොලැබේ.
2. ඉහත සඳහන් ප්‍රධාන අයිතමයන් වෙනුවෙන් එක් අයිතමයක් සඳහා **රු. 500.00 ක්** ලියාපදිංචි කාස්තු වශයෙන් ගෙවිය යුතුවේ. එම ශුද්ධ කාර්යාල දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ගෙවිය හැක.දැනට රට තුළ පවතින කොවිඩ් වසංගත තත්වය මත ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයට අමතරව **www.nfpb.lk** වෙබ් අඩවිය මගින් අදාල අයදුම්පත ලබාගැනීමේ පහසුකම් සලසා ඇති අතර ලියාපදිංචි කිරීමේ ගෙස්තු **"ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවාරණ වෙළඳාම් මණ්ඩලය"** නමින් ශ්‍රී ලංකා බැංකුව බොරැල්ලේ අධි ශ්‍රේණි ශාඛාවේ **ගිණුම් අංක 134125** යන ගිණුමට ඉල්ලුම් කරනු ලබන අයිතමයට අදාල කාස්තුව බැර කරන ලද අදාල රිසිට්පත, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත හා සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ලියාපදිංචි වන අයිතමයන්ගේ මිල ගණන් ලේඛනයක්ද **info@nfpb.lk** ඊමේල් ලිපිනයට යොමුකරන්න. අයදුම්පතේ ගුල් පිටපත හා බැංකු රිසිට්පත, මිල ගණන් ලේඛනයක්ද ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබීමට සලස්වන්න.
3. මිල ගණන් අවම වශයෙන් මාස 03ක කාලයක් සඳහා වලංගු විය යුතුය. අත්‍යවශ්‍ය යැයි හඟින අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන්ට පරිබාහිරව වෙනත් සැපයුම්කරුවන් ගෙන් භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමේ අයිතිය මණ්ඩලය සතුව පවතී. තවද සැපයුම්කරුවන් ණය බිල් මත භාණ්ඩ හා සේවාවන් සැපයීමට එකඟ විය යුතුය. සියලුම ගොවීම් වෙත්පත් මගින් පමණක් සිදුකරනු ලබන බව සලකන්න.
4. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ දී 011-3 370 028, 011-2 580 194 අංකය විමසීමෙන් ලබාගත හැකිය.

සභාපති
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
නො.45, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට. දුර: 0112506895 ෆැක්ස්: 2506907

ප්‍රසම්පාදන දැන්වීමයි

සෞඛ්‍ය අමාත්‍යාංශය

2021/2022 වර්ෂය සඳහා නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ආරාධනයයි

(රු. 1,000,000.00 ඉක්මවන කොන්ත්‍රාත් සඳහා)

01. කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවතේ, අංක 385 හි, "සුව සිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය, වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "සී" හි සභාපති විසින් පහත විස්තර කර ඇති පරිදි (රු. 1,000,000.00 ඉක්මවන කොන්ත්‍රාත් සඳහා) 2021/2022 වර්ෂය සඳහා නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම අරහයා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින්, මුද්‍ර, තබන ලද පූර්ව - යෝග්‍යතා ලියවිලි දැන් කැඳවනු ලැබේ.

02. මෙහි වැඩබිම්, සෞඛ්‍ය අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඇතුළත පිහිටා ඇති අතර, ආයතනයේ සාමාන්‍ය එදිනෙද කාර්ය කාර්මාන්තවලට බාද නොවන අයුරින් වැඩ කටයුතු ඉෂ්ඨ සිද්ධ කළ යුතුය. කොන්ත්‍රාත්තු කාලය වැඩ කටයුතු අනුව විචල්‍ය විය හැකිය. කාර්යයට එදිනෙද හදිසි අලුත්වැඩියාවන්; එනම්, පයිප්ප කාර්මික වැඩ, මලාපවහන කටයුතු, විදුලි වැඩ, පින්තාරු කිරීම, කොන්ක්‍රීට් කිරීම, වායු සමීකරණ කටයුතු, ජල රෝධන කටයුතු, ඇළමිතියම් වැඩ, යනාදිය අන්තර්ගතය.

03. පූර්ව - යෝග්‍යතාකරණය, ලියවිල්ලේ දක්වා ඇති යෝග්‍යතාවය සඳහා වන අවශ්‍යතා වලට අනුකූලව සිදුවන අතර, ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් 2006 දී ප්‍රකාශයට පත්කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පටිපාටියට අනුගාමිව සිදුකරනු ලැබේ.

04. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා යෝග්‍යවීමට සාර්ථක කොන්ත්‍රාත්කරුවන්, අසාධු ලේඛනගත නොවී සිටිය යුතුවන අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

විශේෂඥතාව : ගොඩනැගිලි, විදුලි වැඩ, වායුසමීකරණය, පයිප්ප කාර්මික වැඩ.

ශ්‍රේණිය : C9 හා ඉහළ

05. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා වන සුදුසුකම් අවශ්‍යතාවන් අතරට, නඩත්තු/ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවකු ලෙස, පසුගිය වසර 2 ක (අඩුම තරමින්) කාලය තුළ, කාර්ය පළපුරුද්දක් තිබිය යුතුය. කොන්ත්‍රාත්කරු හට, නඩත්තු කටයුතු සඳහා වහාම නිරතව ක්‍රියාකිරීමට හැකියාව තිබිය යුතුවන අතර, එම කටයුත්ත සාර්ථකව නිමා කිරීමටද හැකියාව තිබිය යුතුය. එම කාර්ය කටයුතු පිළිබඳ පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

06. මේ පිළිබඳව උනන්දුවක් දක්වන අභිලාෂී කොන්ත්‍රාත්කරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් වන පූර්ව යෝග්‍යතා අයදුම්පත් ලේඛන ආපසු ගෙවනු නොලබන රු. 1500.00 ක ගාස්තුවක් ගෙවීමෙන් හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021-04-23 වන දින සිට 2021-05-06 වන දින දක්වා කාර්යාල වේලාවන් තුළදී, (පෙ.ව. 9.00 - ප.ව. 2.00 දක්වා අතරතුර) මිලදී ගත හැකිය. ගෙවීම්, මුදලින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, සරප් වෙත සිදුකළ යුතුය.

07. පූර්ව යෝග්‍යතා අයදුම්පත්, අනුපිටපතකින් යුක්තව 2021-05-07 වන දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවතේ, අංක 26 හි මෙඩි හවුස් ගොඩනැගිල්ලේ, දෙවන මහලේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) කාර්යාලය වෙත භාර දිය යුතුය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ.

08. සියලුම අයදුම්පත් සමග දී ඇති ආකෘතියට අනුව වන ප්‍රකාශ පත්‍රයක් නිසි පරිදි සමාගමේ අත්සන් කිරීමේ බලයලත් බලධාරියා විසින් අත්සන යොද සහතික කර එවිය යුතුය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "C1",
සෞඛ්‍ය අමාත්‍යාංශය,
2 වන මහල, මෙඩි හවුස් ගොඩනැගිල්ල,
අංක 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
011-2112717

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දක්වා ඇති අයිතමයන් සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	ටෙන්ඩරයේ නම	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රුපියල්)	ලිපිලේඛන ගාස්තුව (වැට් බදු ඇතුළුව)	භාරගන්නා අවසාන දින හා වේලාව
CES/FP/03/PT/6152(MP)	Main Hoist Wire Rope for Kato KA-900 (CR 28) Mobile Crane	18,000.00	1,000.00	20/05/2021 10.00 පැය
CES/FP/02/PT/6048(MP)	**79 Nos. Main Hoist Wire Rope for Mitsui RTG Crane at JCT 3 & 4**	105,000.00	3,500.00	20/05/2021 10.00 පැය
CES/FP/02/PT/6038(MP)	12 Nos. of Main Hoist Wire Rope 25MM x 490M	108,000.00	3,500.00	20/05/2021 10.00 පැය
CES/FP/02/PT/6184(EL)	Alternator Spares for JCT RTG Cranes	40,000.00	1,000.00	25/05/2021 10.00 පැය
CES/FP/02/PT/6187(EL)	Spare Parts for the Stinis Spreaders	30,000.00	1,000.00	25/05/2021 10.00 පැය
CES/FP/02/PT/6193(MP)	Injector Assembly for Cummins 855 Engines fitted with Transfer Cranes at JCT	69,500.00	1,000.00	01/06/2021 10.00 පැය
CES/FP/02/PT/6144(EL)	3 Phase Spreader Pump Motor for RAM Spreaders	20,000.00	1,000.00	01/06/2021 10.00 පැය
CMS/LP/19/PT/04/007	Supply, Installation, Testing & Commissioning of 02 Nos. of Automatic Fuel Pumping System (Consists of Flow Meters, Fuel Pumps, Valves, ATM Machine, Computers with Fuel Management System Software)	70,000.00	1,000.00	13/05/2021 13.30 පැය
CMS/LP/21/PT/15/004	MS Plates	15,800.00	1,000.00	13/05/2021 13.30 පැය
CMS/LP/21/PT/17/051	Supply, Installation and Commissioning of Main Engine Control and Monitoring System of Launch Pilot 15.	15,000.00	1,000.00	13/05/2021 13.30 පැය
CMS/LP/21/PT/15/052	**GI Pipe Heavy Duty 40MM, 5.8M/ Length – 500 Len**	26,000.00	1,000.00	17/05/2021 13.30 පැය
CMS/LP/19/PT/17/059	**Cloth Drill – 2500 mtrs**	25,000.00	1,000.00	17/05/2021 13.30 පැය
CMS/LP/21/PT/15/051	**2400MM x 1200MM MS Plates (25mm – 20 Nos. & 8MM – 60 Nos.)**	26,600.00	1,000.00	18/05/2021 13.30 පැය

02. රු. මිලියන 5 ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ වන විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ මුළු කාලය පුරාම එකී පනත අනුවම බැඳී කටයුතු කරන ලෙස ඉහත සඳහන් ටෙන්ඩරය හා සම්බන්ධව සියලු පාර්ශවයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. තවද, ඕනෑම විදේශීය නිෂ්පාදකවරයෙකුගේ හෝ සැපයුම්කරුවෙකු සඳහා හෝ වෙනුවෙන් ඒජන්තවරයෙකු, උප-ඒජන්තවරයෙකු, නියෝජිතයෙකු හෝ තම් කරන ලද අයකු ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම ලංසුකරුවෙකු පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි විස්වකීය ලංසු ලිපිලේඛන සමග තිසි පරිදි සම්පූර්ණ කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

03. ලංසුකරුවන් අවම වශයෙන් පසුගිය වසර තුන (3) ක කාලය තුළ සමාන ස්වභාවයේ භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක නිරත වී සිටිය යුතුය.

04. අභිලාෂී ලංසුකරුවන් හට, වැඩිදුර විස්තර තොරතුරු ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන කාර්යාල වේලාවන් තුළ පහත දක්වෙන ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

05. අභිලාෂී ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා 04 වන තීරුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2021 අප්‍රේල් 23 වන දින සිට ලංසු භාරගන්නා අවසාන දිනට පෙර දින දක්වා රාජකාරි දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත.

06. ලංසුව, එම ලංසු භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම පහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ. සියලු ලංසු සමග ඉහත සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණයක් (ඇපකරයක්) ද ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),
සැපයුම් අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01.

දුරකථන අංක : 2482231, 2483338, 2482499, 2482832, 2482409, 2482652, 2482638, 2483024
ෆැක්ස් අංක : 2381652, 2470443

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් රැඹ

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 69 හි සෙලින්කෝ හවුස් නැගෙනහිර කොටසෙහි 10 වන මහලෙහි, එන්ට්‍රන්ස් සිකියුරිටිස් පී.එල්.සී. හි ණය වගකීම් වෙනුවෙන් කොළඹ 03, අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 06 හි පිහිටි උකස් කරන ලද දේපළ.

ලංකා බැංකු ආඥා පනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 නොවැම්බර් 08 දිනැති අංක 2149 දරන ගැසට් පත්‍රයේ හා 2019 ඔක්තෝබර් 25 වන දින "දිනමිණ,, "ඩේලිනිව්ස්" හා "තිතකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2021 ජූනි 04 වෙනි දින පෙ.ව. 10.00 ට, කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි වී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර සමාගමේ එම්.එච්. තුසිත කරුණාරත්න මහතා විසින් වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 8 (කොල්ලුපිටිය) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ කොළඹ මහනගර සභා සීමාවේ කොල්ලුපිටිය පෙන්ඩෙනිස් ඇවනියුහි (දැනට අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) පිහිටි "මිලිසෙන්ට් කොටේජ්" යැයි කියනු ලබන සහ එනමින් ප්‍රසිද්ධ කලින් වරිපනම් අංක 60^{k2} දරන (පසුව වරිපනම් අංක 08 දරන) සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල **උතුරට** පටුමගක් ද, **නැගෙනහිරට** එච්. දෙන් කරෝලිස් සහ පුත්‍රයන්ට අයිති පෙන්ඩෙනිස් ලෙස ප්‍රසිද්ධ පරිශ්‍රය ද, **දකුණට** සී. ඩබ්. ලෙවිස් පෙරේරාට අයිති "කිලර්නි" ලෙස ප්‍රසිද්ධ පරිශ්‍රයද, **බස්නාහිරට** "බ්ලෙන්හිම්" ලෙස ප්‍රසිද්ධ වරිපනම් අංක 60^{k1} දරන පරිශ්‍රයද මායිම්ව බලයලත් මිනින්දෝරු එච්.ඩී.ඩයස් විසින් සාදන ලද 1915/05/01 දිනැති අංක 1705 දරන මැනුමෙහි සහ එහි විස්තරයට අනුව පර්චස් දහතක් සහ පර්චසයකින් දහසෙන් තුන්සිය හැත්තෑපහක පංගුවක (අ.0 රූ.0 පර්. 17 375/1000) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1003/238 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු වී. කාර්තිගේසු විසින් පසුව සාදන ලද 1946/02/08 දිනැති අංක 518 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, කොල්ලුපිටිය පෙන්ඩෙනිස් ඇවනියුහි (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) පිහිටි **"මිලිසෙන්ට් කොටේජ්"** නැමති කලින් වරිපනම් අංක 60^{k2} දරන (පසුව වරිපනම් අංක 08 දරන) සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල **උතුරට** පෙන්ඩෙනිස් ඇවනියු ද (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) **නැගෙනහිරට** පෙන්ඩෙනිස් ඇවනියු හි (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) දැන් වරිපනම් අංක 10 දරන පරිශ්‍රය ද, **දකුණට** ගාලු පාරේ දැන් වරිපනම් අංක 295 දරන පරිශ්‍රයද, **බස්නාහිරට** ගාලු පාරේ දැන් වරිපනම් අංක 293 දරන පරිශ්‍රය ද මායිම්ව පර්චස් දහතයි දශම තුනයි හතයි පහක (අ. 0 රූ. 0 පර්. 17.375) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහ කොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1003/238 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු කේ.ඩී.ජී. වීරසිංහ විසින් මෑතකදී සාදන ලද 2008/05/28 දිනැති අංක 3802 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කොල්ලුපිටියෙහි පිහිටි අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 06 දරන, අංක 3802 දරන එකී පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල **උතුරට** අබ්දුල් ගෆූර් මාවත ද, **නැගෙනහිරට** අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 10A දරන පරිශ්‍රය ද, **දකුණට** ගාලු පාරේ වරිපනම් අංක 295 දරන පරිශ්‍රය ද, **බස්නාහිරට** ගාලු පාරේ වරිපනම් අංක 293 දරන පරිශ්‍රය ද මායිම්ව පර්චස් දහතයි දශම දෙකයි නවයක (අ. 0 රූ. 0 පර්. 17.29) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකරු
(ආයතනික අයකරගැනීම්)

ලංකා බැංකුව,
ආයතනික අයකරගැනීම් අංශය,
3 වන මහල, ලංකා බැංකු චතුරස්‍රය,
අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.

මුදල් අමාත්‍යාංශය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

දැන්වීමයි

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල හා අවට කාර්යාලයන් නව ස්ථානයක ස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීම

නාරාහේන්පිට සමිතිපුර මහ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය හා අවට ගොඩනැගිලි කිහිපයක පවත්වාගෙන යනු ලැබූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යාලයන් මේ වනවිට නාරාහේන්පිට මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ දහනව වන මහල, විසිවන මහල, විසිඑක්වන මහල, විසිදෙවන මහල හා විසිතුන්වන මහල්වල ස්ථාපනය කර ඇති බව දැනුම් දෙමු. ඒ අනුව නව කාර්යාලයන්හි තොරතුරු පහත පරිදි වේ.

ලිපිනය - සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
හැ.පෙ 807 (මහල් 19-23), මෙහෙවර පියෙස, නාරාහේන්පිට, කොළඹ 05

පොදු දුරකථන අංක -

011 - 774 7200	011 - 258 1704	011 - 236 9116	011 - 236 9038	011 - 236 9106	011 236 8542	011 - 236 8163
011 - 774 7800	011 - 236 9897	011 - 236 9056	011 - 236 9057	011 - 236 8162	011 236 9120	

සෙසු දුරකථන අංක -

01.	සභාපති / ප්‍රධාන විධායක නිලධාරි		011 - 774 7201
02.	සාමාජිකාධිකාරී		011 - 774 7204
03.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(රැස්කිරීම් හා සේවායෝජක සම්බන්ධතා)	011 - 774 7244
04.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(අභ්‍යන්තර විගණන)	011 - 774 7283
05.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(ආයෝජන)	011 - 774 7298
06.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(මුද්‍රණ)	011 - 774 7250
07.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(සාමාජික සේවා)	011 - 774 7225
08.	නියෝජ්‍ය සාමාජිකාධිකාරී	(පරිපාලන හා මානව සම්පත්)	011 - 774 7240
09.	සහකාර සාමාජිකාධිකාරී	(මුදල්)	011 - 774 7814
10.	සහකාර සාමාජිකාධිකාරී	(දායක මුදල් රැස්කිරීම්)	011 - 774 7265
11.	සහකාර සාමාජිකාධිකාරී	(සලකුන 01)	011 - 774 7297
12.	සහකාර සාමාජිකාධිකාරී	(නීති)	011 - 774 7268
13.	වැඩබලන සහකාර සාමාජිකාධිකාරී	(සාමාජික සේවා)	011 - 774 7259
14.	කළමනාකරු	(අභ්‍යන්තර විගණන)	011 - 774 7284
15.	කළමනාකරු	(ප්‍රතිලාභ පරිපාලන)	011 - 774 7234
16.	කළමනාකරු	(ප්‍රතිලාභ)	011 - 774 7230
17.	කළමනාකරු	(ප්‍රතිලාභ තීරණය කිරීම්)	011 - 774 7226
18.	කළමනාකරු	(සාමාජික ගිණුම් ඉඩා කාණ්ඩය)	011 - 774 7254
19.	මුද්‍රිත කළමනාකරු	(ප්‍රතිලාභ පෙවීම්)	011 - 774 7224
20.	කළමනාකරු	(සාමාජික ගිණුම් විශෙෂ කාණ්ඩය)	011 - 774 7216
21.	විදුලි බාංකුකරණය අංශය		011 - 774 7215
22.	කළමනාකරු	(නීති)	011 - 774 7269 / 011 - 74 7270
23.	කළමනාකරු	(ස්වයං රැකියා)	011 - 774 7249
24.	කළමනාකරු	(දිස්ත්‍රික් කාර්යාලය - කොළඹ)	011 - 774 7288
25.	කළමනාකරු	(දිස්ත්‍රික් කාර්යාලය 1-7)	011 - 774 7295
26.	කළමනාකරු	(දිස්ත්‍රික් කාර්යාලය 8-15)	011 - 774 7279
27.	කළමනාකරු	(දායක මුදල් රැස්කිරීම්)	011 - 774 7260 / 011 -774 7263
28.	කළමනාකරු	(අධීක්ෂණ)	011 - 774 7266
29.	කළමනාකරු	(පරිපාලන හා මානව සම්පත්)	011 - 774 7237 / 011 - 774 7238 / 011 - 774 7239
30.	කළමනාකරු	(මුද්‍රණ)	011 - 774 7251
31.	කළමනාකරු	(නිලධාරිනා)	011 - 774 7222
32.	කළමනාකරු	(ප්‍රසම්පාදන)	011 - 774 7236
33.	කළමනාකරු	(තොරතුරු සංස්කරණ)	011 - 774 7805 / 011 - 774 7807
34.	කළමනාකරු	(ආයෝජන)	011 - 774 7299 / 011 - 774 7815 / 011 - 774 7816

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
හැ.පෙ 807 (මහල් 19-23), මෙහෙවර පියෙස, නාරාහේන්පිට, කොළඹ 05

ලංසු සඳහා ආරාධනයයි (IFB)

අධ්‍යාපන අමාත්‍යාංශය
රුහුණ විශ්වවිද්‍යාලය

කඹුරුපිටිය, කරගොඩ - උයන්ගොඩ, රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා, ගෘහ භාණ්ඩ හා මුළුතැන්ගේ උපකරණ සහිත ශිෂ්‍ය ආපනශාලාව ඉදිකිරීම

කොන්ත්‍රාත් අංකය : RUH/W/CAP/2021/01

01. මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ, උපකුලපති වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහතින් විස්තර කොට ඇති පරිදි, කඹුරුපිටිය, කරගොඩ – උයන්ගොඩ රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගෘහ භාණ්ඩ හා මුළුතැන්ගේ උපකරණ සහිත ආපනශාලාව ඉදිකිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රිත, තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය, වැට්, අවිනිශ්චිතාවයන් හා මිල ගණන් වැඩිවීම් සඳහා වෙන් කිරීම් ඇතුළත් නොවි රුපියල් මිලියන 47 ක් වේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. මාතර, වැල්ලමඩම රුහුණ විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන වැඩ) කාර්යාලයෙන් ලබාගත හැකි ලංසු ලේඛන මගින් ලංසු ඉදිරිපත් කළ යුතුවේ. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 12,500.00 ක් විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවීමෙන් ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් 2021 මැයි 13 වන දින දක්වා, පෙරවරු 9.00 හා පස්වරු 2.45 අතර කාලය තුළ, ලංසු ලේඛන මිලදී ගත හැක.

04. සුදුසුකම්ලත් ලංසුකරුවන් විසින් පහත සඳහන් නිපුණතා නිර්ණායකයන් සපුරාලිය යුතුය.

විශේෂඥතාවය : ගොඩනැගිලි ඉදිකිරීම.

සීඩා ශ්‍රේණිය (කලින් ඉක්ටැඩ් ශ්‍රේණිය) C4 හෝ C5

05. අදාළ කොන්ත්‍රාත් (ඉදිකිරීම්) කාලය, ආරම්භක දිනයේ සිට ලිත් මාස 08 ක් වේ.

06. අදාළ ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලීමත්, වැඩිදුර තොරතුරු ලබාගැනීමත්, මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන වැඩ) කාර්යාලයේදී කළ හැකිය. (දුරකථන – 041-2227023/ 24 දිගුව – 2131)

07. ලංසු, 2021 අගෝස්තු 16 දින දක්වා වලංගු විය යුතුය.

08. මේ සම්බන්ධ පෙර ලංසු – හමුවක්, 2021 මැයි 05 වන දින 11.00 පැයට, කඹුරුපිටිය, කරගොඩ උයන්ගොඩ රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වීමට නියමිතය.

09. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා රුපියල් භාර ලක්ෂ හැත්තෑ දහසක (ශ්‍රීලරු. 470,000.00) වටිනාකමින් යුත්, රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති නමටගත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කළ බැංකු ඇපකරයක් වශයෙන් වූ ලංසු ඇපකරයක් හෝ ඉදිකිරීම් ඇපකර අරමුදලින් (CGF) නිකුත් කළ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතු අතර. එම ලංසු ඇපකරය, 2021 සැප්තැම්බර් 13 වන දින දක්වා වලංගු ලංසු ලේඛනයන්හි සඳහන් ආකෘතියෙන් යුත්, "ඒක්ෂණ" හා "කොන්දේසි විරහිත" එකක් විය යුතුය.

10. ලංසු භාර ගැනීම, 2021 මැයි 17 වන දින 14.00 පැයට අවසන් කෙරේ.

11. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු, පිටපතක් සහිතව, මුද්‍ර, තබා ලියාපදිංචි තැපෑලෙන් සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර යන ලිපිනයට එවීමෙන් හෝ මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක 01 හි බහාලීමෙන් අදාළ අවසාන වේලාවට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, කොන්ත්‍රාත් අංකය හා නාමය සඳහන් කළ යුතුය.

12. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, ඉහත ලිපිනයේදී ලැබී ඇති සියලුම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම,
මාතර.
2021 අප්‍රේල් 23 වන දින.

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2187/27 අනුව හඳුනාගත් ඉදිකිරීම් වැඩ අනුමැතිය සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමට අයදුම්පත් කැඳවීම

ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ මුහුණදෙන ප්‍රමාදයන් අඩු කිරීම පිණිස අනුමැතින් ලබාදීමේ ක්‍රියාවලියක් සඳහා වන වැඩරාමුවක් සංවර්ධනය කිරීමේ කර්තව්‍ය ICTAD හි මෙහෙයක අනුප්‍රාප්තිකයා වන ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන අධිකාරිය වශයෙන් ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පවරා ඇත. 2020.08.09 දිනැති 2187/27 අතිවිශේෂ ගැසට් දැන්වීම අනුව, විය 4 වන වගන්තියේ විශේෂ ප්‍රමුඛතා අංක 02 ලෙස සඳහන්ව ඇත.

2.ඉදිකිරීම් කර්මාන්තය තුළ අනුමැතිය ලබාගැනීමේ අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීමට එක් විශේෂිත මධ්‍යස්ථානයකින් හෝ අන්තර්ජාලය හරහා සියලු අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය පහසුකම් නිර්මාණය කිරීම.

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පැවරී ඇති බලය අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ඉංජිනේරු විද්‍යාව, ගෘහනිර්මාණ ශිල්පය, ප්‍රමාණ සමීක්ෂණය සහ පාරිසරික හා පොදු සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව යන විෂය ක්ෂේත්‍ර හැර එහෙත් ඒවාට සම්බන්ධ විෂය ක්ෂේත්‍ර තුළ සිටින, "හඳුනාගත් ඉදිකිරීම් වැඩ" හා සම්බන්ධ වීමට අදහස් කරන, අධ්‍යයන හෝ වෘත්තීය ආයතන හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ඉදිකිරීම් කර්මාන්තයට අදාළව ක්‍රියාපදිංචිව ඇති මණ්ඩල වෙතින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 26 (1)(ඉ) වගන්තිය යටතේ සුදුසුකම් ලත් පුද්ගලයන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් ලබාගැනීමට අදහස් කරයි.

එමෙන්ම, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව,
"හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යනු-

(අ) රුපියල් මිලියන දහය හෝ අමාත්‍යවරයා විසින් කලින් කළ නියම කරනු ලැබිය හැකි රිට වඩා යම් වැඩි වටිනාකමින් යුක්ත වන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිතයන් හෝ මිතජනයාගේ පාවිච්චිය සඳහා වන යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ බිම් සැකසුමක්;

සහ

(ආ) පාරිසරික, භූවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුම නියාමන ආයතනවල අනුමැතිය අවශ්‍යවන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිත හෝ බිම් සැකසීම්

යම් පෞද්ගලික අයිතිකරුවකුගේ පුද්ගලික පාවිච්චිය සඳහා ඉදිකරන ලද යම් පෞද්ගලික නේවාසික ගොඩනැගිල්ලක් "හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යන යෙදුමේ අර්ථ නිරූපණයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

ඔබගේ අයදුම්පත්‍රය මෙම දැන්වීම පළ වී දින 30 ක් ඇතුළත **සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය** වෙත ලැබිය යුතු ය. මෙම දැන්වීම පළ වී එක් සතියක් ඇතුළත, **සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, 123, 'සවිසිරිපාය', විජේරාම මාවත, කොළඹ 07** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය වෙතත් තොරතුරු ලබාගත හැකිය.

සභාපති
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
ෆැක්ස් : 0112-685163
2021.03.12

ඊමේල්: cidaqpreg@gmail.com

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

ලංසු කැඳවීමයි

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත විස්තර කර ඇති කම්පත දික්කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටියි.

කොන්ත්‍රාත් අංකය	කොන්ත්‍රාත්තුවේ නම	තක්සේරුකරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුව (රු. මිලි)	ලංසු ආරක්ෂණය (රු. මිලි)	කාලය (දින)
RDA/DC/WP/IR-GOSL/2021/11	පැලියගොඩ - පුත්තලම මාර්ගයේ අංක 15/2 දරන පාලම පුළුල් කිරීම (නා ඇල පාලම) - AA003	127.4	1.6	365

2. මෙම කාර්යයට පාලම පුළුල් කිරීම, පිවිසුම් ඉදිකිරීම සහ අනෙකුත් වැඩ අයත් වේ.

3. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

4. මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා යෝග්‍ය වීමට කාර්යක්ෂම ලංසුකරුවා පාලම් සම්බන්ධ විශේෂඥතාවයේ **C4 හෝ ඊට ඉහළ** ශ්‍රේණිවලට අදාළව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (**CIDA**) ක්‍රියාපදිංචි වී සිටිය යුතු ය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පහත කාර්යාලවලින් වැඩි දුර තොරතුරු ලබාගත හැකි අතර **2021.04.27** සිට **www.rda.gov.lk** හරහා ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.

- විනාපති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල

  දුරකථන: 011 - 2876600 සහ ෆැක්ස් අංකය.: 011 - 2877226

- අධ්‍යක්ෂ (ඉදිකිරීම්), මාර්ග සංවර්ධන අධිකාරිය, 3 වන මහල, "මිහනෑගුම් මිහමිදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

  දුරකථන: 011 - 2864398 සහ ෆැක්ස් අංකය.: 011 - 2861621

6. පුර්ව ලංසු රැස්වීම, **2021.05.04** දින **පැය 10.00ට** විනාපති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, "සෙත්සිරිපාය" බත්තරමුල්ල හිදී (දුරකථන 011 - 2876600 ෆැක්ස් 011 - 2877226) පැවැත්වෙනු ඇති අතර අවශ්‍ය වන්නේ නම්, ඉන් පසු වැඩ බිම් සංචාරයක් සැලසුම් කළ හැකිය.

7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, අධ්‍යක්ෂ (ඉදිකිරීම්), මාර්ග සංවර්ධන අධිකාරිය, 3 වන මහල, "මිහනෑගුම් මිහමිදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙතින් **2021.04.27 දින සිට 2021.05.17** තෙක් පැය **09.00 සිට 15.00** දක්වා නැවත ගෙවනු නොලබන වෙන්ඩර් ගාස්තුවක් ගෙවා ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

රු.21,600.00ක් වන නැවත ගෙවනු නොලබන වෙන්ඩර් ගාස්තුව (වැට් සහිත) ලංසුකරුවන් විසින් පහත බැංකු ගිණුමට තැන්පත් කළ යුතු ය.

a. **ගිණුමේ නම : අධ්‍යක්ෂ ජනරාල් - මාර්ග සංවර්ධන අධිකාරිය**

b. **ගිණුම් අංකය : 0000001943**

c. **බැංකුවේ නම : ලංකා බැංකුව - ආයතනික ශාඛාව (Corporate Branch)**

ලංසුකරුවා, ලංසු ලේඛන මිල දී ගැනීමට **රු. 21,600.00 (වැට් සහිත)** මුදල ගෙවා ගත් මුද්‍රා/වලංගු ලදුපත අධ්‍යක්ෂ (ඉදිකිරීම්), මාර්ග සංවර්ධන අධිකාරිය, 3 වන මහල, "මිහනෑගුම් මිහමිදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කළ යුතු ය.

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, වෙන්ඩරය ලබාගැනීමට සමාගම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.

8. සෑම ලංසුවක්ම ඉහත වගුවේ දක්වා ඇති වටිනාකමට සරිලන ලංසු ආරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතු ය. ලංසු ආරක්ෂණය **2021.09.14** දක්වා වලංගු විය යුතු ය.

9. ලංසු, පිටපත් දෙකකින් යුතුව, **2021.05.18** දින පැය **14.00** හෝ ඒදිනට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යක්ෂ ජනරාල් බාරේ, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, "මිහනෑගුම් මිහමිදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සභාපති විසින් අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.

10. ලංසු **2021.08.17** දක්වා වලංගු විය යුතු ය.

සභාපති
මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,
මාර්ග සංවර්ධන අධිකාරිය
1 වන මහල, "මිහනෑගුම් මිහමිදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය
තනතුරු පුරප්පාඩු

කෘෂි කාර්මික, තොග හා සිල්ලර වෙළඳාම, ආනයන හා අපනයන කටයුතු වල නිරත වූ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් සම්බන්ධතාවයක් සහිත දිවයිනේ ප්‍රධානතම සමුපකාර සංවිධානයක් වූ මෙම සංගමයේ පහත පුරප්පාඩු තනතුර සඳහා සුදුසුකම් ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර - වාණිජ කළමණාකරු

වැටුප් පරිමාණය - 31,100 – 43,350 / 10X600 – 10X625

(සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප සාකච්ඡාකර තීරණය කර ගත හැකි අතර ඉහත වැටුප් පරිමාණයට අමතරව රුපියල් 22,300/-ක දීමනාවක් අදාල වේ.)

01. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

I. පිළිගත් විශ්ව විද්‍යාලයක අලෙවිකරණ විෂය සහිතව ලබාගත් උපාධිය හා අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද හෝ
II. පිළිගත් ආයතනයකින් අලෙවිකරණය පිළිබඳව ලබාගත් ඩිප්ලෝමාව සහිත අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද හෝ
III. පොදුගොලුන් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අලෙවීකරණය හෝ ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව සහිත පිළිගත් ආයතනයක අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද හෝ
IV. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් පවත්වන සමුපකාර සංවර්ධන උසස් පෙළ සහිත අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද.

02. ඉහත තනතුර සඳහා අයදුම්කරුවන්ගේ අවම වයස අවු.18 නොඅඩුවිය යුතු අතර උපරිම වයස අවු. 45ක් නොඉක්මවිය යුතුය. (සමුපකාර සේවයේ යෙදී සිටින කාර්යමණ්ඩලයට ඉහත වයස් සීමාවක් අදාල නොවේ.)

- ඉහත සඳහන් සුදුසුකම් ඇති අයවලුන් පමණක් විසින් සකස් කර ගත් අයදුම්පතක් මඟින් සියළු විස්තර සඳහන් කොට උප්පැන්න, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ සිය අයදුම්පත් 2021.05.17 දින හෝ ඊට පූර්ව ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.
- දැනට සේවයේ නියුතු සමුපකාර කාර්ය මණ්ඩලිකයින්ගේ අයදුම්පත් ඔවුන් සේවයේ නියුතු අදාල සමිතිය මඟින් ඉදිරිපත් කළ යුතුවේ.

සභාපති,
සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය,
අංක 127, ගුණේඩිපාස් පාර,
කොළඹ 14.
දුරකථන: 0112325642
2021.04.23

මට්ටක්කුලියේ මූලික පෙළේ පොලිතින් නිෂ්පාදන ආයතනයක පහත සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ.

- **පුහුණු / නුපුහුණු අත් උදව්කරුවන් (පිරිමි)**
  HELPERS

සම්බන්ධ කිරීම :

THREE STAR PACKAGING SOLUTIONS
NO. 50C, KELANIGANGA MILL ROAD,
MATTAKULIYA, COLOMBO - 15
දුරකථන අංක : 0115230052 (8.30 a.m. - 5.30 p.m.)

රැකියා ඇබෑර්තු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

තනතුරු පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **ප්‍රලේඛන නිලධාරී තනතුර** (II වන ශ්‍රේණිය) MA 5-2 - (තනතුරු 03)
2. **පිරිවැයකරණ නිලධාරී තනතුර** (II වන ශ්‍රේණිය) MA 5-2 - (තනතුරු 03)
3. **ගිණුම්කරණ නිලධාරී තනතුර** (II වන ශ්‍රේණිය) MA 5-2 - (තනතුරු 07)
4. **පරිපාලන නිලධාරී තනතුර** (II වන ශ්‍රේණිය) MA 5-2 - (තනතුරු 02)
5. **මාධ්‍ය නිලධාරී** MA 5-2- (කොන්ත්‍රාත් පදනම මත) - (තනතුරු 01)

ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමේදී සලකා බලන සුදුසුකම් සහ අනෙකුත් විස්තර සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිල වෙබ් අඩවියට (http://www.caa.gov.lk/) පිවිසෙන්න. අයදුම්පත් කැඳවන අවසන් දිනය 2021.05.07 දින වන අතර, එදින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස දන්වමි.

අධ්‍යක්ෂ ජනරාල්,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
02 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
නො. 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
23.04.2021

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
ඉඩම් අමාත්‍යාංශය
අභ්‍යන්තර විගණක තනතුර සඳහා ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩුව පවතින කළමනාකාර සේවා ගණයෙහි අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **තනතුර** : අභ්‍යන්තර විගණක
   1.1. තනතුරු සංඛ්‍යාව : 01
2. **වැටුප් පරිමාණය** : **53175/- 1375x10-1910x15-95575/=**
   2.1 මාසික මූලික වැටුප : 53175/=
3. **වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.
4. **සුදුසුකම්**
   4.1 බාහිර අයදුම්කරුවන් :
   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ්‍ය පිළිබඳ ප්‍රථම උපාධිය
   හෝ
   වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ පිරිවැය හා කළමනාකාරීත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) අන්තර් මධ්‍යම මට්ටම සමත්වීම
   සහ
   සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳ වසර තුන (03) ක පළපුරුද්ද
   4.2 අභ්‍යන්තර අයදුම්කරුවන්
   කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ ගිණුම් නිලධාරී තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් ලබාතිබීම
5. ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල පිටපත් ද සහිතව 2021.05.04 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.
6. සියලුම අයදුම්කරුවන්ගේ විස්තර දුහුඩු ලැයිස්තු ගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
7. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තෝරාගත හොත් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය.
8. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.
2021.04.19

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
පුරප්පාඩු දැන්වීමයි

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අඩු ආදායම්ලාභීන් සඳහා නීති ආධාර ලබාදීම මූලික කරගනිමින් 1978 අංක 27 දරන නීති ආධාර පනත මගින් සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

තනතුර : සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) (පුරප්පාඩු -01 යි)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II සුදුසුකම් සපුරා තිබිය යුතුය)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය හෝ ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ සමාන පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
- පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක (ICASL, CIMA, ACCA, CMA) අන්තර් මධ්‍යම මට්ටමේ පරීක්ෂණය සමත්වීම සමග රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ හා සමාන පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ මුදල් පිළිබඳව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම.
- 2021.01.01 දිනට වයස අවුරුදු 32 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

වැටුප් කේතය :

MM - 1-3-රු. 55,925-10X1375-15X1910-98,325+ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) +EPF/ETF

(ලිඛිත පරීක්ෂණයකින් හා/හෝ සම්මුඛ පරීක්ෂණයකින් අතතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.) (ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාළ කාලයන්හිදී පෙනී සිටිය යුතු වේ)

ඉහත තනතුරු සඳහා අයදුම්පත් 2021 මැයි 07 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහන් කිරීම අනිවාර්යය වේ

ලිපිනය : සභාපති,
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,
මහාධිකරණ සංකීර්ණය, අලුත්කඩේ, කොළඹ 12.

විශේෂ ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හබුරුගල, දෙද්දුව, අංක 127 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 561571341V හිමි (01) **සුනිල් ආනන්ද රණවක** වන මම ද ඉඳුරුව, අතුරුවැල්ල, "රණගිරි" හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 573161661V හිමි (02) **කමල් ධම්මානන්ද රණවක** වන මම ද ඉඳුරුව, අතුරුවැල්ල හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 615892483V හිමි (03) **දීප්ති මල්ලිකා රණවක** වන මම ද ඉඳුරුව, අතුරුවැල්ල හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 670202771V හිමි (04) **සුසිල් ලීලානන්ද රණවක** වන මම ද වන අප හතර දෙනාට හබුරුගල පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් **චතුරාණි අබේවික්‍රම මහත්මිය** විසින් ලියා සහතික කර දෙන ලද අංක 3947 සහ වර්ෂ 2019.04.25 දින දරන ගාල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දින පොත් අංක 1286 යටතේ 103 කාණ්ඩයේ 58 පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් බෙත්තොට, කෝම්මල, අංක 175 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 831940875V හිමි **ගයාන් ක්‍රිෂාන්ත සිරිමාන්න** යන අයට දෙන ලද ඇටෝර්නි බලය මෙතැන් සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බවත් මින් ඉදිරියට ඔහු විසින් අප වෙනුවෙන් කරනු ලබන කිසිම කාර්යයකට ගනුදෙනුවකට අප වග නොකියන බවත් මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමු.

01. **සුනිල් ආනන්ද රණවක**
02. **කමල් ධම්මානන්ද රණවක**
03. **දීප්ති මල්ලිකා රණවක**
04. **සුසිල් ලීලානන්ද රණවක**

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)
7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : 4/3/8/දු. මා. ව්‍යා.හ.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/3/2017/NRD/603

මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන ඉඩම් කොටස් පොදු කටයුත්තක් සඳහා රජයට අත්කර ගෙන ඇත. එම ඉඩම් කොටස් සම්බන්ධයෙන් පනතේ 9 වෙනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ පැවැත්වෙන දිනය මුල් හිමිකම් පාත්තත් වෙත වෙන වෙනම දැනුම් දෙනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2021 ක් වූ මාර්තු මස 10 වැනි දින අංක 2218/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ III වන කොටස බලන්න.

පළාත	:	මධ්‍යම පළාත
දිස්ත්‍රික්කය	:	මාතලේ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	ගලේවෙල
ග්‍රාම නිලධාරී කොට්ඨාසය	:	අංක ඊ 431බී, හත්අඩුක්කුව
ගමේ නම	:	හත්අඩුක්කුව
ඉඩමේ නම	:	බංගලාවත්ත, වැල්හිඹුටුයාය, පිංකුඹුර ඇළ, පිංකුඹුර, බෙලිගමුව එස්ටේට්, පරගහමුල උල්පතේ ඇළ, අක්කරවල, බෙලිගමුව වත්ත සහ තවත් ඉඩම්.
අවසන් ගම් පිඹුරු අංකය	:	අවසන් ගම් පිඹුරු අංකය 339, අතිරේක අංකය 9, පත්‍ර අංකය 7
කැබලි අංක	:	718, 720, 722,723, 724, 725, 727, 729, 730, 731, 737, 738, 740, 742, 744, 748, 750, 751, 752, 755, 756, 757, 758, 759, 760, 762, 763, 764, 767, 768, 769, 775, 779
ප්‍රමාණය	:	හෙක්ටයාර් 2.7684

එම්. කේ. පී. ආරියරත්න,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.
2021 අප්‍රේල් මස 09 දින
ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී.

දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න
කතරගම
ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිරිපිට, ඊස්සදේව මාවත, කතරගම
047 223 5291
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

CDU/TS/2021/05&06

ශ්‍රී ලංකා රේගුව
රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීම

කොළඹ වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබමින් සිටියදී සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුට තම වැඩිමහල් සහෝදරයා වූ එකල ගුරු සංගමයේ ක්‍රියාකාරිකයකු වූ හේම නිහාල් ප්‍රනාන්දු හරහා රෝහණ විජේවීරව හඳුනාගැනීමට හැකිවිය. එතැන් පටන් රෝහණ විජේවීරගේ දේශපාලන කටයුතුවල සහකාරයකු විය. රෝහණ විජේවීරට විවාහයක් කරවා දීමට පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීන්දු කරනු ලැබුවේ 1980 දීය. සී. අයි. ඒ සංවිධානය විසින් කිසියම් තරුණියක් ඔහු හා හාද කරනු ඇතැයි යන බියක් මේ වන විට ජනතා විමුක්ති පෙරමුණේ ඉහළ පෙළේ නායකයන් තුළ ඇති වී තිබිණි. කෙසේ වුවද එයට හේතු තිබෙන්නට ද ඇත.

විජේවීරගේ අනාගත බිරිඳ බවට පත්විය යුත්තේ එවක ගුරු සංගමයේ සභාපති එච්. එන්. ප්‍රනාන්දු ගේ නැගණිය වූ චිත්‍රාංගනී විය යුතු යැයි පක්ෂය මෙන්ම සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු ගේ ද තීරණය විය. චිත්‍රාංගනී ඒ වන විට උසස් පෙළ විභාගයට ලියා ප්‍රතිඵල එනතුරු බලා සිටි තරුණියක් වූ අතර දේශපාලනය පිළිබඳව කිසිදු උනන්දුවක් නොදැක්වූවාය. සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු මෙම විවාහයට කැමති වුව ද, වැඩිමහල් සොහොයුරා වූ එච්.එන්. ප්‍රනාන්දු එයට විරුද්ධ විය. එයට හේතුව ලෙස එච්. එන්. ප්‍රනාන්දු කියා සිටියේ, දෙදෙනා අතර පවතින වයස් පරතය වැඩි බවත් නැගණිය දේශපාලනය පිළිබඳ උනන්දුවක් නොදක්වන කෙනෙකු බවත්ය. එහෙත් සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුගේ බලකිරීම මත 1980 මාර්තු මසදී විජේවීර හා චිත්‍රාංගනීගේ විවාහය සිදුවිය.

දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු වෛද්‍ය උපාධිය ලබා රත්නපුර මහ රෝහලේ පළමු පත්වීම ලැබීමෙන් පසුව ලාංකේය සමාජය යහපත් ලෙස වෙනස් කළ යුතුය යන අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියා කළේය. වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන කාලය තුළ විශ්වවිද්‍යාල හා දේශපාලන හැඳුනුම්කම මත විද්‍යෝදය සරසවි ශිෂ්‍ය සංගමයේ සභාපති වූ මහින්ද විජේසේකර සමඟ ද මිතුරුකම් ගොඩ නගා ගන්නා සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු, 1971 අරගලයේදී රත්නපුර පොලිසිය මඟින් අත්අංඩංගුවට පත්වන මහින්ද විජේසේකරට ඇප ලබා දීමට පොලිසියට යන්නේ ද සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුය. මේ සමඟ සී.අයි.ඩී යේ ඇස් ඔහු වෙත යොමු වේ. 1971 කැරැල්ල අප්‍රේල් මස මුල් සතියේදී පොලිස්පතිතුමන්ට සහ සී.අයි.ඩී ය වෙත පෙත්සම් දෙකක් ලැබෙන අතර ඉන් කියැවෙන්නේ රත්නපුර ජනතා විමුක්ති පෙරමුණේ නායකයා වශයෙන් කටයුතු කරන්නේ සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු බවය. ඒ අනුව ඔහුව වහාම පොලිස් අත්අඩංගුවට ගනු ලැබීය.

එසේ අත්අඩංගුවට ගන්නා ලද සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුව ජීප් රථයේ බිම හෙළා මඟ දිගටම දරුණු ලෙස පහර දී මුවගම පාලම අසලදී වෙඩි තබා ඝාතනය කිරීමට සැලැසුම් කළ නමුත් හදිසියේ තම අදහස වෙනස් කරගත් ආරක්ෂක නිලධාරියා පොලිසිය වෙත රැගෙනවිත් ලිංගික වධ හිංසා පමුණුවා මළ මූත්‍රා පෙවීමට ද කටයුතු කරන ලදි. තවද ඇඟිලි යකඩයකින් ද හිස්කබල බැටන් පොල්ලකින්ද තලන ලදි. දිනපතාම පැය පහක කාලයක් ඔහුට පහර දීම සිදුවේ. පිස්තෝලයෙන් ඇන තම දත් ද කඩා දමන ලදි. මෙලෙස දරුණු වධ බන්ධනයට ලක්වූ නමුත් සවිමත් ප්‍රාණයකින් යුක්ත වූ සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු මිය යන්නේ නැත. මෙසේ කෘර වධ හිංසා පමුණුවන විට ඔහුගේ වයස අවුරුදු 25 කි. කෙසේ වුව ද සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු හඳුනන සහකාර පොලිස් නිලධාරියකු වූ නීල් වීරසිංහ මහතා විසින් ඔහුව බේරා ගෙන වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කරන ලදි.

1977 අග සිට 1983 දක්වා සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු අනෙකා කෙරෙහි දයාවන්ත ඉතාමත් බුද්ධිමත්ව කල්පනාකාරීව කටයුතු කළ චතුර ලෙස කතා බහේ යෙදුණු පුද්ගලයකු විය. 1977 විජේවීරගේ නිදහසින් පසු ජනතා විමුක්ති පෙරමුණ අප්‍රසිද්ධියේ ක්‍රියාකාරී වෙමින් පැවතුණු අතර මෙම කාලය තුළ සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු ජනතා විමුක්ති පෙරමුණ සමඟ සම්බන්ධතා ගොඩනගා ගන්නට උත්සාහ දැරුවේ නැත. නමුත් පසුව ජනතා විමුක්ති පෙරමුණ සමඟ පූර්ණ කාලීනව නොවූව ද පාක්ෂිකයකු ලෙස කටයුතු කළේය. පසුව ගම්පහ ප්‍රදේශයේ බ්‍රැණ්ඩියමුල්ල ගමෙහි දෙමහල් නිවසක් සමග ඉඩමක් මිලදී ගත් සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු තමන්ගේ වෛද්‍ය සායනය සහ නිවස ලෙස එය තෝරා ගත්තේය. වෛද්‍ය සායනය පිහිටි පරිශ්‍රයේ කොටසක් ජනතා විමුක්ති පෙරමුණේ ගම්පහ ප්‍රාදේශීය ශාඛාවේ කටයුතු සඳහා යොදා ගැනීමට ද ඔහු විසින් සකස් කරදී තිබුණි. ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂයේ පාසල හා පුස්තකාලය පවත්වනු ලැබුවේ ද එම ගොඩනැඟිල්ලේය. පූර්ණකාලීන ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙකු නොවුව ද අවශ්‍ය හැම විටම නොඅලස්ව මුදලින් ආධාර කළ අතර පක්ෂයේ හිතවතුන්ට ද උදව් උපකාර කළේය. ඒ අනුව ඔහු සමාජවාදී ශ්‍රී ලංකාවක් දැකීමේ පිපාසයකින් පෙළෙමින් සිටියේය. කෙසේවුව ද ඇතැම් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුගේ ඇවතුම්පැවතුම් ගැන නොසතුට පළ කළහ. ඊට හේතුව ඔහු හැම විටම පාවිච්චි කළේ බෙන්ස් වර්ගයේ මෝටර් රථයකි. නිතරම පාහේ බෙන්ස් රථ විකුණමින් නව මාදිලියේ රථ මිලට ගනිමින් මෝටර් රථ මාරු කළේය. දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු, විජේවීර ජනතාව අමතන රැස්වීම් පැවැත්වෙන විට ඒවා සොයා ගොස් සවන් දුන්නේය. වරක් යාපනය වීරසිංහම් පිටියේ පැවති රැලියේදී විජේවීරට එල්ල කළ ගල් ප්‍රහාරයෙන් පසු ලේ ගලන විට දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු සෙනඟ අතරින් මතුවී තුවාලයට බෙහෙත් කිරීම කාගේත් විමතියට හේතුවිය.

1983 ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීමෙන් පසුව සී.අයි.ඩී යේ ප්‍රධානියා වූ ටිරල් ගුණතිලක විසින් ඔහු අත්අඩංගුවට ගෙන පැමිණිල්ලක් නොලියාම හය මාසයක් සිර කොට තබන ලදි. එසේම 1985 අගෝස්තු මසදී ද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රේමදාස උඩුගම්පොල විසින් අත්අඩංගුවට ගෙන සති දෙකකට පසුව නිදහස් කරන ලදි. මෙලෙස දිනකට දෙවරක් පමණ අත්අඩංගුවට පත් වෙමින් නිදහස ලැබීම සිදුවන අතර සිර ගත දිවියේ කෘර වධ හිංසාවලට ද නිරන්තරයෙන් ලක්වීම සිදුවිය. 1989 වසරේදී ගම්පහ රෝහලේ වෛද්‍යවරයකුට පහර දුන් බවට චෝදනා එල්ල වීම නිසා සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුව පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන සිරගත කරන ලදි. ඒ අතර කාලයේදී ගම්පහ පිහිටි "වයිට් හවුස්" නම් තම දෙමහල් නිවස රජයේ හමුදාව විසින් ගිනි තබා විනාශ කරන ලදි. විජේවීරගේ ඝාතනයෙන් පසුව ද සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු ට සිදුවන වධබන්ධනයන්ගෙන් නම් අඩුවක් නොවුණි. මේ අනුව දිගු කාලීන සිරගත ජීවිතය හා වධබන්ධනයන් හා මානසික පීඩාව නිසා සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු මානසික හා ශාරීරිකව රෝගියකු බවට පත් වන්නේය. මෙකී පීඩාකාරී තත්ත්වයෙහි ගොඩ නැගුණු මානසික ව්‍යාකූලතාව තුළ තම සාමාන්‍ය ජීවිතයේ වගකීම් පසෙකට කළේය. මෙම තත්ත්වය දිගු කාළයක් තිස්සේ පැවතීම ක්ලමථය දක්වා නැත්නම් සමාජීය රැකියාමය හා වෙනත් අවශ්‍ය වගකීම් ඉටු නොකරන නැත්නම් ඒවායෙන් දුරස්ථ වන තත්ත්වයක් දක්වා වර්ධනය විය. ඔහුගේ ක්ලමථකාරී හැසිරීම් රටාව නිසා විවිධ සිදුවීම් සිදුවුන අවස්ථා විය.

2001 වසරේදී කොළඹ වරායේ 4 වන ගේට්ටුව ඉදිරියට ගිය ඔහු විදේශ රටවලින් ගෙන්වූ රථයකට බදු ගැසීම සම්බන්ධයෙන් තම විරෝධය පළ කළේය. නමුත් පසු දින ඔහු ඒ සම්බන්ධයෙන් සමාව ගත්තේය. තවද එම වසරෙහිම කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ ගොඩනැඟිල්ලකට පැමිණ කළහකාරී ලෙස හැසිරීම නිසා තරුණයන් පිරිසකගේ මිරිස්කුඩු ප්‍රහාරයකට ඔහු ලක්විය. 2006 වසරේ දී කොළඹ නිපෝන් හෝටලයේදි මාධ්‍ය හමුවක් කැඳවා එවකට ජනතා විමුක්ති පෙරමුණේ නායකයා වූ සෝමවංශ අමරසිංහට පක්ෂය පාවා දුන්න බවට චෝදනාවන් එල්ල කළේය. 2012 වසරේ මැයි මාසයේදී දිනයක කොටුව පොලිස් ස්ථානය වෙත දිවගොස් යෝක් වීදියේ බැංකුවක කළමණාකාරියක විසින් තමන් හට පරුෂ වචනයෙන් බැන වැදුණු බවත් එහි ආරක්ෂක නිලධාරීන් විසින් තමන්ට පහර දුන් බවත් පැමිණිලි කරනු ලැබුවේය. තවද ලේක්හවුස් ආයතනය ඉදිරිපිට මාර්ගයෙහි කළහකාරී ලෙස හැසිරුණු අවස්ථාවක් ද විය. මෙලෙස කාලයෙන් කාලයට දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු ගැන ආරංචි ලැබුණ අතර විටෙක ඔහු කලහකාරි ලෙස හැසිරුණේය. එක්කෝ ඔහු කිසිවකුට පහර දුන්නේය. නැත්නම් කාගෙන් හෝ පහර කෑවේය. වරක් අධිකරණය ඉදිරියට කැත්තක් රැගෙන පැමිණ කලහකාරි ලෙස හැසිරුණු දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දුව කෙසෙල්වත්ත පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදි. එහිදී සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු පිළිබඳව මානසික තත්ත්ව වාර්තාවක් ලබා දෙන ලෙස නියෝග කිරීමෙන් පසුව අංගොඩ මානසික රෝහල වෙත යොමු කරන ලදි. පීඩාවලට ලක්වීමත් හිසට සිදුකරන ලද පහර දීම් නිසා සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු පශ්චාද් ක්ලමථ අක්‍රමතාවය නිසා හට ගත් පෞරුෂ වෙනස්වීම්වලින් පෙළෙන බවට වූ අනුමාන කිරීමේ සාධක පවතින බව හඳුනා ගන්නා ලදි.

ජනතාව ඔහුව හැඳින්වූයේ විජේවීරගේ මස්සිනා බව මිස ඔහු මුහුණදුන් දරා ගත නොහැකි දුක්ඛ දොම්නස් ගැන කිසිවකු කතාකළේ නැත. 2015 වසරෙන් පසුව වනවාසල පාරමිතා වැඩිහිටි නිවාසයේ නේවාසිකයකු වී පොතපත

> ඔහු හැම විටම පාවිච්චි කළේ බෙන්ස් වර්ගයේ මෝටර් රථයකි. නිතරම පාහේ බෙන්ස් රථ විකුණමින් නව මාදිලියේ රථ මිලට ගනිමින් මෝටර් රථ මාරු කළේය. දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු විජේවීර ජනතාව අමතන රැස්වීම් පැවැත්වෙන විට ඒවා සොයා ගොස් සවන් දුන්නේය. වරක් යාපනය වීරසිංහම් පිටියේ පැවති රැලියේදී විජේවීරට එල්ල කළ ගල් ප්‍රහාරයෙන් පසු ලේ ගලන විට දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු සෙනඟ අතරින් මතුවී තුවාලයට බෙහෙත් කිරීම කාගේත් විමතියට හේතුවිය.

කියවමින් හුදෙකලා නිහඬ දිවියක් ගත කළ දොස්තර සුභාෂ් චන්ද්‍රා ප්‍රනාන්දු එම වැඩිහිටි නිවාසයේ අනෙකුත් පිරිසගේ ලෙඩ රෝගයන් හිදී වෛද්‍ය ප්‍රතිකාර සිදු කළේය. අවසානයේ ඔහු ඔහුගේ ජීවිත පොතේ අවසන් පරිච්ඡේදයේ අවසන් පිටුව ලිවීමට තීරණය කළා විය යුතුය. ඔහු තම සියලු බැඳීම්වලින් නිමාව කරා එළඹීමට තීරණය කළා විය යුතුය. දිනය 2018 සැප්තැම්බර් මස 05 වැනිදාය. උදැසන වනවාසල තෙළඟපාත දුම්රිය මාර්ගයේදී කොළඹ සිට මහනුවර දක්වා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියට පැන සියදිවි හානි කරගත්තේය. මියයන විට හෙතෙම 73 වියේ පසුවිය. ඔහු මියයන තුරු රෝහණ විජේවීරට ආදරය කළේය. සමාජවාදී ලංකාවක් පිළිබඳ විශ්වාසය දරා සිටියේය.

එම්. තාරික්

මැතිනිය හැඩූ දා

රටක් පාලනය කළ එඩිතර අවංක නායිකාවක් ලෙස හිටපු අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හැඳින්විය හැකිය. 1960 වසරේ ලොව ප්‍රථම අගමැතිනිය ලෙස පත් වී ශ්‍රී ලංකා නාමය ලෝකයට රැගෙන ගිය එතුමිය නැවත වතාවක් 1970 සහ 1994 යන වසර වලදී අග්‍රාමාත්‍ය තනතුරට පත්වූවාය. එම පාලන කාලය තුළ විශාල අභියෝග රාශියකට මුහුණ දෙන එතුමිය, ඒවා ජයගන්නේ එතුමිය සතු නොසැලෙන ආත්ම ශක්තියත් එඩිතර නායකත්වයත් ලොවටම විදහා පාමිනි.

1978 වසරෙහිදී දේශපාලන විරුද්ධවාදීන්ගෙන් පළිගැනීම පිණිස ජේ.ආර්. ජයවර්ධන විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නීතිය පිහිටුවන ලදි. ව්‍යවස්ථානුකූල ඒකාධිපතියකු වීමට සිහින මැවූ එක්සත් ජාතික පක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධන විසින් මෙම නීතිය සම්මත කරන ලද්දේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම ඇතුලු තවත් පලිගැනීම් සඳහාය. එකී කොමිෂන් සභාවට අතීත කාලයට බලපාන බලතල පැවරිය නොහැකි යැයි අභියාචනාධිකරණය දුන් තීන්දුව එක්සත් ජාතික පක්ෂය සතුව තිබූ හයෙන් පහේ පාර්ලිමේන්තු බලයෙන් සමතලා කරන ලදි. ඒ අනුව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විභාගය පවත්වාගෙන ගොස්, 1980 සැප්තැම්බර් මස 25 ඇය බලය වැරදි අයුරින් පරිහරණය කිරීම පිළිබඳව වැරදිකරු කරන ලදි. 1980 ඔක්තෝබර් 16 දින පාර්ලිමේන්තුවට යෝජනා දෙකක් ඉදිරිපත් කර 1970 - 1977 පාලන කාලය තුළ මෙරට අග්‍රාමාත්‍ය පදවිය හෙබ වූ ඒ වන විට අත්තනගල්ල මන්ත්‍රීවරිය මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකාව ද වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිවාසිකම් වසර 7 කට අහිමි කරමින් අදාළ යෝජනා වැඩි ඡන්දයෙන් පාර්ලිමේන්තුවේදී සම්මත කරගන්නා ලදි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තමාගේ ප්‍රජා අයිතිය අහෝසි වීම ගැන කණස්සලක් ඇති වුව ද දේශපාලනික වශයෙන් නොසැලුනාය. ඒ නොසැලුණ එඩිතර හදවත සැලුනේ ඇය පක්ෂයේ සභාපති තනතුරින් ඉවත් කිරීමට පක්ෂයේ ප්‍රබලතම පිරිසක් කළඑළි බැසීමත් සමඟය. ඒ වේදනාව ඇයට වඩාත් දරා ගත නොහැකි වූයේ තමාගේ පුත් අනුර බණ්ඩාරනායක මහතාත් ඒ ප්‍රතිවාදීන්ගේ පැත්තට එකතු වීම ගැනය. ඔවුනට මුළාවී කටයුතු කිරීම ගැනය.

"මම මගේ ප්‍රජා අයිතිය නැති කරනවයි කියා මම ඒ වෙලාවේ සැලුනේ නෑ. මම මගේ රටේ මට ආදරය කරන ජනතාව වෙනුවෙන් ඉතාමත් එඩිතරවයි ජේ.ආර්. ජයවර්ධනගේ ජනාධිපති කොමිසමට සාක්කි දෙන්න ඉදිරිපත් වුණේ. එහෙම නැතුව නිදහස ලබා ගන්නවත් සමාව ඉල්ලා ගන්නවත් නොවෙයි." එසේ කී බණ්ඩාරනායක මැතිනිය තමාට පක්ෂයේ සභාපතිකමින් ඉවත්වන්නැයි ඇඟිල්ල දිගුකළ අයට තමාගේ ඉතා දිගු කොමිෂන් සාක්ෂියේ අවසාන කොටස් සිහිපත් කර දුන්නාය.

"සාමාන්‍ය වශයෙන් අධිකරණයකට හෝ අධිකරණ මණ්ඩලයකට ඇඟිලි ගැසීම උසාවියකට අපහාසයක් කළා යැයි කෙනෙක් දඬුවම් ලැබීමේ වරදක් වෙයි. ව්‍යවස්ථාවේ 116 (2) වගන්තිය යටතේ ඔහුගේ ප්‍රජා උරුමය නැති වීමටද ඉඩ ඇත. එහෙත් ව්‍යවස්ථාවේ තිස් පස් වෙනි වගන්තිය පරිදි ජනාධිපති විසින් නිල වශයෙන් හෝ පුද්ගලික වශයෙන් කර ඇති වරදකට නඩු පැවරීමෙන් ආවරණය වී මේ පරීක්ෂණවලට බාධා රහිතව ඇඟිලි ගැසීම සිදු කෙරෙනවා."

"ඔහු ප්‍රධාන වශයෙන් මේ ගැන උනන්දු වන බව මා ප්‍රකාශ කර සිටින්නේ, ඔහු විසින් නම් කළ ඇත්තන් ලවා මා වැරැදිකරු යැයි තීරණය කළහොත් ඔහුගේ දේශපාලන පක්ෂයේ පාර්ලිමේන්තුවේ හයෙන් පහක සිටින්නවුන් විසින් මගේ ප්‍රජා අයිතිය අහෝසි කර ජනාධිපති තනතුර සඳහා ඉදිරියේ පැවැත්වෙන පළමුවැනි ඡන්ද විමසීමේදී ප්‍රධාන විරුද්ධවාදියා වූ මා තරගයෙන් ඉවත් කර ගැනීමට කල් ඇතිව සහතික කෙරෙන නිසාය."

"ඉතා හරබර දේශපාලන මුහුණුවරක් ගත්තා සේ සලකා කලඑළි බස්සවා ඇති මේ කොමිසම පත් කිරීමට හේතුවත් එහි පරමාර්ථයත් එයම බව ප්‍රකාශ කරමි."

"රජයට අහිතකර සෑම දෙනාම සහ මගේ පවුලේ අනෙකුත් අයත් ජේ.ආර්. ජයවර්ධන මහතාගේ රජයේ නීතීඥයන් විසින් සමච්චලයට ලක්කලාක් මෙන්ම එක්සත් ජාතික පක්ෂයට මා සමච්චලයට ලක්කිරීමේ අවස්ථාවක් හැරුණු විට වෙන කිසිම ඵලක් මේ කොමිසමෙන් ඇති නොවන බව කීමට හේතු මට තිබෙනවා."

"නින්දා අපහාස කිරීම පිළිබඳව තවත් කැරොල් නැටුමක් ආරම්භ කර ජනතාවට සිහිමුර්ජා වන තුරු ගුවන්විදුලියෙන් මේ අය බෙරිහන් දේවි. මගේ දේශපාලන ජීවිතය මෙතනින් හමාර වුවත් එවැනි ගර්හිත කෝලම් ආදියට හෝ අමනෝඥ මඩගැසීම් නැවත ප්‍රදර්ශනය කිරීම්වලට හෝ භාජනය වීමට මම අකමැති බව ප්‍රකාශ කරමි. මා එසේ නින්දා අපහාසවලට භාජනය වීම මේ රටේ ජනතාවට කරන ගෞරවයකි. මදිපුංචිකමකි. ජනතාව දෙන ඕනෑම තීරණයක් කවදත් වෛරයෙන් හා ද්වේශයෙන් තොරව මම බාර ගත්තෙමි. අනාගතයේදී පැවැත්වෙන නිදහස් මැතිවරණයේදී රටේ නායකත්වයට මා නුසුදුසු යැයි ජනතාව තීරණය කරනවා නම් ප්‍රීතියෙන් එම ජනමතයට හිස නැමීමට මම සූදානම්."

"මා සවිස්තරාත්මකව දක්වා ඇති වට පිටාව තුළ අපක්ෂපාති නඩු විභාගයක් පවත්වා නිර්දෝෂ වීමේ සාධාරණ අවස්ථාවක් මට ලබා ගත හැකි වෙතැයි මම දැන් විශ්වාස නොකරමි. මේ හේතු නිසාවෙන් ගරු කොමසාරිස්වරුනි තවදුරටත් මේ කොමිෂමේ පරීක්ෂණවලට සහභාගි වීමට මම අදහස් නොකරමි. ඒ බව ගෞරවයෙන් ප්‍රකාශ කරමින් මා මේ පරීක්ෂණයෙන් ඉවත් වෙමි. මට සාවධානව සවන් දුන් ඔබතුමන්ලාට ස්තූතියි කරමි."

මෙවන් ප්‍රකාශයක් කොට ජනාධිපති කොමිෂන් සභාවෙන් එඩිතර නායිකාවක ලෙස එළියට බැස පැමිණ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ දැස්වලින් කඳුළු වැටුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍යම කාරක සභා රැස්වීමේදීය.

ස්ටැන්ලි තිලකරත්න මහතා මතු කළ නීති ප්‍රශ්නයක් සමග ඇයට නොසැලී ගැටෙන්නට ශක්තිය තිබුණි. එහෙත් ඇයට දරාගත නොහැකිවූයේ තම පුත් අනුර බණ්ඩාරනායක මහතා ඔවුනට එකතුවී සිටීම ගැනය. අනුර බණ්ඩාරනායක මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වනවාට මැතිනිය තුළ කිසිම අහිතක් නොවිය. ඇගේ අනාගත අපේක්ෂාව වී තිබුණේද එයමය. එහෙත් එය ක්‍රමානුකූලව සංයමයෙන් සිදුවිය යුත්තක් බව මැතිනියගේ අදහස විය. ඒ මැතිනිය අනුරගේ දේශපාලන ගමන ක්‍රමානුකූලව සැලසුම් කළ නිසාය. අනුර බණ්ඩාරනායක 1977 මැතිවරණයෙන් නුවරඑළියට ඉදිරිපත් කොට පාර්ලිමේන්තුවට අරගත්තේද ඔහුගේ දේශපාලන අනාගතය ගැන සලකාය. ඒ වන විට නුවරඑළිය - මස්කෙලිය මැතිවරණ කොට්ඨාසය පැවතියේ බහු මන්ත්‍රී කොට්ඨාශයක් ලෙසය. මැතිවරණයෙන් දෙදෙනෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලෙස තෝරා ගනි. එහි පළමුවැනි මන්ත්‍රීධුරය එක්සත් ජාතික පක්ෂයට ගියත් දෙවැනි මන්ත්‍රීධුරය අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලැබෙන බව මැතිනිය දැන සිටියාය. තම පුත් අනුර බණ්ඩාරනායක මහතා එයට ඉදිරිපත් කළේ ඒ ස්ථිර වූ ජයග්‍රහණයෙන් පුතා දේශපාලන කරලියට ඇදගැනීමේ එකම අපේක්ෂාවෙනි. එවන් වූ දේශපාලන පසුතලයක් නිර්මාණය කරමින් තිබුණ අනුරගේ ජීවිතය වෙනස් වීම මැතිනියට දරා ගත නොහැකි විය. ඇය කඳුළු සැලුවේ ඒ ගැනය. ස්ටැන්ලි තිලකරත්න, ජේ.ආර්.පී. සූරියප්පෙරුම සහ මෛත්‍රීපාල සේනානායක වැනි පක්ෂයේ ඉහළම පෙළේ කණ්ඩායම අනුරගේ අතින් ඒ පැත්තට ඇද ගනිද්දි මැතිනියගේ කඳුළු පිසින්නට ඉදිරිපත් වූයේ බැණනුවන් වූ විජය කුමාරතුංගය.

කේ. පත්මනාදන්

ජේ. ආර්.
කකුල අඩියක් පස්සට ගත් දවසක්

1956දී බලයට පත් බණ්ඩාරනායක රජය 1956 මුල්භාගයේදීම සම්මත කරගත් රාජ්‍ය භාෂා පනතට දෙමළ ජනතාව නියෝජනය කළ පෙඩරල් පක්ෂය දැඩි විරෝධතාවක් පළකරන ලදි. 1956 අගෝස්තු මාසයේ ත්‍රිකුණාමලයේදී පැවැති පෙඩරල් පක්ෂ සම්මේලනයේදී සිය ඉල්ලීම්වල ස්වභාවය පැහැදිලි කරන ලද්දේය.

1. පෙඩරල් ආණ්ඩු ක්‍රමයක් යටතේ උතුරු හා නැගෙනහිර පළාත් දෙකට ස්වයං පාලන බලතල දීම.
2. රාජ්‍ය භාෂා වශයෙන් දෙමළ හා සිංහලට සමතැන දීම.
3. උතුරු නැගෙනහිර පළාත්වල සිංහල ජනාවාස පිහිටුවීම නතර කිරීම.

ඉහත ඉල්ලීම් ඉදිරිපත් කරමින් පෙඩරල් පක්ෂය ගෙන ගිය උද්ඝෝෂණ නිසා බණ්ඩාරනායක මහතාට රාජ්‍ය භාෂා පනත සම්මත කරගත් අවස්ථාවේ රටට දෙන ලද පොරොන්දු පරිදි පෙඩරල් පක්ෂය සමඟ සාකච්ඡා කර දෙමළ භාෂාවට ද සාධාරණ තැනක් දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස 1957 මැයි 17 දින රටසභා පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලදි. 1957 ජූලි 26 දින පෙඩරල් පක්ෂය සමඟ ඇතිකරගත් ගිවිසුම අනුව උතුරු හා නැගෙනහිර පළාත්වල පරිපාලන කටයුතු සඳහා දෙමළ භාෂාවට රාජ්‍ය භාෂාවක තත්ත්වය පිරිනැමීමට යෝජනා කෙරිණ. මෙය කලින් සම්මත කර ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය භාෂා පනත ප්‍රබල ලෙස සංශෝධනයට භාජන වන්නකි. මෙසේ බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ප්‍රකාශයට පත් වූ වහාම එහි සඳහන් කොන්දේසි පදනම් කර ගනිමින් රට තුළ සිංහල බෞද්ධ ජනතාව අතරින් විරෝධතා වැළැක්වීම ගලා එන්නට විය.

මේ වන විට එ. ජා. පක්ෂය අන්දමන්දව සිටි යුගයන් (මන්ත්‍රී ධුර සංඛ්‍යාව 08ට බැසීම නිසා) වූ අතර, පක්ෂය ගොඩගැනීමට පක්ෂ නායක වශයෙන් සර් ජෝන් කොතලාවලත්, ඩඩ්ලි සේනානායකත් ඉදිරිපත්ව නොසිටි අවස්ථාවකි. මේ නිසා පක්ෂයේ අනියම් නායකත්වයක් ගොඩනඟා ගෙන සිටි ජේ. ආර්. ජයවර්ධන ලැබුණු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගෙන ආණ්ඩු විරෝධී මතය තුළ එ. ජා. පක්ෂය ඉදිරියට ගැන්මට උත්සාහ කළේ තමන්ගේ නායකත්වය ද තහවුරු කර ගනිමිනි. බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ප්‍රකාශයට පත්කරනු ලැබූ 1957 ජූලි 26 දිනදාම එ. ජා. පක්ෂයේ කෘත්‍යාධිකාරි සභාව රැස්වී එම ගිවිසුම සිංහල ජනතාව පාවාදීමකැයි රජයට චෝදනා කරමින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ඒ අතර ජූලි 29 දින ජේ. ආර්. ජයවර්ධන ඔහුගේ හිතවත් සගයන් පිරිසක් ද සමඟ ඩඩ්ලි සේනානායක මහතාගේ වුඩ්ලන්ඩ් නිවසට රැස්වී ගිවිසුමට එ. ජා. පක්ෂය විරුද්ධ වන්නේ කවර හෙයින් ද යන්න පිළිබඳව විස්තරාත්මක ප්‍රකාශයක් කෙටුම්පත් කෙරිණ. ජේ. ආර්. ගේ මඟපෙන්වීම මත කෙටුම්පත් කරන ලද විරෝධතා ලියවිල්ල සේම පුවත්පත්වලට ලංකාවේ සිතියම අඳිමින් දෙමළ ජනතාවගේ පාලනයට යටත්වන ප්‍රදේශ ඇඳ දක්වමින් විශාල ප්‍රචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කළේය. භික්ෂූන් වහන්සේලා පිරිසක් ද මේ සඳහා යොමුකර ගත් අතර, ශ්‍රී ලංකාව දෙමළ තර්ජනයට බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම නිසා ලක්වන බවට වූ ප්‍රචාරය රට පුරා අස්සක් මුල්ලක් නැර ගෙන යාමට උත්සාහ කළේය. 1957 අගෝස්තු 03 දින ජේ. ආර්. විසින් කෙටුම්පත් කළ ගිවිසුමට විරුද්ධ එ. ජා. පක්ෂයේ දෙවන නිවේදනය නිකුත් විය. ඒ තුළින් ගිවිසුම අවලංගු කරවා ගැනීමත්, එය ක්‍රියාත්මක නොකෙරෙන්නට වගබලා ගැනීමත් මෙරට ජනතාවගේ යුතුකම බවත් ප්‍රකාශ කරමින් ඒ වෙනුවෙන් කැපවන ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අතර මේ ප්‍රශ්නය මහ පාරට බැස ජනතාව අතරට යා යුතු බවට ඉදිරිපත් වූ ජේ. ආර්. ගේ අදහස පිළිබඳව එවකට පක්ෂයේ උප ලේකම්වරයකු වූ ආනන්ද තිස්ස අල්විස් මහතා රට බේරාගැනීමේ ප්‍රතිඥාවක් දීමට අනුරාධපුර ශ්‍රී මහා බෝධිය දක්වා පාගමනක් යාමට සුදුසු බවට යෝජනා කර සිටියේය. සැතපුම් 100ක් දුර ජනගුණ්‍ය ප්‍රදේශයන් හරහා ගමන් කිරීම අවාසි සහගත බව දැන්වූ ජේ. ආර්. ඒ සඳහා නුවර දළදා මාලිගාවට යාම සුදුසු බවට වූ යෝජනාවට කවුරුත් අනුමැතිය දුන්නේ වඩාත් ජනාකීර්ණ ප්‍රදේශ හරහා ගමන් කිරීමට ඉන් ඉඩ ප්‍රස්ථා උදාවන බැවිනි.

එ. ජා. පක්ෂයේ නාවික නායකයා වූ සර් ජෝන් කොතලාවල මේ පාගමන පිළිබඳව සැක පළකළ අතර දිගු කලක් තම පෞද්ගලික ලේකම් වශයෙන් සිටි ආනන්ද තිස්ස ද අල්විස්ට ප්‍රකාශ කරන ලද්දේ එසේ යනවා නම් යන අයගේ ආරක්ෂාවට ගල් ලොරියක් ද රැගෙන යන ලෙසය. ඩඩ්ලි සේනානායක මේ පාගමන ගැන එතරම් උනන්දු නොවූ අතර, ජාතික පුවත්පත්වලින් ප්‍රසිද්ධියක් ලබා දුන් විට ඔහු පාගමනට සම්බන්ධ විය. සැලසුම වූයේ කොළඹ සිට මහනුවරට දින 04 පාගමනකින් ළඟාවීමටය. මල්වතු අස්ගිරි මාහිම්වරුන්ගේ මෙහෙයවීමෙන් ආගමික උත්සවයන් සඳහා ජනතාවට ආරාධනා කරන ලදහ. ජේ. ආර්. පාගමනට යන්නවුන් වන්දනාකරුවන් ලෙස හඳුන්වා දුන් අතර, නමුත් එය දේශපාලන වශයෙන් පොළඹවනු ලැබූ පෙරහරක් විය. මුළු රටම තියුණු ලෙස දෙකට බෙදී ගිය ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මෙසේ පාගමනක් තුළින් උද්ඝෝෂණයක් ඇතිකිරීම බරපතළ ප්‍රතිවිපාක ඇතිකරන්නක් බව මුල සිටම පෙනී ගියේය. පාගමනට සමගාමීව මල්වතු අස්ගිරි මහානායක හිමිවරුන් ජනතාවට ප්‍රකාශයක් නිකුත් කරමින් එහි අවසානයට මෙසේ ප්‍රකාශ කළේය.

'..... වෙනම ද්විවිධ රාජ්‍යයක් ඇතිවීමෙන් ශ්‍රී ලංකාව දෙකඩ කිරීම වළක්වාලීම පිණිස බුද්ධ වර්ෂ 2501 ක් වූ වප් මස 09 වැනි පුර පසළොස්වක දා සවස් භාගයෙන් (1957 ඔක්තෝබර් 08 වෙනිදා) අතිපූජනීය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශීර්වාදයත්, ආරක්ෂාවත්, ශ්‍රී ලංකාද්වීපවාසීන්ට ලබාදීම සඳහා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි පූජෝපහාරයක් පැවැත්වීමට අප තීරණය කොට ඇති හෙයින් එදින කාල වේලා නොඉක්මවා සෙංකඩගල නුවර දළදා මන්දිරයට පැමිණෙන ලෙස සමස්ත ලාංකික ජනතාවට ලෝක ශාසනාලයෙන් ආයාචනා කරමිහ....'

මෙසේ 1957 ඔක්තෝබර් 03 දින අපරභාගයේදී පාගමන කොළඹ කොස්ගස් හන්දියෙන් ආරම්භ කරන ලදහ. ඩඩ්ලි සේනානායක මහතා ආරම්භයේදී පාගමනට ආශීර්වාද කරමින් කතා කළ අතර, පාගමනට සහභාගි නොවීය. සංඝයා වහන්සේලා වැඩ සිට මණ්ඩපයක් සහිත රථයක් පිරිත් සජ්ඣායනා කරමින් ඉදිරියෙන් ගමන් කළ අතර, ජේ. ආර්. ගේ සොහොයුරු රාජනීතිඥ එච්. ඩබ්. ජයවර්ධන ද පාගමනට එක්ව සිටියහ. කොළඹින් සැතපුම් 12 ඔබ්බෙහි කඩවත නිවසක පළමු රාත්‍රිය ගතකිරීමට පාගමන්කරුවන් සැලසුම් කර සිටි අතර, ඒ ස්ථානයට ළඟාවන විටත් ගමන් මාර්ගයේ දෙපස සිට ගල් ගැසීමත්, 'හූ' කීමත් දිගටම සිදු විය. පොලිසිය මෙම ක්‍රියාදාමයට නිසි පරිදි මැදිහත් නොවූ විට එච්. ඩබ්. ජයවර්ධන මහතා නියෝජ්‍ය පොලිස්පති සී. සී. දිසානායක මහතා විමසූ බවත් තමනට

> පෙරහර තහනම් කරන ලද බව පොලිසිය ජේ. ආර්. ජයවර්ධනට දන්වන ලද අතර, එස්. ඩී. බණ්ඩාරනායක මහතා තම පිරිස සමඟ ඉවත්ව ගියේය. අපරභාග 12.00 පමණ ජේ. ආර්. ජයවර්ධන මහතා සමඟ පාගමනේ යෙදුණු පිරිස පොලිස් ආරක්ෂාව සහිතව ඔමිනි බස් සමාගමට අයත් බස් රථ 04කින් කොළඹ බලා පිටත් විය. ගම්පහ පෙරමුණේ අධිෂ්ඨානය හා සටන්කාමීභාවය ඉදිරියේ ආපසු හැරුණු පයින් ගමන්කරුවන් උසුළු විසුළු හා 'හූ' හඬ මැද්දේ කොළඹ බලා පැමිණියේය.

ආරක්ෂාව ලබා නොදෙන්නේ නම් සාමය කඩවීමට තිබූ අවස්ථාවක සිය රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් පෞද්ගලික පැමිණිල්ලක් මත නීති මඟින් කටයුතු කරන බවට තර්ජනය කළ විට නවාතැන් ගත් නිවසට පොලිස් ආරක්ෂාව ලබාදෙන ලදි.

පසුදා එනම් ඔක්තෝබර් 04 උදෑසන නැවත ගමන් ආරම්භ කළ විට පෙනී ගියේ සියලු කඩසාප්පු වසා ඇති බවත් මාර්ගය ජනගුණ්‍ය වී ඇති බවත්ය. මෙය කිසියම් ඉදිරි ක්‍රියාමාර්ගයක පෙරහුරුවක් බව ජේ. ආර්. ට පෙනී ගියේය. පාගමන ආරම්භ කර කඩවත මංසන්ධියෙන් සැතපුම් 03 ඔබ්බෙහි පිහිටි ඉඹුල්ගොඩ කන්ද කැපූ තැන දෙබුක්කාව මැදින් පාර දිවෙන ස්ථානයේදී ප්‍රතිවාදීහු පිරිසත් පැමිණ පාගමනේ යෙදුණු පිරිස නවතාලූහ. මෝටර් රථ දෙකක් පාර හරහා යොදා නවතා තිබූ අතර, එක් රථයක් ගම්පහ මන්ත්‍රී එස්. ඩී. බණ්ඩාරනායක මහතාගේ විය. ඔහු පිටුපස විශාල පිරිසක් පාරේ වාඩිගෙන සිටි නිසා පාගමන්කරුවනට ඉදිරියට ගමන් කිරීම දුෂ්කර විය. වාඩිගත් පිරිසේ සටන් පාඨය 'මොවුනට ගම්පහට ඇතුල්වීමට ඉඩ නොදෙමු' යන්න විය. උදෑසන 10.00 පමණ වූ මේ අවස්ථාවේ දෙපිරිසට මුහුණට මුහුණලා වාඩිගත්තත්, පාගමනේ යෙදෙන්නන් සංඛ්‍යාව මේ වන විට ඉතා සුළු පිරිසක් විය. 10.30 ට පමණ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් වූ සී. සී. දිසානායක හා සිඩ්නි ද සොයිසා පැමිණ පාගමන්කරුවනට ආපසු යන ලෙස දැන්වූ අතර, ඒ සඳහා බස් සපයා දීමට ද පොරොන්දු විය. එහෙත් ජේ. ආර්. තම කණ්ඩායමට කාණ්ඩ වශයෙන් නුවර යාමට ඉඩ ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. එහිදී පොලිසිය ප්‍රකාශ කළේ එකවිට දෙදෙනෙකුට වඩා එකට යාමට ඉඩදිය නොහැකි බවත් එසේ ගියත් මඟදි සිදුවන අතවරවලට පොලිසියට වගකීමට බැරි බවත්ය.

මේ තත්ත්වය යටතේ පෙරහර තහනම් කරන ලද බව පොලිසිය ජේ. ආර්. ජයවර්ධනට දන්වන ලද අතර, එස්. ඩී. බණ්ඩාරනායක මහතා තම පිරිස සමඟ ඉවත්ව ගියේය. අපරභාග 12.00 පමණ ජේ. ආර්. ජයවර්ධන මහතා සමඟ පාගමනේ යෙදුණු පිරිස පොලිස් ආරක්ෂාව සහිතව ඔමිනි බස් සමාගමට අයත් බස් රථ 04කින් කොළඹ බලා පිටත් විය. ගම්පහ පෙරමුණේ අධිෂ්ඨානය හා සටන්කාමීභාවය ඉදිරියේ ආපසු හැරුණු පයින් ගමන්කරුවන් උසුළු විසුළු හා 'හූ' හඬ මැද්දේ කොළඹ බලා පැමිණියේය. කෝළාහල, ගල් ගැසීම්, වෙඩි තැබීම්, වැලි බෝතල්වලින් ගැසීම්, ගිනි තැබීම්, මංකොල්ලකෑම් මැද්දේ නුවර පාගමන ඉඹුල්ගොඩින් හැරී ආපසු ආවේ 17 දෙනකුට පමණ තුවාල සිදුකරගෙනය. එස්. ඩී. බණ්ඩාරනායක 'ඉඹුල්ගොඩ වීරයා' ලෙස නම් පටබැඳ ගත්තේ මේ සිදුවීමත් සමඟය.

◣ **සමරසේන මුදලිගේ**

සුද්දගෙ කාලේ
අපුසිද්ධ කුමන්ත්‍රණය

1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ආක්‍රමණය කළ ඉංග්‍රීසීන්ට 1815 වන තෙක් උඩරට රාජධානිය අත්පත් කර ගැනීමට නොහැකි විය. නමුත් ඔවුන් අවස්ථා කීපයක්ම උඩරට රාජධානිය අත්පත් කර ගැනීමට උත්සාහ කළ බව නොරහසකි. උඩරට රාජධානියේ භූගෝලීය පිහිටීම හා සිංහලයන්ගේ ගරිල්ලා සටන් ක්‍රම හමුවේ ඉංග්‍රීසීන්ට එම උත්සහයන් සාර්ථක කර ගැනීමට නොහැකි විය.

අවසානයේදී නායක්කර්වංශිකයකු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා බලයෙන් පහකිරීමට උඩරට ප්‍රභූන් ඉංග්‍රීසීන් සමග අත්වැල් බැඳ ගත් බව කිසිදා කවර ආකාරයකින්වත් සැඟවීමට නොහැකි සත්‍යයකි. ඒ උඩරට ගිවිසුම හරහාය. උඩරට ගිවිසුමට අනුව බලයෙන් නෙරපනු ලබන ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ අනුප්‍රාප්තිකයා විය යුත්තේ සිංහල රජ කෙනෙකි. එහෙත් උඩරට සිංහලයන්ගේ අභිලාෂය මුදුන්පත් කර ගැනීමට නොහැකි වූ අතර, අවසාන ප්‍රතිඵලය වූයේ උඩරට ප්‍රදේශ පාලනය කිරීමට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයකු පත් කිරීමයි. 1815 උඩරට ගිවිසුමේ අග්‍රඵලය වූයේ එයයි. එය තවදුරටත් නිවැරදි කර ගැනීමට නොහැකි වරදක් විය. එම ඓතිහාසික වරද සිදු කිරීම වෙනුවෙන් සිංහල ප්‍රභූන් බහුතරයකට ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු විය. තවත් පිරිසක් බන්ධනාගාර ගතකරන ලදී. තවත් පිරිස් ඉංග්‍රීසීන්ට අත්පත් කර දුන් රාජ්‍ය බලය නැවත ලබාගැනීමේදී උඩරට ප්‍රභූහු විවිධ උපායමාර්ග අනුගමනය කළහ. 1833 කුමන්ත්‍රණය එම උපාය මාර්ගවලින් එකකි.

1833 කුමන්ත්‍රණයේ මහ මොළකරුවන් කීපදෙනෙක් සිටි අතර, ඉංග්‍රීසි පාලකයින් මහනුවරට කැඳවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම කුමන්ත්‍රණයේ මූලික අංගය විය. මෙම කුමන්ත්‍රණය පිටුපස සිටියේ මොල්ලිගොඩ අදිකාරම්, දුනුවිල දිසාව, දුල්ලෑවේ අදිකාරම් ඇතුළු ප්‍රභූන් පිරිසකි. මෙම භෝජන සංග්‍රහයේදී කැමවලට වස මිශ්‍ර කර ඉංග්‍රීසි පාලනයේ කාඩරය සාතනය කිරීම උපක්‍රමය විය. එහෙත් මේ කුමන්ත්‍රණය පිළිබඳව තොරතුරු සිංහලයන් හරහාම ඉංග්‍රීසි පාලකයින්ට යාම දෛවෝපගත සිද්ධියක් විය. අවසානයේ කුමන්ත්‍රණකරුවන් සියල්ලම ඉංග්‍රීසි ආණ්ඩුවේ අත්අඩංගුවට පත් වූ අතර, මොවුන්ට එරෙහිව පැවති නඩු විභාගය ජූරි සභාවක් සහිතව මහාධිකරණයේදී පවත්වන ලදි. ජූරි සභාව ඉංග්‍රීසි ප්‍රභූන් හයදෙනෙකුගෙන් සහ පහතරට සිංහලයන් හත්දෙනෙකුගෙන් සමන්විත විය. ජූරි සභාවේ තීරණය බහුතර තීරණය හා සුළුතර තීරණය ලෙස කොටස් දෙකකින් ලැබුණ අතර, බහුතර තීරණය වූයේ විත්තිකරුවන් (කුමන්ත්‍රණකරුවන්) නිවැරදිකරුවන් බවයි. එසේ තීන්දුව ලබා දුන් ජූරි සභිකයින් සියලුදෙනාම පහතරට සිංහලයන් වීම විශේෂත්වය වේ.

මෙහිදී අවධාරණය කළ යුතු වැදගත් කරුණක් වන්නේ උඩරට ගිවිසුම පිළිබඳව පහතරට සිංහලයන්ගේ මනාපයක් නොතිබූ බවයි. 1505 සිටම බටහිර ජාතිකයින්ගේ ආක්‍රමණවලින් හෙම්බත්ව සිටි පහතරට ජනතාව උඩරට ගිවිසුම වහ කදුරු මෙන් තිත්ත විය.

එදා 1815 වසරේ උඩරට ගිවිසුම අත්සන් නොකළා නම් කිසිම ආකාරයකින් උඩරට ප්‍රදේශවල බලය අත්පත් කර ගැනීමට ඉංග්‍රීසීන්ට හැකියාව නොලැබෙනු ඇතැයි අනුමාන කළ හැක. එසේ වූයේ නම් මේ රටේ ඉතිහාසය ද මුළුමනින්ම වෙනස් වීමට ඉඩ තිබුණි.

1815 උඩරට ගිවිසුමෙන් අප උගත යුතු පාඩම නම් ස්වදේශිත පාලකයකු බලයෙන් නෙරපීම සඳහා විදේශීය බලවේගවල පිහිට ලබා නොගත යුතු බවයි. මේ පරම සත්‍යය වර්තමානයට ද එක සේ වලංගුයි.

◣ **නීතිඥ එස්. එම්. ජයසූරිය**

දේශවංශය

භේද අතැර සමගිය රැකි කම්කරු නායකයා

අසීස් මහතා

වතු කම්කරු ජනතාවගේ විමුක්ති අරගලය සාක්ෂාත් කරලීමට ජීවිතය කැප කළ විශිෂ්ට මානව හිතවාදී දේශපාලන නායකයකු වූ අබ්දුල් අසීස් මහතාගේ 31වැනි ගුණ සමරුව අප්‍රේල් 29 වැනි දිනට යෙදී තිබේ.

1943 වර්ෂයේ දිනක කොළඹ අලුත්කඩේ උසාවියේ පෙනී සිටි නඩුවක විත්තිකරුවකු විය. බ්‍රිතාන්‍ය රජයට එරෙහිව කැරලි ගැසීම් සිදු කරන අන්දමේ කතාවක් පැවැත්වීම ඔහුට විරුද්ධව වූ චෝදනාව විය. ජූරි සභාව ඔහු නිවැරැදිකරු බවට තීන්දු කළේය. බ්‍රිතාන්‍ය ජාතික විනිසුරුවරයා තම තීන්දුව ප්‍රකාශ කර සිටියේ තිත්ත බෙහෙතක් බොන්නාක් මෙන් දැඩි අකමැත්තෙනි.

1959 බලන්ගොඩ පිහිටි පිටියාගල වත්තට බලහත්කාරයෙන් ඇතුළුවීම පිළිබඳ ඔහුට නඩු පැවරුණි. මහේස්ත්‍රාත් නඩු විභාගයේ දී ඔහු ඇතුළු අනෙක් අය මාස දෙකක් බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි. එම තීන්දුවට එරෙහිව ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැලක් පවා ඉදිරිපත් කළ මුත් එය නිෂ්ප්‍රභ කෙරිණි. සිර දඬුවම් ස්ථිර විය. පසුව ඔහු එම තීන්දුවට විරුද්ධව ලන්ඩන් ප්‍රිවි කවුන්සලයට ඇපැලක් ඉදිරිපත් කළේය. ඩිල්හෝන් නමැති විනිශ්චයකාරවරයා ඇපැලට ඉඩ දෙමින් සිර දඬුවම අවලංගු කළේය. වතුකරයේ වතුවලට වෘත්තීය සමිතිවලට ඇතුළු වීමට එතෙක් තිබූ තහනම ඉන් ඉවත් විය.

මෙරට වතු කම්කරු වෘත්තීය අයිතීන දීමේ හා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම උදෙසා වූ අරගලයේ දී අබ්දුල් අසීස් නම් වූ විශිෂ්ට මිනිසාගේ භූමිකාව එවන් අනන්ත වූ සිදුවීම්වලින් යුක්ත වූවකි.

ඉන්දියාවේ මහත්මා ගාන්ධිතුමා ජන්ම ලාභය ලැබූ පෝර්බන්දර් නගරයේදීම 1912 ඔක්තෝම්බර් 06 වැනිදා ඔහුද උපත ලැබීය. අසීස්ගේ පියා වූයේ ගුලාන් හුසේන් රෙයිමු මහතාය.

මෙරට කලක් ප්‍රකටව පැවැති රේමු සන්ස් ව්‍යාපාරය ඔහුට අයත්ව තිබිණි. ඉන්දියාවේ ප්‍රකට මහන මැෂින් හා සෙසු විද්‍යුත් උපාංග ඌෂා නම් වෙළෙඳ ජාලයේ මෙරට පළමු කර්මාන්ත ශාලාව හා ව්‍යාපාරය ඇරඹුවේ ඔහු විසිනි. අබ්දුල් අසීස් මහතා කරච්චියේ දී ද්විතීක අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය කරච්චියේ දී හා බොම්බායේ දී හැදෑරීය. බොම්බාය විශ්වවිද්‍යාලයේ දී වාණිජ්‍යය පිළිබඳ උපාධිය ද හෙතෙම ලැබීය.

ඔහු ද්විතීයික අධ්‍යාපනය ලබන කාලයේ දී ශිෂ්‍යයන් ගේ සමිතියක් පිහිටුවා ගනු ලැබීය. එහි අරමුණ වූයේ අසරණුන්ට පොත් මිල දී ගැනීමට හා පාසල් ගාස්තු ගෙවීමට සහය වීමයි.

තම පියාගේ ව්‍යාපාර කටයුතුවලට සහාය වීමට අබ්දුල් අසීස් මහතා මෙ රටට පැමිණියේය. මෙරට වතු කම්කරු ජනතාවගේ විමුක්ති අරගලයට ඔහු තම නායකත්වය ලබාදුන්නේ සුඛෝපභෝගී ධනවත් ජීවිතයකට උරුම වූ සැප සම්පත් පවා පසෙකට විසි කර දමමිනි. අධිරාජ්‍යවාදී පාලනය හමුවේ සූරාකෑමට හා තාඩන පීඩනයන්ට ගොදුරු වී සිටි වතු කම්කරු ජනතාව ඉන් බේරාගෙන ඔවුනගේ ජීවිත උසස් තලයකට ගෙන ඒමට හෙතෙම තම ජීවිතයම කැප කළේය.

අසීස්ගේ ජව සම්පන්න නායකත්වයට අධිරාජ්‍යවාදී නායකයන් මෙන්ම වතු හිමිකරුද බිය වූහ. කුමන හෝ වරදක් මත ඔහුට චෝදනා ගොනුකොට සිරගතකරලීමට පාලකයන් ප්‍රයත්න ගත් අවස්ථා අපමණය. එහෙත් එම කිසිදු මර්දනයකින් අසීස් නිහඬ කළ නොහැකි විය.

ඔහුගේ පුරෝගාමිත්වය ඇතිව 1939 ඇරඹුණු ලංකා ඉන්දියානු කම්කරු සංගමය වාර්ෂික සැසිය ඇමතීමට ඔහුට සිදු විය. 1943 මාර්තු මාසයේ බදුල්ලේ පැවැති එම සැසියේ දී ඔහු කළ කතාව මහ රජතුමාට විරුද්ධව අපකීර්තිමත් මෙන්ම කැරලි ගැසීමට තුඩු දෙන බව පවසමින් එම කතාව නඩු භාණ්ඩයක් ලෙස උසාවියට ඉදිරිපත් කෙරිණි.

එම නඩුවේ ජූරිය බ්‍රිතාන්‍ය වැවිලිකරුවන්ගෙන් සමන්විත වුවහොත් තමාට ස්ථිරවම දඬුවම් ලැබෙන බව තේරුම් ගත් ඔහු දෙමළ භාෂාව කතාකරන ජූරි සභාවක් ද ඉල්ලා සිටියේය. ඔහුගේ එම ඉල්ලීම ඉටු කරන්නට සිදුවිය. ඒ අනුව පත් කෙරුණු හත් දෙනකුගෙන් යුත් ජූරි සභාව විත්තිකරු නිදහස් කොට නිදොස් කළේය.

මේ සුවිශේෂ පුද්ගලයා ඉන්දියාවේ සිට මෙරටට විත් ශ්‍රී ලාංකීය භූමිය තුළ වතු කම්කරු විමුක්ති අරගලයට අතීත නායකත්වයක් සැපයූ 1939 දී මෙරට ඇරඹුණු ලංකා ඉන්දියානු වතු කම්කරු කොන්ග්‍රසයේ නිර්මාතෘවරයා වූ අබ්දූල් අසීස් මහතාය. ඉනික්බිතිව ඔහු හා ලංකා ඉන්දියානු වතු කම්කරු කොන්ග්‍රසයට එක්ව සිටි ආර්. තොන්ඩමන් මහතා පසු කලෙක ඉන් ඉවත්ව ලංකා කම්කරු කොන්ග්‍රසයට නායකත්වය දුන්නේය. අබ්දූල් අසීස් මහතාගේ ජ්‍යෙෂ්ඨ පුතණුවන් වන අශ්රොෆ් අසීස් මහතා අද තම පියා ඇරඹූ සංවිධානයේ අසීස් ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොන්ග්‍රසයේ වත්මන් නායකත්වය හොබවයි. අබ්දූල් අසීස් නමැති සුවිශේෂ විප්ලවවාදී චරිතය පිළිබඳ අශ්රොෆ් අසීස් කළ හෙළිදරව්වකි මේ.

මහත්මා ගාන්ධිතුමා උපත ලද පෝර්බන්දර් ගම්මානයෙන් ජන්ම ලාභය ලැබූ තම පියාට මහත්මා ගාන්ධිතුමා වරෙක හමු වූ අපූර්ව සිද්ධිය ද අසීස් මහතා මෙම පිළිසඳරේ දී අපට හෙළි කළේය.

මගේ පියා ලංකාවට විත් මෙරට ඉන්දියානු වතු කම්කරු ජනතාවගේ විමුක්ති අරගලයට දායක වූ සමයේ විටින් විට ඉන්දියාවට ගිහින් තම උපන් ගම් පළාතේ සංචාරය කළා. එහෙම ඉන්න විට පියාට ඕන වුණා ගාන්ධිතුමා හමුවන්න.

එහෙත් ගාන්ධිතුමා හමුවන්න එහෙම වෙලාවක් ගන්න එක අමාරු කටයුත්තක් වුණා. එහෙත් එතුමාගේ අනුගාමිකයන් කියා තිබෙනවා මහත්මා ගාන්ධිතුමා ඇවිදින්න යන විට ඔබත් ඇවිදින්න ආවොත් එසේ යන ගමන් කතා කළ හැකියි කියලා. ඒ අනුව ගාන්ධිතුමා ඇවිදින්න යන විට පියාත් එතුමා සමඟ ඇවිදින්න ගියා. යන විට පියා තමා ඉන්දියාවේ සිට ලංකාවට ගිහින් කරන සටන ගැන ගාන්ධිතුමාට කියා තිබෙනවා.

ලංකාවේ නිදහස් සටන කොහොමද? ඉන්දියානුවන්ට රටේ සැලකිල්ල කෙබඳුද යන ප්‍රශ්න ගාන්ධි තුමා තාත්තාගෙන් අසා තිබෙනවා. පියා ඒවාට උත්තර දෙන විට ගාන්ධිතුමා

නේරු සමඟ

ඉතා වැදගත් ප්‍රශ්නයක් පියාගෙන් පෙරළා අසා තිබෙනවා. ඒ වන විට ඉන්දියානු නිදහස් අරගලයක් ප්‍රබල ලෙස තිබුණා. ගාන්ධිතුමා පියාගෙන් ඇසූ ප්‍රශ්නයට පියා විමතියට පත් වුණා.

ඔබ ජවහර්ලාල් නේරුතුමා ගැන දන්නවාද? ගාන්ධිතුමා ඇසූ විට පියා දන්නවාල කීවේ කිසිවක් හිතා ගන්නද බැරිවය. ඔහු ඉන්දියාවේ අගමති කරන්නයි අපේ සූදානම. ඊට ඔහු සුදුසු ද? ගාන්ධිතුමා අසා තිබෙනවා.

මා වැන්නකුගෙන් එවැන්නක් අහන්නේ ඇයි? පියා විමතියෙන් ගාන්ධිතුමාගෙන් පෙරළා අසා තිබෙනවා. ශ්‍රී ලංකාවේ සිටින ඔබ වැනි අය නේරුතුමා ගැන දක්වන ආකල්පය අපට ඉතා වැදගත්.

ගාන්ධිතුමා ඇසූ ප්‍රශ්නයට පියා පිළිතුරු දී ඇත්තේ නේරු තුමාට වඩා සුදුස්සෙක් ඊට නැති බව අපේ හැඟීමයි. නේරුතුමා ගැන තමා දරන ආකල්පය ද ශ්‍රී ලාංකීය ජනතාවගේ හැඟීරමඳ ගාන්ධිතුමාට පළ කර තිබෙනවා. පියා තම ජීවිතයේ හැමදාම මේ අපූර්ව හමුව සිහිපත් කළා.

1959 වන විට රටේ අග්‍රාමාත්‍යවරයාව සිටියේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතායි. බණ්ඩාරනායක මහතා සහ එම මැතිනිය අපේ පවුලෙ අය එදා ළඟින්ම ඇසුරු කළා. තාත්තත් බණ්ඩාරනායක මහතා සමඟ දැඩි මිත්‍රත්වයකින් කටයුතු කළා.

එකළ ඒබ්‍රහම් සිංඤ්ඤෝ ඝාතනය වීමෙන් පසු වතුකරය පුරාම ආන්දෝලනයක් හට ගත්තා. අගමැති බණ්ඩාරනායක මහතා මැදිහත්වී සාකච්ඡාවක්ද ලබා දුන්නා. එහෙත් පියාගේ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සංගමය පිළිගැනීමට වෘත්තීය සමිතියක් තුළ සංවිධාන වීමට වතු හාමිපුතුන් කැමති වුණේ නැහැ. කම්කරුවන් පොලිසිය ලවා මර්දනය කරවීම වතු හාමිපුතුන්ගේ පිළිවෙත වුණා. එදා ඒබ්‍රහම් සිංඤ්ඤෝගේ අවමඟුලට අති විශාල ජන ගඟක් සහභාගි

අසීස්ගේ ජව සම්පන්න නායකත්වයට අධිරාජ්‍යවාදී නායකයන් මෙන්ම වතු හිමිකරුද බිය වූහ. කුමන හෝ වරදක් මත ඔහුට චෝදනා ගොනුකොට සිරගතකරලීමට පාලකයන් ප්‍රයත්න ගත් අවස්ථා අපමණය. එහෙත් එම කිසිදු මර්දනයකින් අසීස් නිහඬ කළ නොහැකි විය.

වුණා. සමසමාජ නායකයන් වූ ඇන්. ඇම්. පෙරේරා, කොල්වින් ආර්.ද. සිල්වා ඇතුළු වමේ නායකයන්ද එක්වුණා. වතු පාලකයන්ට අන්තිමේ වතු කම්කරුවන්ට සංවිධානය වීමට හා වෘත්තීය සමිතියක පිළිගැනීමකට එක් වීමට සිදුවුණේ එම දිවි පිදූ කම්කරු සහෝදරයාගේ මළගම දවසෙයි. බණ්ඩාරනායක අගමැතිවරයාත් ඊට මැදිහත් වීම උපරිම ලෙස කළ බවයි අපේ හැඟීම. එම අවුරුද්දේම බණ්ඩාරනායක අගමැතිතුමත් ඝාතනය වුණා. අධිරාජ්‍යවාදී කඳවුරු තුළින් අප මාතෘ භූමිය මුදා ගැනීමේ අරගලයට අසීස් දැක්වූ කැපවීම ගැන සිහිපත් කළ අශ්රොෆ් අසීස් හැමවිටම අවධාරණය කළේ පළමුව අප රටට නිදහස ලබා දිය යුතු බවයි. සොල්බරි කොමිසම සමඟ පවා තාත්තා දැඩිව කීවේ පළමුව අපට රටට නිදහස දෙන්න. අපට අවශ්‍ය ආණ්ඩු ක්‍රමයකට ඉඩ දෙන්න. අපි සිංහල ජනතාව කෙරෙහි විශ්වාසය තබනවා. අපේ ප්‍රශ්න අප දෙවනුව විසඳා ගන්නම්ල යන්නයි.

1952 මුල් භාගයේ දිනෙක කොළඹ 11 කෙලින් විදියේ ස්ථානයකින් ඇරඹුණු දහසකට අධික ජන සහභාගීත්වයක් දැරූ පෙළපාළිය කොල්ලුපිටිය අරලියගහ මන්දිරය කරා ගමන් ගැනීම ඇරඹුණි. මද දුරක් යද් දී කොළඹ කොටුව ප්‍රදේශයේ දී පොලිසිය ඔවුනගේ ගමන නවත් වන්නට උත්සාහ කළ නිසා පෙළපාළියේ ගමන් ගත්තවුන් සත්‍යග්‍රහයක යෙදෙන්නට පටන් ගත්හ. බැටන් පොලු ප්‍රහාර එල්ල කර අශ්වාරෝහක කණ්ඩායම්වලද සහයෙන් විරෝධතාව මැඩ පැවැත්විය. ජනතාවට නායකත්වය දෙමින් සිටි අසීස් සහ ආර්. තොණ්ඩමන් අල්ලාගෙන වැන් රථයක නංවාගෙන සැතපුම් 25ක් පමණ ඈත ප්‍රදේශයක දමා ගියා. මේ දෙදෙනා හඳුනාගත් එම ප්‍රදේශයේ පිරිස් ඔවුන්ට සත්කාර කොට කොළඹ බලා පිටත් කර යවා තිබෙනවා. ඩලංකා ඉන්දියානු කම්කරු සංගමය ඊළඟට රැස්වී ගත යුතු පියවර සාකච්ඡා කරන්නට වුණා. අනතුරුව අගමැති කාර්යාලයට නුදුරින් පිහිටි භූමියක දින පහක් නිරාහාර විරෝධතාවයක යෙදෙන්න තීරණය වුණා. වතු කම්කරුවන් 500ක් පමණ ඊට එක්ව සිටියා. එසේ වුවද රටවැසි භාවය නොදීම හා සර්ව ජන ඡන්ද බලය නොදීම එලෙසම ක්‍රියාත්මක වුණා. දීර්ඝ සටනක් අවසානයේ සංගමයේ නියෝජිත පිරිසක් ඉන්දියානු අගමැති ලෙස පත් වූ ජවහර්ලාල් නේරු හමුවීමට කටයුතු කළා. ඒ පිළිබඳ පැවසූ අශ්රොෆ් අසීස් එදා නේරු අගමැතිතුමා හමුවීමට ගිය පිරිසේ තාත්තත් ඇතුළත් වුණා යැයි කීය. ඒ අනුව පැවැති සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස දෙරටේ අගමැතිවරුන් වූ නේරු සහ අප රටේ අගමැතිව සිටි ශ්‍රීමත් ජෝන් කොතලාවල අතර ගිවිසුම මගින් රටවැසිභාවය ඉල්ලා තිබූ අයදුම්පත් පිළිබඳ සලකා බැලීම ඉක්මන් වුණා. ලංකාවේ පදිංචිව සිටි ඉන්දියානු අය සඳහා ආසන 4ක් වෙන් කිරීමට පියවර ගත්තා. මැයි දිනය, සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයද වැවිලි කර්මාන්තයේ නිරත කම්කරු පන්තියට වැටුප් සහිත නිවාඩු දින බවට පත් කරන්නට ඔහු ද සටනේ පෙරමුණෙහි සිටියේය.

ඔහු නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රීවරයකු ලෙසද කටයුතු කළේය. අබ්දුල් අසීස් මහතා වතු කම්කරු ජනතාවට කළ මෙහෙවර අගයමින් 1970 දී බලයටපත් සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය තම රජයේ පත් කළ මන්ත්‍රීවරයකු ලෙසද අසීස් මහතාව පත් කරනු ලැබීය. මේ රටේ ස්වෛරීවත්වය පළමුව පතමින් තම ජනතාවගේ විමුක්තිය උදෙසා ජීවිතය කැප කළ අබ්දුල් අසීස් මහතා 1990 අප්‍රේල් 29 වැනිදා අභාවප්‍රාප්ත විය.

කල්‍යාණි පී. නිශ්ශංක

සමාජවාදයේ සිහිනයක් සමඟ

එලොව ගිය රත්නායක වනසිංහ

උඩරට සන්දේශය' සතිපතා තීරු ලිපිය මගින් කන්ද උඩරට පමණක් නොව මේ දිවයිනේ සිව් දිගෙහිම ජනතාව ආකර්ශණය කැර ගත් නිලමේ පසුගිය දා මහනුවර මහයියාවේ දී අවසන් ගමන් ගියේය.

රත්නායක වනසිංහ නමින් රට ම හඳුනාගත් මේ තීරු ලිපි රචකයා ලේඛකයකු පරිවර්තකයකු, දේශකයක, කවියකු, වෘත්තීය සමිති නායකයකු, කොමියුනිස් පක්ෂ ප්‍රාදේශීය නායකයකු, ජන සාහිත්‍ය පර්යේෂකයකු වේදිකා නාට්‍ය ශිල්පියකු ආදී විවිධ ක්ෂේත්‍රයන්හි පතළ අත් දැකීම් ලැබූවකු මෙන්ම ඒ සෑම තැනකටම පොදු වූ සැබෑ ජනතා හිතවාදියෙක් ද වූයේය.

1935 අප්‍රේල් 10 වැනිදා පස්සර දී උපන් අපේ මේ ලේඛකයා 2021 අප්‍රේල් 11 වැනිදා මහනුවර දී අවසන් හුස්ම ගෙළුවේය.

බදුල්ල පස්සර මධ්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඔහුට වයස අවුරුදු විස්සේ දී බදුල්ල කච්චේරියේ සැලසුම් ශිල්පි තනතුරක් ලැබිණ.

පාසල් වියේ සිටම ඔහුට තිබුණේ සමාජවාදී අදහස්ය. පාසල් පුස්තකාලයෙන් ලැබුණු කාල්මාක්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනය ඔහුට කට පාඩම්ය. මාක්ස්ගේ, ලෙනින්ගේ, මාඕ සේතුගේ ජීවිත කතා, සහ මැක්සිම් ගෝර්කිගේ අම්මා නව කතාව ලොව පිළිබඳ ඔහු තුළ නව බලාපොරොත්තු ඇති කෙළේය.

"මා උපන් මේ බිමේ ද සමාජවාදී සමාජයක් බිහි කිරීමට කැපවෙමි' ඔහු සිතුවේය.

ඒ සඳහා සම්බන්ධ විය යුතුයැයි ඔහුට සිතුවේ දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ නායකත්වය දුන් කොමියුනිස්ට් පක්ෂයයි. ඔහු ඒ පක්ෂයට බැඳුණේය. බදුල්ලේ කොමියුනිස්ට් පක්ෂ ශාඛාව රත්නේට දේශපාලන හා සාහිත්‍ය පොත් සපයා දුන්නේය. ඔහු කච්චේරිය තුළ දී සැලැසුම් ශිල්පියකු වශයෙන් අකුරටම සේවයේ යෙදෙන අතර විටෙක කාලයේ දී සමාජවාදී සමාජයක් පිළිබඳ සැලසුම් සිය මනෝ ලෝකයේ ඇන්දේය.

රත්නායක වනසිංහ පාසලේ විවාද කණ්ඩායමේ ප්‍රධානියාය. දක්ෂම කථිකයාය. මේ ගැන ඇසූ බදුල්ල කොමියුනිස්ට් පක්ෂ නායකයෝ පක්ෂයේ තරුණ සමිති ඇමතීමට ඔහු යොදා ගත්තේය. නිවාඩු දිනවල ඈත ගම්වල කොමියුනිස් පක්ෂයේ ප්‍රචාරක කටයුතුවලට ඔහු සහභාගි විය.

1965 දී එ.ජා.ප. රජය බලයට පත්වීමත් සමඟ බදුල්ලේ සමාජවාදීන්ට දඬුවම් ලැබිණ. ඇතැමකුට රැකියාද අහිමි විය. රත්නේ අම්පාර කච්චේරියට මාරු කැරිණ.

'එන්න සහෝදරයා, අපි ඔබ පිළිගන්නවා'

අම්පාර කච්චේරියේ සමාජවාදියෝ ඔහු සාදරයෙන් පිළිගත්හ. ඒ පිරිස අතර ජනපද ගොවියකුගේ පුතකු හා ගුරු නායකයකු වූ ලේඛක පියසේන කහඳගමගේ ද විය.

රත්නේට අමුත්තක් නොදැනිණ. ගංගා නිමින සංවර්ධන මණ්ඩලයේ කුරිරු අණ සකට යටත් වූ ජනපද ගොවීන්ගේ පීඩනය ඔහු මුල දී ම හඳුනාගත්තේය. 'අරගලවලත් පිරුණු හා පිරෙන තැනක් ඔහු සිතුවේය.

පාසල් වියේ සිටම ඔහුට තිබුණේ සමාජවාදී අදහස්ය. පාසල් පුස්තකාලයෙන් ලැබුණු කාල්මාක්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනය ඔහුට කට පාඩම්ය. මාක්ස්ගේ, ලෙනින්ගේ, මාඕ සේතුගේ ජීවිත කතා, සහ මැක්සිම් ගෝර්කිගේ අම්මා නව කතාව ලොව පිළිබඳ ඔහු තුළ නව බලාපොරොත්තු ඇති කෙළේය.

එස්. ජී. පුංචිහේවා, අයි. සුවදරත්න, සේන ජයකොඩි වැනි ගුරු නායකයන් හා කම්කරු නායකයන් සමඟ එක්ව ඔහු වෘත්තීය අරගලවල දී සටන්කාමී සහාය පළ කෙළේය. හැම විරෝධතා පෙළපාළියකට ඔහු ඉදිරියෙන්ම ගමන් කෙළේය. ඔහුගේ හඬ සියලු හඬ අභිබවා නැගිණි.

ඔහගේ කතා බස් සිනා රසයෙන් පිරී තිබිණ. ඒ නිසාම ඔහුගේ දෙසුම් ශ්‍රාවකයන්ගේ මන බඳනා සුලු විය.

ඔහු සේවය කළ යුගය අම්පාරට තාමත් මතකය. අම්පාරේ සෑම ගමකම, කැලෑබද ගම්වල පවා කොමියුනිස්ට පක්ෂයේ ශාඛා පිහිටුවා තිබිණ. කච්චේරියේ සේවයෙන් පසු හැන්දෑවේ පියසේන කහඳගමගේද සමඟ මූලධර්ම ජනතාවට පැහැදිලි කොට දුන්නේය.

දිවි සමානාත්මක භෞතිකවාදය, අතිරික්ත ශ්‍රවය, වගේ මූලික, විෂ්‍ය මූලික, කම්කරුපන්ති ආඥාදායකත්ය වැනි වචනවලින් තොරව එහෙත් ඒ අදහස් සිප් තුළ ගැඹුරට කාවදින හෝ ඔහු ජනතාවාට ඉදිරිපත් කෙළේය.

'රාජ්‍යය' පිළිබඳ දේශනයකය පැවැත් වූ ඔහු එය අවසන් කොට සවන් දෙන්නක් ගෙස මඳ වේලාවක් බලා සිටියේය. හීන් හඬක් ඔහුට ඇසිණ.

'ඔව්, සහෝදරයා මේ රාජ්‍යය වෙනුවට අපේම එකක් අපට ඕනෑ. අපි එහෙම එකක් හදා ගන්න ඕනෑ.'

රත්නේගේ මුහුණ මහත් සතුටකින් පිරිණි.

එදා මම ද ඒ දේශනයට සවන් දුනිමි. ඒ යුගයේ එම අම්පාරේ පාසලේ පියසේන කහඳගමගේ සමඟ එකට සේවය කළේය.

සිය දෙසුම සරු වී දැයි රත්නේ බැලුවේ සවන් දෙන්නන්ගේ මුහුණවලිනි.

තැම්බු බඩ ඉරිඟු කා තේ කහට බී, ගොවීන් සමඟ ඔවුන්ගේ නිවසක නිදා සිට පසුදා කච්චේරියේ වැඩට ගිය දවස් ද රත්නේට විය.

ඔහු පසුපස රහස් පොලිසිය ද ඇවිද්දේය.

'ඉතින් කොහොමද සහෝදරයා?' ඔහු ඔවුන්ගේ පිටට තට්ටු කරමින් ඇසීය.

රජයේ සේවය සඳහා පැය අටක් ගත කළ රත්නේ ඉන් පසු වැඩිම කාලයක් දේශපාලන හා වෘත්තිය අරගල සඳහා කැප කළේය. ඔහු ලිවීමට හා කියවීම් කෙසේ හෝ පැය දෙකක් ඉතිරි කැර ගත්තේය.

රත්නේ ඉංග්‍රීසි, සිංහල දෙබසට මැනවින් දැක සිටියේය. ඉංග්‍රීසි මසින් ලියැවුනු ලිපි රාශියක් ඔහු ඇත්ත පුවත්පතේ පළ කෙළේය. 'ඇත්ත'ට කව් ලීවේය.

විශිෂ්ට සාහිත්‍යධරයකු හා ප්‍රවීණ පරිවර්තකයකු වූ එස්.ජී. පුංචිහේවා මහතා අම්පාරේ දී හමුවීම ඔහුගේ ලේඛන කලාව දියුණුවීමට හේතුවක් විය. බිලීප් ගිම්රාන්, ලුගුන් වැනි එදා ලංකාවට නුහුරු විදෙස් කවීන් හඳුන්වා දුන් පුංචිහේවා මහතාගේ ඇසුර ඔහුට ධෛර්යයක් විය. ඔහු පුංචිහේවා මහතා සමඟ සාහිත්‍ය හා දේශපාලනය ගැන දීර්ඝ සාකච්ඡාවල යෙදුණේය.

1970 මහ මැතිවරණයෙන් එ.ජා.ප.ය පැරදීමත් සමගම රත්නේට මහනුවරට ස්ථාන මාරුවක් ලැබිණ. ගොවීන්, කම්කරුවන්, ලිපිකරුවන් හඬා වැටෙද්දී ඔහු අම්පාරෙන් සමුගත්තේය.

මහනුවර නිවාස දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියා ලෙස විශ්‍රාම ලබන තුරා ඔහු සේවය කළේය. ඔහුට හුරු යහපත්, යුක්ති සහගත සමාජ ... ඒ සේවා කාලය තුළ දී ද බැහැර නොවීය. වැඩ කිරීමේ දී ඔහු චිත්‍ර ලේඛ දෙස නොබැලුවේය.

එහි දී ඔහුට කෑගල්ල දිස්ත්‍රික්කයේ සංගීත අධ්‍යාපන අධ්‍යක්ෂ විරසේන ගුණතිලක මහතාගේ ඇසුර ලැබිණ. එතුමා ජන සංගීතය පිළිබඳ පර්යේෂණ කටයුතුවල යෙදුනේය.

'අපේ සංගීතය ගොඩනැඟිය යුත්තේ දේශීය ජන සංගීතය පදනම් කරගෙනයි' යන මතයේ පිහිටි රත්නේ විරසේන මහතාට එකතු විය. ඔහු දන්නා ගම්මානවල පරපුරෙන් පරපුරට පා සංගීතය ගුණතිලක මහතාට සමීප කෙළේය. ඒ ගමන් රසමුසු විය.

වේදිකා නාට්‍ය හිල්පියකු වශයෙන් ද රතනේ සතු කුසලතා අවස්ථා රැසක දී මතු වූයේය.

මධ්‍යම පළාත් ලේඛක සංවිධානය බිහිවීමට ඔහුද මුල් විය. දස වසරක්ම ඔහු එහි සභාපතිධුරය දැරුවේය.

ඉංග්‍රීසියෙහි ආ උසස් නවකතා රැසක් ඔහුගෙන් සිංහලයට නැගිණ. 'චීන ජන කතා' නමින් ඔහු ලියා පො පාසල් දරුවෝ සතුටින් පිළිත්හ.

1981 දී දිවයින ඉරිදා සංග්‍රහය ආරම්භ කරන විට එහි සංස්කාරක දයාසෙන් ගුණසිංහ මහතා එක් එක් ප්‍රදේශ නියෝජනයට සුදුසු ලේඛකයන් තේරුවේය. උඩරට ජනතාව නියෝජනයට සුදුස්සා ලෙස ඔහුට පෙනුනේ රත්නායක වනසිංහය.

ඔහු 'උඩරට සන්දේශය' නමින සතිපති තීරු ලිපියක් දිවයින ඉරිදා සංග්‍රහයට ලීවේය. ඒ තීරු ලිපිය උඩරට ජනතාවගේ හඬ විය. ගුණසිංහ මහතාගේ බලාපොරොත්තු ඉන් ඉටුවිය.

'කොන්ද පණ නැති, මන්ද ගාමී, කන්ද උඩරට ලොකු උන්දැලාගේ අන්ධ භාවයට බේත් දෙන්නට කාලය ඇවිත්'

ඔහු ලීවේය. කන්ද උඩරට දිසා ඇමැතිවරුන්ට, ඇමැතිවරුන්ට, නගරාධිපතිවරුන්ට, රත්නේ දෙන පහරින්, කන්ද පහළ, පහත රට සිටින දිසා ඇමැතිවරුන්ටද, ඇමැතිවරුන්ටද, නගරාධිපතිවරුන්ටද, රිදිණ. උන්ගෙන් රළු පරුෂ බස් නැගිණ.

'මං ගැහුවේ මුන්ට. උන්ටත් වැදිලා තියෙනවා. ඒකට මං මක් කරන්නටද ආයිබෝං'

රත්නේ දිනක් සංස්කාරකවරයාගෙන් ඇසුවේය. ඔහු ලියු හැම තීරු ලිපියක්ම ජනප්‍රිය විය. සිය දයාබර බිරිය වන කමලා වනසිංහ මහත්මියගේ සාදර සත්කාර මැද ලෙඩ ඇඳට වැටී දිගු කලක් ගෙවූ, රත්නේට තමා බැලීමට එන සටන් සගයකු, ලේඛක මිත්‍රයකු වන මාතලේ පියදාස වැලිකන්නගේ දකින විට ඔහුගෙන් මෙසේ කියැවෙයි.

'වැලි, උඩ කාල ද ඉන්නේ, කාල නැත්නම් කුස්සියට ගිහින පිඟානක් අරගෙන කෑම ටිකක් බෙදාගෙන කාල වරෙන්.'

'මං කාල ආවේ රත්නේ, වැලිට කියැවෙයි. ඉන්පසු කතාව ඇරඹයි. ඒ එකම කතාවකි.

'වැලි, අපි හිතපු දේවල් කර ගන්න බැරි වුණා. මේ බිමේ සමාජවාදය ගොඩ නගන්නනේ හිටියේ. ඒක අපට බැරිවුණා. උඹ කියන්නේ ඒක හරියන වැඩක් නොවෙද?'

'එහෙම කියන්න එපා රත්නේ, උඹ කොමියුනිස්ට් පක්ෂ ඉඳන් එහෙම හිතුවා. මට සමසමාජ ඉඳන් එහෙම හිතුව. අපි දෙන්නට පක්ෂයක් නැතුවත් එහෙම හිතුව. මේ ලෝකෙ තිබෙන ප්‍රශ්න විසඳන්න මොන වාදයකටවත් බැහැ. බල අරගල මෝරල මෝරල යුද්ධවලින් මහ විනාශයක් එනවා. විසඳුම් නැහැ. ප්‍රශ්න විසඳන්න තියෙන්න සමාජවාදයෙන් බව මිනිසුන්ට එනකොට තේරුම් යාවි. කවදහරි ලෝකයම සමාජවාදී වෙනවා.

'එතකොට මම නැහැ.'

'මමත් නැහැ.' ඒ දෙදෙනා හමුවූ හැම දිනකම සංවාදය කෙළවර වූයේ එසේය.

මේ පසුගිය 11 වැනිදා වැලි, රත්නේ බැලීමට පැමිණිවිට 'උඹ කෑම කාලද ආවේ'යි ඇසීමටවත් සමාජවාදය ගොඩනැගෙනවිට 'මම නැහැ'යි කීමටවත් රතනේ කෙනෙක් සිටියේ නැත.

දෙනගම සිරිවර්ධන

දේශවංශය
සංස්කරණය - උදිත ගුණවර්ධන
මෙම සියලු ලිපි සංවාදයට විවෘත බව සලකන්න.
දේශපාලනය හා සම්බන්ධ ඔබේ ලිපි අපට එවන්න.
'දේශවංශය', දිනමිණ, අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
deshawanshaya@lakehouse.lk

2021 අප්‍රේල් 23 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.